ඉදිරිමගෙන්
ඉදිරියට
ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
CPSL
80
1943-2023
ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය

ඉදිරිමගෙන්
ඉදිරියට

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

1955 තරම් ඈත වකවානුවක
අප වෙනුවෙන් තැබූ
ඒ මහඟු පියවර
ඉදිරිමගයි...

අදත් අපි පියනගන
මග එයයි...

රටට මග පෙන්වන ප්‍රතිපත්ති මාලාව

ඉද්දිරමගෙන්
ඉද්දිරියට

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

පළමු මුද්‍රණය: 2023

ඉදිරිමගෙන් ඉදිරියට

© ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

ISBN 978-624-5612-01-7

පරිගණක අක්ෂර සංයෝජනය, පිටු සැකසුම
සහ පිටවැසුම් නිමවුම :
මාධ්‍ය අංශය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
කවරයේ චිත්‍රය - උදය ගමාච්චි

පටුන

	පෙරවදන	7
1.	සමාජ - ආර්ථික විවරණය	11
2.	සංකල්පීය රාමුව	19
3.	ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය	29
	අධ්‍යාපනය ප්‍රතිපත්තිය	30
	වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තිය	38
	ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන ප්‍රතිපත්තිය	49
4.	සෞඛ්‍ය ප්‍රතිපත්තිය	57
5.	කාන්තා ප්‍රඥප්තිය	65
6.	හරිත ආර්ථිකය	75
	වාරිමාර්ග ප්‍රතිපත්තිය	85
	කිරි ගව කර්මාන්තය	98
7.	නීල ආර්ථිකය	107
8.	රතු ආර්ථිකය	117
9.	මූල්‍ය සහ බැංකු කටයුතු ප්‍රතිපත්තිය	139
10.	ඩිජිටල් පරිවර්තන ප්‍රතිපත්තිය	145
11.	ප්‍රවාහන ප්‍රතිපත්තිය	153
12.	බලශක්ති ප්‍රතිපත්තිය	169

13. සංචාරක කර්මාන්තය 181
14. නිවාස සහ නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය 187
15. සමාජ සුබසාධන ප්‍රතිපත්තිය 201
16. සංස්කෘතික සංවර්ධනය 211
17. රාජ්‍ය ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව 221
18. යහපාලනය සහ පරිපාලන ප්‍රතිපත්තිය 233
19. විදේශ කටයුතු ප්‍රතිපත්තිය 241

පෙරවදන

2022 වර්ෂයේ පැවැත්වූ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ විසි දෙවැනි ජාතික සම්මේලනයේ දී ගනු ලැබූ තීරණයක් අනුව ඔබ වෙත, මෙම 'ඉදිරි මගෙන් ඉදිරියට' - විකල්ප සංවර්ධන වැඩපිළිවෙළ ඉදිරිපත් කරමු.

අප පක්ෂය විසින් 'ඉදිරිමග' නමින් 1955 වසරේ දී මෙවැනි ම ආර්ථික වැඩපිළිවෙළක් ඉදිරිපත් කළෙමු. එය, පක්ෂයේ ඓතිහාසික සතරවැනි ජාතික සමුළුවේ දී (1950 වර්ෂයේ පැවැත්වූ) ගනු ලැබූ තීරණය අනුව සැකසූ එකකි. එවකට පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා වූ දොස්තර සුගීශ්වර වික්‍රමසිංහ විසින් සම්පාදනය කරනු ලැබූ 'ඉදිරිමග', රටේ ඉදිරි ගමනට බෙහෙවින් බලපෑ කෘතියක් විය. පාසල්වල, විශ්වවිද්‍යාලවල භාවිතයට ද ගනු ලැබූ කෘතියක් බවට 'ඉදිරිමග' පත්විය.

ශ්‍රී ලංකාවට ඩොමීනියන් තත්ත්වය වශයෙන් ලැබූ අර්ධ නිදහසින් පසු බලයට පැමිණි සියලු දේශපාලන පක්ෂ සහ සන්ධාන ආණ්ඩුවලට ආර්ථික සංවර්ධනයේ දී ආධාරකාරී වූ මග පෙන්වීමක් බවට එම 'ඉදිරිමග' කෘතිය පත්විය. එම කෘතිය සම්පාදනය කිරීමට සාමූහිකව වෙරදැරූ සහ කතුවරයාට ක්‍රියාකාරී ලෙස සහාය දුන් පී. කන්දයියා, ප්‍රේමලාල් කුමාරසිරි, වී. පොන්නම්බලම් සහ ආර්ථික විද්‍යාඥ ජී. වී. එස්. ද සිල්වා යන සහෝදරවරු අපි මෙහි දී සිහිපත් කරමු.

මෙම 'ඉදිරි මගෙන් ඉදිරියට' කෘතිය සම්පාදනයට සහාය දුන් විද්වතුන් රාශියකි. ඔවුන්ට මෙම කෘතිය එළි දක්වන මෙම අවස්ථාවේ දී පක්ෂයේ කෘතවේදිත්වය සහ ගෞරවය පිරිනමන්නෙමු.

මෙම කෘතිය සම්පාදනය කරලීමට බලපෑ සාධකය වූයේ අද ශ්‍රී ලංකාවේ පවත්නා මෙතෙක් නොදුටු ප්‍රබල, ගැඹුරු, ආර්ථික අර්බුදයයි. එම අර්බුදය මතුවූයේ 1978 - 2023 (වසර 45 ක) කාලපරිච්ඡේදය පුරා නොවෙනස්ව අනුගමනය කරනු ලැබූ නව ලිබරල්වාදී ආර්ථික උපාය මාර්ගය තුළිණි. ජාතික මෙන් ම ජාත්‍යන්තර වශයෙන් නව ලිබරල්වාදය තියුණු අර්බුදයකට පත්ව ඇත්තේය.

1947-1977 අතර වූ කාලපරිච්ඡේදය තුළ විවිධ පක්ෂවල/පෙරමුණුවල ආණ්ඩු යටතේ ක්‍රියාත්මක වූ ආර්ථික වැඩපිළිවෙළ ද එම කාලපරිච්ඡේදය තුළ දී මතුවූ අර්බුදකාරී තත්ත්වයන් ද අපි සැළකිල්ලට ගත්තෙමු.

ආසියානු රටවල් අතරින්, නව නිදහස් රටවල් වශයෙන් පළමුවෙන් ම මතුවූ රටවල් වූයේ දකුණු ආසියාවට අයත් රටවල් ය. 'සාර්ක්' සහ 'බිම්ස්ටෙක්' සංවිධානවලට අයත් රටවල් ය. එහෙත් ශ්‍රී ලංකාව ඇතුළු එකී ආසියාතික රටවල් ආර්ථික සංවර්ධනයේ දී සාපේක්ෂව පසුපසින් සිටිය දී, පසුව නිදහස් වූ රටවල් අපට වඩා අද ඉදිරියෙන් සිටින්නේ ඇයි ද කියා විමසා බැලිය යුතු වේ. එසේ වීමට බලපෑ සුවිශේෂි සාධක තිබිය හැකි වුව ද, දකුණු ආසියාතික රටවල පසුබෑස්මට හේතු වූ පොදු සාධක ද පවතී. ජාතික සමගිය, ආගමික සංහිඳියාව වැනි අවශ්‍ය ම හිතකර සාධක නොපැවතීම එවැනි පොදු සාධක වන්නේ ය.

එසේ වුව ද වත්මන් අර්බුදය පිළිබඳ කතිකාවේ දී අවධානය යොමු වන්නේ දූෂණය, අකාර්යක්ෂමතාව, කළමනාකරණය ආදී සාධකය වෙත ය. මෙම කෘතිය තුළින් අප අවධාරණයෙන් ප්‍රකාශ කර සිටින්නේ මෙම අර්බුදය, නව ලිබරල්වාදී ආර්ථික මූලෝපාය තුළින් ම පැන එන්නා වූ එකක් බවයි. එහි ජාත්‍යන්තර පැතිකඩ වන්නේ ද නව ලිබරල්වාදය තුළින් ම මතුවන්නා වූ අර්බුදයයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) ලබාදෙන්නා වූ උපදෙස් මෙන් ම ණය සහනාධාර තුළින් ද අර්බුදයට විසඳුම් ලබාගත නො හැකි ය. එයින් සිදුවන්නේ අර්බුදය තව තවත් දිග්ගැස්සීම පමණය. නව ලිබරල්වාදී ආර්ථික උපාය මාර්ගයෙන් දුරස්වීම අනිවාර්ය අවශ්‍යතාවකි.

වාසිදායක ජාත්‍යන්තර වාතාවරණයක් නිර්මාණය වී තිබීම මෙම වැඩපිළිවෙළේ අවධානයට යොමු වී ඇත. ආසියානු ආර්ථිකයේ පිබිදීම, නව ආර්ථික කලාප, අන්තර් මහද්වීපික යටිතල පහසුකම් ව්‍යාපෘති, ඩොලර්හරණය, විදේශීය වෙළඳාම සඳහා වූ නව ගෙවීම් වේදිකා සහ ක්‍රමවේද, විකල්ප ලෝක සංවර්ධන බැංකු ආදී සාධක තුළින් ලෝක බල තුලනය වාසිදායක ලෙස වෙනස්වෙමින් පවතී. සංවර්ධනය උදෙසා සාම්ප්‍රදායික ලෙස වත්මන් 'ගෝලීය උතුරේ' සරණ සොයා යාම ඵල රහිත ය. ඒ වෙනුවෙන්, නිර්මාණය වෙමින් තිබෙන ප්‍රබල 'ගෝලීය දකුණ' ට පිවිසිය යුතුය.

මෙම කෘතිය තුළින් යෝජනා කර ඇති නව ආර්ථික වැඩපිළිවෙළ සම්පාදනය කිරීමේ දී ඉහතින් දැක්වූ නව ගෝලීය ප්‍රවණතා සහ වර්ධනයන් සැලකිල්ලට ගනු ලැබීය.

මෙම කෘතිය මගින් ජනතාව අතර නව සංවාදයක් ඇති කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය

2023 ජූලි 3 වැනි දින

සමාජ - ආර්ථික විවරණය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය විසින් සම්පාදනය කරනු ලැබූ 'ඉදිරිමග' ආර්ථික වැඩපිළිවෙළ ප්‍රකාශයට පත් වූයේ 1955 දී ය. ඒ 1950 දී පවත්වන ලද පක්ෂයේ සතර වැනි ජාතික සම්මේලනයේ දී ගනු ලැබූ තීරණයකට අනුව ය.

1948 ඩොමීනියන් මට්ටමේ අර්ධ නිදහස ලැබූ තත්ත්වය තුළ 1947 මැතිවරණයෙන් බලයට පත්වූ රජය සහ ඉන් පසු බලයට පත්වූ ආණ්ඩු මුහුණ දී තිබූයේ නව යටත්විජිතවාදයට එරෙහි අරගලයකට ය. 1947-1977 කාල පරිච්ඡේදය තුළ ක්‍රමානුකූලව අධිරාජ්‍ය විරෝධී කාර්යභාරයන් රැසක් ඉටු කරලමින් ජාතික ආර්ථිකයක් ගොඩනැගීමට රටක් වශයෙන් අපි සමත්වීමු.

ඒ වකවානුවේ සංකල්පමය වශයෙන් ක්‍රමසම්පාදනය මත පදනම් වූ ආර්ථික සංවර්ධන මගක අපි ගමන් කළෙමු. ආපසු හැරී බලන විට 1955 දී රට හමුවේ තැබූ 'ඉදිරිමග' ආර්ථික වැඩපිළිවෙළ සියලුම ආණ්ඩුවලට ප්‍රබල බලපෑමක් එල්ල කළ බව කිව හැකි ය.

වත්මන් ආර්ථික අර්බුදය

1977 මහා මැතිවරණයෙන් බලයට පත් වූ ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව නව ලිබරල්වාදී ආර්ථික උපාය මාර්ගයට අවතීර්ණ වූ අතර ඒ සඳහා අවශ්‍ය දේශපාලන ස්ථාවරත්වය ඇතිකරගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවා වෙනස් කළේය.

එතැන් සිට 2022 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ආණ්ඩු වෙනස් වීම් සිදු වුවද, මූලික වශයෙන් ක්‍රියාත්මක වූයේ නව ලිබරල් 'ආර්ථික උපාය මාර්ගයයි'. මෙය ගෝලීය වශයෙන් ක්‍රියාත්මක වූ අධිරාජ්‍යවාදයේ නව ආර්ථික උපක්‍රමයකි.

මෑතකාලීන ඉතිහාසය විමසීමේ දී, කාර්මික ප්‍රාග්ධනය සහ එහි නවීකරණ බලපෑම් ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගැනීමට අපොහොසත් වී ඇති බව පෙනෙන අතර, වතු ආර්ථිකය, සංචාරක හා සේවා අංශය හරහා වෙළෙඳ සහ මූල්‍ය ප්‍රාග්ධනය ආර්ථිකය තුළ අඛණ්ඩව ආධිපත්‍යය දරයි. 1977 දී සිය ආර්ථිකය ලිබරල් කිරීමේ සිට, ශ්‍රී ලංකාව මැතිවරණ ජයග්‍රහණය කිරීම සඳහා මූලික මට්ටමේ රැකියා සහ සමාජ සුබසාධන මට්ටමක් පවත්වා ගැනීමේ දේශපාලන අවශ්‍යතාවයෙන් පමණක් සීමා වූ 'වොෂින්ටන් සම්මුතියේ' නියමයන් අනුගමනය කර ඇත. රාජ්‍ය ව්‍යවසාය පුද්ගලීකරණය කිරීම, වෙළෙඳාම ලිහිල් කිරීම සහ දේශීය ප්‍රාග්ධනයේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා කාර්මික ප්‍රතිපත්තියක් නොමැතිකම හේතුවෙන් ශ්‍රී ලංකාව දළ දේශීය නිෂ්පාදිතයෙන් 9% ක් පමණ වන දැවැන්ත හා අඛණ්ඩ වෙළෙඳ හිඟයකට ගොදුරු වී ඇත. එම තත්ත්වය රුපියල මත දැඩි පීඩනයක් එල්ල කරනවාට අමතරව එය නොනවත්වා අවප්‍රමාණය වීමට ද හේතුවී ඇත. බලශක්තිය, පොහොර සහ ආහාර ඇතුළු උපායමාර්ගික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා ආනයනය මත යැපීම හේතුවෙන් 10% ක පමණ ඉහළ මට්ටමක උද්ධමනයකට මුහුණ දීමට ද සිදුවී තිබුණි. ඉතා මෑතක දී කෝවිඩ් - 19 වසංගතයෙන් සහ නේටෝව විසින් යුක්‍රේනයේ යුද්ධය අවුලුවාලීමෙන් පසු, අපේ රට ගෝලීය වෙළෙඳපොළ කම්පනයන්ට ගොදුරු වීම පුදුමයක් නොවේ.

අර්බුදයේ සංයුතිය

අද අප මුහුණ දෙන්නාවූ මෙතෙක් නොවූ විරූ ආර්ථික අර්බුදය, අවශ්‍යයෙන් ම නව ලිබරල්වාදයේ ම අර්බුදයයි. 2022 වන විට ආර්ථික අර්බුදය පුපුරා ගියේ ත්‍රිත්ව අර්බුදයක් වශයෙනි. ඒ රාජ්‍ය මූල්‍ය, විනිමය හා ණය අර්බුදය වශයෙනි.

රාජ්‍ය මූල්‍ය අර්බුදය

වෙනත් රටවල නොදකින දේශීය මුදල් අර්බුදයක් ශ්‍රී ලංකාවේ හට ගත්තේ අපේ මහා භාණ්ඩාගාරය හිස් වූ හෙයිනි. මෙම තත්ත්වය 1978න් පසු ක්‍රමානුකූලව වර්ධනය වූ ප්‍රවණතාවයකි. 1978දී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් 24% ක් වුව ද, මෙම ප්‍රතිශතය 2022 වන විට 6% ක් දක්වා පහත වැටුණි. මෙය බදු ප්‍රතිපත්ති තුළින් ගලා ආ නිශේධනාත්මක ප්‍රවණතාවකි. අසීමිත බදු සමා, බදු සීමා, බදු සහන, බදු අහෝසිය ද අතිරේක සාධකය. මෙය නව ලිබරල් ආර්ථික උපාය මාර්ගයට අදාළ සාධක වන්නේය. මෙහි දී බදු ප්‍රතිපත්තිය දේශපාලනිකරණය වීමත් පෙනෙන්නට තිබුණි.

විදේශ විනිමය අර්බුදය තුළින් ඩොලර් හිඟයක් මතුවිය. මෙයට බලපෑ ප්‍රධාන හේතු වන්නේ වෙළෙඳ හිඟය උග්‍රවීමත් ඒ හේතුවෙන් ගෙවීම් ශේෂයේ විශාල ගැටලුවක් නිර්මාණය වීමත් ය. 1978 දී අපේක්ෂා කළ අපනයන ආර්ථිකය වෙනුවට නිර්මාණය වූයේ ආනයන ආර්ථිකයකි. නව ලිබරල්වාදයේ ප්‍රධාන ලක්ෂණය වන අධිපරිභෝජනය උදෙසා අසීමිතව ආනයන කිරීමේ ප්‍රතිපත්තිය, ගෙවීම් ශේෂයේ බරපතල ගැටලුවක් ඇතිවීමට ඍජු ලෙසින් බලපෑවේය. අසීමිත ආනයනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වෙළෙඳ ප්‍රතිපත්තිය බව තේරුම්ගත යුතුය. සියලු ආණ්ඩු මෙම ආනයන ප්‍රතිපත්තියේ දැඩි ලෙස එල්බගෙන සිටියේ ය. මෙහි තර්කානුකූල ප්‍රතිඵලය වූයේ අඛණ්ඩව වසර ගණනාවක් පුරා පැවත ආ වෙළෙඳ හිඟය සහ ගෙවීම් ශේෂයේ පරතරයයි.

ඊට අමතරව තීරණාත්මකව බලපා ඇති තවත් සාධකයක් නම් උපයා ගන්නා විදේශ විනිමය රට තුළට මුළුමනින් ම නොලැබීමයි. විදේශ විනිමය රෙගුලාසි නග්න ලෙස උල්ලංඝනය කරමින්, උපයාගත් විදේශ විනිමය, විදේශ රටවල බැංකුවල මෙන් ම රට තුළ ද විදේශ බැංකු තුළ ද රඳවා තබා මහ බැංකුවට ගලා ඒම වළක්වාලනු ලැබීය.

මෙකී සියලු සාධක 2022 සිට ඉන් ඉදිරි වර්ෂවල රට මුහුණදුන් ඩොලර් හිඟයට හේතු විය.

ණය අර්බුදය

අර්බුදයේ තුන්වන ලක්ෂණය ණය අර්බුදයයි. අර්බුදය පුපුරා යනවිට විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 52කි (ඩොලර් මිලියන 52,000 කි). 1978 දී ශ්‍රී ලංකාවේ මුළු විදේශ ණය ප්‍රමාණය වූයේ ඩොලර් මිලියන 743 කි.

විදේශ ණය ගැනීම ආරම්භයේ දී සීමාවී තිබුණේ ආණ්ඩු අතර සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන අතර පමණ ය. ඒවා බොහෝ සෙයින්ම ද්විපාර්ශ්වීය හෝ බහු පාර්ශ්වීය ණය යි.

2008 ගෝලීය අර්බුදයෙන් පසු විදේශ ණය ලබාගැනීම ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ දක්වා ව්‍යාප්ත විය. එය, කිසිදු කොන්දේසියක් හෝ ප්‍රතිපත්තියක් හෝ නොමැතිව, ජාතික රාජ්‍යයන්ට විදේශ ණය පහසුවෙන් ම ලබා ගතහැකි මාවතක් විය. නව ලිබරල්වාදී ආර්ථික මූලෝපාය තුළ ප්‍රාග්ධනයට නිදැල්ලේ හැසිරීමට දොර විවෘත කරනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාවාරම් ප්‍රාග්ධන අරමුදල්, ජාතික රාජ්‍යයන්ගෙන් බාහිරව ලොව පුරා මතුවිය. ඒ තුළින් කළු සල්ලි (විදේශ විනිමය) සුදු කරලීමට මංපෙත් විවෘත විය.

මෙම නව ක්‍රමවේදය තුළින් ජාතික රාජ්‍යයන්ට විදේශ ණය සැපයීම, ජාත්‍යන්තර ජාවාරමක් බවට පත් විය. මෙම ණය ආපසු ලබාගැනීම සහතික කරලීම සඳහා ස්වෛරී බැඳුම්කර ක්‍රමවේදය ආධාරකාරී විය.

ශ්‍රී ලංකාව ද 2007 වර්ෂයේ සිට ස්වෛරීත්ව බැඳුම්කර ණය ලබාගැනීම ආරම්භ කළ අතර 2015 - 19 කාලය තුළ දී ලබාගත් ඇමරිකානු ඩොලර් බිලියන 12 ක් ද ඇතුලු ඩොලර් බිලියන 17 ක් ඒ අයුරින් එකතු වී තිබේ. සංවර්ධනය වන රටවල් ණය උගුලේ සිරවීමට මෙම ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රධාන හේතුවක් බවට ජාත්‍යන්තර පිළිගැනීමක් ඇත.

අර්බුදයේ පිළිබිඹුව

අර්බුදය පැති ගණනාවක් ඔස්සේ පිළිබිඹුවෙමින් ඇත. 2021 සහ 2022 අතර ශ්‍රී ලාංකික රැකියා මිලියන භාගයක් අහිමි

වී ඇති බව ලෝක බැංකුව ඇස්තමේන්තු කර ඇති අතර, වැඩ කරන අයට ඔවුන්ගේ සැබෑ ආදායම 15% කින් පමණ අඩුවී ඇත. ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාතිකය 2021 දී 13.1% සිට 2022 දී 25.6% දක්වා දෙගුණයක් වී ඇති බව ලෝක බැංකුව ඇස්තමේන්තු කර ඇති අතර ඒ අනුව එම වසර ඇතුළත දිළිඳුකමට වැටෙන අතිරේක ජනගහනය ලක්ෂ 27 කි. නාගරික දරිද්‍රතා අනුපාතිකය 15% දක්වා තුන් ගුණයකින් වැඩි වී ඇති අතර වතු ජනගහනයෙන් 50% කට වැඩි පිරිසක් දැන් දරිද්‍රතා රේඛාවට පහළින් සිටිති. කෙසේ වෙතත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දේශීය අධ්‍යයනයකින් පෙනී යන්නේ 2022 දී දරිද්‍රතාවට පත් වූ සැබෑ පුද්ගලයින් සංඛ්‍යාව ලක්ෂ 90 ඉක්මවිය හැකි බවයි. මේ අතර, ලෝක ආහාර වැඩසටහන ඇස්තමේන්තු කරන්නේ ශ්‍රී ලංකාවේ කුටුම්භවලින් 70% කට ආසන්න ප්‍රමාණයක් ඔවුන්ගේ ආහාර ප්‍රමාණය අඩු කර ඇති බවත්, මන්දපෝෂණයේ අර්බුදයකට මෙම තත්ත්වය තුඩු දෙන බවත් ය. එක්සත් ජාතීන්ගේ ළමා කටයුතු අරමුදල (UNICEF) ඇස්තමේන්තු කර ඇත්තේ 2022 දී ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගෙන් 33.4% ක් මන්දපෝෂණයෙන් පෙළෙන බවයි.

ගෝලීය අර්ථික අර්බුදය - නව ප්‍රවනතා සහ වර්ධනයන්

1945 දී දෙවන ලෝක යුද්ධය නිමාවට පත්වූ පසු, උදා වුයේ 'ද්විධ්‍රැව' (Bipolar) ලෝක රටාවකි. 'නේටෝ' නමින් අත්ලාන්තික් යුද්ධ ගිවිසුම් සංවිධානයක් ද ඊට ප්‍රතික්‍රියාවක් වශයෙන් 'වෝර්සෝ' යුද්ධ ගිවිසුම් සංවිධානයක් ද ස්ථාපිත විය. ඇමරිකාව සහ සෝවියට් දේශය වශයෙන් වූ ප්‍රබල න්‍යෂ්ටික බලවතුන් දෙදෙනකු ද බිහි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 'ශීතල යුද්ධය' වශයෙන් වු තත්ත්වයක් ද උදාවිය.

ලෝක ආර්ථිකය මෙහෙයවීමට 'ලෝක බැංකුව' සහ 'ජාත්‍යන්තර මූල්‍ය අරමුදල' ස්ථාපිත කරනු ලැබීය. ලෝක බැංකුව හා ජාත්‍යන්තර මුල්‍ය ආරමුදල පසුකාලීනව ලෝක ආර්ථිකය මෙහෙයවීම් අවියක් වශයෙන් යොදවනු ලැබීය.

ලෝක ආර්ථිකය ක්‍රියාත්මක වුයේ මෙම ජාත්‍යන්තර වාතාවරණය තුළ ය. සමකාලීනව, ජාතික විමුක්ති අරගලය උත්සන්න විය. නව නිදහස් රටවල් බිහිවිය. මෙකී කාලය තුළ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය රටවල් 50 සිට 193 දක්වා වැඩි වුයේ නව නිදහස් රටවල් බිහිවීම තුළිනි.

1980 න් පසු, සතරවැනි කාර්මික විප්ලවය (තාක්ෂණ) හේතුකොටගෙන ලෝක ආර්ථිකය වේගයෙන් ගෝලීයකරණ ක්‍රියාවලියට ලක්විය. ඊට සමගාමීව, ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ මුලුමනින් ම මුදාහැරලීමේ ක්‍රියාවලිය ද නව ලිබරල්වාදය, හරහා සිදුවිය. 1991 දී සෝවියට් සංගමය බිඳවැටීම තුළින් ගෝලීයකරණ ක්‍රියාවලිය වඩාත් වේගවත් වූයේ නව ලිබරල් ආර්ථික උපාය මාර්ගය හරහා වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 'ඒකධ්‍රැව' (Unipolar) ලෝක රටාවක් බිහිවිය.

21 වැනි සියවස උදාවීමත් සමඟ ආසියානු ආර්ථිකය, ලෝක ආර්ථිකයේ පෙරගමන්කරු බවට පත්විය. මීට බලපෑ තීරණාත්මක සාධක දෙක වන්නේ චීනය ආර්ථික බලවතකු වශයෙන් නැගී සිටීමත්, අග්නිදිග ආසියානු කලාපය (ආසියාන්) වේගවත් වර්ධනයක් ලබමින් සාමූහිකව නැගි සිටිමත් ය. චීනය හා ආසියාන් සංවිධානය අතර වු සමීපතාව ද ඊට දායක වු සාධකයකි. 2010 දී චීනය ලෝක ආර්ථිකයේ දෙවැනි බලවතා බවට පත්වීම තුළින් ලෝක ආර්ථික බල තුලනය ද වෙනස් විය.

2010-2020 අතර වූ දශකය, ලෝක ආර්ථිකය ප්‍රබල ලෙස වෙනස් කරලීමට බලපෑ කාලපරිච්ඡේදයකි. ඊට දායක වු සාධක වශයෙන් සැලකිය හැක්කේ බ්‍රික්ස් (BRICS) නම් නැගි එන ආර්ථික සංවිධානය හා අන්තර මහද්වීපික ප්‍රවාහන, යටිතල පහසුකම් හා වෙළෙඳාම වර්ධනය කරන තීරයක් - මාවතක් (BRI) ආර්ථික ව්‍යාපෘතියත්ය.

වර්තමානයේ, ආසියානු, අප්‍රිකානු, ලතින් ඇමෙරිකානු සහ යුරේෂියානු කලාප ආර්ථික වශයෙන් සාමුහිකව මතුවීම, ලෝක ආර්ථික රටාවේ තවත් නව ලක්ෂණයකි.

මෙකී සියලුම වර්ධන තුළින්, ජාත්‍යන්තර වෙළදාම පුළුල්වීමත්, කඩිනම් වීමත් සිදුවිය. එහි ප්‍රතිපඵලයන් වශයෙන් ප්‍රාග්ධනයේ සංසරණයත්, නව වෙළෙඳපොළවල් බිහිවීමත් සිදු වෙමින් පවතී. ඩොලරය වෙනුවට විකල්ප මුදල් ක්‍රම, ගෙවීම් වේදිකා, දේශසීමා අතර වෙළෙඳ ගනුදෙනු සිදුවෙමින් පවතී. ඉහත දැක්වූ සියලු සාධක තුළින් ලෝක ආර්ථික රටාවේ සහ ලෝක ආර්ථික බල තුලනයේ ප්‍රබල වෙනසක් දැකිය හැකිය.

අවසාන විග්‍රහයේ දී ප්‍රබල 'ගෝලීය දකුණ සහ 'ගෝලීය උතුර' (ඇමරිකාව, යුරෝපා සංගමය, කැනඩාව) වශයෙන් වූ නව පෙළගැස්මක් ද නිර්මාණය වෙමින් තිබේ.

ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීමේදී, නව ලෝක ආර්ථික රටාව සහ නව ලෝක බල තුලනය සැළකිල්ලට ගත යුතු ය.

සංකල්පීය රාමුව

සංවර්ධනය යනු බහුවිධ අර්ථ ඇති ඉතා බලවත් වචනයකි. මෙම වචනය විසින් අඩ සියවසකට වැඩි කාලයක් මුළුල්ලේ ලෝකය ම 'සංවර්ධිත' සහ 'ඌන සංවර්ධිත' ලෙස බෙදා තිබේ. ප්‍රායෝගිකව, එය විසින් ධනවාදයේ අධිරාජ්‍යවාදී 'අරටුව' පොහොසත් කර ඇති අතර, 'පරිධිය' දුප්පත් කරයි. ශ්‍රී ලංකාව වැනි රටවල් දැන සිටියේ ඌන සංවර්ධිත සංවර්ධනය පමණි. වසර ගණනාවක් තිස්සේ බොහෝ දෙනා සංවර්ධනයේ මූලික ගමන් පථය මෙන් ම 'සංවර්ධනය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න ප්‍රශ්න කරති.

1977 සිට, ශ්‍රී ලංකාව විසින් ආර්ථික සාධනයෙන් රාජ්‍යය ඉවත් කරමින්, පෞද්ගලික දේපළ සහ වෙළෙඳපොළ බලවේගවල ආධිපත්‍යය පමණක් ප්‍රවර්ධනය කරන 'වොෂින්ටන් සම්මුතිය' මගින් නියම කරන ලද නව ලිබරල් සංවර්ධන මාවත දිගේ ගමනක් පැමිණ තිබේ. ශ්‍රී ලංකාව යනු මේ ආර්ථික න්‍යායයන් පරීක්ෂාවට ලක් කළ ලෝකයේ පළමු රටවල් අතරින් එකකි. මෙම පරීක්ෂාවේ ප්‍රතිවිපාක ඉතාමත් විනාශකාරී ය, තරුණ කැරැල්ලක් සහ ජීවිත දහස් ගණනක් අහිමි කළ බෙදුම්වාදී යුද්ධයක් ඇතුළුව දැවැන්ත සමාජ අස්ථාවරත්වයකට මෙය දායක වී ඇත. නව ලිබරල්වාදය ආර්ථිකයේ ව්‍යුහය වෙනස් කළ අතර, කාර්මික භාණ්ඩ නිෂ්පාදනය විසින් 1977 දී දළ දේශීය නිෂ්පාදිතයට ලබාදුන් 23% ක දායකත්වය 2019 වන විට 16% දක්වා පහත වැටුණේ ය. කෘෂිකර්මය සහ ධීවර

කර්මාන්තය ඉදිරියට නොගිය අතර, ශ්‍රම බලකායෙන් 31% ක් ම එම අංශවල නිරත වී සිටියත්, දළ දේශීය නිෂ්පාදිතයට ඔවුන් දායක වී ඇත්තේ 7% කින් පමණකි.

කොවිඩ් අර්බුදය විසින් එම පෙර පැවති ප්‍රතිවිරෝධතා විවෘත කර තව තවත් උග්‍ර කළේය. 2022 දී ආර්ථිකය කඩා වැටී බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කරන ලද අතර, වර්තමානයේ මුහුණදෙමින් පවතින දේශපාලන හා සමාජ අර්බුදය ඉස්මතු කෙරිණි. මෙම සමස්ත අර්බුදය පදනම් වී පවතින්නේ ආර්ථික අර්බුදය තුළ ය. එය 1978 සිට වසර ගණනාවක් තිස්සේ අනුගමනය කරන ලද නව ලිබරල් ආර්ථික උපාය මාර්ගයේ අර්බුදය වන අතර, ඒ පිළිබඳව 'අපේ සමාජ - ආර්ථික විවරණය' පරිච්ඡේදයෙන් විස්තර කර තිබේ.

'ජාතික ආර්ථිකයක්' සංවර්ධනය කිරීම දැන් ජනප්‍රිය සටන් පාඨයක් වී ඇතත්, එය සාක්ෂාත් කරගැනීම සඳහා කිසිදු දේශපාලන බලවේගයක් බරපතල සහ ශක්‍යතාවයෙන් යුත් සැලැස්මක් ඉදිරිපත් කර නැත. එබැවින්, ආසියානු ප්‍රගති සංසදය (Asia Progressive Forum), ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සමඟ එක්ව විද්‍යාත්මක ප්‍රවේශය මත පදනම් වූ විකල්ප සංවර්ධන වැඩසටහනක් යෝජනා කරයි. 'සංවර්ධනය' යන්නෙන් අප අදහස් කරන්නේ ප්‍රාග්ධනයේ නිෂ්පාදන බලවේග සහ ඓන්ද්‍රීය සංයුතිය වැඩි කිරීමයි. මෙය කළ හැක්කේ 'මානුෂිකව' භාවිත වටිනාකම් නිෂ්පාදනය කිරීම සහ වැඩකරන පන්තිය කායික ශ්‍රමයේ සිට මානසික ශ්‍රමයට මාරුකිරීම මගිනි. මෙයින් යෝජිත විකල්ප සංවර්ධන වැඩසටහන මගින් වර්තමාන ආර්ථික, සමාජයීය, දේශපාලන හා සංස්කෘතික අර්බුද විශ්ලේෂණය කර ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් ප්‍රතිපත්ති ඉදිරිපත් කෙරෙයි.

සංකල්පීය පදනම යනු විකල්ප සංවර්ධන වැඩසටහනට පාදක වන දර්ශනය සහ මතවාද වන අතර ඒවා මෙහි විස්තර කෙරේ. එය මෙම විකල්ප වැඩසටහන මගින් අපේක්ෂා කරන ආකාරයේ 'මානුෂික සංවර්ධනය' සංවර්ධනය ලිහිල් ලෙස නිර්වචනය කරයි. සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ දී අවශ්‍ය

මෙවලමක් ලෙස රාජ්‍යය විසින් දිගුකාලීන මධ්‍යගත ජාතික සැලසුම්කරණයේ වැදගත්කම ද මෙයින් අවධාරණය කෙරෙයි. වැඩසටහනට ඇතුළත් කර ඇති යෝජනා කෙටුම්පත් කර ඇත්තේ ප්‍රවීණයන් සහ විද්වතුන් මෙන් ම පක්ෂ සාමාජිකයින් සහ පක්ෂයේ හිතවතුන් සමඟ පුළුල් සාකච්ඡාමය ක්‍රියාමාර්ගයක් තුළිනි.

මෙහි ඉදිරිපත් කර ඇති යෝජනා පහත දක්වා ඇති සංකල්පීය මූලධර්ම සමඟ බැඳී තිබේ.

1. 'මානුෂීය' සංවර්ධනය

නිෂ්පාදනය පදනම් කරගත් ආර්ථිකයක්, ස්වභාවික ඒකාධිකාරයේ පොදු අයිතිය සහ පුද්ගලික ව්‍යාපාර අතර ඇති දැඩි තරඟකාරීත්වය සමඟ අතිවිශාල ධනයක් උත්පාදනය කළ හැකි වුව ද, එම ධනය සාධාරණ ලෙස බෙදී යන බවට සහතිකයක් නොමැත. ධනේශ්වර ක්‍රමයේ අතිරික්තයන්, ගොවි කම්කරුවන්ගේ සහ දේපල හිමියන්ගේ පන්ති අතර ගැඹුරු ධ්‍රැවීකරණයක් ඇති කිරීමේ ප්‍රවනතාවක් වී තිබේ. එබැවින්, මූලික සේවා සැපයීම සහ සමාජීය පොදු අවශ්‍යතා උදෙසා, ධනය සමාජගත කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය ආයෝජනය සිදුවිය යුතු බව අපගේ ප්‍රතිපත්තිවල මූලික පදනමකි. මෙම අරමුණු සඳහා ආදායම් ඉහළ නැංවිය යුත්තේ අනුක්‍රමිකව අයකෙරෙන බදු ක්‍රමයක් (progressive taxation) මගින් වන අතර, එහි දී ධනවතුන් දුප්පතුන්ට වඩා ඉහළ බදු බරක් දරනු ඇත. තව ද, බලශක්තිය, ප්‍රවාහනය සහ සන්නිවේදනය වැනි ස්වභාවික ඒකාධිකාරයන්ගේ පොදු අයිතිය තුළ ක්‍රියාකරමින් ඒවායේ ආදායම ඉහළ නැංවිය යුතු ය. සෞඛ්‍ය, අධ්‍යාපනය සහ නිවාස වැනි සාමාජීය පොදු අවශ්‍යතා සඳහා පුළුල් පරාසයක රාජ්‍ය ආයෝජන මෙයින් යෝජනා කෙරෙයි. ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් අහිමි කරමින් සිදු කෙරෙන සංවර්ධනය අමානුෂික ය. සංවර්ධනය මානුෂීයවීමට සහ ජනතාව සතු දේ ඔවුන්ට අහිමිවීම් වැළැක්වීමට බිම් මට්ටමේ උපදේශනයත් වන්දි ලබාදීමයත් (විශේෂයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු සඳහා) අවශ්‍ය වේ.

රට තුළ සමාජ සුබසාධන ජාලය ආරක්ෂා කිරීමට, ශක්තිමත් කිරීමට සහ පුළුල් කිරීමට යෝජිත විකල්ප සංවර්ධන වැඩසටහන කැපවී සිටී.

2. සමගිමත් ජාතිය

රටක් ලෙස ඉදිරි සංවර්ධනයක් ඇති කරගැනීම සඳහා ජාතික සමගිය මුඛ්‍ය කොන්දේසිය බව අපගේ පිළිගැනීමයි. දිවයිනේ විවිධ අනන්‍යතා කණ්ඩායම් එකමුතු කිරීම වෙනුවෙන් 'ශ්‍රී ලාංකීය' ජාතික අනන්‍යතාවයක් වගාකර ප්‍රවර්වධන කළ යුතු ය. ජාතික සමගිය නොමැති විට ස්වෝත්තමවාද, බෙදුම්වාද, අන්තවාද සහ ත්‍රස්තවාද හිස ඔසවමින් ශ්‍රී ලාංකීය ජාතිය බෙදා වෙන්කිරීමට කටයුතු කරනු ලබයි. ඒ සඳහා ඉඩ නොතැබීමට වගබලාගත යුතු ය. අන් අයගේ අයිතිවාසිකම්වලට බාධාවක් නොවන පරිදි තම භාෂාව ආරක්ෂා කරගැනීමට සහ ඔවුන්ගේ ඇදැහීම් පිළිපැදීමට රටේ සියලුම ප්‍රජාවන්ට අයිතිය තිබිය යුතු ය. ජන කණ්ඩායම්වල අනන්‍යතා අයිතීන් මෙන්ම රටේ භෞමික අඛණ්ඩතාව සහ ඒකීයභාවය ආරක්ෂා වන පරිදි විවිධ මට්ටම්වල ප්‍රජාතන්ත්‍රවාදී බල ඒකකවල, මහජන පරමාධිපත්‍යය ප්‍රායෝගකව සහතික කළ යුතු ය.

3. නිෂ්පාදන ආර්ථිකය

මූලික වශයෙන් ගත් කල අපගේ යෝජනා මගින් අපේක්ෂා කෙරෙන්නේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රධානක්වය ලබාදෙන ආර්ථිකයකි. බ්‍රිතාන්‍ය රාජ්‍ය විසින් අප රටට දායාද කරන ලද්දේ මුළුමනින් ම පාහේ අපනයනය මූලික කරගත් කෘෂිකර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයකි. මෙම ආර්ථිකය ගෝලීය භාණ්ඩ මිලෙහි උච්චාවචනයන් හමුවේ අතිශයින් අවදානමට ලක් වන අතර, රටේ වැඩිවන ජනගහනය සඳහා රැකියා උත්පාදනය කිරීමට සහ නවීන සමාජයක සංවර්ධනයට සහාය වීමට අපොහොසත් ය. මෙම යටත්විජිත සංවර්ධන ආකෘතියෙන් තීරණාත්මක ලෙස බිඳී යාමට අනුප්‍රාප්තික රජයන් අසමත් වී ඇත. ආනයන-ආදේශන කාර්මීකරණයක් සඳහා ගත් ප්‍රයත්නයන් 1977 දී ආර්ථිකය විවෘත

කිරීම විසින් ගබ්සා කෙරිණි. එතැන් පටන් ශ්‍රී ලංකාව අපනයන කෘෂිකර්මාන්තය මත යැපීමේ සිට සංචාරක ව්‍යාපාරය සහ විදේශ ප්‍රේෂණ වැනි සේවා මත යැපීම දක්වා මාරු වී ඇත.කොවිඩ් අර්බුදය එවැනි ආර්ථික ආකෘතියක මූලික දුර්වලතා හෙළිදරව් කළේය.

ඊට වෙනස්ව, ආසියාවේ සමෘද්ධිය අත් කරගෙන ඇත්තේ කෘෂිකාර්මික අංශයේ පවා ඉහළ කාර්මිකකරණයක් සහ තාක්ෂණික පරිවර්තනයක් ලබා ඇති රටවල් ය. ජපානය, කොරියාව වැනි සමහර රටවල් ධනේශ්වර සංවර්ධනයේ පදනම මත මෙය සාක්ෂාත් කර ගෙන ඇති අතර චීනය, වියට්නාමය වැනි රටවල් සමාජවාදී දේශපාලන ක්‍රමයක රාමුව තුළ එය සාක්ෂාත් කරගෙන තිබේ. කාර්මිකකරණය යනු ගතික, පුනරාවර්තන සහ පරිවර්තනීය ක්‍රියාවලියක් වන අතර, නව තාක්ෂණය සහ කළමනාකරණ භාවිතයන් සමඟින් එය මුළු සමාජය ම විප්ලවීය වෙනසකට භාජනය කරයි. කාර්මිකකරණය යනු හුදු ආංශික ප්‍රතිපත්තියක් නොව, නවීකරණය සඳහා සියලු අංශ සහ සියලු පාර්ශ්ව සම්බන්ධ කෙරෙන වැඩපිළිවෙළකි. කාර්මික පද්ධතියක් තුළ ආර්ථිකය සමන්විත වන්නේ අන්තර් සම්බන්ධතාවලින් සහ ස්වයං - සවිමත්වීමේ හැකියාවලින් යුත් නිෂ්පාදන පරිසර පද්ධති කිහිපයකිනි.

4. රාජ්‍ය මැදිහත්වීම (මිශ්‍ර ආර්ථිකයක්) සහ ජාතික සැලසුම්කරණය

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය මැදිහත්වීම අපගේ යෝජනාවල මාර්ගෝපදේශක සංකල්පීය මූලධර්මයකි. බොහෝ ප්‍රධාන ධාරාවේ ආර්ථික විද්‍යාඥයින් විසින් පරිකල්පනය කරන ලද ධනවාදයේ පරමාදර්ශී අනුවාදයට පටහැනිව, ලොව පුරා බොහෝ නවීන ආර්ථික, ඇත්ත වශයෙන් ම මූලික ආකාරවලින් රාජ්‍ය විසින් මෙහෙයවනු ලැබේ. විශේෂයෙන් ම ඉතිහාසයේ මෙම තීරණාත්මක සන්ධිස්ථානයේ දී, එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වැනි 'නිදහස් වෙළෙඳාම' සහ 'පුද්ගලික දේපල' කප්පිත්තන් යැයි කියනු ලබන අය තාක්ෂණික දියුණුව සහ නිෂ්පාදන ධාරිතාව

වැඩිකරගැනීම සඳහා ජනසතු කිරීම, සහනාධාර සහ මිල පාලනයන් හරහා ඔවුන්ගේ ආර්ථිකයට දැඩි ලෙස මැදිහත් වන අයුරු අපි දැක ඇත්තෙමු. ඒ හා සමානව, ඉහළ ආදායම් තත්ත්වය අත්කරගෙන ඇති සියලුම සංවර්ධනය වෙමින් පවතින රටවල් ව්‍යුහාත්මක පරිවර්තනය සඳහා දිගුකාලීන උපාය මාර්ගික සැලසුම් භාවිතා කිරීම ඇතුළුව ආක්‍රමණශීලී රාජ්‍ය මැදිහත්වීම හරහා එය සිදු කර ඇත. කෙසේ වෙතත්, මෙයින් වෙළෙඳපොළ සහ පෞද්ගලික දේපල සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීමක් අදහස් නොවේ. ඒ වෙනුවට, ස්වභාවික ඒකාධිකාරයන් ක්‍රියාත්මක වන, පොදු සේවා සඳහා ආයෝජනය කරන සහ සැබෑ ආර්ථිකය සඳහා යෙදවුම් පිරිවැය අඩු කරන සංවර්ධන රාජ්‍යයක රාමුව තුළ තරඟ කිරීමට සහ ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමට පුද්ගලික සමාගම්වලට දිරිගැන්වීම් ලැබෙනු ඇත.

ශ්‍රී ලංකාවට දිගුකාලීන සංවර්ධන සැලැස්මක් සහ එය ක්‍රියාවට නැංවීම සඳහා තිරසාර උත්සාහයක් අවශ්‍ය වේ. මන්ද යත්, රටේ සංවර්ධන ගැටලු බොහොමයක් පැන නගින්නේ ව්‍යුහාත්මක දුර්වලතා නිසා බැවින් සහ ඒවා විසඳීමට කාලය අවශ්‍ය බැවිනි. නිදසුනක් වශයෙන්, බාහිර ණය ගැටලුව තුළ එවැනි දුර්වලතා සොයා ගත හැකිය. ප්‍රමාණවත් නිෂ්පාදනයක් නැති නිසා අපි දිගින් දිගට ම ණය ගනිමින් සිටින්නෙමු.

කෙසේ වෙතත්, නිෂ්පාදනය දේශීය සහ විදේශීය වෙළෙඳපොළ සඳහා විය යුතු ය. ජනගහන ප්‍රමාණය සහ මිල දී ගැනීමේ ශක්තිය යන දෙ අංශයෙන් ම දේශීය වෙළෙඳපොළ කුඩා බැවින් අපනයනය සඳහා ද අපට නිෂ්පාදනය කිරීමට සිදු වේ. මේ අනුව, දේශීය හා විදේශීය ඉල්ලුම පුළුල් වන පරිදි ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යුහය වෙනස් විය යුතුය. මේ සඳහා නව තාක්ෂණය, නව කුසලතා සහ අමතර ප්‍රාග්ධනය අවශ්‍ය වන අතර එය දිගුකාලීන ආර්ථික උපාය මාර්ගයක්, සැලසුම්කරණයක් සහ ඵලදායී ක්‍රියාත්මක කිරීම් තුළින් පමණක් සපුරාගත හැකි වන්නේ ය. මැදිහත්වීමක් සැලසුම් කිරීමේ මූලික ලීවරවලට බලශක්තිය, ප්‍රවාහනය සහ සන්නිවේදනය වැනි ස්වභාවික ඒකාධිකාරය

මත පොදු අයිතිය සහ වෘත්තීය සමිති, ගොවි සංවිධාන සහ පෞද්ගලික අංශය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් එක් කරන ජාතික සැලැස්මක් ඇතුළත් වේ.

5. රාජ්‍ය ව්‍යවසාය සහ සමුපකාර

අපගේ යෝජනා තුළින් පුද්ගලික දේපල සඳහා විකල්ප හිමිකාරිත්ව මාදිලිවල අවශ්‍යතාව අවධාරණය කරයි. ශ්‍රී ලංකාවට පූර්ව යටත් විජිත යුගයේ එකිනෙකට වෙනස් දේපළ අයිතිවාසිකම් සහ සාමූහික හිමිකාරිත්වය පිළිබඳ පොහොසත් ඉතිහාසයක් ඇත. පුද්ගලික දේපල නූතන ධනේශ්වර නිෂ්පාදනයේ මූලික පදනම වන අතර, ඉතිහාසය සහ වර්තමාන භාවිතය පෙන්නුම් කර ඇත්තේ විකල්ප හිමිකාරිත්ව, බොහෝ විට සමාන ශක්‍යතාවයකින් සහ නිර්මාණාත්මක බවකින් යුක්ත බවයි. නිදසුනක් වශයෙන්, රාජ්‍ය ව්‍යවසාය යනු කොමියුනිස්ට් සමාජවල පමණක් නොව කාර්මික ධනවාදී සමාජවල ද ප්‍රධාන පදනමකි. එනිසා, ඇතැම් ආර්ථික විද්‍යාඥයන් සහ විදේශ අරමුදල් මගින් නඩත්තු වන බුද්ධි මණ්ඩල (Think Tanks) විසින් ප්‍රචාරය කරන, තොග-වශයෙන් පුද්ගලීකරණය පිළිබඳ මන්ත්‍රය, අපි සංකල්පමය වශයෙන් ප්‍රතික්ෂේප කරමු. ශ්‍රී ලංකාවේ වත්මන් රාජ්‍ය ව්‍යවසාය බොහෝමයක් අකාර්යක්ෂම සහ යල් පැන ගිය තාක්ෂණික සහ කළමනාකරණ භාවිතාවලින් පිරී පවතින බව සත්‍යයක් වුව ද, විසඳුම වන්නේ කාර්මික සංවර්ධනය සඳහා වූ පුළුල් වැඩසටහනක කොටසක් ලෙස මෙම ආයතන ප්‍රතිසංස්කරණය කර නවීකරණය කිරීමයි. සමහර අවස්ථාවල දී, පුද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වය, තාක්ෂණය සහ දැනුම හුවමාරු කිරීම සඳහා, අවශ්‍ය සහ ප්‍රයෝජනවත් විය හැකි ය. කෙසේ වෙතත්, කිසිදු තත්ත්වයක් යටතේ ස්වභාවික ඒකාධිකාරය (බලශක්ති, ප්‍රවාහන, සන්නිවේදන, බැංකු ආදිය) සහ උපාය මාර්ගික වත්කම් (වරාය, ගුවන් තොටුපල ආදිය) තොග වශයෙන් පුද්ගලික අංශයට පැවැරිය යුතු නොවේ. රාජ්‍ය ව්‍යවසාය සමඟ සමුපකාර අංශය ශක්තිමත් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පුළුල් අවශ්‍යතාවක් ද පවතී. ඒ, විශේෂයෙන් ම, ආහාර නිෂ්පාදනය සහ අත්‍යවශ්‍ය

භාණ්ඩ බෙදා හැරීම සඳහා ය. සේවක හිමිකාරිත්වය සහ සේවා ස්ථාන ප්‍රජාතන්ත්‍රවාදය රාජ්‍යය විසින් දිරිමත් කළ යුතු ය.

6. පාරිසරික තිරසාරත්වය

ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනය ස්වභාවික ධනයේ මූලික සාධක වන වායුගෝලීය, ජල සහ පාංශු සංරක්ෂණය ඇතුළු පාරිසරික තිරසාරභාවය මත රඳා පවතිනු ඇත. තිරසාර සංවර්ධනය මිනිසා සහ පරිසරය අතර ඇති නො බිඳිය හැකි සහජීවනය හා බැඳී පවතී. ධනවාදයේ මතුවීම නිසා සිදු වූ පරිසර විනාශයේ ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ දේශගුණික විපර්යාස නිසා ආන්තික දේශගුණික සිදුවීම් ඇතිවීමයි.

දේශගුණික විපර්යාසය දැන් ලොව මුහුණ දෙන ප්‍රධාන අර්බුදයක් ලෙස සියලුම ප්‍රධාන රටවල් විසින් සලකනු ලැබේ. දියුණු නොදියුණු භේදයකින් තොරව සියලු රටවල් අනපේක්ෂිත ස්වභාවික විපත්වලින් පීඩාවට පත් වන අතර එ මඟින් විශාල ලෙස ජීවිත හානි සහ ඩොලර් බිලියන ගණනක දේපළ හානි ද සිදු වේ. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාව දේශගුණික විපර්‍යාස බලපෑම්වලට වඩාත් ම අවදානමට ලක්විය හැකි රටක් ලෙසින් සැළැකෙයි.

දේශගුණික විපර්යාස සඳහා ප්‍රධානතම හේතුව ලෙස සාමාන්‍යයෙන් පිළිගැනෙන්නේ පසුගිය වසර 150 තුළ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ හරිතාගාර වායු ප්‍රමාණය වැඩිවීමයි. ඒ නිසා වායුගෝලයේ ගබඩා වී ඇති තාපයේ ප්‍රමාණය වැඩිවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස උෂ්ණත්වය වැඩිවී මුහුදු මට්ටම ඉහළ යාම, ආන්තික කාලගුණික විපර්යාස, ආහාර නිෂ්පාදනයට හා ජෛව විවිධත්වයට තර්ජනයක් එල්ල වීම ආදිය සිදුවෙයි.

ඒක පුද්ගල කාබන් විමෝචනය සම්බන්ධයෙන් ගත් කල, ලෝක සාමාන්‍යය මෙට්‍රික් ටොන් 5 කි. කෙසේ වෙතත්, ඕස්ට්‍රේලියාව සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි දියුණු ආර්ථික මෙට්‍රික් ටොන් 16-17 මට්ටමකින් ඒක පුද්ගල විමෝචනය සිදු

කරන අතර, ජර්මනිය මෙට්‍රික් ටොන් 10 ක සහ චීනය මෙට්‍රික් ටොන් 7 ක ඒක පුද්ගල විමෝචනයන් සිදු කරයි. පසුගිය වසර 250ක කාලසීමාව සැළැකූ විට, ඓතිහාසිකව විමෝචනයේ වැඩි ප්‍රමාණයකට වගකිව යුත්තේ, පිළිවෙළින්, යුරෝපය සහ ඇමරිකා එක්සත් ජනපදයයි. මෙයට හේතුව කාර්මික ධනවාදය මෙම රටවල වර්ධනය වීමයි.

එ නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමත් එහි ප්‍රතිඵලයක් ලෙස පාරිසරික බලපෑමත් යුරෝපයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ සිදු වූ කාර්මීකරණ ක්‍රියාවලිය නිසා ඇති වූ එකකි. එබැවින්, ගෝලීය දකුණේ රටවලට ඔවුන්ගේ ආර්ථික සංවර්ධන ඉලක්ක කරා ගමන් කරන විට කාබන් විමෝචනය වැළැක්වීමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීමේ වගකීම ගෝලීය උතුර විසින් දැරිය යුතු ය. එ සේ ම, ජාතික සංවර්ධන වැඩපිළිවෙළ සඳහා, නිෂ්පාදන බලවේග ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාව, දේශගුණික විපර්යාසවලින් මිනිසුන් සහ රටේ ස්වභාවික ධනය ආරක්ෂා කිරීම සඳහා අනුවර්තන පියවර සමඟ, සමතුලිත කිරීම වැදගත් වේ.

7. ඩිජිටල් පරිවර්තනය

ඩිජිටල්කරණය යනු ගෝලීය ආර්ථිකයේ වැළැක්විය නොහැකි ප්‍රවණතාවකි. රටවල් එක්කෝ මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතු ය, නැතහොත් පසුබෑමට ලක්වීමේ අවදානමක් භාරගත යුතු ය. ඩිජිටල්කරණය යනු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විශාල ලෙස භාවිතා කිරීම පමණක් නොව, පුද්ගලික සහ පොදු පාර්ශවකරුවන් ඇතුළු සමාජ ආර්ථික ක්‍රියාවලීන්ගේ සම්පූර්ණ පරිවර්තනයක් ලෙස වටහා ගත යුතු ය.

අපේ කර්මාන්ත ඉක්මන් ඩිජිටල් පරිවර්තනයකින් තොරව, දේශීය කර්මාන්ත, සමාන්තර ගෝලීය තරඟකරුවන්ට වඩා පසුගාමී වනු ඇත. ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලියේ දී, සමාගම්වල විශාලතම වත්කම බවට පත්වන්නේ දත්ත ය. එබැවින්, දත්තවල විභවයන් සහ වාණිජමය යෙදීම් පිළිබඳව සමාගම්වලට හොඳ

අවබෝධයක් තිබිය යුතු අතර ඉලක්ක පිහිටුවාගැනීම අවශ්‍ය වේ. ජාතික පරිමාණයෙන්, ඩිජිටල් පරිවර්තනය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට, ශ්‍රම ඵලදායිතාවට සහ රැකියා ව්‍යුහයට ධනාත්මක ලෙස දායක විය හැක. එ නිසා, දිරිගැන්වීම් ලබාදීමෙන් සහ අවශ්‍ය ඩිජිටල් යටිතල පහසුකම් නිර්මාණය කරමින්, ඩිජිටල් පරිවර්තනය සඳහා දිරිගැන්වීමට රාජ්‍යය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ යුතු ය.

8. බහුධ්‍රැව දිශානතිය

ආර්ථික බලය ආසියාවට මාරුවීම සහ බහු ධ්‍රැවීය ලෝක රටාවක් ඇතිවීම අපි හඳුනාගෙන සිටිමු. ඒ සමග ම, නව බහුපාර්ශ්වික ආයතන බිහිවීම සහ දේශසීමා හරහා මූල්‍ය හුවමාරුක්‍රම ඇතිවී තිබෙන බව ද අපි පිළිගනිමු. එ බැවින් වෙළෙඳ සහ කාර්මික ප්‍රතිපත්ති ඇතුළුව ශ්‍රී ලංකාවේ ම ආර්ථික උපායමාර්ග මෙම භූ දේශපාලනික සහ භූ - ආර්ථික ගතිකත්වයන් සමඟ ගැළැපෙන අයුරින් අපි අපගේ යෝජනා ඉදිරිපත් කර ඇත්තෙමු.

ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය

නිදහසින් පසු ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ආකෘතිය සමාජ ප්‍රතිපත්තිය සහ ආර්ථික ප්‍රතිපත්තිය සමග එකට බැඳී තිබුණි. එහි ප්‍රතිපලයක් වශයෙන් සෙසු සංවර්ධනය වන රටවලට සාපේක්ෂව මානව සංවර්ධන දර්ශනයන් ඉහළ මට්ටමක පැවතුණි. මෙහි දී, වාමාංශික ව්‍යාපාරය විසින් ඉටු කළ මෙහෙවර සහ ලබාදුන් දායකත්වය පිළිගත් සත්‍යයකි.

දියුණු රටක සහ නොදියුණු රටක ජනතාව අතර වෙනස මැන බලනු ලැබුවේ ජනතාවගේ ජීවිතවල ගුණාත්මක භාවය මත ය. අප විසින් රටක මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කළ යුත්තේ පුරවැසියන්ගේ දැනුම සහ නිපුනත්වය වර්ධනය කිරීම තුළින් ජාතික ආර්ථිකයට නිර්මාණශීලි හා ඵලදායී දායකත්වය සහතික කරලීමට මෙන් ම ඔවුනට යහපත් ජීවන තත්ත්වයක් ලබාදීමටත් අවස්ථා සළසාදීම සඳහා ය.

ජනතාවට වත්මන් මෙන් ම අනාගත අභියෝගයන්ට මුහුණදීමටත් ජාතික ආර්ථිකයට දායකවෙමින් යහපත් ජීවිතයක් ගත කිරීමට හැකිවන සේ ඔවුනට අවස්ථාව සළසාදීම කළ හැකිවන්නේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් තුළිනි. මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සම්පාදනය කරලීමේ දී දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සාමාන්‍ය අධ්‍යාපනය, උසස්

අධ්‍යාපනය, නිපුනතා වර්ධනය, වෘත්තීය පුහුණු හා තාක්ෂණයට අදාළ ජාතික ප්‍රතිපත්ති ආවරණය විය යුතු ය. එ මගින් ජාතික මෙන් ම ගෝලීය ශ්‍රම වෙළෙඳපොළට අවශ්‍ය වන සේ සෑම පුරවැසියෙකුට ම දැනුම නිපුණතාව සහ තාක්ෂණය ලබාදිය හැකිවන්නේ ය.

අනාගත පරම්පරාවේ එක ම අපේක්ෂාව මානව සම්පත් සංවර්ධනයයි.

අධ්‍යාපන ප්‍රතිපත්තිය

හැඳින්වීම

"සෑමට අධ්‍යාපනය" (Education for All) යන ලෝක ප්‍රකාශයේ සඳහන් පරිදි "සෑම පුද්ගලයකුට ම - ළමා, තරුණ සහ වැඩිහිටි - ඔවුන්ගේ මූලික ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කර ඇති අධ්‍යාපන අවස්ථාවලින් ප්‍රතිලාභ ලැබිය හැකි විය යුතු ය". මෙම අවශ්‍යතාවලට සාක්ෂරතාව, වාචික ප්‍රකාශනය, සංඛ්‍යා සමග වැඩකිරීමේ හැකියාව සහ ගැටලු විසඳීම වැනි අත්‍යවශ්‍ය ඉගෙනුම් මෙවලම් ද ජීවිත රැකගැනීමට, පූර්ණ හැකියා වර්ධනයට, ගෞරවාන්විතව ජීවත්වීමට සහ වැඩ කිරීමට, සංවර්ධනය සඳහා පූර්ණ වශයෙන් සහභාගීවීමට, තම ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට, දැනුවත් තීරණ ගැනීමට සහ ඉගෙනීම දිගට ම කරගෙන යාමට අවශ්‍ය දැනුම, කුසලතා, සාරධර්ම සහ ආකල්ප වැනි මූලික ඉගෙනුම් අන්තර්ගතයන් ද ඇතුළත් වේ.

අධ්‍යාපනයේ සමාජ හා ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව ගෝලීය වශයෙන් ප්‍රමාණවත් සාක්ෂි තිබේ. උසස් තත්ත්වයේ මූලික අධ්‍යාපනය විසින් පුරවැසියන්ට තාක්ෂණික වෙනස්වීම්වලට අනුවර්තනය වීමට පදනම සකසනු ලබන අතර, උසස් අධ්‍යාපනය විසින් නවෝත්පාදනයට සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීමට සහය සළසා දෙයි. මෑත කාලය වන තුරු, ප්‍රාථමික පාසල්වලට ඇතුළත්වීම සහ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීම, වැඩිහිටි සාක්ෂරතාව වැනි මූලික දර්ශකවලින් හොඳ අධ්‍යාපන මට්ටමක්

ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රසිද්ධ වී තිබිණි. කෙසේ වුව ද සිය අධ්‍යාපන ක්‍රම සාර්ථකව ප්‍රතිව්‍යුහගත කර සංවර්ධනය කර ඇති මධ්‍යම ආදායම්ලාභී රටවල් විශාල සංඛ්‍යාවක් මේ වන විට ශ්‍රී ලංකාව අභිබවා ගොස් ඇත. මේ අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සෑම අංශයක ම ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා හදිසි අවශ්‍යතාවක් පැන නැගී තිබෙන බව පැහැදිලි වෙයි.

ගැටලු

භෞතික සහ මානව සම්පත් යන අංශ දෙකට ම අයත් සම්පත් පාසල් අතර අසමානව බෙදීයෑමේ ගැටලුවක් පවතියි. පාසල් සහ විශ්වවිද්‍යාල පාලනයේ දුර්වලතා විශාල ප්‍රමාණයක් ද දක්නට තිබේ. එහෙයින්, මෙම කාර්යය සඳහා ඉහළ ස්වාධීනත්වයක් අවශ්‍ය වී තිබේ. අධ්‍යාපනයෙන් බිහි කරන මිනිස් සම්පත් සහ ශ්‍රම වෙළෙඳපොළ/ සංවර්ධන ප්‍රතිපත්ති/ සාමාජීය අපේක්ෂා අතර විශාල නොගැලපීමක් පවතින බව ද ප්‍රකට කරුණකි. පාසල් හැරයන ශිෂ්‍යයන් මෙන් ම විශ්වවිද්‍යාල උපාධිධාරීන් ද ප්‍රමාණවත් අයුරින් සාමාජ-භාවාත්මක කුසලතා වර්ධනය කරගෙන නොමැත. විශේෂයෙන් ම, ඔවුන්ගේ සන්නිවේදන කුසලතා, භාෂා නිපුණත්වය, නිර්මාණාත්මකභාවය සහ නවෝත්පාදන හැකියාව යන සෑම අංශයක ම විශාල අඩුවක් පවතින බව නිරීක්ෂණය කළ හැකි ය.

පවත්නා අධ්‍යාපන ක්‍රමය තුළින් බිහිවන පිරිස් අතර යහපත් පුරවැසි ගුණාංගයන් ද දක්නට නොමැත. එ මෙන් ම, ඔවුන් තුළ සංස්කෘතික විවිධත්වයන් පිළිබඳව ද අන්තර්ජාතික කටයුතු පිළිබඳව ද ඇත්තේ ඉතා අඩු අවබෝධයකි.

මෙම අධ්‍යාපන ක්‍රමය මුළුමනින් ම මෙන් ගුරුවරයා කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වන අතර එය උගන්වන දේ ඉගෙනගත යුතු ය යන සීමාව තුළට කොටු වී පවතියි. මෙම අධ්‍යාපන ක්‍රමය සැකැසී ඇත්තේ විභාග ඉලක්ක කරගත් විෂයමාලා සහ ඇගැයීම්වලිනි. ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියට ප්‍රමාණවත් තරමින් නවීන තාක්ෂණය ඇතුළත් කරගෙන නොමැත. පාසල් ගුරුවරුන් හට අඛණ්ඩ අයුරින් වෘත්තීය සංවර්ධනයක් ඇති කරගැනීමට පවතින අවස්ථා ද ඉතාමත් සීමිත ය.

ප්‍රමාණවත් තරමින් අරමුදල් සැපැයීමට රජය අසමත්වීම නිසා රාජ්‍ය විශ්වවිද්‍යාල තුළින් අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව හිමිවන්නේ ඉතාමත් සීමිත ශිෂ්‍ය පිරිසකට ය. තව ද, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ පවතින්නේ ඉතාමත් දුර්වල පර්යේෂණ සංස්කෘතියකි. එ මෙන් ම, රටේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය කෙරෙන වානිජමය දැනුම සහ හැකියා නිර්මාණය කිරීමට ද අපගේ විශ්වවිද්‍යාල අසමත් ය.

අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලධර්ම

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලධර්ම වනුයේ,

- **පාසල් විෂයය මාලා සහ ඇගැයීම් ක්‍රම ප්‍රතිසංස්කරණය**
- **ඉගැන්වීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම**
- **පාසල් පරිපාලන සහ කළමනාකරණය විධිමත් කිරීම**
- **උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ**

ඉදිරිමග

1. පාසල් විෂයමාලාව සහ ඇගයීම් ප්‍රතිසංස්කරණය

සාක්ෂරතාව, සංඛ්‍යා සමඟ වැඩ කිරීම, කුසලතා වර්ධනය සහ චරිත සංවර්ධනය වැනි ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් තේමාත්මක ප්‍රවේශයක් මත ප්‍රාථමික පාසල් විෂයමාලාව සකස් කළ යුතු ය. ආගම් පිළිබඳ තුලනාත්මක ආගමික අධ්‍යාපනය සහ ඇගැයීම් අධ්‍යාපනය පිළිබඳ විෂයයක් ප්‍රාථමික මට්ටමට ඇතුළත් කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

ප්‍රාථමික මට්ටමේ ඉගෙනුම ලබන දරුවන් හට විභාග පැවැත්වීම අවම කළ යුතු අතර දරුවන් තුළ ආතතිය අඩු කළ යුතු ය. දරුවාගේ අත්‍යවශ්‍ය නිපුණතා තක්සේරු කිරීම සඳහා සරල පරීක්ෂණ භාවිතා කළ යුතු ය. මේ සම්බන්ධයෙන් ෆින්ලන්තය, ජපානය වැනි රටවලින් පාඩම් උකහා ගත හැකි ය.

අධ්‍යාපනය පිරමීඩයක් ලෙසින් සැළැකිය යුතු ය. පහළ

මට්ටම්වල දී පුළුල් නිරාවරණයක් ලබා දිය යුතු අතර, ඉහළ මට්ටම්වල දී විශේෂීකරණය ලබා දිය යුතු ය. උදාහරණයක් වශයෙන්, සාමාන්‍ය පෙළ මට්ටමේ දී සිසුන් විවිධ ශාස්ත්‍රීය සහ වෘත්තීය විෂයයන් වෙත නිරාවරණය කළ යුතු වන අතර, උසස් පෙළ මට්ටමේ දී නිශ්චිත තෝරාගත් විෂයයන් වෙත සිසුන්ගේ අවධානය යොමු කරවිය යුතු ය. වර්තමානයේ දී ද මෙ සේ සිදු කළත් මෙය තවදුරටත් සියුම් සුසරකිරීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ මෙයට පෙර කළ බොහෝ විෂයමාලා ප්‍රතිසංස්කරණවල දී, ගුණාත්මකභාවයේ වැඩි දියුණුවකින් තොරව විෂයමාලාවේ අන්තර්ගතය වර්ධනය කර තිබේ. සෑම ශ්‍රේණියක දී ම, විෂය දැනුම අදාළ කුසලතා සමඟ පැහැදිළි අයුරින් සම්බන්ධ කළ යුතු ය. සිසුන් හට අඛණ්ඩව භාවිතයෙන් ඉගෙනගැනීමට හැකිවන පරිදි පෙළපොත් සම්පාදනය කළ යුතු ය. විෂයමාලාව හරහා ස්වයං ඉගෙනීම ද දිරිමත් කළ යුතු ය.

සියලු ශිෂ්‍යයන් හට ක්‍රීඩා, සෞන්දර්යය, ප්‍රජා සේවා වැනි විෂය-බාහිර ක්‍රියාකාරකම් අනිවාර්ය කළ යුතු ය. ගුරුවරුන්ගේ මගපෙන්වීම යටතේ නිර්මාණාත්මක හා නවෝත්පාදන කාර්යයන්හි නිරවීමේ අවස්ථා ලබාදීම ද අත්‍යවශ්‍ය වේ.

1 වැනි ශ්‍රේණියේ සිට මූලික විෂයයන් ලෙසින් විද්‍යාව, ගණිතය, රාජ්‍ය භාෂා සහ කැමැති තෙවැනි භාෂාවක් (දැනට ඉංග්‍රීසි භාෂාව ඉගෙනගැනීම සඳහා මෙම අවස්ථාව ලබා දී ඇති නමුත් අනාගතයේ දී එයට අමතරව හින්දි, චීන, අරාබි වැනි ප්‍රධාන ලෝක භාෂා දක්වා ද ව්‍යාප්ත විය යුතු ය.) ඒවායේ සංකල්ප ඉගැන්විය යුතු ය.

වර්තමානයේ දී රැකියා ස්ථානයේ සාර්ථකත්වයට මෙන් ම සමෘද්ධිමත් සමාජයක් ඇති කරගැනීම සඳහා සමාජ-භාවාත්මක කුසලතා වර්ධනය ඉතා වැදගත් ය. සමාජ-භාවාත්මක කුසලතා වර්ධනය සඳහා වැඩි අවස්ථා ලබාදීම සඳහා පන්ති කාමර ක්‍රියාකාරකම් සහ ඉගැන්වීම් භාවිතාවන් නවීකරණය කළ යුතු ය.

අන්තර්ක්‍රියාකාරී, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ-ඉගෙනගැනීමේ ක්‍රමයක් හඳුන්වාදීම ද එය තවදුරටත් වර්ධනය කිරීම ද අවශ්‍ය වේ. එ පමණක් නොව, තාක්ෂණය සහ නවීන ඉගැන්වීම් ශිල්පීය ක්‍රම

උපයෝගී කරගනිමින් ඉගැන්වීමේ සහ ඉගෙනගැනීමේ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කළ යුතු ය.

සිසුන් දන්නා සහ තේරුම් ගන්නා ප්‍රමාණය තීරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විභාග භාවිතා කළ යුතු ය. හැඩගැන්වීමේ (Formative) සහ සමාකලනීය (Summative) ඇගයීම් ක්‍රම දෙකෙහි ම සංකලනයෙන් ශිෂ්‍ය ඇගැයීම් ක්‍රම සකස් විය යුතු අතර, ලිඛිත විභාග ඔස්සේ විෂය දැනුම පරීක්ෂා කිරීමට පමණක් සීමා නොවිය යුතු ය. සිසුන්ගේ නිර්මාණාත්මක හා විෂය-බාහිර ක්‍රියාකාරකම් තක්සේරු කිරීම සඳහා විනිවිදභාවයෙන් සමන්විත, අපක්ෂපාතී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු ය. එයට අමතරව, සිසුන්ගේ සමාජ-භාවාත්මක කුසලතා මැන බැලීම සඳහා සම්මත ඇගැයීම් ක්‍රම ද හඳුන්වා දිය යුතු ය. සිසුන්ගේ හැකියාවන් තීරණය කිරීමේ දී අඛණ්ඩ ඇගයීම් සඳහා ද සුදුසු බර තැබීමක් කළ යුතු ය.

ඒකාබද්ධ අධ්‍යාපන ක්‍රමයක් ඇතිකිරීමේ අරමුණ ඇතිව සාමාන්‍ය පාසල්, කාර්මික විද්‍යාල සහ වෘත්තීය පාසල් සහ විශ්වවිද්‍යාල යන සියලු මට්ටමේ අධ්‍යාපන ආයතන සඳහා පුළුල් හා ඒකාබද්ධ විෂයමාලා සහ ඇගැයීම් රාමුවක් සකස්කිරීමේ කාර්යය පැවැරිය හැකි ජාතික විෂයමාලා සංවර්ධන සහ ඇගයීම් මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව මෙයින් යෝජනා කරනු ලැබේ. මෙම පුළුල් රාමුව තුළට දැනුම හා කුසලතා තක්සේරු කිරීමේ ක්‍රම ද ඇතුළත් කළ යුතු ය. කෙසේ වුව ද, ජාතික අධ්‍යාපන ආයතනය, තෘතියික සහ අධ්‍යාපන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල වැනි ඒ ඒ ආයතන විසින් එක් එක් උප-අංශය සඳහා සවිස්තරාත්මක විෂයමාලා සහ විෂය නිර්දේශ සකස් කළ හැකි ය.

2. ඉගැන්වීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම

නිපුණතා මත පදනම් වූ විෂයමාලා සහ ඇගයීම් ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් ලෙසින් සහ අඛණ්ඩව ගුරුවරුන් පුහුණු කළ යුතු ය. සමස්තයක් ලෙස, ගුරු පුහුණුව වැඩි කළ යුතු අතර ගුරුවරුන්ගේ චිත්ත ධෛර්යය ඉහළ නැංවිය යුතු ය. ගුරු සේවය යනු අධ්‍යාපන සේවා අතර ප්‍රමුඛතම සේවාවක් ලෙස පිළිගත යුතු ය.

මෑතක දී හඳුන්වා දුන් පාසල් පාදක ගුරු සංවර්ධන (School-Based Teacher Development, SBTD) වැඩසටහන තවදුරටත් ශක්තිමත් කර සංවර්ධනය කළ යුතු ය. මෙම වැඩසටහන යටතේ නිර්දේශිත ක්‍රියාකාරකම්වලට සාමාන්‍යයෙන් එකිනෙකාගෙන් ඉගෙනීම, පාසල් පාදක උපදේශනය, ආදර්ශන පාඩම්, අනෙකුත් ගුරුවරුන්ගේ කාර්යයන් නිරීක්ෂණය, අධ්‍යයන පහසුකම් සැපැයීම, ඉගැන්වීමේ-ඉගෙනුම ලැබීමේ ලේඛන/ද්‍රව්‍ය සකස්කිරීම සහ භාවිතය, අධ්‍යයන කණ්ඩායම්, සිද්ධි සාකච්ඡා යනාදිය ඇතුළත් වේ. යහ භාවිතයන් බෙදා හදාගැනීමේ අරමුණ ඇතුව ජාතික, පළාත් සහ කලාප මට්ටමින් නිරන්තර ගුරු සමුළු සංවිධානය කළ යුතු ය.

සියලු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ඒවාට සමීපව පිහිටි රාජ්‍ය විශ්වවිද්‍යාලවලට අනුබද්ධ කර ඒවායේ අධ්‍යාපන පීඨ බවට පත් කළ යුතු බව මෙයින් නිර්දේශ කරනු ලැබේ. එයට සමගාමීව, ජාතික අධ්‍යාපන පීඨ ඩිප්ලෝමාව උපාධි මට්ටම දක්වා උසස් කළ යුතු බව ද මෙයින් යෝජනා කෙරෙයි. එ මෙන් ම, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපනික විශ්වවිද්‍යාලයක් පිහිටුවිය යුතු බව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

3. පාසල් පරිපාලනය සහ කළමනාකරණය විධිමත් කිරීම

1AB, 1C, Type 2 සහ Type 3 ලෙසින් පවතින පාසල් වර්ගීකරණ ක්‍රමය සංශෝධනය කිරීමට අවශ්‍ය වන අතර, ඒවා සියල්ල ප්‍රාථමික සහ ද්විතීයික පාසල් ලෙසින් පමණක් වර්ග කළ යුතු බව මෙයින් නිර්දේශ කෙරෙයි. "ජාතික පාසල්" යන යෙදුම වෙනුවට සියලු ම පාසල් අදාළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශවල විෂය පථය යටතට ඇතුළත් කළ යුතු ය.

පාසල් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන (Programme for School Improvement, PSI) නමින් හැඳින්වෙන මෑතක දී හඳුන්වා දුන් පාසල් පාදක කළමනාකරණ (School-Based Management, SBM) ආකෘතිය තවදුරටත් ශක්තිමත් කර සංවර්ධනය කළ යුතු ය. මෙම වැඩසටහන විසින් තීරණ ගැනීමේ

වැඩි ස්වයං පාලන බලයක් පාසල් ප්‍රජාවට ලබා දී ඇති අතර, ඒ තුළින් දැනටමත් ශ්‍රී ලංකාවේ ඉගෙනුම් ප්‍රතිඵල කෙරෙහි ධනාත්මක බලපෑමක් පෙන්නුම් කර තිබේ.

4. උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

පවතින විශ්වවිද්‍යාලවලට අනුබද්ධ මණ්ඩප, විද්‍යාල සහ නව නගර මණ්ඩප පිහිටුවීමෙන් ප්‍රථම උපාධි සඳහා සිසුන් ඇතුළත් කරගැනීම් ඉහළ නැංවිය යුතු ය.

දේශීය සහ විදේශීය සිසුන් ආකර්ශනය කරගැනීමේ අරමුණ ඇතිව රාජ්‍ය නොවන සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාර විශ්වවිද්‍යාල පිහිටුවීම වෙනුවෙන් පෞද්ගලික අංශයේ ආයෝජනවලට ඉඩ සළසාදීම සඳහා නිසි නියාමන යාන්ත්‍රණ හඳුන්වා දිය යුතු ය.

සාධාරණත්වය, විනිවිදභාවය වැඩි කිරීමට සහ ඇතුළත්වීමේ ක්‍රියාවලියේ ප්‍රමාද වැළැක්වීමට සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවල සියලු ම සිසුන් බඳවාගැනීම් සම්පූර්ණ කර ඇති බව සහතික කිරීමට රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා දැනට ක්‍රියාත්මක ප්‍රවේශ නිර්ණායක සංශෝධනය කළ යුතු ය.

සේවා යෝජකයන්ට සහ කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය ආකල්ප, කුසලතා සහ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් විෂයමාලා, ඉගැන්වීමේ-ඉගෙනගැනීමේ ක්‍රියාවලිය සහ ඇගයීම් ක්‍රම සංශෝධනය කළ යුතු ය. ප්‍රතිඵල-පාදක අධ්‍යාපනය (Outcome-based education, OBE) සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් (Student-centered learning, SCL) සහ ඇගයීම් ප්‍රවේශයන් අනුව දැනට සිදු කෙරෙන විෂයමාලා ප්‍රතිසංස්කරණ වේගවත් කළ යුතු ය.

රාජ්‍ය විශ්වවිද්‍යාල මගින් පිරිනමනු ලබන බාහිර උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය සහ අදාළත්වය ඒවායේ තත්ත්වය සහතික කිරීමෙන් සහ නියාමන මැදිහත්වීම් තුළින් ඉහළ නැංවිය යුතු ය.

රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලු ම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් සහතික කිරීම සඳහා අවශ්‍ය නෛතික අධිකාරිත්වය සහිත ස්වාධීන තත්ත්ව සහතික ආයතනයක් ස්ථාපිත කළ යුතු ය.

උපාධි පිරිනමනු ලබන සියලු ම රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට (Sri Lanka Qualifications Framework, SLQF) අනුකූලවීම අනිවාර්ය කිරීම සඳහා එය ගැසට් නිවේදනයක් මගින් නීතිගත කළ යුතු ය.

විශ්වවිද්‍යාල පර්යේෂණ සංස්කෘතිය ශක්තිමත් කළ යුතු ය. විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර නවෝත්පාදන සහයෝගීතාවයන් සහ වාණිජකරණය සඳහා තාක්ෂණ හුවමාරුව ප්‍රවර්ධනය කළ යුතු ය.

දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල අතර සහයෝගීතා හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කළ යුතු ය. දේශීය හා විදේශීය හවුල්කාර ආයතන සමඟ එක් වී රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් ඒකාබද්ධ උපාධි ලබාදීමේ ක්‍රම හඳුන්වාදිය යුතු ය.

සියලු ම විශ්වවිද්‍යාල තුළ අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සහිත තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කළ යුතු ය.

ප්‍රමාද වළක්වා ගැනීම සහ අන්තර් දෙපාර්තමේන්තු, අන්තර් පීඨ, අන්තර් විශ්වවිද්‍යාල සහ ජාත්‍යන්තර සහයෝගිතා උපාධි වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම පිණිස රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා සම-කාලික අධ්‍යයන දින දර්ශනයක් හඳුන්වා දිය යුතු ය.

ගුණාත්මක සංවර්ධනයට ඉඩ සළසාදීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට වැඩි ස්වයං පාලනයක් ලබා දිය යුතු ය.

නවක වදය, ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කරගත් පීඩාවට පත්කිරීම්, සහ ප්‍රචණ්ඩත්වය වැනි සියලු ආකාරයේ බිය ගැන්වීම්

සහමුලින් ම දුරු කර රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ හිතකර සහ සහජීවනාත්මක ඉගෙනුම් පරිසරයක් ඇති කළ යුතු ය.

වෘත්තීය අධ්‍යාපන ප්‍රතිපත්තිය

හැඳින්වීම

උද්ගත වී තිබෙන මහා ලෝක ආර්ථික අර්බුදය විසින් ශ්‍රී ලංකාව මත ඇති කරන බලපෑම් ඉතාමත් ව්‍යසනකාරී එකක් බවට පත් වී තිබේ. මේ අර්බුදය විසින් ජනතාවගෙන් අතිමහත් බහුතරයක් දරිද්‍රතාවයට තල්ලු කර තිබෙන අතර විශාල විරැකියා ගැටලුවක් ද නිර්මාණය කර තිබේ. මේ හේතුවෙන් මිලියන ගණනක තරුණ තරුණියන් විදේශ රැකියා සඳහා යොමු කර ඇත. කෙසේ වුව ද, ලෝක ආර්ථික අර්බුදයට අනෙකුත් රටවල් ද පත් වී තිබෙන හෙයින් විදේශ රැකියා සොයාගත හැක්කේ කොපමණ කාලයකට ද යන්න ද ගැටලුවකි.

මෙතෙක් කාලයක් රටේ ආර්ථිකය ඉහළ මට්ටමකින් රඳවා තබා තබාගැනීමට උපකාරී වූයේ විදේශගත ශ්‍රමිකයන් විසින් එවනු ලබන ප්‍රේෂණ ය. කෙසේ වුව ද, විදේශගත ශ්‍රමිකයන්ගෙන් බහුතරයක් නුපුහුණු ශ්‍රමිකයන් වන බැවින් ඔවුන් හට තම පවුල් වෙත ආපසු එවිය හැකි මුදල් ප්‍රමාණය සීමා සහිත ය. එ නමුදු සාපේක්ෂව අඩු සංඛ්‍යාවක් වන පුහුණු ශ්‍රමිකයෝ එම ප්‍රමාණයට බෙහෙවින් වැඩියෙන් උපයා ඇත. ඒ අතර ම, පුහුණු ශ්‍රමිකයන් වැඩි වැඩියෙන් විදේශගත වීම සහ පවතින රැකියාවල නවීනත්වය වැඩිවීම විසින් ශ්‍රී ලංකාව තුළම පුහුණු ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම ඉහළ නංවා ඇත.

ශීඝ්‍රයෙන් වෙනස් වන රැකියා වෙළෙඳපොළෙහි ස්වභාවය විසින් පුහුණු ශ්‍රමය සඳහා ඇති ඉල්ලුම කෙරෙහි විශාල බලපෑමක් එල්ල කරයි. කර්මාන්ත විසින් ද වෘත්තීය රැකියා ව්‍යුහය සැළැකිය යුතු ලෙස වෙනස් කරනු ලබයි. බිඳ වැටෙමින් පවතින අංශවල සංකේන්ද්‍රණය වී ඇති වෘත්තියන්ට වඩා වර්ධනය වන අංශවලට

සංකේන්ද්‍රණය වී ඇති වෘත්තිකයන් රැකියා අවස්ථා හිමි කර ගනු ඇත.

ඇතිවෙමින් පවතින වෙනස්කම් තුළ පහත දැක්වෙන නැඹුරුවීම් නිරීක්ෂණය කළ හැකි ය.

- **ඉහළ නිපුණතා සහිත වෘත්තීන් කෙරෙහි නැඹුරු වූ රැකියා ධ්‍රැවීකරණය අඛණ්ඩව සිදුවීම.**
- **සියලු ම වෘත්තීන්හි ඉහළ සුදුසුකම් මට්ටම් කරා මාරුවීම**
- **පරිපාලන හා ලිපිකාර, නිපුණ වෘත්තීන්, ක්‍රියාවලි, කම්හල් සහ යන්ත්‍ර ක්‍රියාකාරීන්හි ශුද්ධ රැකියා අහිමිවීම්**
- **කාර්යයන් එ තරම් පහසුවෙන් ස්වයංක්‍රීයකරණයට ලක් කළ නොහැකි මූලික වෘත්තීන්හි මධ්‍යස්ථ වර්ධනයක් දැකිය හැකි නමුත් වෙනත් ක්ෂේත්‍රවල රැකියා අහිමිවීම්**
- **රැකවරණ, විනෝද සහ අනෙකුත් එවැනි වෘත්තීන්හි සැළැකිය යුතු වර්ධනයක් ඇතිවීම**

ගැටලු

ඇති වී තිබෙන අවිනිශ්චිත තත්ත්වය තුළ, විශේෂයෙන්ම ශ්‍රම බලකායෙන් සියයට 20 ක් පමණ වූ විශාල ප්‍රමාණයක් විදේශයන්හි සේවය කරන බැවින් වෘත්තීය අධ්‍යාපනය සඳහා දිගුකාලීන සැලසුම් සකස් කිරීම දුෂ්කර කටයුත්තක් බවට පත්විය හැකි ය. තවත් වසර 5-10 කින් ඇතිවිය හැකි සුබවාදී ආර්ථික පෙරළිය පෙර නොවූ විරූ අයුරින් තාක්ෂණය මත පදනම් වූ එකක් බවට පත්වනු ඇත. එ නමුත් යුරෝපය, උතුරු ඇමරිකාව සහ තෙල් මත පදනම් වූ මැද පෙරදිග රටවල්වල වැදගත්කම අහිමිවිය හැකි බැවින් නව ශ්‍රම වෙළෙඳපොළ සෙවීමට අප උනන්දු විය

යුතු ය. කෙසේ වුව ද නිපුණතා සඳහා ඉල්ලුම වර්ධනය වන්නේ කුමන ක්ෂේත්‍රවලදැයි පුරෝකථනය කිරීම දුෂ්කර කාර්යයකි.

තාක්ෂණික වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (Technical and Vocational Education and Training TVET) සඳහා ඇති විශාලතම බාධාව වන්නේ සමාජය තුළ ඒ සම්බන්ධයෙන් පවතින ඍණාත්මක දැක්මයි. කෙසේ වුව ද, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුවට අදාළ විෂය කරුණු සාමාජීය වශයෙන් නිර්වචනය වෙයි. ශාස්ත්‍රීය හා වෘත්තීය අධ්‍යාපනය අතර පවතින සාම්ප්‍රදායික බෙදීම් බිඳ දමමින් එය සාමාජීය වශයෙන් නැවත නිර්වචනය කළ හැකි ය.

උක්ත සඳහන් ගැටලුවලට අමතරව මෙම කරුණු කෙරෙහි ද අපගේ අවධානය යොමු කළ යුතු වෙයි.

- පවතින රැකියා සහ පුහුණු අවස්ථා අතර නො ගැලපීම
- දැනට පවතින සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ අසමත් බව
- නවීන යන්ත්‍රසූත්‍ර සහ උපකරණවල හිඟය
- ගැලැපෙන වෘත්තීන් පිළිබඳව ශිෂ්‍යයන්ට මඟපෙන්වීම සඳහා වැඩපිළිවෙළක් නොමැතිවීම (ශිෂ්‍යයන් බහුතරයකට වෘත්තීය අධ්‍යාපනයෙන් කළ හැකි දෑ පිළිබඳ කිසිදු දැනුමක් නොමැත).
- වෘත්තීය පුහුණුව ඇතුළු අධ්‍යාපනය ලබාදෙන ශාස්ත්‍රාලයන්/විද්‍යායතන සහ කර්මාන්ත අතර පවතින සම්බන්ධතාව ඉතා දුර්වල එකක් වන අතර පුහුණුව ලබා බඳවාගත් තැනැත්තන්ගේ ගුණාත්මකභාවය පිළිබඳ කර්මාන්තයෙන් ලැබෙන ප්‍රතිපෝෂණය ද ප්‍රමාණවත් නැත.
- මෘදු කුලසතා (රැකියාවේ දී සහ අනෙක් අය සමඟ ගනුදෙනු කිරීමේ දී යොදාගනු ලබන තාක්ෂණික නොවන නිපුණතා) ද ඉතා අඩු මට්ටමක පවතියි.

- වෘත්තීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයින්ට වඩා වැඩ කරමින් ඉගෙනගැනීම සිදු කළ ද සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකික ශිෂ්‍යයෝ නැවත නැවත කිරීමෙන් ඉගෙනගැනීම කෙරෙහි යොමු වී සිටිති. ඔවුන් ස්වයං-අධ්‍යාපනය සඳහා පුස්තකාල හෝ අන්තර්ජාලය හෝ භාවිතා කරන්නේ ඉතා කලාතුරකිනි.

- අභ්‍යාසලාභීන්ට රැකියා වෙළෙඳපොළට හැඩගැසීම සඳහා හැකියාව ලබාදීම සඳහා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ නම්‍යශීලීත්වයක් තිබිය යුතු නමුත් වෙනස් නොවන විෂයමාලා එක දිගට ම යොදාගැනීම ද බරපතල ගැටලුවකි.

- පොදුවේ අනෙකුත් ගුරුවරුන්ට මෙන් ම වෘත්තීය පුහුණු ආයතනවල සේවය කරන උපදේශකයන්ට ගෙවනු ලබන වේතනය ද ක්ෂේත්‍රයේ සම්මතවලට වඩා ඉතා අඩු මට්ටමක පවතින අතර ඔවුන් ලබා ඇති ගුරු පුහුණුව ද ඉතා පහළ මට්ටමක පවතී.

- ක්ෂේත්‍රයේ පිළිගන්නා තත්ත්වයන් හා සැසඳීමේ දී අභ්‍යාසලාභීන් ලබන කාර්මික පුහුණු අත්දැකීම ද අඩු මට්ටමක පවතී.

- සැබෑ ප්‍රායෝගික පුහුණුවට ලබාගැනීමට පෙර සාපේක්ෂව මිල අධික නොවන ආදර්ශක මාර්ගයෙන් පුහුණුව ලබාදීමේ අවස්ථා ද ප්‍රමාණවත් නැත.

- උසස් තාක්ෂණය සහ නැව් ඉදිකිරීම වැනි තාක්ෂණික ක්ෂේත්‍රවලට අයත් කර්මාන්ත සහ තාක්ෂණය සම්බන්ධ පුහුණුවක් ලබාගැනීමට ශ්‍රී ලංකාවේ කාර්ය මණ්ඩල සහ අභ්‍යාසලාභීන් සඳහා ඇති අවස්ථා ප්‍රමාණය ඉතාමත් සීමිත ය.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන තාක්ෂණික, වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිපත්තියයේ මූලික ඉලක්ක වන්නේ,

1. ප්‍රශස්ත පුද්ගලයින් සංඛ්‍යාවකගේ පුද්ගල සේවා නියුක්ති හැකියාව ඉහළ නංවමින්, සිසුන් අතර රැකියාව සහ ජීවිතය පිළිබඳ යහපත් ආකල්පයක් වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ අධ්‍යයන කාර්යසාධනය නො සළකා වෘත්තීය සහ තාක්ෂණික අවස්ථා සළසාදීම.

2. කාන්තාවන්ගේ සහ සමාජයේ සිටින වරප්‍රසාද අහිමි කොටස්වල තාක්ෂණික සහ වෘත්තීය පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවස්ථා සළසාදීම.

3. පුහුණු මානව සම්පත සම්බන්ධයෙන් පවතින ඉල්ලුම සහ සැපයුම අතර ඇති වෙනස අවම කිරීම මඟින් මෙම අංශයට වඩා හිතකර ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ශ්‍රම වෙළෙඳපොළ සැපයුම් ප්‍රතිපත්ති දිශානතිය සහ උපාය මාර්ග වැඩිදියුණු කිරීම.

4. ගුණාත්මක, සහභාගීත්ව සහ නම්‍යශීලී තාක්ෂණික වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) හරහා අනුගතවීම සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම

5. දැනට සිටින ශ්‍රම බලකායට ඔවුන්ගේ කුසලතා ඉහළ නංවාගැනීමට සහ උසස් අධ්‍යාපනය හැදෑරීමට අදහස් කරන අයට විකල්පයක් සැපයීමට පුළුල් අවස්ථාවක් ලබාදීම සඳහා අඛණ්ඩ වෘත්තීය අධ්‍යාපනයේ සහ පුහුණුවෙහි (Continuing Vocational Education and Training CVET) අදාළත්වය අවධාරණය කරමින් ජීවිත කාලය පුරා ම ඉගෙනීමේ නව සංස්කෘතියක් ඇති කිරීම සහ ඩිජිටල්කරණය.

6. තාක්ෂණික වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුවෙහි (TVET) තිරසාරකත්වය තහවුරු කිරීම

ඉදිරිමග

1. තාක්ෂණික වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව (TVET) නැවත අර්ථදැක්වීම

විද්‍යාවෙන් හා සමාජ අධ්‍යයනයන්ගෙන් වෙන්කර, විවාදාත්මක කරුණු ඉවත් කර ඉදිරිපත් කර ඇති හෙයින්

වර්තමාන නිර්වචනයෙන් සිදුවන්නේ තාක්ෂණික අධ්‍යාපනය පහත හෙළීමකි. කෙසේ වුව ද, ක්ෂේත්‍රයේ වර්තමාන වර්ගීකරණ කෘත්‍රිම, තාවකාලික සහ වෙනස් කළ හැකි ඒවා වෙති. ශ්‍රී ලාංකීය සමාජය විසින් පොදුවේ ශ්‍රමය වෙහෙසා කරන වැඩ පහත් කොට සළකනු ලබයි. එනමුත් ශ්‍රමයේ අභිමානය සහ රැකියා විනය යනු කාර්මික සංවර්ධනය සඳහා අනිවාර්ය පූර්ව අවශ්‍යතා ය. ජනමාධ්‍ය (ටෙලිනාට්‍ය, වාර්තා චිත්‍රපට) සහ සමාජ මාධ්‍ය භාවිතා කරමින් පුහුණු රැකියා සහ ශ්‍රමයේ අභිමානය පිළිබඳව දෙමාපියන් සහ ගුරුවරුන් මෙන් ම මහජනතාව ද දැනුවත් කළ යුතුය.

2. ජීවිත කාලය පුරාම ඉගෙනීමේ සංස්කෘතියක් හඳුන්වාදීම

විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා යා හැකි මාවතක් ඇති කිරීමෙන් තරුණ තරුණියන් තුළ වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි ඇති අකමැත්ත ජයගත හැකි ය. අධ්‍යයන සුදුසුකම් ලබාගැනීම සඳහා බහුවිධ මාර්ග ඇති කිරීමෙන් වෘත්තීය පුහුණුවෙන් පසු උපාධියක් ලබාගැනීම සඳහා වලංගු ප්‍රවේශයක් සළසාදෙයි. එ මෙන් ම, ඒ ඔස්සේ සුදුසු සබැඳි පාඨමාලා හරහා වෘත්තීය වර්ධනය, වෘත්තීය දියුණුව සහ සාමාන්‍ය, තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන පාඨමාලා සඳහා පාර්ශ්වීය ප්‍රවේශ අවස්ථා ද නිර්මාණය කරයි. වෘත්තීය ආයතනවලින් සමත් වී රැකියාවල නියැලී සිටින්නන් හට තාක්ෂණික විශ්වවිද්‍යාල (බහු තාක්ෂණික ආයතන) සමඟ එක් වී ඒ ඔස්සේ ප්‍රධාන වශයෙන් ගැඹුරු න්‍යායික සහ පර්යේෂණ කටයුතු කිරීම සඳහා සුදුසු විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට අවස්ථාව ද උදා කළ යුතු ය.

3. අධ්‍යාපන ක්‍රමය අනුගත කිරීම

තමන් කිරීමට බලාපොරොත්තු වන රැකියාවේ සාමාන්‍ය ප්‍රවීණතා ක්ෂේත්‍රය තෝරා ගැනීමට හැකි වන පරිදි වෘත්තිය පදනම් කරගෙන පාසල් විෂයමාලා සම්පාදනය කරන්නේ නම් සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු එම ඉසව් වෙත මාරුවීමේ කුසලතා අවශ්‍යතාවලට අනුගත විය හැකි නවමු ශිෂ්‍ය ප්‍රජාවක් අප

හට නිර්මාණය කළ හැකි වනු ඇත්තේ ය. වෛද්‍ය වෘත්තීන්වලට සම්බන්ධ වීමට අදහස් කරන සිසුන් හෙදියන් සහ වෛද්‍ය කාර්මිකයන් වීමට පුහුණු කරනු ලැබිය යුතු අතර එමඟින් වෛද්‍යවරුන් වීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන්ට වෘත්තියෙහි පරිපූර්ණ පදනමක් ලැබෙනු ඇත. ඒ හා සමානව, ඉංජිනේරුවන් කාර්මික ශිල්පීන්ගේ සහ යාන්ත්‍රිකයන්ගේ කුසලතා මත පදනම් වන අතර, ඔවුහු තමන්ගේ දෑත් අපිරිසිදු කර ගැනීමට ඇති අකමැත්ත නැති කර ගනිති.

පෙර පාසල් සහ 1 සිට 5 වසරවල පාසල් ශිෂ්‍යයන්ට විශ්ලේෂණාත්මක හැකියා සහ දක්ෂතාව වර්ධනය කරන අධ්‍යාපනික සෙල්ලම් බඩු ලබා දිය යුතු ය, නිදසුනක් වශයෙන් එකලස් කිරීම සහ ගැලැවීම සඳහා වූ සෙල්ලම් බඩු, ආකෘති සෑදීම, සරුංගල් සෑදීම වැනි කාර්යයන් මේ සඳහා යොදාගත හැකි ය. තාක්ෂණයට අමතරව අත්‍යවශ්‍ය, ස්ත්‍රී-පුරුෂ වෙනස්කම්වලට අදාළ නැති වෘත්තීය පුහුණුව සඳහා ද ප්‍රයෝජනවත් විය හැකි ජීවන කුසලතා ද මිනිසුන් සමඟ කටයුතු කිරීමේ දී අවශ්‍ය වන ආචාරශීලී බව, සන්නිවේදනය, තාර්කිකව කාර්යයන් වෙත ප්‍රවේශවීම සහ අක්‍රමවත් හෝ හදිසි අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කිරීම වැනි මෘදු කුසලතා ද ඇතුළත් ප්‍රායෝගික තාක්ෂණික පාඨමාලා 6 - 13 වසරවල පාසල් සිසුන්ට හඳුන්වා දිය යුතු ය. වයස අවුරුදු 14 ට සහ ඊට අඩු දරුවන් නීත්‍යානුකූලව සේවයේ යෙදවිය නොහැකි බැවින් ඔවුන්ට වයස අවුරුදු 15 සිට වෘත්තීය පුහුණුවට මාරුවීමට මෙන් ම ඒ සඳහා පෙර සූදානම් වීමේ අවස්ථා ද සළසා දිය යුතු ය.

4. ආධුනිකත්ව යෝජනාක්‍රම නැවත ක්‍රියාත්මක කිරීම

ගරාජ්, සහල් මෝල් සහ ආපනශාලා වැනි කුඩා ආයතනවල රැකියා කරන අතර ම ප්‍රායෝගික පුහුණුව ලබා ගනිමින් ශ්‍රම වෙළෙඳපොළට ඇතුළුවීම සඳහා අභ්‍යාසලාභීන්ට අවස්ථාව හිමි කර දුන් ආධුනිකත්ව ක්‍රමය අප විසින් නැවතත් පණ ගැන්විය යුතු ය. ආර්ථික ක්‍රියාකාරකම් අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් නාගරික ප්‍රදේශවල සංකේන්ද්‍රණය වී ඇති බවත් ඒවා ග්‍රාමීය ජනතාව වෙත සමීප කළ යුතු බවත් එ මඟින් වසංගත වැනි හදිසි කම්පන

අවස්ථාවලට වඩාත් හොඳින් ඔරොත්තු දිය හැකි පරිදි කටයුතු කළ හැකි වන බවත් කොවිඩ්-19 වසංගතය විසින් අප හට ඉගැන්වූ එක් පාඩමකි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇතිවිය හැකි වෙනස්කම්වලින් මෙම ක්‍රියාවලිය වේගවත් කළ හැකිය.

5. තාක්ෂණය සඳහා සූදානම්වීම

නව තාක්ෂණ ජයග්‍රහණයන් විසින් අපේක්ෂා නො කළ ක්ෂේත්‍රවල පවතින රැකියා රටා මුළුමනින් ම බිඳ දැමීමට ඉඩ ඇත. කෘතිම බුද්ධිය (Artificial intelligence AI), රොබෝවරු සහ අන්තර්ජාලය පදනම් කරගත් උපාංග මත පදනම් විය හැකි නව තාක්ෂණයේ රැල්ලට මුහුණදීම සඳහා අප සූදානම් විය යුතු ය. නිදසුනක් වශයෙන් කෘෂිකාර්මික අංශයේ විවිධ කුසලතා අවශ්‍යතා සඳහා සූදානම් වීම දැක්විය හැකි ය. මේ වනවිට, බොහෝ සේවා ස්ථාන පරිගණක ජාල සහ ඒවායේ තාක්ෂණය මත විශාල ලෙස රඳා පවතින ඒවා බවට පත්වෙමින් පවතී. එහෙයින් මෙම ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව ඉතා වැදගත් වනු ඇත. විශේෂිත මෘදුකාංග මත රඳා පවතින ආරක්ෂිත පවුරු, ස්විච, විවිධ දෘඩාංග සහ දත්ත හුවමාරු ධාරිතා ප්‍රශස්ත කිරීම පිළිබඳ දැනුම ලබාගැනීම යනාදිය ඇතුළත් අභ්‍යන්තර ජාල, අන්තර්ජාල සේවා, ජාල ආරක්ෂාව සහ මංගත සේවා කවුළු වැනි දේ ඇතුළත් ජාල ප්‍රදේශ ඇති කිරීමට අදාළ පුහුණුව කෙරෙහි අප වැඩි අවධානයක් යොමු කළ යුතු ය. අභ්‍යන්තර දහන එන්ජින් සහිත ඒවායේ සිට විදුලියෙන් ක්‍රියාකරන වාහනවලට මාරුවීම ඉදිරි වසර කිහිපය තුළ දී සිදුවනු ඇති අතර එය සමස්ත මෝටර් රථ සහ බල ඉංජිනේරු ක්ෂේත්‍රයට ගැඹුරු බලපෑමක් එල්ල කරනු ඇත.

6. විෂයමාලා සංශෝධනය

අභ්‍යාසලාභීන්ට රැකියා වෙළෙඳපොළට අනුවර්තනය වීම පිණිස නම්‍යශීලීභාවය අවශ්‍ය වන බැවින් විෂයමාලාවල ඇති දැඩි අනම්‍යශීලී ස්වභාවය වෘත්තීය පුහුණුවට ද විශාල අභියෝගයක් එල්ල කරයි. කර්මාන්තයේ වර්ධනයන් සමඟ සමගාමීව ගමන් කිරීම පිණිස අපි විෂයමාලා නිතිපතා සංශෝධනය කළ යුතු වන අතර ඒ සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කළ යුතු ය.

7. රැකියා වෙළෙඳපොළ ප්‍රතිපෝෂණය

වෘත්තීය පුහුණු ආයතනවලින් පිටවෙන විශාල පිරිසක් රැකියා සඳහා විදේශගත වන බැවින්, සේවායෝජක අවශ්‍යතා ප්‍රමාණවත් අයුරින් ප්‍රතිපෝෂණය සහතික කිරීම සඳහා වූ යාන්ත්‍රණයක් අප විසින් නිර්මාණය කළ යුතු ය. විදේශීය රැකියා සඳහා සේවකයන් සොයන ආයතන ඒ සඳහා වන විශේෂ කැපැවීමකින් තොරව යල්පැන ගිය ක්‍රම අනුගමනය කරමින් කටයුතු කරන බැවින් මෙය සිදු නොවේ.

8. පුහුණු ආයතන

(අ) පුහුණු ආයතනවල ප්‍රමාණවත් මෙවලම් සහ කාර්යය උපකරණ පවතින බව සහතික කළ යුතු ය.

(ආ) වෘත්තීය පුහුණු ආයතනවල සහ විශ්වවිද්‍යාලවල සමාන අධ්‍යාපන ක්ෂේත්‍ර සඳහා ඒකාබද්ධ පුහුණු පහසුකම් සැළැසීමෙන් වියදම් අඩු කරගත යුතු ය.

(ඇ) දුරස්ථ අධ්‍යාපනය සමඟ බැඳුණු ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමට හැකි වන පරිදි, සියලු ම රජයේ ආයතනවල ශිෂ්‍යයන් සඳහා වූ විමධ්‍යගත කුසලතා මධ්‍යස්ථාන ස්ථාපිත කළ යුතු ය.

(ඇ) පුහුණුකරුවන් පුහුණුකිරීම සඳහා සහ ප්‍රායෝගික පුහුණුව ලබාදීම සඳහා කෘත්‍රිම තථ්‍ය / අතථ්‍ය යථාර්ථ මෘදුකාංග සහ දෘඩාංග භාවිතා කෙරෙන සාපේක්ෂව මිල අධික නොවන ආදර්ශක සපයාදීම.

(ඉ) දැනුම කළමනාකරණ ශිල්පක්‍රම භාවිතා කරමින් කාර්යශූර ශිෂ්‍යයන්ව ගැලපෙන වෘත්තීන්ට යොමු කරවීම.

(ඊ) ප්‍රතිපෝෂණ ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම මඟින් වෘත්තීය ආයතන සහ කර්මාන්ත අතර පැවැතිය යුතු සබඳතාව ශක්තිමත් කළ යුතු ය. වෘත්තීය ආයතන සඳහා උපදේශකයන් බඳවාගත යුත්තේ ශාස්ත්‍රීය ආයතනවලින් නොව කර්මාන්ත තුළිනි.

(එ) අදහස් සන්නිවේදනය සහ ඉදිරිපත් කිරීම සඳහා මෘදු කුසලතා වර්ධනය කිරීම සහ විශේෂයෙන් ම ඉංග්‍රීසි භාෂා කුසලතාව ඇතිකිරීම.

(ඒ) අභ්‍යාසලාභීන්ට විෂයය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට සහ කර්මාන්ත පරිසරයක එය ප්‍රගුණ කිරීමට අවස්ථාව සළසා දෙමින් පුහුණුව සමග කර්මාන්ත අත්දැකීම ලබාදෙන කෙටි කාලීන පාඨමාලා ඇතුළත් කරමින් විෂයමාලා නවීකරණය කළ යුතු ය.

(ඔ) උසස් තාක්ෂණය සහ විශිෂ්ට ව්‍යවහාර පිළිබඳ යාවත්කාලීන කළ ප්‍රතිපෝෂණය සහතික කිරීම පිණිස කාර්ය මණ්ඩලය සහ අභ්‍යාසලාභීන් සඳහා විදේශීය කර්මාන්ත ආයතන තුළ පුහුණු අවස්ථා සළසාදීම.

(ඕ) කර්මාන්ත තුළ ලබාගත හැකි ආදායම්වලට ගැලපෙන පරිදි, සමාන සුදුසුකම් ඇති නමුත් ඉතා අඩු වැටුප් ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලවල වැටුප් සහ දීමනා ඉහළ දැමීම.

9. ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා පුහුණු ආයතන ස්ථාපිත කිරීම

(අ) කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ ශිල්පක්‍රම

සාම්ප්‍රදායික වගාවන් සහ වැවිලි යන අංශ දෙකෙන් මෙන් ම වඩාත් නවීන උද්‍යාන විද්‍යාත්මක හා කිරි නිෂ්පාදන අංශයන්හි ශ්‍රම බලකායෙන් විශාල කොටසක් කෘෂිකාර්මික අංශය තුළ සංකේන්ද්‍රණය වී ඇත. මෙම ක්ෂේත්‍රවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නවීන යන්ත්‍රෝපකරණ, උපකරණ සහ ශිල්පීය ක්‍රම අවශ්‍ය වන අතර ඒ සඳහා දක්ෂ ක්‍රියාකරුවන් සහ කාර්මික ශිල්පීන් අවශ්‍ය වේ.

(ආ) ආහාර පිරිසැකැසුම

කෘෂිකාර්මික හා ධීවර නිෂ්පාදකයින් සඳහා ස්ථාවර වෙළෙඳපොළක් සැපැයීම පිණිස විශේෂයෙන් ආහාර සංරක්ෂණය සඳහා ආහාර සැකැසුම් කම්හල් අත්‍යවශ්‍ය වන අතර එ මඟින් ඍතුමය වශයෙන් ලැබෙන අධික අස්වැන්න නාස්තිවීම වැළැක්වීමට සහ අවාර කාලය තුළ වඩාත් නම්‍යශීලී අලෙවිකරණය සක්‍රීය කිරීමට හැකි වේ. කෙසේ වුව ද අවශ්‍ය කරන ශීතකරණය, විජලනය, වියළීම, ටින් කිරීම සහ බෝතල් කිරීමේ කම්හල පවත්වාගෙන යාමට ප්‍රමාණවත් පුහුණු පිරිස් නොමැත.

(ඈ) ඛණිජ සම්පත් නිස්සාරණ තාක්ෂණය

ශ්‍රී ලංකාවේ පතල් සහ අනෙකුත් කාර්මික නිස්සාරණ කර්මාන්ත සඳහා නව තාක්ෂණික සහ නිපුණ කාර්ය මණ්ඩලය සමඟ නවීකරණය අවශ්‍ය වේ. විදේශයන්හි මෙම ක්ෂේත්‍රවල බොහෝ රැකියා අවස්ථා පවතී.

(ඈ) කාර්ය සම්පාදන පුහුණුව

කාර්ය සම්පාදන (logistics) අංශය වේගයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ඉදිරි වසරවල දී විශාල දියුණුවක් දැකිය හැකි බවට අපේක්ෂිත මංගත වෙළෙඳාම ඔස්සේ භාණ්ඩ ඉතා දක්ෂ ලෙස ඉලක්කගත කිරීම සහ ප්‍රශස්ත කිරීම භාවිතයට එන බැවින්, කාර්ය සම්පාදන අංශයේ පැවැත්ම අභියෝගයට ලක්වනු ඇත. කාර්ය සම්පාදන පුහුණු ආයතන පිහිටුවීම ලාභදායී හා අඩු සංකීර්ණ කරමින් එම අංශයේ සේවකයන්ගේ පුහුණු කටයුතු බොහෝමයක් අන්තර්ජාලය ඔස්සේ සිදු කළ හැකි ය.

(ඉ) නාවුක කටයුතු සහ නැව් ඉදිකිරීම

කාර්ය සම්පාදන කටයුතු වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ වෙළෙඳ නාවික සේවා වේගයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. මෙයින් අදහස් කරන්නේ විශාල නැව් සංඛ්‍යාවක් සහ විශාල සේවක සංඛ්‍යාවකි. ජපානය, දකුණු කොරියාව, චීනය සහ යුරෝපය වැනි විදේශීය වෙළෙඳපොළ කිහිපයක නාවික සහ නැව් තැනීමේ කාර්මික ශිල්පීන්ට ඉහළ ම ඉල්ලුමක් පවතින අතර, පුහුණු කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් අපට එම ඉල්ලුම සපුරාලිය නොහැක. විවිධ සේවා කේන්ද්‍රස්ථාන ලෙස ශ්‍රී ලංකාවේ වරාය සම්බන්ධයෙන් ඉහළ යමින් පවතින වැදගත්කම හේතුවෙන් නැව් අලුත්වැඩියාව සහ නඩත්තුව සඳහා ද විශාල වැඩි ඉල්ලුමක් දැකිය හැකි ය. එහෙයින්, සෑම වරායක ම සමුද්‍ර හා නැව් තැනීමේ තාක්ෂණය පිළිබඳ පුහුණුව සඳහා වෙන් වූ ආයතන තිබීම ඉතා වැදගත් වේ.

ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන ප්‍රතිපත්තිය

හැඳින්වීම

ප්‍රජාතාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා මෙන් ම, සමාජ ඒකාබද්ධතාව ශක්තිමත් කිරීම සඳහාත්, සහයෝගීතාවයේ බැඳීම් නිර්මාණය කිරීම සඳහාත්, නූතන කාර්මික ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට තරුණයින්ව පුහුණු කිරීම සඳහාත් ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය ඉතා වැදගත් වේ. එංගලන්තයේ කාර්මික විප්ලවය පැවති කාලය තුළ ඓතිහාසික වශයෙන් ක්‍රිකට් සහ පාපන්දු වැනි ක්‍රීඩා ඒවායෙහි නූතන ස්වරූපයන් දක්වා සංවර්ධනය වූ අතර, නූතන කර්මාන්තවලට අවශ්‍ය කරන කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියා සහ විශිෂ්ඨත්වය වර්ධනය කරගැනීමේ අවශ්‍යතා එ මගින් ඉටුවිය. ධනවතුන් සඳහා ක්‍රිකට් ක්‍රීඩාව ද, කම්කරු පන්තිය සඳහා පාපන්දු ක්‍රීඩාව ද ඒ සඳහා යොදා ගනු ලැබීය. පසුගිය කාලය පුරා වඩාත් දිළිඳු පුද්ගලයින් මෙම ක්ෂේත්‍රයේ වැඩි බලපෑමක් ඇති කර තිබෙන බැවින් එහි යම් සමතාවයක් ඇතිවීමේ ක්‍රියාවලියක් සිදුවෙමින් පවතියි.

ගැටලු

පසුගිය වසර 40 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පරිවර්තනයක් සිදු වී ඇත. නාගරික ප්‍රදේශවල ප්‍රධාන ක්‍රීඩාව වූ පාපන්දු ක්‍රීඩාව ද, ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රධාන ක්‍රීඩාව වූ වොලිබෝල් ක්‍රීඩාව ද වෙනුවට ක්‍රිකට් ක්‍රීඩාව ආදේශ වී ඇත. ඒ සමග ම, ක්‍රීඩාව කෙතරම් වාණිජකරණය වී ඇත්ද යත්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට සහ විශිෂ්ටත්වය හඹා යාමට වඩා මුදල් ඉපැයීම ක්‍රීඩාවේ ප්‍රබලතම උද්යෝගී සංරචකය බවට පත්වී ඇත. කාන්තා ක්‍රීඩා, පිරිමින්ගේ ක්‍රීඩා තරම් දියුණු වී නොතිබීම ඇතැම් විට මෙම හේතුව නිසා සිදුවූවක් විය හැක.

මේ අතර, අනෙකුත් ක්‍රීඩාවලට, එනම්, එල්ලේ සහ ගුඩු

වැනි දේශීය ක්‍රීඩාවලට ද, කබඩි සහ කෝ-කෝ වැනි කලාපීය ක්‍රීඩාවලට ද, බේස්බෝල්, වොලිබෝල්, නෙට්බෝල් සහ හොකී වැනි ජාත්‍යන්තර ක්‍රීඩාවලට ද ලැබෙන්නේ කුඩම්මාගේ සැළැකිලි ය.

තරුණ තරුණියන්ව ඔවුන්ගේ ජංගම දුරකථන, පරිගණක සහ වීඩියෝ ක්‍රීඩාවලින් ඈත්කිරීමේ අමතර වැදගත් කාර්යයක් ද අද දවසේ ක්‍රීඩාවට සහ ශාරීරික අධ්‍යාපනයට පැවරී ඇත. ක්‍රීඩාව සහ ශාරීරික අධ්‍යාපනය, ළමයින් අතර බහුල වෙමින් පවතින තරබාරුකමට එරෙහිව සටන් කිරීම සඳහා අත්‍යාවශ්‍ය මෙවලම් බවට පත් වී ඇත.

ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ:

- **සියලු දෙනාට සහභාගි විය හැකිවන පරිදි ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය නැවත සකස් කිරීම**
- **වාර්ගික හා ආගමික වෙනස්කම් මැඩපවත්වා ගනිමින් ජාතික සහයෝගීතාව ගොඩනැගීම**
- **කණ්ඩායමක් ලෙස සහ සහයෝගීත්වයෙන් යුතුව කටයුතු කිරීමට තරුණයින්ව පුහුණු කිරීම**
- **කිසිවකු සහභාගීත්වයෙන් බැහැර නොකරන හෝ අත්හැර නොදමන පරිදි සියලු ම පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ සලසාදීම.**
- **ක්‍රීඩා සම්බන්ධ සියලුම සංවිධාන මෙන් ම පහළ ම මට්ටමේ රාජ්‍ය ආයතන ද තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම.**
- **ජාත්‍යන්තර සහ කලාපීය වශයෙන් ජාතියට කීර්තිනාමයක් අත් කරදීම.**

ඉදිරිමග

1. ක්‍රීඩා කිරීම

ප්‍රාථමික පාසලේ සිට ඉහළට සියලු ම ක්‍රීඩකයින් සඳහා වන මනෝවිද්‍යාත්මක පුහුණුව තුළින් අරමුණු කළ යුත්තේ "ජයග්‍රහණ" ලබාගැනීම ම නොව, විශිෂ්ඨත්වය, ස්වයං විනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, සහයෝගීතාව සහ සාධාරණත්වය සාක්ෂාත් කර ගැනීම යි. ඉලක්කය විය යුත්තේ "ක්‍රීඩාව නිසි ලෙස කිරීමට ඉගෙනීම" යි. එනම්, ජයග්‍රහණය හෝ පරාජය ලැබීමට වඩා ක්‍රීඩාව කරන ආකාරය වැදගත් වන පරිදි, සාධාරණව ක්‍රීඩා කිරීම සහ ගෞරවය, පක්ෂපාතීත්වය සහ වගකීම වෙනුවෙන් පෙනී සිටීම යි; "රණතුංග කරුණානන්දගේ ධෛර්යය" - එනම් හුදු ජය නොව සහභාගීත්වය ප්‍රමුඛතාවේ තබාගෙන ක්‍රීඩාව වෙනුවෙන් තමන්ගේ උපරිමය ලබාදීමයි. විශිෂ්ඨත්වය ළඟාකර ගැනීමේ දී ප්‍රේක්ෂකයින් තමන්ගේ කණ්ඩායමේ විරුද්ධවාදීන්ට ද ඇතුළුව සියලු ම සහභාගිවන්නන්ට ප්‍රශංසා කිරීමට ඉගෙන ගත යුතු ය.

2. ආයෝජනය

වර්තමානයේ ක්‍රීඩාව සහ ශාරීරික අධ්‍යාපනය කෙරෙහි ආයෝජනය ව්‍යාප්ත වී ඇත්තේ අසමාන ආකාරයකට ය. බොහෝ ආයෝජන (විශේෂයෙන් ම පුද්ගලික අංශයේ ආයෝජන) සිදු වන්නේ වෙළෙඳ ප්‍රචාරණ හෝ ප්‍රවර්ධන වියදම් ස්වරූපයෙනි; එබැවින් ක්‍රිකට් වැනි ඉහළ පෙළේ ක්‍රීඩා සහ ජවන හා පිටිය තරඟ ඉසව් සඳහා වැඩි වශයෙන් ආයෝජන සිදු කරනු ලැබේ. ආයෝජන අවස්ථා ක්‍රීඩා අතර සාධාරණව බෙදා හැරිය යුතු ය. වෙළෙඳ ප්‍රචාරණවලින් ලැබෙන ආදායම අනෙක් ක්‍රීඩා ව්‍යාප්ත කිරීමට පියවර ගත යුතු ය. උදාහරණයක් ලෙස, ක්‍රිකට් වැනි ක්‍රීඩාවන්හි ප්‍රචාරණය කිරීමට හෝ ප්‍රවර්ධනය කිරීමට අවසර ලබා ගැනීමට නම්, අනෙකුත් නිශ්චිත ක්‍රීඩා ක්ෂේත්‍රවල යම් යම් ප්‍රතිශත වියදම් කිරීම අනිවාර්ය කළ හැකි ය.

3. විමධ්‍යගත කිරීම

මහජනතාවට, විශේෂයෙන් ම පාසල්වලට ප්‍රවේශ විය හැකි පොදු ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන පහසුකම් සපයාදීම සම්බන්ධයෙන් මහ නගර සභාවලට, නගර සභාවලට සහ ප්‍රාදේශීය සභාවලට වැඩි වගකීමක් පවරමින් පළාත් පාලන ආයතන මට්ටමෙන් විශාල ආයෝජනයන් සිදු කළ යුතු ය. සෑම ප්‍රාදේශීය සභාවක ම සහ මහ නගර සභා / නගර සභා උපනග රයක ම සුදුසුකම් ලත් ක්‍රීඩා පුහුණුකරුවන් සහ භෞතචිකිත්සක නිලධාරීන් සහිතව පොදු ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපනය කළ යුතු ය. බාර්සිලෝනා (Barcelona), බොරුසියා (Borussia), ජුවෙන්ටස් (Juventus) සහ ලිවර්පූල් (Liverpool) වැනි යුරෝපීය පාපන්දු කණ්ඩායම්වල පාපන්දු ලෝලීන් අතර පවතින සිවිල් සවිඥානකතාව වැනි සිවිල් සවිඥානකතාවක් ගොඩනැගීම සඳහා මෙම මට්ටම්වල ක්‍රීඩා කණ්ඩායම් ධෛර්යමත් කළ යුතු ය.

4. ක්‍රීඩා සංගම්

ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා සෑම මට්ටමක් තුළ ම ප්‍රමාණවත් ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයක් ඇතිව, තීරණ ගැනීමේ බලතල සහිත ක්‍රීඩා සංගම් පිහිටුවිය යුතු ය. රාජ්‍ය නොවන සංවිධානවල සහ සංගම්වල කාර්යභාරය අවම කළ යුතු අතර, ඒවායෙහි සහභාගීත්වය ද ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගෝපදේශවලට යටත් කළ යුතු ය.

5. පොදු විවෘත අවකාශය

විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් පොදු, විවෘත අවකාශ නොමැත. ඇවිදීම සඳහා ම වෙන් කරන ලද ඇවිදීමේ මංතීරු සඳහා සැළැකිය යුතු මුදලක් වැය කර ඇති නමුත්, එම මුදල් වියදම් කළ යුතුව තිබුණේ ජනතාවට ක්‍රීඩා හා ශාරීරික සෞඛ්‍ය ක්‍රියාකාරකම්වල නිරත විය හැකි උද්‍යාන සහ ක්‍රීඩා පිට්ටනි ඉදිකිරීම සඳහා ය.

6. ජාතික ක්‍රීඩා

ශ්‍රී ලංකාවේ නම් කරන ලද ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාව ප්‍රචලිත කිරීම සඳහා ආයෝජන අවශ්‍ය කරයි. සෑම ගමකට ම සහ සෑම පාසලකට ම වොලිබෝල් ක්‍රීඩාව සඳහා පහසුකම් සපයා දී තිබිය යුතු අතර, වොලිබෝල් තරග සඳහා රූපවාහිනියේ සහ ගුවන් විදුලියේ විකාශන කාලය වෙන් කිරීම අනිවාර්ය කළ යුතු ය. එල්ලේ සහ ගුඩු වැනි සාම්ප්‍රදායික ජාතික ක්‍රීඩා ද ඒ හා සමාන ආකාරයකට ප්‍රචලිත කළ යුතු ය.

7. බයිසිකල් පැදීම

අතීතයේ දී ලංකා සවාරිය වැනි පාපැදි තරග පැවැත්වීම බොහෝ විට සාමාන්‍ය අංගයක් විය. වර්තමානයේ සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවවල දී හැර එවැනි තරග පැවැත්වෙන්නේ ඉතා කලාතුරකිනි. ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පාපැදියට හිමිවී තිබූ වැදගත්කම නැති වී ගොස් ඇති නිසා තමන් සතුව පාපැදියක් ඇත්තේ ඉතා සුළු පිරිසකට පමණි. දේශගුණික විපර්යාස ඇතිවීම අවම කිරීමේ අවශ්‍යතාවට විශේෂයෙන් අදාළ කර ගනිමින්, ජනතාව අතර පාපැදි ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම තුළින් ප්‍රවාහන මාධ්‍යයක් ලෙස පාපැදි භාවිතා කිරීම දිරිමත් කළ යුතු ය.

8. ජලජ ක්‍රීඩා

දූපතක් වන ශ්‍රී ලංකාව බොහෝ අභ්‍යන්තර ජල මූලාශ්‍රවලින් අනූන රටකි. එබැවින් පිහිනුම් සහ අනෙකුත් ජලජ ක්‍රීඩා අපගේ සංස්කෘතියේ අත්‍යවශ්‍ය අංග ලෙස සැළැකිය යුතු ය. සෑම ළමයෙකුට ම වයස අවුරුදු 10 වන විට පිහිනීමේ හැකියාව තිබිය යුතු ය. අවම වශයෙන් ප්‍රාදේශීය සභා මට්ටමෙන් හෝ පිහිනුම් තටාක සහ පිහිනුම් ක්‍රීඩාව සඳහා අත්‍යාවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය සපයා දිය යුතු ය.

9. සටන් කලාව සහ ජිම්නාස්ටික්

සටන් කලාව සහ ජිම්නාස්ටික් යනු ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය යන දෙකෙහි ම අත්‍යවශ්‍ය අංග වේ. උදාහරණයක්

ලෙස, ඈත පෙරදිග රටවලට අයත් සටන් කලාවන් පුද්ගලයෙකුගේ බාහිර විරුද්ධවාදීන්ව පරාජය කරනවාට වඩා බොහෝ දුරට තමන්ව ජයගැනීම හා සම්බන්ධ වේ. අංගම්පොර වැනි දේශීය සටන් කලාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම පුළුල් කර, ආත්මාරක්ෂාව සඳහා කාන්තාවන් අතර ඒවා ප්‍රවර්ධනය කළ යුතු ය. ප්‍රාදේශීය සභා හෝ මහ නගර සභා / නගර සභා තුළ පිහිටි සෑම නාගරික ප්‍රදේශයක ම රජයේ මධ්‍යස්ථාන පිහිටුවා, එම මධ්‍යස්ථානවල විශේෂයෙන් ම වැඩිහිටි පුරවැසියන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම සඳහා යෝගා සහ තායිචි පුහුණු කළ යුතු ය. ජිම්නාස්ටික් ක්‍රීඩාව, සමහර විට යෝගා සහ තායිචි සමඟ ඒකාබද්ධ කර, ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේ අධ්‍යාපනික සරඹවල සිට ද්විතීයික අධ්‍යාපන මට්ටමේ ශාරීරික අධ්‍යාපන විෂයය දක්වා වන විෂය මාලාවලට ඇතුළත් කළ යුතු ය.

10. කලාපීය ක්‍රීඩා

කලාපීය ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දී ශ්‍රී ලංකාව ඉදිරියෙන් ම සිටිය යුතු ය. බටහිර ක්‍රීඩාවලට අමතරව, කබඩි සහ කෝ-කෝ යන ක්‍රීඩාවල ද ප්‍රවීණතා මට්ටම් ළඟාකර ගැනීමට ද ඉලක්ක කළ යුතු ය. දකුණු ආසියානු ක්‍රීඩා උළෙලේ සම්මත ඉසව්වක් බවට පත් කිරීම සඳහා අංගම්පොර සටන් කලාව කේරළයේ කලරිපයාට්ටු සමග ඒකාබද්ධ කිරීමට උත්සාහ කළ යුතු ය.

11. ජාත්‍යන්තර ක්‍රීඩා

තරඟ පාවාදීම, ඔට්ටු ඇල්ලීම සහ තහනම් ඖෂධ ගැනීම ආදිය විමර්ශනය කිරීමේ සහ ක්‍රීඩකයින්ට සහ නිලධාරීන්ට අවවාද නිකුත් කිරීමේ සහ සම්බාධක පැනවීමේ බලතල සහිතව, සියලු ම ජාත්‍යන්තර ක්‍රීඩා අධීක්ෂණය කිරීමට අපක්ෂපාතී ජාත්‍යන්තර ක්‍රීඩා කවුන්සිලයක් ස්ථාපනය කළ යුතු ය. සාධාරණ සමාජ මිශ්‍රණයක් සහතික කිරීම පිණිස එය ක්‍රීඩකයින් සම්බන්ධ විනය සහ අනිසි පක්ෂපාතීත්වයන් පිළිබඳව ද අධීක්ෂණය කළ යුතුය. කාර්ය සාධනයෙහි විශිෂ්ටත්වය අත්කර ගැනීමට වඩා කණ්ඩායම් හැඟීම සහ සමාජ සමානාත්මතාව අත්කර ගැනීම ප්‍රධානත්වය ගත යුතු ය.

12. ආබාධිත පුද්ගලයින්

ආබාධිත පුද්ගලයින් (තාවකාලික හෝ ස්ථිර) ප්‍රමාණය ජනගහනයෙන් සියයට 8 ක් පමණ වේ. එවැනි ආබාධිත පුද්ගලයින් ක්‍රීඩා පද්ධතියට ඒකාබද්ධ කරගැනීම සඳහා හැකි සෑම උත්සාහයක් ම දැරිය යුතු ය. ආබාධිතභාවය සම්බන්ධයෙන්, විශේෂයෙන් ම ප්‍රවේශය සහ ආරක්ෂාවට අදාළව ප්‍රතිපාදන සපයා දිය යුතු ය. සාපේක්ෂ වශයෙන් අඩු තරඟකාරී පරිසරයක් නිර්මාණය කිරීම මගින් සාමාන්‍යකරණය කරන ලද ක්‍රීඩා ඉසව් සඳහා ආබාධ සහිත පුද්ගලයින්ගේ සහභාගීත්වය පහසු කරනු ඇත.

13. ආකර්ෂණීය ක්‍රීඩා

ඇතැම් අවස්ථාවල දී, ආකර්ෂණීය ක්‍රීඩාවල යෙදීමෙන් රටකට ජාත්‍යන්තර කීර්තියක් අත්පත් කරගත හැකි ය. උදාහරණයක් ලෙස, ජැමෙයිකානු බොබ්ස්ලෙඩ් කණ්ඩායම, ශ්‍රී ලංකාවේ ස්නෝබෝඩ් ශූර අශ්ක්වියා යූසූප් සහ ශ්‍රී ලංකාවේ එවරස්ට් කඳු නගින්නන් වන ජයන්ති කුරු-උතුම්පාල සහ ජොහාන් පීරිස් එලෙස ජාත්‍යන්තර කීර්තිය අත් කර දුන් ක්‍රීඩකයින් වේ. ක්‍රීඩා සංගම් විසින් මෙම ක්ෂේත්‍ර සඳහා ඇති අයැදුම්කිරීම් පිළිබඳ ඇගයීම් සිදු කර විශේෂයෙන් පුහුණු ක්ෂේත්‍රයෙහි සහාය සපයා දිය යුතු ය.

සෞඛ්‍ය ප්‍රතිපත්තිය

හැඳින්වීම

පහළ මට්ටමේ ජාතික ආදායමක් සහ සෞඛ්‍ය සේවාවට අඩු මූල්‍ය විභජනයක් පැවතිය දී පවා ශ්‍රී ලංකාවේ මූලික සෞඛ්‍ය සේවා දර්ශක ලොව වඩා දියුණු රටවල මට්ටමේ තරම් සන්සන්දනාත්මක ඉහළ අගයක පවතී. මාතෘ මරණ අනුපාතය, නව ජන්ම, පශ්චාත් ජන්ම, ළදරු සහ ළමා මරණ අනුපාත අතින් සීමිත සම්පත් උපයෝජනයක් මධ්‍යයේ පවා ශ්‍රී ලංකාව වඩා ප්‍රශංසනාත්මක ප්‍රගතියක් සාක්ෂාත් කරගෙන සිටියි. උපතේ දී අපගේ කාන්තා සහ පිරිමි ආයු අපේක්ෂාව පිළිවෙළින් අවුරුදු 78.6 ක් සහ 72.0 ක් ය. 1990 දී 0.629 ක් වූ මානව සංවර්ධන දර්ශකය 2019 වන විට 0.782 දක්වා වර්ධනය විය. නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය, 1940 දශකයේ තරම් ඈතක සිට ස්ථාපිත කෙරුණු සමාජ සුබසාධන වැඩපිළිවෙළ, මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන එන නිදහස් සෞඛ්‍ය සේවාව මෙන් ම රට පුරා ව්‍යාප්ත රෝග වළක්වාගැනීමේ සහ සුව කිරීමේ සේවාව නිසා මෙම ජයග්‍රහණ ලැබී තිබේ.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෛද්‍ය ක්‍රම කීපයක් දක්නට ලැබේ. සම්ප්‍රදායික, බටහිර, ආයුර්වේද, යුනානි, සිද්ධ, හෝමියෝපති සහ කටු චිකිත්සාව ඒ අතර වේ. මේ අතුරෙන් බටහිර ඇලොපතික වෛද්‍ය ක්‍රමය බහුතරයේ අවශ්‍යතා පිරිමසින ක්‍රමය බවට පත්

වී තිබේ. නේවාසික ප්‍රතිකාරවලින් සියයට 90 ක් ම රජයේ රෝහල්වල නොමිලේ සැපයේ. තව ද රජයේ ආයුර්වේද රෝහල් ද පවතී. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දුන් 1987 සිට පැවත එන පළාත් සභා රෝහල්වලින් මහජන සෞඛ්‍ය සේවය විමධ්‍යගත ලෙසින් ක්‍රියාත්මක වෙයි.

මහජන සෞඛ්‍ය සේවාව දෙවැදෑරුම් ආකාරයකට සංවිධානය වී පවතී.

එනම්,

1. සේවා ප්‍රවර්ධන සහ රෝග වළක්වාගැනීමේ අරමුණින් ක්‍රියාත්මක ප්‍රජා සෞඛ්‍ය සේවාව

2. විශේෂඥ නොවන ප්‍රාථමික උපස්ථානයේ සිට රෝහල් සමුදායක් විසින් සපයනු ලබන විශේෂඥ ප්‍රතිකාර සේවා

මේ අතර, පෞද්ගලික රෝහල් විසින් මේ සියලු ආකාරයේ ම ප්‍රතිකාර සේවා ඉහළ මිලකට සපයමින් මධ්‍යම හා ඉහළ මධ්‍යම පංතියට සේවා සපයයි.

රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයට ම සෞඛ්‍ය ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය සහ ජාතික මට්ටමේ සෞඛ්‍ය ආයතන මගින් සේවා පවත්වාගෙන යාම සහ නියාමනය පිළිබඳ මධ්‍යම මට්ටමේ වගකීම දරන්නේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයයි. ස්වකීය පළාත්වල, ප්‍රතිකාර සේවා සහ වළක්වාගැනීමේ සෞඛ්‍ය සේවා කාර්යක්ෂමව පවත්වාගෙන යෑම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ නවයේ වගකීමයි. ඒ බැවින් ජනතාවට සෞඛ්‍ය සේවා ලබාදීම මධ්‍යම රජයේ ආණ්ඩුවේ සහ පළාත් සභාවල වගකීමයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණ අංශ සහ රෝග වැළැක්වීමේ වැඩසටහන්වලින්, ජාතික මට්ටමේ වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සම්පාදනය සහ තාක්ෂණ උපදේශණ සැපයීම සිදු කෙරෙයි. මධ්‍යම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික සෞඛ්‍ය සේවා ආයතන 48ක් සහ සෞඛ්‍ය සේවා ආයතන 1070ක් යටතේ පළාත්

අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක වන මධ්‍යම සායන සහ ශික්ෂණ රෝහල් සමූහයක් විසින් ප්‍රතිකාරමය සේවා සැපයෙයි.

පෞද්ගලික රෝහල් 145 පමණ විසින් රජයේ රෝහල්වලින් සැපයෙන සේවා මෙන් ප්‍රතිකාර සේවා සපයයි. මෙයට අමතරව මෙ රට පෞද්ගලික රෝහල් විසින් පොදු හෝ පවුල් වෛද්‍ය සේවා මෙන් ම බාහිර රෝගී ප්‍රතිකාර සේවා ද පවත්වාගෙන යයි. එ පමණක් නොව සායනික පර්යේෂණාගාර, රෝග චිකිත්සක මධ්‍යස්ථාන සහ පෞද්ගලික ෆාමසි සේවා ද ඒවා විසින් සපයනු ලබයි.

ගැටලු

ඉහතින් විස්තර කළ සාර්ථක තත්ත්වයන් පැවතිය ද රටේ සෞඛ්‍ය සේවාවට බලපාන ගැටලු රාශියක් ද පවතී. වත්මන් ආර්ථික අර්බුදය සහ අවපාතය හමුවේ පැන නැගී තිබෙන ළමා මන්දපෝෂණය, ගර්භනී රක්තහීනතාව, ඇතැම් බෝවන රෝග සහ බෝ නොවන රෝග පැතිරීම මෙරට ප්‍රධානතම සෞඛ්‍ය ගැටලු කීපයකි.

මෑතකාලීන රෝහල්ගත කිරීම් බහුලව සිදුවන්නේ හදිසි අනතුරු, ශ්වසන රෝග, රක්තහීනතාව නිසා බවත් මරණයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ හෘදාසන්න රක්තහීනතාව බව වාර්තා වී තිබේ. සමාජීය භීතිකාව සහ සම්පත් හිඟකම නිසා මෙ රට මානසික වෛද්‍ය උපස්ථාන සේවා වෙත රජයේ ප්‍රමාණවත් අවධානය යොමු නොවේ. සේවා ස්ථාන සහ වෘත්තීන් ආශ්‍රිත රෝගාබාධ කෙරෙහි ද මෙ රට සෞඛ්‍ය ප්‍රතිපත්තියේ අවධානය ගිලිහී ගොස් ඇති බව පෙනෙයි.

රටේ සෞඛ්‍ය සේවා දර්ශකවල පවා පළාත්බද විශාල විසමතාවක් පෙන්වයි. ඇතැම් පළාත් වෙත සම්පත් බෙදීයෑම ඉතා අඩු මට්ටමක පවතී. මෙ රට සෞඛ්‍ය සේවයේ ගුණාත්මක බව වැඩිදියුණු කර පවත්වාගෙන යාමේ දී එහි ප්‍රමිතිය රැකගැනීම පමණක් නොව, සෑම ප්‍රදේශයක ම මහජනතාවට විසමතාවයකින් තොරව හෝ අවම විසමතාවකින් යුතුව හෝ සෞඛ්‍ය සේවා

ලබාගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම අප ඉදිරියේ ඇති අභියෝගයකි.

මානව සෞඛ්‍ය සුවතාව ප්‍රකාශ කෙරෙන තවත් වැදගත් දරශකයක් වන්නේ පාරිසරික පවිත්‍රතාවයි. එක් අතෙකින් එය රැකගැනීම ද, අනෙක් අතින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම ද අනාගත සෞඛ්‍ය සේවා සැලසුම් සැකැසීමේ දී සැළකිල්ලට ගත යුතු ය.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන සෞඛ්‍ය ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ,

- **සියලු ප්‍රදේශවලට සම්පත් විභජනය සහතික කිරීම**
- **සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග වළක්වාගැනීමේ සේවා ප්‍රමුඛතාකරණය**
- **දුෂ්කර ප්‍රදේශවල ප්‍රතිකාරමය සේවා වැඩි දියුණුකිරීම**
- **සෞඛ්‍ය සම්පන්න දියණියක්, සෞඛ්‍ය සම්පන්න මවක් තුළින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ සංකල්පය**
- **ක්ෂේත්‍ර කීපයකට පොදු අංශ සම්බන්ධීකරණය**
- **ජනගහනයේ වෙනස්වන ප්‍රවණතාවලට සූදානමින් සිටීම**
- **සාකල්‍යමය මෙහෙයුම් සැලසුම්කරණය**

ඉදිරිමග

1. සියලු ප්‍රදේශවලට සම්පත් විභජනය සහතික කිරීම

සෞඛ්‍ය සේවයේ මානව, මූල්‍ය සහ භෞතික සම්පත් ආදිය සඳහා අයවැය ප්‍රතිපාදන විභජනය කිරීම තවත් වැඩිකිරීම ආණ්ඩුවේ වගකීමයි. 2021 දී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය සඳහා (රජයේ සහ පෞද්ගලික දෙ අංශයේ ම) වැය කළ සමස්ත වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.8 ක් විය. පහළ

මධ්‍යම ආදායමක් පවතින රටවල වියදම වන සියයට 4.1 අගයට සාපේක්ෂව පහළ අගයක් වුවත් දකුණු ආසියානු රටවල මධ්‍යන වියදම වන සියයට 3.5 ට සාපේක්ෂව මෙය ඉහළ මට්ටමකි. පවත්නා සම්පත් පවා රට පුරා සමසේ බෙදී නොයන බැවින් සම්පත් හිඟ පළාත්වලට වැඩි මුදලක් විභජනය කළ යුතු ය.

2. සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග වළක්වාගැනීමේ සේවා ප්‍රමුඛතාකරණය

බෝවන සහ බෝ නොවන රෝග වැළඳීමෙන් ගිලන්වන සහ මියයන පිරිස අවම කරගැනීමෙහි ලා රජය විසින් සෞඛ්‍ය ප්‍රවර්ධන සහ රෝග වළක්වාගැනීම් සේවා බලගැන්විය යුතු ය. ඩෙංගු සහ කෝවිඩ් 19 වැනි බෝ වන රෝග පැවැතීම සහ වර්ධනය වීම නිසා සෞඛ්‍ය සේවා සැපැයීම ඉදිරියේ දී තවත් අභියෝගකාරී විය හැකි ය. ඒවා වළක්වාගැනීමට හා පාලනය කිරීමට වැඩි අවධානයක් යොමු විය යුතු ය. තව ද, හෘද රෝග සහ දියවැඩියාව වැනි බෝ නොවන රෝග විසින් ද සෞඛ්‍ය සේවාවට බලවත් අභියෝගයක් එල්ල කර තිබේ. සෞඛ්‍ය ප්‍රවර්ධන සහ රෝග වළක්වාගැනීමේ පියවර තුළින් පිළියම් සෙවිය යුතු එවැනි බෝ නොවන රෝගවලට අදාළ අවදානම් සාධක ද පවතී.

3. දුෂ්කර ප්‍රදේශවල ප්‍රතිකාරමය සේවා වැඩි දියුණුකිරීම

පිට පළාත්වලට වැඩි අවධානයක් යොමු කරමින් ප්‍රතිකාර සේවා දියුණු කිරීමට රජය විසින් පියවර ගත යුතු ය. උතුරු, ඌව සහ නැගෙනහිර පළාත්වලට සාපේක්ෂව බස්නාහිර පළාත සහ තදාසන්න නගර කීපයක පමණක් හොඳ ප්‍රතිකාර සේවා දක්නට ලැබේ. එබැවින් එවැනි දුෂ්කර ප්‍රදේශවල ප්‍රතිකාර සේවා වඩාත් දියුණු මට්ටමකට පත්කිරීමට මෙයින් යෝජනා කෙරෙයි.

4. සෞඛ්‍ය සම්පන්න දියණියක්, සෞඛ්‍ය සම්පන්න මවක් තුළින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීමේ සංකල්පය

ළමා මන්දපෝෂණය තුරන්කිරීමට, දියණියන්ගේ සෞඛ්‍ය ගැටලු සහ මාතෘ සෞඛ්‍ය ගැටලුවල දී දුෂ්කර ප්‍රදේශ කෙරෙහි

වැඩි අවධානයක් යොදමින් ඒවා විසඳීමට හදිසි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම කඩිනමින් කළ යුතු ය. රක්තහීනතාව, මන්දපෝෂණය සහ අනෙකුත් මාතෘ සෞඛ්‍ය ගැටලු කෙරෙහි ප්‍රමුඛතාව ලබා දී කඩිනමින් ක්‍රියාත්මක වුවහොත් එක් අතෙකින් මාතෘ මරණ තවත් අඩු කරගැනීමටත් අනෙක් අතින් ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව තහවුරු කරගැනීමටත් උපකාරී වනු ඇත. මෙම ගැටලු මුලින් ම හඳුනාගෙන ඒවා විසැඳීමට ප්‍රවිෂ්ඨ විය යුත්තේ දැරිවියන්ගේ බාල වියේ දී පටන් ය.

5. ක්ෂේත්‍ර කීපයකට පොදු අංශ සම්බන්ධීකරණය

පෝෂණය, මානසික සෞඛ්‍ය, පාරිසරික සෞඛ්‍ය වැනි පොදු අංශ හඳුනාගෙන ඒකාබද්ධ ජාතික ප්‍රතිපත්ති සැකසුවහොත් එම ගැටලු විසඳීමෙහි ලා සාමූහික ප්‍රයත්නයක් දැරිය හැකි ය. උදාහරණයක් වශයෙන්, පෝෂණය යනු සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල අංශයක් වුවත් එය කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ද එක ලෙසින් අදාළ වෙයි. එයට අමතරව, මෙය ආහාර බෙදාහැරීම වැනි වෙනත් අංශවලට ද සම්බන්ධ ය. සෞඛ්‍ය ක්ෂේත්‍රයට බාහිර වෙනත් අංශය සමග බැඳී තිබෙන වගකීම් එවැනි විවිධ ආයතන සමග සම්බන්ධීකරණයෙන් විසඳාගත යුතු ය.

6. ජනගහනයේ වෙනස්වන ප්‍රවණතාවලට සූදානමින් සිටීම

ශ්‍රී ලංකාවේ ජනගහනය වියපත්වෙමින් පවතින නිසා වැඩිහිටි ජන සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. එහෙයින් ඉදිරියේ දී වැඩිහිටි උපස්ථානය උදෙසා වැඩියෙන් සම්පත් හා සේවා විභජනය කළ යුතු වන අතර ඒ සඳහා රජය සූදානම් විය යුතු ය. ජනගහනය වියපත්වීමේ හේතුව නිසා ම රෝග වැළැඳීමේ ප්‍රවනතාව වෙනස් වීමටත් එය රටට බරක් වීමටත් හේතු විය හැකිය. එ නිසා ඉදිරියේ දී ඇතිවන තත්ත්වයන්ට මුහුණදීම සඳහා කුමන සම්පත්, කුසලතා හා තාක්ෂණය අවශ්‍ය වන්නේදැයි සළකා අංග සම්පූර්ණ සැලසුම් සකසා තිබීම අත්‍යවශ්‍ය වේ.

7. සාකල්‍යමය මෙහෙයුම් සැලසුම්කරණය

සෞඛ්‍ය අංශයේ වෘත්තිකයන් සහ පාදක කාලයේ ආශ්‍රිත පාර්ශ්ව සම්බන්ධ කරගනිමින් ඉහත සඳහන් කරන ලද යෝජනා පාදක කර ගනිමින් සාකල්‍යමය මෙහෙයුම් සැලසුමක් සැකසිය යුතු ය. එවැනි මෙහෙයුම් සැලසුමක් සැකසීමේ දී, ඊට පැහැදිලි පරමාර්ථ, නිමැවුම්, ප්‍රතිඵල සහ ලැබෙන බලපෑමේ තක්සේරුවක් කෙරෙහි මනා අවබෝධයකින් යුතුව යොමු විය යුතු ය.

කාන්තා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකාවේ තත්කාලීන අර්බුදය තුළ කාන්තා ගැටලු ජයගැනීම සහ දිගුකාලීන ක්‍රියාමාර්ග

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික පසුබෑම විසින් සමස්ත සමාජය ම කම්පාවට පත් කර තිබේ. මෙම අර්බුදය ඉතාමත් තීව්‍ර ආකාරයෙන් කාන්තාවන්ට බලපාන බව ද පැහැදිළි ය. දරිද්‍රතාව සහ අර්බුදයට හැඩගැසීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග යන දෙ අංශයෙන් ම මෙම බලපෑම තවත් උග්‍රවිය හැකි අතර, ස්ත්‍රී - පුරුෂ අසමානතා මත පදනම් වූ වෙනස්කම් යළිත් ඉස්මතු විය හැකි ය. විධිමත්/අවිධිමත් ක්ෂේත්‍රවල රැකියා, ආදායම, සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය මත පදනම්ව කාන්තාවන්ට වෙනස්කම් සහ බලපෑම් ඇති වන බව ද පැහැදිළි ය. පවුල් සහ ප්‍රජාවන් කෙරෙහි පවතින ආතතියේ ප්‍රතිඵලයක් ලෙස අර්බුද කාලවල දී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ද ඉහළ ගොස් ඇත.

අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණදීමේ යාන්ත්‍රණ සහ විශේෂයෙන් අඩු ආදායම් ලබන කාන්තාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව හඳුනාගැනීම වැදගත් වේ. නමුත් ආර්ථික හා සමාජීය අර්බුදවලට මුහුණදීමට ඔවුන්ට ඇති හැකියාව පිළිබඳව "ඇගැයීම්" කතා කිීම හෝ ඒ පිළිබඳව ඕනෑවට වඩා ශුභවාදී ඇසකින් බැලීම හෝ සුදුසු නැත. විශේෂයෙන් ම, ආර්ථිකයේ පැවැත්ම සහ එහි

ප්‍රකෘතිය සඳහා කාන්තාවන්ගේ දායකත්වය මෙන් ම අනාගත සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ දී ඔවුන්ගේ තීරණාත්මක කාර්යභාරය හඳුනාගෙන ඒ සඳහා සහාය දැක්විය යුතු ය.

ශ්‍රී ලංකාවේ ඇඟලුම් අංශය ජාතික දළ දේශීය නිෂ්පාදිතයට සියයට 6 කින් දායක වෙයි. එම අංශයේ පවතින සෘජු රැකියා 350,000 ක් සහ වක්‍ර රැකියා 700,000 න් බහුතරයක් නියෝජනය කරනු ලබන්නේ කාන්තාවන් විසිනි. ඒ හා සමානව, රටේ විදේශ විනිමය ඉපැයීමට දෙවන විශාලතම දායක වන සංක්‍රමණික සේවකයින් අතරින් සියයට 50 කට වැඩි පිරිසක් කාන්තාවන් වේ. ඔවුන් විසින් ප්‍රේෂණ ඔස්සේ ආර්ථිකයට ලබාදෙන දායකත්වය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8 කි. මෙවැනි බරපතල අර්බුදකාරී වාතාවරණයක් තුළ පවා ආර්ථිකයට කාන්තාවන්ගෙන් දැවැන්ත දායකත්වයක් ලැබුණ ද ඒ පිළිබඳ ලැබෙන්නේ මඳ පිළිගැනීමකි.

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ අඩු සහභාගීත්වය පිළිබඳව 2020 වසරේ දී ලෝක බැංකුව විසින් ඉදිරිපත් කර තිබෙන ඇගැයීම තුළින් ශ්‍රම වෙළෙඳපොළේ ස්ත්‍රී-පුරුෂභාවය මත ඇති වී තිබෙන හිඩැස් පැහැදිළි කෙරෙන ප්‍රධාන සාධක තුනක් දක්වා තිබේ.

- **ගෘහස්ථ කටයුතු සහ වගකීම් වැඩි වශයෙන් භාර වී ඇත්තේ කාන්තාවන්ට වන බැවින් ඔවුන්ගේ කාලය සහ සංචලනය සීමා වී තිබේ.**
- **මානව ප්‍රාග්ධන නො ගැළපීම, එනම්, රැකියා වෙළෙඳපොළ ඉල්ලා සිටින කුසලතා කාන්තාවන් විසින් සම්පූර්ණ කරගෙන නො සිටීම**
- **රැකියා සෙවීම, බඳවාගැනීම් සහ උසස්වීම් ක්‍රියාවලීන්හි පවතින ස්ත්‍රී - පුරුෂභාවය මත පදනම් වූ වෙනස්කම්**

ලෝක බැංකු නිරීක්ෂණයෙහි දක්වා නැතත් කාන්තාවන්ට ශ්‍රම බලකායට ඇතුළුවීමට බාධා කරන සමාජයීය සම්මතවලට අමතරව පවුලේ බලපෑම් හේතුවෙන් රැකියාවෙන් ඉවත්ව යෑමට සිදුවන කාන්තාවෝ පවා සිටිති.

ප්‍රඥප්තිය

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන කාන්ත ප්‍රඥප්තිය කොටස් තුනකින් සමන්විත වෙයි.

- **ආර්ථික දුෂ්කරතා විසැඳීම**
- **රැකවරණ ආර්ථිකය කළමනාකරණය**
- **සමාජ ආරක්ෂණ දැල ශක්තිමත් කිරීම.**

1. ආර්ථික දුෂ්කරතා විසැඳීම

- ආර්ථික කටයුතුවල කාන්තා දායකත්වය (විශේෂයෙන් ම, ගෘහස්ථ කාන්තා දායකත්වය) ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික අංශය පදනම් කරගත් නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- සෞඛ්‍ය වෘත්තිකයන් සහ මාධ්‍ය සම්බන්ධ කරගෙන විකල්ප ආහාර සැකැසීමේ ක්‍රම ප්‍රවර්ධනයෙන් ආහාර පිසීම සඳහා කාන්තාවන් විසින් වැය කරනු ලබන කාලය අඩු කිරීම
- ගොවියන්ට සහ කුඩා ඉඩම්හිමියන්ට ණය පහසුකම් ලබාදීමෙන් සහ සැපයුම් දාම සමග ඔවුන් සම්බන්ධ කිරීමෙන් එම අංශයේ නිෂ්පාදන කටයුතු සඳහා කාන්තා දායකත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය ශක්තිමත් කිරීමෙන් කාන්තාවන්ගේ සහ කුටුම්භවල පවතින ණයගැතිභාවයට විසඳුම් ලබාදිය යුතු ය
- කාන්තාවන් සඳහා වන අවම වැටුප් මට්ටම් සහතික කිරීම සඳහා තාවකාලික රජයේ රැකියා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

- විදේශ රැකියා සඳහා කාන්තාවන් පුහුණුකිරීම සඳහා දීප ව්‍යාප්ත වෘත්තීය පුහුණු ආයතනික ව්‍යුහය යොදාගැනීමත් ඒ අංශයේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ඇතිකිරීමත් සිදු කළ යුතු ය.
- සංක්‍රමණික කාන්තා ශ්‍රමිකයින්ගේ ස්ථානගත කිරීම සහ සේවා කාලය තුළ දී ඔවුන්ට අවශ්‍ය වන නීති උපදෙස් සහ ආරක්ෂාව සැළැසීම.
- සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා රාජ්‍ය සහ පෞද්ගලික බැංකු සම්බන්ධ කර ඩිජිටල්කෘත, මිල අඩු සහ පහසු ප්‍රේෂණ ක්‍රම හඳුන්වාදීම.

2. රැකවරණ ආර්ථිකය කළමනාකරණය

සැබෑ වැටුප් පහත වැටෙන විට භාණ්ඩ හා සේවා සඳහා වන වියදම් සීමා කිරීමට කුටුම්භයන්ට බල කෙරෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් විසින් ඉටු කරනු ලබන රැකවරණ කාර්යයන්ගේ බර තවදුරටත් වැඩිවනු ඇත. ආර්ථික පීඩනය, සමාජ නොසන්සුන්තාව සහ බලාපොරොත්තු සුන්වීම සංකලනය තුළින් ගෘහස්ථ හිංසනය පැතිරීම තව දුරටත් උග්‍ර කරන අතර පොදු ස්ථානවල කාන්තා ආරක්ෂාවට බලපෑම් ඇතිවිය හැක. රැකවරණ ආර්ථිකය කළමනාකරණයේ යෙදෙන කාන්තාවන්ට සහායවීමේ දී අත්‍යවශ්‍ය සමාජ සේවා සඳහා ආදායම් ඉහළ නැංවීම වැදගත් වන අතර එ මඟින් ඔවුන්ගේ ගුණාත්මකභාවය සහ ආවරණය අවදානමට ලක් නොවේ.

- වැටුප් ගෙවීම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, පොදු ප්‍රවාහනය, නිවාස, සහ ආහාර වැනි භාණ්ඩ සහ සේවා බෙදාහැරීම නිසි පරිදි සිදු කිරීමෙන් කාන්තාවන්ගේ රැකවරණ කාර්යය පහසු කිරීම.
- ප්‍රාදේශීය වශයෙන් රාජ්‍ය සහ පුද්ගලික වැඩිහිටි සත්කාරක ආයතන පිහිටුවීමෙන් කාන්තාවන් මත පැටවී තිබෙන වැඩිහිටි සත්කාරක බර අඩුකිරීම.

- ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ගලවාගත් කාන්තාවන් හට ගුණාත්මක බවින් ඉහළ රැකවරණ ස්ථාන සැපැයීම.

3. සමාජ ආරක්ෂණ දැල් ශක්තිමත් කිරීම

සාර්ව ආර්ථික ගැලැපීම් නිසා සිදුවන බිඳවැටීම්වලින් හානි සිදුවීම වැළැක්වීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් අවශ්‍ය වේ. පුළුල් ආවරණයක්, වැඩි සම්පත්, වැඩි දියුණු කළ ඉලක්ක සහ එක් පවුලකට හිමි ප්‍රතිලාභ ප්‍රමාණය වැඩිකිරීමෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපැයිය හැකි ය. සමාජ ආරක්ෂණ දැල්වලට සාර්ව ආර්ථික ස්ථායීකාරකයක් ලෙසින් ද ක්‍රියා කරන බැවින් ඒ තුළින් දරිද්‍රතාව සහ සමාජ පිටමංකිරීම් වඩා හොඳින් ජයගැනීමේ හැකියාව මිනිසුන්ට ලැබෙයි.

ශ්‍රී ලංකාව තුළ සමාජ ආරක්ෂණ ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක වන නමුත් වත්මන් අර්බුදයේ බලපෑම්වලට මුහුණදීම සඳහා ඒවාට බොහෝ ප්‍රතිසංස්කරණ හඳුන්වා දිය යුතුව තිබේ. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාවේ පොදු පාසල් පද්ධතිය විශ්වීය පාසල් දිවා ආහාර වැඩසටහන සඳහා යොදා ගත හැකි ය.

පවත්නා සමාජ ආරක්ෂණ දැල් ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග මෙයින් යෝජනා කෙරෙයි.

- මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා සායන පද්ධති භාවිතා කරමින් කාන්තාවන්ට සෘජුව ම මුදල් ලබාදීම.
- වැඩ කරන වයස්වල ජනගහනය සඳහා තාවකාලික මූලික ආදායමක් සපයන සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
- ආයතනික, නෛතික, මූල්‍ය, පරිපාලන සහ ඩිජිටල් අංශ ආමන්ත්‍රණය කෙරෙන ස්ථාවර සමාජ ආරක්ෂණ ව්‍යුහයක් සඳහා ආයෝජනය කිරීම.
- "නව දුප්පතුන්" විමර්ශනය කොට ඒ අනුව ජාතික දරිද්‍රතා රේඛාව සංශෝධනය කිරීම.

- කෙටි කාලීන ආහාර සහනාධාර වැඩසටහනක් ආරම්භ කිරීම.

ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් සහතික කිරීම සඳහා දිගුකාලීන පියවර

1. දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම්

- ශ්‍රී ලංකාවේ දේශපාලන සහ පොදු ජීවිතය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම්කිරීම් ඉවත්කිරීම සහ ස්ත්‍රීන් පුරුෂයන් හා සමානව තැබීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහතික කිරීම.
- වෘත්තීය සමිති සහ දේශපාලන ක්‍රියාකාරකම්වල නිරත වන සංවිධාන සහ සංගම්වල කාන්තාවන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
- පුරවැසිභාවය ලබාගැනීම, වෙනස්කිරීම හෝ රඳවාගැනීම සඳහා පිරිමින්ට ඇති අයිතියට සමාන හිමිකමක් කාන්තාවන්ට ද ලබාදීම.
- පුද්ගල නිදහස, ආරක්ෂාව සහ නීතියේ සමාන ආරක්ෂාවට ඇති අයිතිය ඇතුළුව කාන්තාවන්ගේ ව්‍යවස්ථාපිතව සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය සියලු ම ක්‍රියාමාර්ග අනුග මනය කිරීම.
- සිවිල් කටයුතුවල දී පිරිමින්ට සමාන නෛතික හැකියාවක් සහ එම හැකියාව ක්‍රියාත්මක කිරීමට සමාන අවස්ථා කාන්තාවන්ට ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

2. පවුල තුළ අයිතිවාසිකම්

- විශේෂයෙන් ම විවාහය සහ පවුල් සබඳතා සම්බන්ධ සියලු කාරණාවල දී කාන්තාවන්ට වෙනස් කොට සැළකීම වැළැක්වීම සඳහා සියලු සුදුසු පියවර ගැනීම.

3. අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ඇති අයිතිය

- පෙර පාසල්, ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික, තාක්ෂණික, වෘත්තීය සහ වෘත්තීය අධ්‍යාපනය තුළ පිරිමින්ට සහ කාන්තාවන්ට සම අවස්ථා සඳහා වන ප්‍රවේශය සහතිකකිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම.
- ඉගැන්වීම, අධ්‍යාපන ග්‍රන්ථ සංශෝධනය, සකස්කිරීම සහ ලිවීම හරහා සියලු ආකාරයේ අධ්‍යාපන අන්තර්ගත ස්ත්‍රී-පුරුෂභාවයේ භූමිකාව පිළිබඳ ඒකාකෘතික සංකල්ප ඉවත්කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම.
- කලින් පාසල් හැර යන අය අඩුකිරීම සහතික කිරීම සඳහා සුදුසු සියලු ක්‍රියාමාර්ග අනුගමනය සහ අඩු වයසින් පාසල් හැර ගිය ගැහැණු ළමයින් සහ කාන්තාවන් සඳහා විකල්ප අධ්‍යාපන වැඩසටහන් හඳුන්වාදීම.

4. ආර්ථික ක්‍රියාකාරකම් සහ ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය

- ආර්ථිකයේ විධිමත් සහ අවිධිමත් අංශවල සිටින සියලු ම කාන්තාවන් හට පිරිමින් හා සමානව සියලු හිමිකම් භුක්ති විඳීමට ඇති අයිතිය සහතික කිරීම
- සමාන වටිනාකමක් ඇති කාර්යය සම්බන්ධයෙන් සමාන ප්‍රතිලාභ, සමාන වේතන, සහ සමාන සැළැකීමක් ලබාගැනීමට ඇති අයිතිය සහතික කිරීම
- ළමා රැකවරණය සහ පවුලේ වගකීම් ඉටුකිරීම හෝ නීතියෙන් පිළිගෙන ඇති වෙනත් හේතූන් සඳහා ලබා ගත් නිවාඩු කාලයකට පසුව නැවත සේවයට ඇතුළුවීමට ඇති අයිතිය සහතික කිරීම
- අවශ්‍ය මූලික පහසුකම් අනිවාර්යයෙන් සැපැයෙන සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක වැඩ කිරීමට ඇති හිමිකම සහතික කිරීම

- "ගෘහ මූලිකයා" යන යෙදුම නැවත නිර්වචනය කර, කුටුම්බයකට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය සළකා ඔවුන්ට සියලු ම රාජ්‍ය සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධවීමේ සහ ප්‍රතිලාභ සමව භුක්තිවිඳීමේ සහ ඒ ආශ්‍රිත වගකීම් පිරිමින් හා සමව දැරීම සඳහා කාන්තාවන්ට ඇති අයිතිය සහතික කිරීම
- විවාහය හෝ මාතෘත්වය පදනම් කරගෙන කාන්තාවන්ට වෙනස් කොට සැළැකීම වැළැක්වීම සඳහා සහ ඔවුන්ගේ ඵලදායී වැඩකිරීමේ අයිතිය සහතික කිරීම සඳහා සුදුසු පියවර ගැනීමට රජය විසින් කටයුතු කළ යුත්තේ ය.

5. සෞඛ්‍ය හා පෝෂණය සඳහා ඇති අයිතිය

- සෞඛ්‍ය සේවා තොරතුරු වෙත ප්‍රවේශවීම සහ ප්‍රවර්ධනය සඳහා ස්ත්‍රී - පුරුෂ දෙපාර්ශවයට ම සමාන ප්‍රවේශයක් සහතික කිරීම
- ගර්භණීභාවය, ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසව කාලය සම්බන්ධයෙන් ඉහළම ප්‍රමිතීන්වලින්යුත් ගුණාත්මක සෞඛ්‍ය සේවා සැපයීම සහතික කිරීම,
- කාන්තාවන්ට තමන්ගේ පවුල් සැලසුම් කිරීමට ඇති අයිතිය, තොරතුරු සඳහා සමාන ප්‍රවේශය, උපදේශනය සහ පවුල් සැලසුම්කරණයේ සේවා සහතික කිරීම,

6. සමාජ වෙනස්කම්වලින් ආරක්ෂාවීමට ඇති අයිතිය

- ■ පිරිමි සහ ගැහැණුන් සඳහා ස්ත්‍රී පුරුෂභාවය සහ ඒකාකෘතික භූමිකාවන්හි පහත්කම හෝ උසස් බව පිළිබඳ අදහස මත පදනම් වූ අගතීන් සහ අනෙකුත් සියලු ම භාවිතයන් තුරන්කිරීමේ අරමුණින් සාධනීය සමාජ හා සංස්කෘතික ආකල්ප ප්‍රවර්ධනය කිරීම.
- සියලුම මාධ්‍ය යොදාගනිමින් කාන්තාවන් පිළිබඳ ඍණාත්මක ප්‍රතිරූප නිරූපණය වැළැක්වීම.

- කාන්තාවන් කිසිදු ආකාරයක සූරාකෑමක්, ජාවාරමක් සඳහා යොදාගැනීම වැළැක්වීම.
- වැන්දඹුවන්, දික්කසාදවූවන්, තනි මාපියන්, තනිකඩ කාන්තාවන් සහ ඕනෑ ම අවදානමට ලක්විය හැකි කාන්තා කණ්ඩායම් කෙරෙහි ඇති සෘණාත්මක සමාජ ආකල්ප සහ ආර්ථික වෙනස්කම් ඉවත් කිරීමට කටයුතු කිරීම.

7. ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාවීමේ අයිතිය

- සමාජයේ, රැකියා ස්ථානයේ, පවුල තුළ මෙන් ම අත්අඩංගුවේ පසුවන කාන්තාවන්ට එරෙහි හිංසන ක්‍රියා සිදුකිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු ම ක්‍රියාමාර්ග ගැනීම.
- ස්ත්‍රී දූෂණ, ව්‍යභිචාරය, ලිංගික හිරිහැර, සහ කායික හා මානසික හිරිහැර වැනි අපයෝජන, වධහිංසා පැමිණවීම සහ කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැළැකීම් වැළැක්වීමට ක්‍රියාකිරීම.

හරිත ආර්ථිකය

හැඳින්වීම

ඉහළ ජන සනත්වය සහ නිවාස ඉදිකිරීම සඳහා සිදු කෙරෙන අකාර්යක්ෂම භාවිතය නිසා ශ්‍රී ලංකාවේ වගා කළ හැකි බිම් ප්‍රමාණය ඉතාමත් අඩු මට්ටමක පවතී. උක්ත හේතු නිසා ම, එම බිම් ප්‍රමාණය තවදුරටත් අඩුවෙමින් පවතියි.

එහෙයින්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් භාවිතය වඩාත් කාර්යක්ෂම කළ යුතු බවත්, තාක්ෂණික සහ ප්‍රාග්ධන සූක්ෂම ගොවිතැන් ක්‍රම ඔස්සේ අස්වැන්න සහ ඵලදායිතාව ඉහළ නැංවිය යුතු බවත් මෙයින් අවධාරණය කෙරෙයි.

තව ද, ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහ ආහාර ස්වෛරීත්වය තහවුරු කරගැනීම වෙනුවෙන් කටයුතු කිරීම දිගුකාලීන කෘෂිකර්ම සංවර්ධන සැලැසුමක අත්‍යවශ්‍ය අංග විය යුතු බව ද මෙයින් අවධාරණය කෙරෙයි. ගෝලීය ආහාර මිල ගණන් ඉහළ යෑමෙන් ඇතිවන බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාවක් ඒ තුළින් වර්ධනය කළ හැකි ය.

ඉහළ ජන සනත්වය සහ නිවාස ඉදිකිරීම සඳහා සිදු කෙරෙන අකාර්යක්ෂම භාවිතය නිසා ශ්‍රී ලංකාවේ වගා කළ හැකි භූමිය ඉතා කුඩා ඉඩම් කොටස්වලට වෙන් වී තිබේ. කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගන්නා භූමියෙන් සියයට 45 ක් පමණ සමන්විත වන්නේ අක්කර කාලකටත් (එනම්, හෙක්ටයාර

0.1 කටත්) අඩු ඉඩම්වලිනි. තව ද, කෘෂි නිෂ්පාදන ඒකකවලින් සියයට 90 කට අධික ප්‍රමාණයක් සමන්විත වන්නේ අක්කර 5 කට (එනම්, හෙක්ටයාර 2 කට) අඩු ඉඩම්වලිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනයෙන් සියයට 80 ක් පමණ සිදු කිරීමේ වගකීම පැවැරී ඇත්තේ කුඩා ඉඩම් හිමියන් වෙත ය. සෘජුව ම ගොවිතැන් කටයුතුවල නිරත වී සිටින පිරිස රටේ ශ්‍රම බලකායෙන් සියයට 27 ක් පමණ (එනම්, ලක්ෂ 20 ක් පමණ) වුව ද, ජනගහනයෙන් සියයට 70 ක් පමණ පිරිසක් සෘජුව හෝ වක්‍රව හෝ කෘෂිකර්මාන්තයෙන් යැපෙයි.

කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ ආහාර අවශ්‍යතා සපුරාලීමට මෙම නිෂ්පාදන කාර්යය ප්‍රමාණවත් වී නැත. තිරිඟු, කරවල, කිරිපිටි ඇතුළු විවිධ ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා ශ්‍රී ලංකාව විසින් වාර්ෂිකව වැය කරනු ලබන මුදල එක්සත් ජනපද ඩොලර් බිලියන දෙකකට අධික වෙයි.

කෘෂිකර්මය කාර්මිකකරණයේ නාමයෙන් පාංශු ඛාදනයට සහ ජල සම්පත් දූෂණය හේතුවන ඒක භෝග වගාවට හෝ වානිජ භෝග වගාවට ශ්‍රී ලංකාවේ ඉඩම් කැප කළ යුතු නැත. දීර්ඝ ඉතිහාසයක් තුළ වර්ධනය වී තිබෙන සාම්ප්‍රදායික දැනුම සමඟ නවීන විද්‍යාත්මක දැනුම ඒකාබද්ධ කර උක්ත ගැටලුවලට විසැඳුම් හඳුනාගැනීමට අපි කැපැවිය යුතු වෙමු.

ඒ අනුව, සම්පාදනය කරනු ලැබූ අපගේ ඉදිරිමග කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ මූලික අරමුණු මේවා ය.

- **ධාන්‍ය නිෂ්පාදන අංශයේ ස්වයං-පෝෂණය සහතික කිරීම.**
- **ග්‍රාමීය අංශයේ කුටුම්බවල මිල දී ගැනීමේ හැකියාව ඉහළ නැංවීම.**
- **අඩු ආදායම් උපයන කුටුම්බ සඳහා ස්ථාවර සහ පහසු මිල ගණන්වලට පෝෂණය ආහාර සැපැයීම.**
- **අපනයනය වෙනුවෙන් විවිධාංගීකරණය කළ සහ අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය.**

- **කෘෂිකාර්මික නිෂ්පාදනයේ පාරිසරික තිරසාරත්වය සහතික කිරීම.**

ඉදිරිමග

1. ආයතනික ඒකාබද්ධතාව

විවිධ අමාත්‍යංශ, රාජ්‍ය දෙපාර්තමේන්තු, සහ නියෝජිතායතන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය බෙදී විසිරී ගොස් තිබේ. මෙම විෂයයට අයත් සියලු අංශ එක් අමාත්‍යංශයක් යටතට ගෙන ප්‍රතිපත්ති ඒකාග්‍රතාව තහවුරු කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. පුද්ගල ගොවිතැන, වැවිලි අංශය, සහ සත්ත්ව පාලනය යන අංශ අතර සහ - සම්බන්ධතා ප්‍රවර්ධනය වන අයුරින් ඒවා සංවිධානගත කළ යුතු ය. ඒ අනුව, විවිධ අංශ සහ ඒවායේ උප අංශ අතර සහපැවැත්ම තහවුරු වන අයුරින් ප්‍රතිපත්ති සම්පාදනයට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ලබාදෙනු ඇත.

2. කෘෂිකාර්මික බැංකුකරණය

ඉහළ පොලී අනුපාත සහ ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමේ ඉඩකඩ සීමාවීම කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි මූලික වශයෙන් බාධා කරයි. එහෙයින්, අඩු පොලී අනුපාත යටතේ මෙම අංශය සඳහා ණය පහසුකම් ලබාදෙන, රාජ්‍ය හිමිකාරීත්වය සහිත කෘෂිකාර්මික සංවර්ධන බැංකුවක් ස්ථාපිත කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

3. අතරමැදියන් පාලනය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වන ගොවිබිමේ මිල, තොග මිල, සහ සිල්ලර මිල අතර පවතින විශාල වෙනස නිර්මාණය කරනු ලබන්නේ පෞද්ගලික වෙළෙන්දන්ගේ සහ අතරමැදියන්ගේ පරපෝෂිත භූමිකාව විසිනි. එහෙයින් ඔවුනට ඇති ඒකාධිකාරිය බිඳහෙළීම සඳහා ගොවියන්ගේ සිට පාරිභෝගිකයා දක්වා කෘෂි නිෂ්පාදන බෙදාහැරිය හැකි රාජ්‍ය සහ

සමුපකාර යාන්ත්‍රණ ශක්තිමත් කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

4. මිල ස්ථායිකරණය

කෘෂිකාර්මික නිෂ්පාදනවල පවතින චක්‍රීය ස්වභාවය නිසා ඒවායේ මිල ගණන් නිරන්තරයෙන් උච්චාවචනය වන අතර එහි වාසිය ලබාගන්නා පෞද්ගලික වෙළෙන්දෝ සමපේක්ෂණයට (අධික ලාභ ඉපැයිය හැකි අනුමානවලට) යොමුවෙති. එහෙයින් එම නිෂ්පාදනවල මිල ස්ථාවරව පවත්වා ගෙන යෑම සඳහා ඉහතින් යෝජනා කළ රාජ්‍ය සහ සමුපකාර බෙදාහැරීම් යාන්ත්‍රණය ඉවහල් විය හැකි බව සහතික ය. අස්වැන්න වැඩි කාලවල දී විශාල වශයෙන් මිල දී ගැනීම් කර අස්වැන්න අඩු කාලවල දී ඒවා බෙදාහැරීමෙන් මෙය සිදු කළ යුතු ය.

5. කාබනික කෘෂිකර්මාන්තය

කෘෂි රසායන භාවිතය නිසා ගොවියන්ගේ, ඒවා යොදා කරනු ලබන නිෂ්පාදන පාරිභෝජනය කරන්නන්ගේ සෞඛ්‍යයටත්, පොදුවේ පරිසරයටත් අහිතකර ලෙසින් බලපාන බව බහුතරයක් දෙනා පිළිගනිති. කාබනික කෘෂි නිෂ්පාදනවලට ගෝලීය වශයෙන් ද ඉතා ඉහළ ඉල්ලුමක් පවතියි. එහෙයින් විශේෂිත නිෂ්පාදන සහ ප්‍රදේශ ඉලක්ක කරගෙන කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සඳහා දිගුකාලීන සැලැස්මක් සකස් කළ යුතු බව ද මෙයින් යෝජනා කෙරෙයි. අවශ්‍ය කාබනික පොහොර සහ අනෙකුත් යෙදවුම් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රමෝපායයන් ද ඒ සැලසුමට ඇතුළත් කළ යුතු වෙයි. එ මෙන් ම, පසේ සහ ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය පුනර්ජීවනයෙන් පරිසරය තුළ තිබිය යුතු ඔරොත්තු දීමේ හැකියාව නැවත ගොඩනැංවීමේ පුළුල් ව්‍යායාමයක් ද මෙම සැලසුම හා ඒකාබද්ධ කළ යුතු වෙයි. පෝෂක චක්‍ර, පාංශු ප්‍රතිජනනය, සහ පලිබෝධකයන්ට එරෙහිව ස්වභාවික විලෝපකයන් හඳුන්වා දීම වැනි කාර්යයන් ද මෙම සැලැස්මට එක් කරගත යුතු ය. කෘෂිකර්මාන්තය ආශ්‍රිතව හැකිතාක් දුරට පූර්ණ පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා වාර්ෂික සහ

බහු-වාර්ෂික භෝග සමඟ පශු සම්පත් අංශය ද ජලජීවි අංශය ද ඒකාබද්ධ කළ යුතු ය.

6. තාක්ෂණ සූක්ෂම කෘෂිකර්මය

ශ්‍රම සූක්ෂම බව සහ නිසි පරිදි ක්‍රියාත්මක නොවන වෙළෙඳපොළ හේතුවෙන් පීඩාවට පත් වී තිබෙන නිසා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනය සහ බෙදාහැරීම් ඉතා ප්‍රාථමික මට්ටමක පවතියි. දැනට භාවිතා කෙරෙන ශිල්ප ක්‍රමවල සහ තාක්ෂණයේ නොදියුණු ස්වරූපය හේතුවෙන් තරුණයන් සහ ව්‍යවසායකයන් මෙම අංශය කෙරෙහි කැමැත්තක් දක්වන්නේ නැත. එහෙයින් මෙම අංශය ඉතා ඉක්මනින් නූතන යුගයට ප්‍රවේශ කරවීම සඳහා නවීන දෘඩාංග සහ මෘදුකාංග මත පදනම් වූ විසඳුම් හඳුන්වාදිය යුතු බව මෙයින් යෝජනා කරනු ලැබේ. කර්මාන්තවල ඵලදායිත්වය සහ නිදහස් ශ්‍රම දායකත්වය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්මය යාන්ත්‍රිකකරණය කිරීම අනිවාර්යය වෙයි. සිරස් ගොවිතැන සහ සාරවත් දියර මත වගාකිරීම වැනි ක්‍රමවලින් අස්වැන්නත් ඵලදායිතාවත් ඉහළ නැංවිය හැකිය. ඉල්ලුම සහ සැපයුම වැනි සාධක ගණනය කිරීම සඳහා විසල් දත්ත භාවිතයට එක් කළ හැකි ය. පෝෂ්‍යදායී, එමෙන් ම දේශගුණයට ඔරොත්තු දෙන දෙමුහුන් බීජ නිපදවීමට ජෛව තාක්ෂණය භාවිතා කළ හැකි ය. අපනයනය සඳහා විශේෂිත ඵලවළු නිෂ්පාදනය කිරීමට හරිතාගාර ව්‍යුහයන් ස්වයංක්‍රීය පද්ධති සමඟ ඒකාබද්ධ කළ හැකිය.

7. ගෙවතු වගාව

ශ්‍රී ලංකාවේ සැළැකිය යුතු භූමි ප්‍රමාණයක් ගෙවතු වගා සඳහා කැපකර තිබේ. පලා වර්ග, අල වර්ග, ඖෂධීය පැළෑටි, පලතුරු සහ විශේෂයෙන් ම පොල්, කොස්, දෙල් සහ ඇතැම් කුළුබඩු ඇතුළු ගෘහස්ථ භෝග සිය ගණනක ඵල නෙලාගත හැකි චිරස්ථායි පාරිසරික පද්ධති මෙම ගෙවතු විසින් නිර්මාණය කරනු ලබයි. කෙසේ වුව ද, මෙම ඉඩම්වල නිෂ්පාදන විභවයෙන් සම්පූර්ණ ප්‍රයෝජනයක් ලබාගෙන නොමැත. එහෙයින්, වැසි ජලය

රැස්කිරීම, පාංශු සංරක්ෂණය, ගෘහස්ථ කසල කළමනාකරණය, සහ ස්වභාවයට අනුගතවීම යන ක්‍රම පිළිබඳ නිසි අධ්‍යාපනයක් ලබාදෙමින් ගෙවතු වගාව ප්‍රවර්ධනය කළ යුතු බව මෙයින් යෝජනා කරනු ලැබේ. ආහාර සුරක්ෂිතතාව, පෝෂණය, සහ බාහිර වෙළෙඳපොළ කම්පන හමුවේ ආරක්ෂාවීම යන අවශ්‍යතා වර්ධනය කරගැනීමට මෙය උපකාරී වෙයි.

8. බෙදාහැරීම

ඇතැම් අධ්‍යයනයන්ට අනුව, ශ්‍රී ලංකාවේ පශ්චාත් අස්වනු හානිය සමස්ත කෘෂි නිෂ්පාදනයෙන් සියයට 40 කි. මෙම නාස්තිය වළක්වන්නේ නම්, නිෂ්පාදන ක්‍රියාදාමය තුළ මූලික වෙනස්කම් සිදු නො කර වුව ද, ඒවායේ ඵලදායි සැපයුම දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි කළ හැකි බවක් මෙයින් අදහස් කෙරෙයි. එහෙයින්, ශීතාගාර පහසුකම් සැපැයීම ද දුම්රිය සහ මාර්ග ඔස්සේ නිෂ්පාදන බෙදාහැරීම ද මගින් පසු-අස්වනු හානි අවම කරවීම සඳහා රජය මැදිහත් විය යුතු බව මෙයින් යෝජනා කරනු ලැබේ. අතරමැදියන් පාලනයට සහ මිල ස්ථාවර කිරීම සඳහා ඇති කරනු ලබන යාන්ත්‍රණ සහ ආයතන සමඟ මෙම ගබඩාකිරීමේ සහ බෙදාහැරීමේ ජාලය ද සම්බන්ධ කළ හැකි ය.

9. පිරිසැකැසුම් සහ අගය එකතුකිරීම

සාමාන්‍ය ඉල්ලුම ඉක්මවා ඉහළ අස්වැන්නක් ලැබෙන කාලවල දී, ඒවා යොදා ටින් කළ ආහාර, පෙර-ඇසුරුම් කළ ආහාර, සහ තෙල් වැනි දෑ නිෂ්පාදනය කළ හැකි ශක්තිමත් කෘෂි-සැකැසුම් කර්මාන්ත ශ්‍රී ලංකාවේ නොමැත. එ මෙන් ම, ගොවිතැන් අවාර කාලවල දී, ඉතිරිවෙන ශ්‍රමය උකහාගත හැකි ග්‍රාමීය කර්මාන්ත ද රට තුළ නොමැත. එහෙයින් මෙම අමතර අස්වැන්නෙන් සහ ශ්‍රමයෙන් වැඩගැනීම සඳහා ග්‍රාමීය කෘෂි යෙදවුම් කර්මාන්ත පද්ධතියක් ගොඩනැගීමට මෙයින් යෝජනා කරනු ලැබේ. ඒවා තුළින් සිදු කරනු නිෂ්පාදනවලට අගය එකතු කළ පෝෂණ ද්‍රව්‍ය, ඖෂධ, රසකැවිලි, ටින් කළ ආහාර, වියළි ආහාර, සහ සුගන්ධ තෙල් යනාදිය ඇතුළත් කළ හැකි ය.

අපනයනය ඉලක්ක කරගෙන පිරිසැකැසුම් කරනු ලබන සහ අගය එකතු කරනු ලබන නිෂ්පාදන පමණක් ප්‍රවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දිය යුතු බව ද මෙයින් යෝජනා කරනු ලැබේ.

10. කෘෂිකර්මාන්තය සඳහා ජාතික නවෝත්පාදන පද්ධතියක්

ශාස්ත්‍රඥයින්, පුද්ගලික අංශය, සමුපකාර, ගොවි සංගම්, නිෂ්පාදකයින්, බෙදාහරින්නන්, සහ තවත් විවිධාකාර බොහෝ පාර්ශ්වකරුවන් කෘෂිකර්ම අංශය කෙරෙහි උනන්දුවක් දක්වති. මෙම අංශයේ විවිධාංගීකරණයට සහ විශේෂිකරණයට උපකාරී වන සම්බන්ධතා වර්ධනය කරගැනීමේ සහ සහයෝගීතා ඇති කරගැනීමේ අවස්ථා මෙකී විවිධ පාර්ශ්වකරුවන්ට නොමැත. එහෙයින් රට පුරා විසිරී සිටින උක්ත පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය සහාය ඇතිව ජාතික නවෝත්පාදන පද්ධතියක් ඇති කළ යුතු බව මෙයින් යෝජනා කරනු ලැබේ. කෘෂිකාර්මික ස්වයං-පෝෂිත බව අත්පත් කරගැනීම වෙනුවෙන් යන ගමනේ දී උපරිම සම්පත් ප්‍රමාණයක් ඒ අරභයා යොදාගැනීම සඳහා විශ්වවිද්‍යාල කෘෂිකර්ම පීඨ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වැවිලි කර්මාන්තයට සම්බන්ධ විවිධ ආයතන, පෞද්ගලික සමාගම්, වාණිජ මණ්ඩල, රාජ්‍ය නොවන සංවිධාන, සමුපකාර, සහ හමුදාව යන මේ සියලු අංශ ඒකාබද්ධව සහ සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය වේ. කෘෂි අංශයේ ගතිකත්වය ඉහළ නැංවීමට සහ සැපයුම් දාම වෙතට නවෝත්පාදන හඳුන්වාදීමට මෙය උපකාරී වනු ඇත.

11. වී මෝල් කතිපයාධිකාරීත්වය මෙල්ලකිරීම

මහා පරිමාණ වී මෝල් හිමි පුද්ගලයන් අතලොස්සකගේ කතිපයාධිකාරීත්වයක් යටතේ ශ්‍රී ලංකාවේ දේශීය සහල් වෙළෙඳපොළ ක්‍රියාත්මක වෙයි. මෙම ව්‍යාපාරිකයන් අතලොස්ස විසින් වී මිල දී ගැනීමේ, ඒවා අඹරා සහල් බවට පත්කිරීමේ, සහ

ඒවා තොග වශයෙන් විකිණීමේ ආධිපත්‍යය තහවුරු කරගෙන තිබේ. ග්‍රාමීය අංශයේ ගොවීන්ට ණය දෙන්නන් වශයෙන් ද ඔවුහු ක්‍රියා කරති. වී මෝල් හිමිකාරීත්වයේ උපරිම වාසිය ලබාගෙන, ග්‍රාමීය කුඩා පරිමාණ වී නිෂ්පාදකයන් සහ නාගරික පාරිභෝජකයන් යන දෙපාර්ශ්වය ම පීඩාවට පත්කිරීමෙන් ලාභ ඉපැයීම ඔවුන්ගේ ප්‍රධානතම ආර්ථික කාර්යය බවට පත් වී තිබේ. එහෙයින් වී අලෙවි මණ්ඩලය වැනි රාජ්‍ය ආයතනවල වෙළෙඳපොළ සහභාගීත්වය පුළුල් කර, වී-සහල් මිල තීරණය කරන්නන් ලෙසින් කටයුතු කර උක්ත කතිපයාධිකාරීත්වය බිඳ දැමිය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. මෙයට අමතරව, වෙළෙඳපොළ තරගකාරීත්වය වැඩිකිරීම සඳහාත්, වී සහ සහල් නිෂ්පාදනයෙන් ලැබෙන ලාභයේ වාසිය ගම්මාන තුළ ම ඒකරාශිවීම සහතික කිරීම සඳහාත් සමුපකාර මට්ටමින් වී මෝල් ඇති කිරීමට ආයෝජන කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

12. වැවිලි කර්මාන්ත නවීකරණය

යටත්විජිත පාලන සමයේ හඳුන්වා දුන් අවස්ථාවේ සිට වැවිලි කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන අංගය බවට පත්විය. ලාභ ශ්‍රමය යොදාගනිමින් නිෂ්පාදනය කරනු ලබන ප්‍රාථමික වැවිලි නිෂ්පාදන අපනයනය මත පමණක් රඳා පැවැතීම මෙම අංශය අඩුවෙන් සංවර්ධනය වීමටත් කාර්මිකකරණය නොවීමටත් බල පෑ මූලික හේතුවක් වශයෙන් සැළැකිය හැකි ය. උච්චාවචනය වන ගෝලීය මිල ගණන් සහ අඩුවෙන ලාභය නිසා මෙම අංශයේ පැවැත්ම ඉහළ අවදානමකට ලක්වෙමින් පවතී. මේ හේතුව නිසා වැටුප් පිරිවැය අඩු කිරීමට හෝ පාරිසරික වශයෙන් හානිකර නමුත් අඩු ශ්‍රමයක් යොදවා ආදායම් ඉපැයිය හැකි කටුපොල් වැනි භෝග වගාකිරීමට වතුහිමියෝ පෙළැඹී සිටිති. එබැවින්, අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදනය සහ ඉහළ වටිනාකමක් ඇති භාණ්ඩ නිෂ්පාදනය අරමුණු කරගෙන වැවිලි කර්මාන්ත අංශය ප්‍රතිසංස්කරණය කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

■ පොල් වගාව

පවතින දේශීය සහ විදේශීය ඉල්ලුම සපුරාලනු වස් සත්ත්ව පාලනය සමඟ හෝ කුරුඳු, ඉඟුරු, කහ ආදී භෝග සමඟ ඒකාබද්ධ කර පොල් වගාවට යොමු කර ඇති භූමි ප්‍රමාණය වැඩි කළ යුතු බව මෙයින් යෝජනා කෙරේ. සත්ත්ව පාලනය යනු කාබනික පොහොර සපයන ප්‍රභවයක් බැවින් එය සහ පොල් වගාව ඒකාබද්ධ කිරීමෙන් අඩු පිරිවැයකින් පොල් අස්වැන්න ඉහළ නැංවිය හැකි ය.

■ තේ වගාව

විශාල වතුවල නිෂ්පාදනය වැඩි නොවී එක තැන රැඳී පැවැතීම, රසායනික පොහොර මත දැඩි ලෙස යැපීම, සහ පාංශු ඛාදනය හේතුවෙන් තේ නිෂ්පාදනය තුළින් ඉපැයිය හැකි ලාභය බරපතල ලෙසින් අඩුවීමේ ප්‍රවනතාවක් පවතින බව මෑත කාලීන නිරීක්ෂණවලින් පැහැදිළි වෙයි. පහත රට තේ වගාව සහ කුඩා වතු හිමියන්ගේ දායකත්වය නිසා මෙම අංශයේ තරගකාරීත්වය තවදුරටත් රැකී පවතියි. එහෙයින් පහතින් දැක්වෙන ක්‍රම තුනෙන් එක බැගින් යොදාගනිමින් පිරිහෙමින් පවතින තේ වගා අංශය ප්‍රතිසංස්කරණය කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි.

1. ඉහළ සේවා සපයන පාරිසරක සංචාරක ස්ථාන බවට පත්කිරීම.
2. ගංවතුර, නායයෑම් වැනි ස්වභාවික විපත්වලින් සිදුවන හානිය අවම කරගැනීම සඳහා ජෛව විවිධත්වය ඉහළ නංවන සහ පාංශු ඛාදනය වළක්වන රක්ෂිත වනාන්තර බවට පත්කිරීම.
3. ජීව අඟුරු, එලදායි සහ ක්‍රියාකාරී ක්ෂුද්‍ර ජීවීන් වැනි දෑ යොදාගන්නා කාබනික වතු වගා ලෙසින් ඉහළ වටිනාකමක් ඇති තේ වර්ග නිෂ්පාදනය

■ කුළු බඩු

රසය සහ ගුණාත්මකභාවය අනුව කුරුඳු, කළු ගම්මිරිස්, සහ කහ වැනි ශ්‍රී ලාංකීය කුළු බඩු නිෂ්පාදන ඉතා සුවිශේෂ ඒවා වෙයි.

කෙසේ වුව ද, ගෝලීය කුළු බඩු වෙළෙඳපොළෙහි වර්තමාන ශ්‍රී ලාංකික නියෝජනයේ දුර්වල ස්වභාවය නිසා මෙම භෝගවලින් ඉහළ ලාභ ඉපැයීමේ අවස්ථාව අහිමි වී තිබේ. එහෙයින්, මෙම අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමු.

1. ගෙවතුවල සහ කුඩා ගොවිපොළවල පරිසර හිතකාමී, තිරසාර සහ කාබනික ක්‍රමවලට කුළු බඩු වගාකිරීම ප්‍රවර්ධනය.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් හිඩැස් පිරවීම, නිසි වගාබිම් කළමනාකරණය යනාදී ක්‍රම ප්‍රවර්ධනය කර කුළුබඩු නිෂ්පාදනය ඉහළ නැංවීම.

3. පෝෂණ, රූපලාවන්‍ය, සහ බීම වර්ග යනාදිය නිෂ්පාදනයෙන් කුළුබඩු සඳහා සිදු කළ හැකි දේශීය අගය එකතුකිරීම් උපරිම මට්ටමකට ගෙන ඒම.

4. කළුබඩු අංශයේ කටයුතු කරන තරුණයන් සඳහා තාක්ෂණික පුහුණුව ලබාදීම.

5. භෝග වගාකිරීම, නඩත්තු කිරීම, සහ අස්වනු නෙලීම යන කටයුතු යාන්ත්‍රිකකරණය සඳහා අවශ්‍ය මෙම අංශයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකිරීමට ආයෝජන ලබාදීම.

6. දේශීය අගය එකතුකිරීම් ප්‍රවර්ධනය උදෙසා හුදෙක් අමුද්‍රව්‍ය වශයෙන් කුළුබඩු අපනයනය කරන්නන් හට බද්දක් පැනවීම.

7. ගොවියන්ට තම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලැබෙන බව සහතික කිරීම වෙනුවෙන් මෙම අංශයේ අතරමැදියන් නියාමනය.

වාරිමාර්ග ප්‍රතිපත්තිය

හැඳින්වීම

ලෝක ජනගහනය වැඩිවීමත් ඒ සමඟ ම සිදුවන කෘෂිකාර්මික සහ කාර්මික කටයුතුවල වර්ධනයත් නිසා 2030 වසර වන විට ලෝක ජල පරිභෝජනය සියයට 30 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. තව ද, දේශගුණික විපර්යාස නිසා වර්ෂාපතනය අක්‍රමවත් වී තිබෙන හෙයින් කෘෂිකර්මය සඳහා යොදාගන්නා ජල ධාරිතාව 2025 වසර වන විට සියයට 25 සිට 60 දක්වා ප්‍රමාණයකින් වැඩි විය හැකි බව ද ඇස්තමේන්තු කර තිබේ. වර්තමානයේ දී, ගෝලීය කෘෂිකර්මය සඳහා මිරිදිය ජලාශවලින් ලබාගන්නා ජල ධාරිතාව සියයට 70 ක් පමණ වෙයි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල මෙම අගය සියයට 75 ක් සියයට 80 ක් පමණ වෙයි.

නිවර්තන මෝසම් කලාපීය දේශගුණයකට හිමිකම් කියන නිසාත් නිරිතදිග සහ ඊසානදිග පැති දෙකෙන් ම ලැබෙන මෝසම් වර්ෂාවෙන් පෝෂණය ලබන නිසාත් මෝසම් දෙකෙන් ම මිලි මීටර් 2500 ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන හෙයින් ශ්‍රී ලංකාව ලෝකයේ ජල සම්පත් අතින් පොහොසත් රටක් වශයෙන් සැළැකෙයි. වසර මුළුල්ලේ ලැබෙන වර්ෂාපතනයේ ප්‍රමාණය සහ ලැබෙන කාලය අනුව ශ්‍රී ලංකාව තෙත්, අතරමැදි, සහ වියළි යනුවෙන් දේශගුණික කලාප තුනකට බෙදා දක්වයි. ලැබෙන වර්ෂාපතනය, භූමියේ ස්වභාවය, සහ පසේ ස්වභාවය යන කරුණු සළකා මෙම කලාප තුන තවදුරටත් කෘෂි-පාරිසරික උප කලාප විසි තුනකට බෙදා දක්වයි. මෝසම් වර්ෂාව ලැබෙන කාලය අනුව අප්‍රේල් - අගෝස්තු කාලය "යල" වශයෙනුත් ඔක්තෝබර් - පෙබරවාරි කාලය "මහ" වශයෙනුත් හැඳින්වෙයි.

ශ්‍රී ලාංකික ගොවියන්ගෙන් ලක්ෂ 20 ක් පමණ පිරිසකගේ ජීවනෝපාය රැඳී ඇත්තේ වී වගාව මත ය. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලයෙන් සියයට 30 කට වැඩි ප්‍රමාණයක් සෘජුව හෝ වක්‍රව වී ගොවිතැන සමඟ බැඳී සිටිති. වී වගාව යටතේ පවතින භූමි

ප්‍රමාණය හෙක්ටයාර් 708,000 ක් පමණ වෙයි. එයින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් වියලි කලාපය තුළ ද සියයට 20 ක් පමණ අතරමැදි කලාපය තුළ ද සියයට 30 ක් පමණ තෙත් කලාපය තුළ ද පිහිටා තිබේ. වියලි කලාපයේ වාර්මාර්ගවලින් පෝෂණය ලබන වී වගාව පවතින සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 275,000 ක් පමණ වෙයි.

ලෝක ආහාර නිෂ්පාදනයෙන් සියයට 40 ක් රඳා පවතින්නේ වාර්මාර්ග මත ය. භූමිය මතුපිට පවතින හෝ භූගතව පවතින ජල සම්පත් යොදාගනිමින් වාරිමාර්ග ක්‍රම සැකැසී තිබෙයි.

ප්‍රමුඛතා පදනමින් ගොවිතැන සඳහා ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණය ක්‍රිස්තු පූර්ව 500 පමණ සිට සිදු කර තිබේ. එය රාජ්‍ය පාලකයාගේ ප්‍රධානතම වගකීම්වලින් එකක් වශයෙන් ද සැළැකිණි. ශ්‍රී ලංකාවේ වාර්තාගත ඉතිහාසයට අනුව, ක්‍රිස්තු පූර්ව 500 දී පමණ ආර්ය සංක්‍රමණය සිදුවන විට, ඔවුන්ගේ ප්‍රධාන ආහාරය ද බත් වූ බැවින් ඔවුහු ජල කළමනාකරණය සහ වාරිමාර්ග පිළිබඳ දැනුමත් සමඟ ම ඔවුහු පැමිණියහ.

එම යුගයේ දී, භූමිය සහ ජලය යනු රාජ්‍යය සතු වැදගත් ම සම්පත් ලෙසින් සැළැකිණි. ඒ කාලයේ දී, ජනතාව පදිංචිය සඳහා තෝරාගත්තේ වර්ෂාපතනය අධික නැති, තරමක් වියලි, එ නමුත් ජලය හිඟ නැති ස්ථාන ය. මෙය ඔවුන්ගේ වගා කටයුතු සඳහා අත්‍යවශ්‍ය කාරණයක් විය. සියලු ගැමියන් පදිංචිය සඳහා තෝරාගත්තේ ගංගා සහ අනෙකුත් ස්වභාවික ජල මාර්ග ආශ්‍රිත පිහිටි වී වගාව සඳහා යෝග්‍ය සමතලා ප්‍රදේශ ය. ආර්. එල්. බ්‍රෝහියර් සඳහන් කර ඇති ආකාරයට, ක්‍රිස්තු පූර්ව යුගයේ දී ම, ශ්‍රී ලාංකිකයෝ නිසරු බිම්වල අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් ස්වභාක ජල ධාරා පාලනය කිරීමේ අදහස ඇති කර ගත්හ.

සාම්ප්‍රදායිකව ජලය ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ ආගමික ක්‍රියාකාරකම්වල කේන්ද්‍රීය කාර්යයක් ඉටු කළේ ය. ශ්‍රී ලංකාවේ ඉපැරැණි ජල කළමනාකරණ ශිෂ්ටාචාරය පිළිබඳව අධ්‍යයනය කරන ඉතිහාසඥයෝ එම ක්‍රමවල සහ ආශ්‍රිත ඉංජිනේරු තාක්ෂණය පිළිබඳව මවිත වී සිටිති. එම ශිෂ්ටාචාරයේ මුල් ගල් වශයෙන් සැළැකුණේ වැව, දාගැබ (පන්සල) සහ ගම ය.

ශ්‍රී ලංකාවේ කෘෂි - දේශගුණික වර්ගීකරණය සිදු කරන්නේ වාර්ෂික පදනමකින් බව ද අවධාරණය කළ යුතු ය. ගොවියන් විසින් තම ගොවිතැන් කටයුතු සැලසුම් කරන්නේ වර්ෂාපතනයේ ස්වභාවය මත පදනම්වීමෙනි. සාමාන්‍යයෙන් වී ගොවිතැන සඳහා තෙත මාසයක් වශයෙන් සැළැකෙන්නේ මිලි මීටර් 200 - 250 ක මාසික වර්ෂාපතනයක් ඇති කාලයක් ය. අනෙකුත් භෝග සඳහා නම් එය මිලි මීටර් 150 ක් වීම ප්‍රමාණවත් ය. සාමාන්‍ය වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ වගා භූමියක ජල හානිය දිනකට මිලි මීටර් 4 - 6 ක් පමණ වෙයි. එහෙයින්, යම් මාසයක් තෙත් මාසයක් වශයෙන් සැළැකීමට වී වගාව සඳහා මසකට මිලි මීටර් 200 ක වර්ෂාපතනයක් ද අනෙකුත් භෝග සඳහා මසකට මිලි මීටර් 150 ක වර්ෂාපතනයක් ද යටත් පිරිසෙයින් ලැබිය යුතු ය.

තව ද, කෘෂිකර්මාන්තය සඳහා වර්ෂාපතනය ප්‍රමාණවත් දැ යි හඳුනාගැනීමට සළකා බැලිය යුතු කරුණු තුනක් පවතියි.

1. විශේෂයෙන් ම, කෘෂි පාරිසරික කලාපවල යල සහ මහ වර්ෂාපතනය ආරම්භ වෙන සතිය සහ මාසය

2. කන්නයක දී ගොවිබිමකට ලැබෙන වර්ෂාපතනයේ ප්‍රමාණය. (මාසික වර්ෂාපතන දත්ත පවතින්නේ නම් ඒවා එකතු කර කන්නයේ අගය තීරණය කළ හැකි ය).

3. කන්නයේ කාල සීමාව. (වගා සමයේ කන්නයක දිග මාසවලින් කීයක් ද යන වග).

ගැටලු

ඉහළ යන ඉල්ලුම තෘප්ත කිරීම සඳහා ප්‍රමාණවත් තරම් ජලය පෘථිවි තලය මත තිබුණ ද, ජල සම්පාදනය නිසි පරිදි සිදු නොවෙයි. විශේෂයෙන් ම, හිඟ සහ අවශ්‍ය ප්‍රදේශ වෙත ජලය ලබාදීම විධිමත් අයුරින් සිදු නොවෙයි. මේ හේතුවෙන් ලෝක ජනගහනයෙන් සියයට 40 ක් ජල හිඟයෙන් පීඩා විඳින බවත් 2025 වන විට, අවශ්‍ය තරම් ජලය නො ලැබෙන ප්‍රමාණය ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ වනු ඇති බවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඇස්තමේන්තු කර තිබේ.

වැසි ජලයෙන් භූගත ජල නිධි පිරුණ ද, ගොවියන් විසින් අධික වශයෙන් ඒවා භාවිතයට ගැනීම නිසා එම ජලයේ ප්‍රමාණාත්මකභාවය මෙන් ම ලවණතාව වැඩිවීම නිසා ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව ද ගැටලු මතු වී තිබේ. එයට අමතරව, දේශගුණික විපර්යාස විසින් ද කෘෂිකාර්මික නිෂ්පාදනයට අභියෝග එල්ල වී තිබේ. ප්‍රශස්ත මට්ටමට වඩා ගෝලීය උෂ්ණත්වය සෙල්සියස් අංශක 1 කින් වැඩි වන විට අස්වැන්න සියයට 10 කින් අඩු වී ආහාර සුරක්ෂිතතාව අභියෝගයට ලක්වනු ඇත.

වැඩිවන නාගරික ජනගහනය සහ ගොවියන් අතර පවතින ජලය පිළිබඳ සංග්‍රාමයෙන් කෘෂිකර්මය නිතර ම නියෝජනය කරනු ඇත්තේ පරාජිත පාර්ශ්වය ය. 2050 වසර වන විට, ලෝක ජනගහනයෙන් සියයට 75 ක් නාගරික ජීවිතවලට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ලොව වටා වේගයෙන් වර්ධනය වන නගර සඳහා අවශ්‍ය ජලය ලබාගන්නේ ගොවියන්ගේ අවශ්‍යතා පරදුවට තබා වන අතර ඒ හේතුවෙන් කෘෂිකර්මාන්තය සහ නාගරික ජනගහනය අතර ගැටුමක් නිර්මාණය වී තිබේ. මෙම ගැටුම් සඳහා හේතු වී ඇති ප්‍රධාන හේතු අතරින් එකක් වනුයේ ජලය කාර්යක්ෂම අයුරින් අදාළ පාර්ශ්ව වෙත බෙදාදීම සඳහා අදාළ රාජ්‍ය නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන, සහ ගොවි සංවිධාන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැති වීම ය.

වර්ෂාපතනයේ අක්‍රමිකතා විසින් ද ගොවිතැනට අභියෝග එල්ලවෙයි. වර්ෂාපතනය සාමාන්‍ය රටාවෙන් සැළැකිය යුතු අපගමනයක් පෙන්වන්නේ නම් එය වගා හානියකට හේතු වනු ඇති අතර ගොවියන් විසින් වගාව ආරක්ෂා කරගැනීමේ හදිසි සැලසුම් වෙත ප්‍රවේශ විය යුතු ය. බොහෝ අවස්ථාවල දී, ගොවියා අපේක්ෂා කරන වර්ෂාපතනය ඒ ආකාරයෙන් ම නො ලැබෙන අතර එය නියගයකට හෝ ගංවතුර තත්ත්වයකට හෝ හේතු විය හැකි ය. මේ අනුව අප විසින් අවබෝධ කරගත යුත්තේ ගොවිතැන ඉතා පහසුවෙන් අවදානමකට ගොදුරුවිය හැකි

බවත් ලෝකයේ පවත්නා වඩාත් ම අවදානම් සහගත ව්‍යාපාරය ගොවිතැන බවත් ය.

අතීතයේ දී, ඉහළ අස්වැන්නක් ලබාදෙන භෝග සංවර්ධනයෙන්, පොහොර භාවිතය සහ ජල සැපයුම ඉහළ නැංවීමෙන් සෑම බිම් අඟලකින් ම උපරිම ප්‍රයෝජනයක් ලබාගෙන වැඩි අස්වැන්නක් ලබාගැනීම සිදු කෙරිණි. එසේ වුව ද, ජල සම්පත් හිඟවීම, පාංශු ඛාදනය, පොහොර සහ පලිබෝධනාශක එකතුවීමෙන් ජලය දූෂණය වීම, තාප තරංග, නියඟය, පරිසර පද්ධති සහ ජීව විවිධත්වය බිඳවැටීම යනාදී කරුණු නිසා ජලය භාවිතා කරන එක් ඒකකයකින් උපරිම වගා අස්වැන්නක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ව තිබේ.

ඉහතින් සඳහන් කළ අපේක්ෂිත අභියෝග බොහෝමයක් සඳහා චිරස්ථායි ඉංජිනේරුමය විසඳුම් විශාල වශයෙන් පවතියි. මේ සඳහා අවශ්‍ය කෙරෙනුයේ දේශපාලන සහ සමාජ උවමනාව, නවෝත්පාදක මූල්‍ය යාන්ත්‍රණ, සහ ප්‍රාදේශීයකරණය තුළින් යොදාගත හැකි යහභාවිතාවන් හඳුන්වාදීම තුළින් සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගැනීම ය. එහෙයින් විශාලතම අභියෝගය වන්නේ කළ යුත්තේ කුමක්දැයි හඳුනාගැනීම නොව අපේක්ෂිත අරමුණු සාධනය කරගත හැක්කේ කෙ ලෙසින් දැ යි හඳුනාගැනීම ය.

1998 - 2000 ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ආකාරයට, ජලය හා බැඳුණු ගැටලුවලට අදාළ ප්‍රධාන කරුණු වන්නේ,

1. ජල සැපයුම අඩුවීම

2. ජල සම්පත් බෙදාදීම සඳහා තාර්කික වැඩපිළිවෙළක් නොමැතිවීම

3. භූගත ජල සම්පත් කළමනාකරණය නො කිරීම

4. ජලයේ ගුණාත්මකභාවය අඩුවීම

1980 දශකයේ ආරම්භයේ සිට 1990 දශකයේ මැද භාගය දක්වා ගතවුණු වසර පහළොවක කාලය තුළ ශ්‍රී ලංකාවේ

වාරිමාර්ග අංශය වෙනුවෙන් කළ සමස්ත ආයෝජනය 1980 දශකයේ ආරම්භයේ පැවැති ප්‍රමාණයෙන් හතෙන් එකක් දක්වා අඩුවිය. කෙසේ වුව ද, 1980 දශකයේ අග භාගය වන තෙක් නො සැළැකිය හැකි මට්ටමක පැවැති ගොවියන් විසින් කෘෂි ළිංවලට සහ වාරි පොම්පවලට කළ ආයෝජනය කිරීම් ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සියල්ල සඳහා කරනු ලැබූ මෙහෙයුම් සහ කළමනාකරණ වියදම් ප්‍රමාණය විශාල වශයෙන් ඉක්මවමින් 1990 දශකය වනවිට වේගයෙන් ඉහළ ගියේ ය. දැන් වාරිමාර්ග අංශය ඉදිකිරීමේ අදියරින් කළමනාකරණ අදියරට මාරු විය යුතු බව පැහැදිළි ය. කෘෂි ළිං සහ පොම්ප සඳහා කරන ලද ආයෝජන මත ලබන සමාජ සහ පෞද්ගලික ප්‍රතිලාභවල ඉහළ අනුපාත විසින් වාරිමාර්ග යෝජනා ක්‍රමවල වැඩිදුර ව්‍යාප්තිය සඳහා විශාල අපේක්ෂා ඇති කරවමින් ඒවායේ වේගවත් ව්‍යාප්තිය තවදුරටත් දිරිමත් කර තිබේ.

බැම් බැඳ සකස් කළ වගා ළිං 33,000 ක් පමණ ද, බැම් බැඳ නැති වගා ළිං 8,000 ක් පමණ ද, නළ ළිං 10,000 ක් පමණ ද, වාරි පොම්ප 100,000 ක් පමණ ද වියලි කලාපයේ වාරිමාර්ග පද්ධති තුළට ඇතුළත් බව ඇස්තමේන්තු කර තිබේ. බැම් බැඳ සකස් කළ වගා ළිංවලින් සියයට 70 කට වැඩි ප්‍රමාණයක් සහ නළ ළිං විශාල ප්‍රමාණයක් ඇත්තේ කුඩා වාර්මාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිතව ය. බැම් බැඳ නැති වගා ළිං වැඩි වශයෙන් ඇත්තේ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිතව ය. වාරි පොම්ප සම්බන්ධයෙන් ගත් කල, සියයට 60 කට වැඩි ප්‍රමාණයක් අයිතිවන්නේ කුඩා වාරිමාර්ග යෝජනාක්‍රම ආශ්‍රිත ගොවියන්ට ය. කුඩා සහ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම දෙක ආශ්‍රිතව ගොවිතැන් කරන ගොවියන්ගෙන් සියයට 10 ක් පමණ වගා ළිං හිමි කරගෙන සිටින අතර සියයට 15 ක් පමණ වාරි පොම්ප හිමි කරගෙන සිටිති.

ගංගා ද්‍රෝණි මට්ටමින් කෘෂිකාර්මික සහ කෘෂිකාර්මික නොවන භාවිතාවන් සඳහා ජලය ලබාදීම සඳහාත් මතුපිට ජලය සහ භූගත ජලය ද්‍රෝණි මට්ටමේ සංවර්ධනය සාර්ව මට්ටමින් නියාමනය කිරීම සඳහාත් රජය විසින් නව ප්‍රතිපත්ති අනුගමනය

කළ යුතු අතර නව ආයතනික යාන්ත්‍රණ සකස් කළ යුතු ය. වාරි කෘෂිකර්මාන්තයේ ඉහළ ඵලදායිතාවයක් සහ තිරසාර බවක් ලබාගැනීම සඳහා මෙම පියවර අවශ්‍ය වන අතර, අතීතයේ දී මෙන් ම අනාගතයේ දී ද ග්‍රාමීය හා කෘෂිකාර්මික සංවර්ධනයේ කොඳු නාරටිය වශයෙන් වාරි සම්පාදනය පවතින බව මෙයින් සහතික කරයි.

උක්ත කරුණු සළකා අප විසින් සම්පාදනය කරනු ලබන වාරිමාර්ග ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ මේවා ය.

- ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ජලය ප්‍රමාණවත් අයුරින් නිසි කලට ලබාදීම.
- කළමනාකරණ වැරැදි නිසා සිදුවන ජල නාස්තිය වැළැක්වීම.
- අවශ්‍ය සියලු අංශ වෙත කාර්යක්ෂම අයුරින් ජලය ලබාදීම සඳහා වගකීම් පැවැරුණු සියලු ආයතන සහ සංවිධාන මෙහෙයවීම සඳහා අවශ්‍ය රජයේ නායකත්වය සහ මැදිහත්වීම කේන්ද්‍රීය ආකාරයෙන් ලබාදීම.
- වාරිමාර්ග අංශයේ සංවර්ධනය සඳහා රාජ්‍ය අංශය විසිනුත් පුද්ගලිකව ගොවියන් විසිනුත් සිදු කරනු ලබන ආයෝජන විධිමත් අයුරින් කළමණාකරණය.
- ජල හිඟයෙන් උග්‍ර ලෙස පීඩාවට පත් වී සිටින ප්‍රදේශ සඳහා ජලය සපයන මහා පරිමාණ ජල සම්පාදන යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- පාංශු ජල පද්ධතිය පෝෂණය කිරීමේ ක්‍රම හඳුන්වාදීම.
- ජල අනතුරු අවමකිරීම.
- වාරිමාර්ග විෂයයට අදාළ දැනුම සහ හැකියාවන් ප්‍රවර්ධනය කෙරෙන විධිමත් සහ අවිධිමත් අධ්‍යාපන වැඩපිළිවෙළක් හඳුන්වාදීම.

ඉදිරිමග

1. ආයතනික ඒකාබද්ධතාව

ජලය සැපැයීම, භාවිතය, සහ කළමනාකරණය සඳහා පවතින විවිධ ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණයට සහ ඒවාට මග පෙන්වීමට තනි රාජ්‍ය ආයතනයක් පිහිටුවිය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. වාරිමාර්ග ඉදිකිරීමට සහ කළමනාකරණයට අදාළ ජාතික මූලධර්ම මාලාවක් සකස් කර එය නිසි පරිදි යාවත්කාලීන කරමින් සමාජගත කිරීම මෙම ආයතනයේ මූලික ම වගකීම වෙයි. මෙම ආයතනයේ අනෙකුත් වගකීම වන්නේ ජලය කාර්යක්ෂම අයුරින් අදාළ පාර්ශ්ව වෙත බෙදාදීම සඳහා අදාළ රාජ්‍ය නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන, සහ ගොවි සංවිධාන සියල්ල නිසි පරිදි සම්බන්ධීකරණය කර, ඒවා විසින් සිදු කළ යුතු කාර්යයන් නිසි පරිදි පවරා, ඒවා නියාමනය කරමින් අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම සහ නායකත්වය ලබාදීම ය.

2. ආයෝජන කළමනාකරණය

වාර්මාර්ග අංශයේ සංවර්ධනය සහ කළමනාකරණය සඳහා ප්‍රමාණවත් ආයෝජන සිදුකිරීම රජයේ මූලික ප්‍රතිපත්තියක් විය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. නව මහා පරිමාණ වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා සැලසුම් සකස් කර ඒවා ඉක්මනින් ඉදිකිරීම සඳහා අවශ්‍ය ආයෝජන විදේශීය මිත්‍ර පාර්ශ්ව වෙතින් ලබාග ැනීමට යුහුසුළුවීම ද රජයේ ප්‍රමුඛතා කාර්යයක් විය යුත්තේ ය. දැනට ද, ගොවියන් විසින් පුද්ගලික වගා ළිං සහ පොම්ප ක්‍රම සඳහා ආයෝජන කරන බැවින් ඒවා ක්‍රමවත් කිරීමට අවශ්‍ය දැනුම සහ අනෙකුත් අනුබලය ලබාදීමටත් රජය ක්‍රියා කළ යුතු ය. මෙම අංශයේ යම් අක්‍රමවත් ඉදිකිරීම් පවතින්නේ නම් ඒවා නිවැරැදි කරවීමට ද රජය මැදිහත් විය යුත්තේ ය. මෙම සියලු කාර්යයන් සඳහා අවශ්‍ය ආයතන පිහිටුවීමත් ඒවා කාර්යක්ෂම අයුරින් කළමනාකරණයත් රජය විසින් සිදු කළ යුත්තේ ය.

ප්‍රාග්ධන ආයෝජනය අඩුකිරීම සහ දේශීය තිරසාර තාක්ෂණ ක්‍රම අනුගත කිරීම දිරිගැන්වීම සඳහා ක්ෂුද්‍ර මූල්‍යකරණය,

ණය සහ පුද්ගලික සහ ප්‍රජා හිමිකාරීත්ව වැඩසටහන්වල නව මාදිලි හඳුන්වාදීම මගින් ජලය කළමනාකරණය සඳහා ගොවීන් පුහුණුකිරීම සහ ගොවි සමිති සහ සමුපකාර ශක්තිමත් කිරීම යනාදී කටයුතු ද මේ සඳහා අදාළ කරගත හැක්කේ ය.

3. නව මහා පරිමාණ ජල යෝජනා ක්‍රම

යෝජිත අයුරින් නිල්වලා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක නො කිරීම නිසා එම ගංගා ද්‍රෝණියේ ගංවතුර ගැටලුව උග්‍ර වී තිබෙන අතර එයින් අපේක්ෂා කළ අයුරින් හම්බන්තොට දිස්ත්‍රික්කයට ජලය ලබාදීමක් ද සිදු කර නොමැත. මෙම දැවැන්ත වැරැද්ද නිවැරැදි කිරීම සඳහා අවශ්‍ය අධ්‍යයන කටයුතු සිදු කර නිසි සැලැස්මක් සම්පාදනය කිරීමට රජය ක්‍රියා කළ යුත්තේ ය. වියලි ප්‍රදේශවලට ජලය සැපැයිය යුත්තේ තෙත් කලාපීය ගංගාවලිනි. කළු ගඟ යනු ලංකාවේ වැඩි ම ජල ධාරිතාවක් ඇති ගංගාව වෙයි. මෙම ජල අධික බව නිසා එම ගංගා ද්‍රෝණියේ (විශේෂයෙන් ම රත්නපුරය ආශ්‍රිත ප්‍රදේශයේ) නිතර ගංවතුර උවදුරු ද ඇතිවෙයි. නල මාර්ගයක් ඔස්සේ කළු ගඟේ ජලය හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකට සැපැයිය හැකි නම් එම ගඟ ආශ්‍රිතව පවතින ගංවතුර උවදුර ද හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි ජල ප්‍රශ්නය ද විසැඳිය හැක්කේ ය. එහෙයින් කළු ගඟේ තරමක් ඉහළ ප්‍රදේශයකින් ජලය ලබාගෙන දක්ෂිණ අධිවේගී මාර්ගයට යාබදව ඉදි කරනු ලබන නල මාර්ගයක් ඔස්සේ හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකට ජලය සපයන මහා ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් අපි යෝජනා කරමු. හම්බත්තොට වරාය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත කලාපයට ද ජලය අවශ්‍ය බැවින් මෙවැනි යෝජනා ක්‍රමයකට අවශ්‍ය මූල්‍ය ආධාර සහ තාක්ෂණය චීනයෙන් ලබාගත හැකි බව ද අපි විශ්වාස කරමු. මෙම කාර්යයට අවශ්‍ය අංග සම්පූර්ණ සැලසුමක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යාධාර ලබාගැනීමටත් එය ක්‍රියාත්මක කිරීමටත් රජයේ ප්‍රමුඛතාව ලැබිය යුත්තේ ය.

4. වැසි ජල භාවිතය ඉහළ නැංවීම

ගෘහස්ථ මට්ටමින් වැසි ජලය ගබඩා කර වියලි කාලවල දී ඒවා විවිධ කාර්යයන්ට භාවිතා කිරීමේ ක්‍රමය තවදුරටත් ප්‍රවර්ධනය කළ යුතු ය. මෙ ලෙසින් ගබඩා කරන ජලය ගෙවතු වගා කටයුතු සඳහා ද, වැසිකිළි යනාදියේ භාවිතව සඳහා ද ඇතැම් වානිජ කටයුතු සඳහා ද යොදාගත හැකි ය. එහෙයින් මෙම ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය දැනුම උපරිම මට්ටමින් ජනගත කිරීම ද මෙවැනි වැසි ජල ටැංකි ඉදිකිරීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර සහ තාක්ෂණය ලබාදීම ද රජය විසින් සිදු කළ යුත්තේ ය. වැසි ජලය රැස්කිරීමේ පද්ධති ප්‍රවර්ධනය කිරීම මගින් සියලු කාර්යයන් සඳහා පානීය ජලය භාවිතා කිරීම නැවැත්විය හැකි ය. (ජල සම්පාදන යෝජනා ක්‍රමයක සන මීටරයක් නිෂ්පාදනය කර බෙදාහැරීම සඳහා අවශ්‍ය කෙරෙන සාමාන්‍ය පිරිවැය රුපියල් 36 සිට 40 දක්වා අගයක් ගනියි. සිදු කරන ලබන ආයෝජනය ආපසු ලබාගැනීමත් සමඟ සැළැකූ විට ජල සන මීටරයක් සැපැයීම සඳහා අවශ්‍ය කෙරෙන සාමාන්‍ය පිරිවැය රුපියල් 158 ක් වෙයි. වර්තමානයේ දී, ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය විසින් අය කරගනු ලබන්නේ ජල සන මීටරයකට රුපියල් 47 ක මුදලකි. එහෙයින්, ජල අංශය ඉතා විශාල වශයෙන් රාජ්‍ය සහනාධාර මත යැපෙන බවත් රජයට විශාල බරක් ව පවතින බවත් පැහැදිළි ය).

5. ජලය ප්‍රතිචක්‍රීයකරණය

අපජලය සහ ලවණ ඉවත් කළ ජලය කෘෂිකාර්මික කටයුතු සඳහාත් ඇතැම් ගෘහස්ථ කටයුතු සඳහාත් ඇතැම් වානිජ කටයුතු සඳහාත් යොදාගත හැකි ය. මේ සඳහා ජලය ප්‍රතිචක්‍රීයකරණය ප්‍රවර්ධනය කළ යුතු ය. විශේෂයෙන් ම, කර්මාන්තවලින් බැහැර කරන ජලය ප්‍රතිචක්‍රීයකරණය නො කර පරිසරයට මුදාහැරීම මුළුමනින් ම වැළැක්විය යුතු ය. ඒ සඳහා අවශ්‍ය දැනුම, තාක්ෂණය සහ මූල්‍යමය ආධාර රජය විසින් ලබාදිය යුත්තේ ය.

6. ජල නාස්තිය වැළැක්වීම

වාරි කළමනාකරණය නිසි පරිදි සිදු නොකිරීම නිසා විශාල ජල නාස්තියක් සිදුවෙයි. වැව් සහ ජලාශවලින් වගාව සඳහා නිකුත්

කරන ජලය විවිධ ආකාරයෙන් අතරමග දී නාස්තිවෙයි. "අහසින් වැටෙන එක දිය බිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට යන්නට ඉඩ නොදිය යුතු" බවට වන ඓතිහාසික ප්‍රකාශයක් ජාතික මනසට එක් වී තිබුණ ද එය මුළුමනින්ම නොතකා හැර කටයුතු කරන බවක් ද පෙනෙයි. ආහාර නාස්තිය යනු ජල නාස්තියක් ද වන බැවින් ආහාර නාස්තිය පිටුදැකීම කෙරෙහි ද අවධානය යොමු කළ යුත්තේ ය. සෑම වසරක ම, නිෂ්පාදනය කරනු ලබන ආහාරවලින් සියයට 40 ක් නාස්තිවෙයි.

සැබෑ වටිනාකම පිළිබිඹු වන පරිදි ජලයේ මිල නියම කිරීම, වාෂ්පීකරණ අලාභ වැළැක්වීම සඳහා ඇළ මාර්ග සැකසීම, ඒවා වරින් වර පිරිසිදු කිරීම, ඇළ වටා ගස් සිටුවීම වැනි විවිධ මට්ටම්වල හානි වැළැක්වීමේ ක්‍රම අනුගමනය කරමින් වැවෙන් ක්ෂේත්‍රයට ජල ප්‍රවාහනය, සහ ජල හානි අවම කිරීම සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම වැනි කාර්යයන් ද ජල නාස්තිය වැළැක්වීම සඳහා උපයෝගී කරගත හැක්කේ ය. විශේෂයෙන් ම, වාරි ජලය සැපැයීම වෙනුවෙන් දරනු ලබන පිරිවැය පිළිබඳ අවබෝධයක් ද ගොවි ජනතාව තුළ ඇති කළ යුත්තේ ය. දැනට තෝරාගත් වාරි යෝජනා ක්‍රමයක කන්නයක වී ගොවිතැනේ ශුද්ධ ආදායමෙන් සියයට 8.6 ක් වන වාරි ජලයේ ඇස්තමේන්තුගත වටිනාකම හෙක්ටයාරයකට රුපියල් 5,275 කි. එනම්, එක්සත් ජනපද ඩොලර් 40 කි.

7. ජල භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ අදියරට දැන් භූගත ජලය සහ මතුපිට ජලය යන දෙක ම ඇතුළත් වන අතර, භූගත ජලය භාවිතය බහුලවීමෙන් පස නිසරුභාවයට ලක් වී, කුඹුරුවල ලවණතා ගැටලුව උග්‍ර කරනු ලබන භූගත ළිංවල ලවණතාවයේ ගැටලුව වැඩිවීම වළක්වා ගැනීම සඳහා වාරිමාර්ග පද්ධති ඒකාබද්ධ භාවිතය සඳහා කළමනාකරණය කළ යුතු ය. රාජ්‍ය කළමනාකරණයෙන් ජල සැපැයුමට එක්වන ඉහළ සමාජ පිරිවැය හිලව් කරගැනීමට මෙය උපකාරී වනු ඇත.

කාර්යක්ෂමතාව අඩු ගලායන සහ විලි පන්නයේ වාරි ක්‍රමවලින් ඉහළ සිට වතුර ඉසින ක්‍රමයට (මෙයින් ජල භාවිතය සියයට 30 කින් අඩුවෙයි) හෝ බිංදු වාරි ක්‍රමයට (මෙයින් ජල භාවිතය සියයට 50 කින් අඩුවෙයි) මාරුවීම සහ ජලය බෙදාහරින ඉසුම් යන්ත්‍රවල සවි කරනු ලබන සංවේදක භාවිතයෙන් හෝ ජල අවශ්‍යතා පවතින තැන් හඳුනාගැනීමේ ක්‍රම භාවිතයෙන් වාරිමාර්ග ක්‍රමවල කාර්යක්ෂමතාව ඉහළ නැංවිය යුතු ය. එ මෙන් ම, "ජල බිඳුවකින් භෝගයක්" යන ඉලක්කය සපුරාගැනීම සඳහා ආරක්ෂිත ගෘහ සහ අවම ජල භාවිත ශිල්ප ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ වැඩි ජල කාර්යක්ෂමතාවක් ඇති භෝග වගාකිරීම ප්‍රවර්ධනය කිරීම කළ යුතු ය.

පාංශු වියවුල් අඩුකිරීම, කාබනික පාංශු ආවරණය, වසුන් යෙදීම සහ බෝග විවිධාංගීකරණය ඇතුළත් වන පරිදි සංරක්ෂණ කෘෂිකර්මාන්තය ව්‍යාප්ත කිරීම යනාදී ක්‍රමවලින් ද ජල භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකි ය. එ මෙන් ම ගුණාත්මක බීජ, පොහොර, මෙවලම් හඳුන්වාදීමෙන් ද ජල පරිහරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකි ය. වසරක දී එක් භූමියකින් එක් භෝගයකට වඩා නිෂ්පාදනය සඳහා බහු-භෝග වගා ක්‍රම ප්‍රවර්ධනය ද මේ සඳහා අදාළ කරගත හැකි ය. වල් පැලෑටි කළමනාකරණය සඳහා වසුන් යෙදීම වැනි විවිධ ශිල්පීය ක්‍රම අනුගත වෙමින් අවම ජල ප්‍රමාණයකින් වගාකිරීම වැනි කාර්යක්ෂම වාරි ක්‍රමවලට අනුගත වන පරිදි ගොවීන්ට දිරිගැන්වීම් ලබාදීම ද සිදු කළ යුත්තේ ය.

ප්‍රජා ජල සංවර්ධනය සහ කළමනාකරණය (සමාජ ජල කළමනාකරණය) යනු ජල භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි ඉතාමත් ඵලදායි උපක්‍රමයකි. මේ සඳහා අවශ්‍ය මෙහෙයුම් සහ කළමනාකරණය භාරගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමත් ඒ උදෙසා ගොවියන් පුහුණු කරවීමත් සිදු කළ යුතු ය.

8. පාංශු-ජල පද්ධතිය පෝෂණය කිරීමේ ක්‍රම හඳුන්වාදීම

ඉපැරැණි එල්ලංගා පද්ධති නිර්මාණය කර තිබුණේ පාංශු - ජල පද්ධතියක් නිර්මාණය කෙරෙන ආකාරයකිනි. එල්ලංගා පද්ධතියක ගම් වැව්, ඔලගම් වැව්, කුළු වැව් සහ පින් වැව් ද මුදුන් ඇල ආදී විවිධාකාර ඇල මාර්ග ද අන්තර්ගත වෙයි. මෙවැනි පද්ධතියක් තුළ බොහෝ ඇල මාර්ග ඉදි කර තිබුණේ සමෝච්ච මට්ටම්වලිනි. ඒවාට අමතරව, පතස් සහ ගොඩවලවල් නමින් හැඳින්වෙන කුඩා ජල පොකුණු සැකැසීමක් ද විය. මේ සියලු ම උපක්‍රම යොදා තිබුණේ වියළි කලාපය තුළ හැකිතාක්ද දුරට ජලය රඳවා තබාගෙන පාංශු-ජල පද්ධතියක් නිර්මාණය කිරීම ය. මේ තුළින් මිනිසා ඇතුළු සියලු ජීවීන්ගේ මෙන් ම වෘක්ෂලතාදියේ පැවැත්ම ද තහවුරු කළ හැකි විය. මේ අනුව ඇතිවන ස්වභාවික කාන්දුවීම් තුළින් භූගත ජල ධාරිතාව ද පෝෂණය කළ හැකි ය. එහෙයින් මෙම ඉපැරැණි බුද්ධි මහිමයෙන් වැඩගත හැකි වන පරිද්දෙන් වියළි කලාපය තුළ පවත්නා සියලු ගම් වැව්, ඔලගම් වැව්, කුළු වැව් සහ පින් වැව් ද ඒවා සම්බන්ධ කරන ඇල මාර්ග ද ඇතුළත් එල්ලංගා පද්ධති ප්‍රතිනිර්මාණය කිරීම කෙරෙහි රජය විශේෂ අවධානයක් යොමු කළ යුත්තේ ය.

9. ජල අනතුරු අවම කිරීම

ස්වභාවික ජල මාර්ග අවහිර වන පරිද්දෙන් සිදු කර තිබෙන විවිධ ඉදිකිරීම් නිසා නිතර ගංවතුර ඇතිවන බව ද ඒ හේතුවෙන් ගොවිතැන් විනාශ වන බව ද අපි දනිමු. එහෙයින් අධික වර්ෂාපතනයක් පවතින අවස්ථාවල අමතර ජලයට පහසුවෙන් බැස යෑම සඳහා පවතින ස්වභාවික ඇල මාර්ග සහ නිම්න ප්‍රදේශ හඳුනාගෙන ඒවා නිදහස්ව තබාගැනීමට අවශ්‍ය නීති සම්පාදනය ද ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදීම ද රජය විසින් සිදු කළ යුත්තේ ය. පාංශු බාදනය සහ කාන්තාරීකරණය වැළැක්වීම සඳහා සහ ගංවතුර සහ නියගවල බලපෑම් අවමකිරීම සඳහා වනාන්තර ආරක්ෂා කිරීම ද අනිවාර්යයෙන් ම කළ යුතු කාර්යයකි. මේ සඳහා අවශ්‍ය දැනුම ප්‍රචලිත කිරීමත් වන සංරක්ෂණ කටයුතු සඳහා ජනතාව සම්බන්ධ කරගැනීමත් කෙරෙහි රජයේ

අවධානය යොමු කළ යුත්තේ ය. තව ද, මුහුදු මට්ටම ඉහළ යාම නිසා පහත් බිම් සහල් වගා කරන ප්‍රදේශ ජලයෙන් යටවීමේ අනතුරක් ද පවතී. එහෙයින් එම අනතුර වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ද රජය විසින් අනුගමනය කළ යුත්තේ ය.

10. වාරි අධ්‍යාපන වැඩපිළිවෙළක් ආරම්භ කිරීම

උක්ත සඳහන් කළ ප්‍රතිපත්ති යෝජනා පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නම් ඒවාට අදාළ අධ්‍යාපන සහ පර්යේෂණ වැඩපිළිවෙළක් පැවැතිය යුතු ය. එහෙයින්, වාරිමාර්ග විෂයයට අදාළ අධ්‍යාපන කටයුතු මෙහෙයවීමටත්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නිරතවීමටත් පූර්ණ වශයෙන් කැපැවිය හැකි විශ්වවිද්‍යාල මට්ටමේ ආයතනයක් ඇති කළ යුතු බව අපි මෙයින් යෝජනා කරමු. මෙම අධ්‍යාපන ආයතනය තුළින් ඉපැරැණි සහ නූතන වාරි ක්‍රම, භූගත ජල සම්පත්, ජල කළමනාකරණය, ප්‍රශස්ත ජල භාවිතය වැනි ඉසව් පිළිබඳ දැනුම සහ හැකියා වර්ධනය කිරීමත් ඒවා ජනගත කිරීමත් සිදු කළ හැක්කේ ය.

කිරි ගව කර්මාන්තය

හැඳින්වීම

සමාජ - සංස්කෘතික සාධකත් ජනතාවගේ පෝෂණ අවශ්‍යතාත් සළකන විට කිරි ගව පාලනයට ශ්‍රී ලංකාව තුළ ඉතා විශේෂත්වයක් හිමිවෙයි. කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන යනු මිනිස් පරිභෝජනයට අත්‍යවශය පෝෂණය ලබාදෙන ප්‍රභවයකි. තම දරුවන්ට කිරි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ලබාදීම දෙමව්පියන් විසින් සළකනු ලබන්නේ අනිවාර්යයෙන් කළ යුතු කාර්යයක් වශයෙනි. නිරෝගී, ජව සම්පන්න ජාතියක් නිර්මාණය කිරීම සඳහා මෙම සංස්කෘතික පුරුද්දෙන් ලැබෙන පිටිවහල ඉතාමත් ඉහළ එකකි.

ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම වසන ජනතාවගෙන් සෑළැකිය යුතු ප්‍රමාණයක් තම තමන්ගේ ශක්තිය සහ පවත්නා

සම්පත් මත පදනම් වී තනි තනිව හෝ සංවිධාන ගත වී හෝ කිරි නිෂ්පාදනයට යොමු වී සිටිති. කිරි ගවයන් ඇති කිරීම සඳහා හිතකර තත්ත්වයක් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම තිබුණ ද එම විභවයන්ගෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රයෝජන නො ගැනෙයි. එහෙයින් ජනතාව තුළින් මතුවන ඉල්ලුම තෘප්ත කිරීම සඳහා කිරි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා විශාල මුදලක් විදේශ රටවලට ගලා යයි.

කෙසේ වුව ද, ස්වකීය ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය කිරිවලින් රට ස්වයං පෝෂණය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතියි. වර්තමානයේ දී, කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන සඳහා හොඳ ඉල්ලුමක් පවතින අතර ඒ වෙනුවෙන් ඉහළ මිලක් ගෙවීමට ද පාරිභෝගිකයෝ යොමු වී සිටිති. එහෙයින්, කිරි ගව පාලනය ප්‍රවර්ධනය සඳහා රජයට ද, පුද්ගලික අංශයට ද, ගොවියන්ට ද ගොවි සමුපකාරවලට ද විශාල ඉඩක් පවතියි.

ශ්‍රී ලංකාවේ පවතින දේශගුණික විවිධත්වය අනුව කිරි ගව පාලනයට යොදාගන්නා කලාප හයක් (6 ක්) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබේ. ඒ, උඩරට කලාපය, මැදරට කලාපය, පහතරට තෙත් කලාපය, පහත රට වියළි කලාපය, පොල් ත්‍රිකෝණය, සහ යාපන අර්ධද්වීපය යනුවෙනි. මෙම කලාප තුළ ඇති කළ හැකි කිරි ගවයන් වර්ග ද විවිධ ය. මෙම කලාප තුළ ගොනු වී ඇති සම්පත් භාවිතයෙන් ශ්‍රී ලාංකික ජනතාවගේ පරිභෝජනයට අවශ්‍ය තිරසාර, අඛණ්ඩ සහ ලාභදායි කිරි නිෂ්පාදන කර්මාන්තයක් ස්ථාපනය කළ හැකි ය.

තිරසාර, අඛණ්ඩ හා ලාභදායි කිරි කර්මාන්තයක් දිවයින පුරා ස්ථාපනය කිරීම සඳහා සැපිරිය යුතු අවශ්‍යතා විශාල ප්‍රමාණයක් තිබෙන අතර, ඒ අතර වන මූලික ම අවශ්‍යතාව වන්නේ සෑම කිරි දෙනක් ම (පරිණත කිරි දෙනක් ම) වසරකට පැටියකු සමගින් උපරිම කිරි අස්වැන්නක් ලබාදෙන බව තහවුරු කිරීම ය. මේ උදෙසා මූලිකව සපුරාලිය යුතු අවශ්‍යතා වන්නේ පානයට, ගවගාල් සේදීමට සහ තෘණ වගාව සඳහා පිරිසිදු ජලයත් තෘණ මූලික කරගත් සමබර ආහාරත් දෛනික පදනම මත

වසර පුරා ම ලබාදීමයි. එ මෙන් ම, අවශ්‍ය මූල්‍ය සම්පත් අඩු පිරිවැයකින් සහ පහසුවෙන් ලබාදීමත් ශ්‍රම සම්පත් නිසි අයුරින් කළමනාකරණයත් කිරි ගොවි සමුපකාර වැනි නිෂ්පාදන මාදිලි ශක්තිමත් කිරීමත් අවශ්‍ය දැනුම ලබා දී හැකියාවන් ප්‍රවර්ධනයත් මේ වෙනුවෙන් කළ යුතු ය.

ගැටලු

1977 දී, ජේ. ආර්. ජයවර්ධන රජය බලයට පත් වී ආනයන මත පදනම් වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන තෙක් ශ්‍රී ලංකාවේ කිරි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 80 ක් සපුරාලීමට දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් විය. එහෙත්, විවෘත ආනයන ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හේතුවෙන්, කිරි පිටි වැනි නිෂ්පාදන පරිභෝජනය සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර, මේ වන විට දේශීය අවශ්‍යතාවයෙන් අප නිෂ්පාදනය කරන්නේ සියයට 45 කට ආසන්න ප්‍රමාණයකි.

කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා ශ්‍රී ලංකාව විසින් ඉතාමත් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කරනු ලබයි. නිදසුනක් ලෙස, දැනට පවත්නා මහා ආර්ථික අර්බුදය පුපුරා යෑමට ආසන්නයේ 2020 වසරේ දී කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා ශ්‍රී ලංකාව විසින් එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 333.8 ක් වැය කර තිබේ. මෙය එම වසරේ ආහාර පාන ආනයනය සඳහා ශ්‍රී ලංකාව විසින් වැය කළ මුදලින් සියයට 21.5 කි. සැබැවින් ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව මෙම ප්‍රවණතාව අඛණ්ඩව දැකගත හැකි ය. සමස්ත ආහාර පාන ආනයනය සඳහා වැය කරන මුදලෙන් කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සඳහා වැය කරන මුදල් ප්‍රමාණය 2008 වසරේ දී සියයට 26.5 ක උපරිම අගයක් වාර්තා කර තිබීමත් 2016 වසරේ දී සියයට 15.3 ක අවම අගයක් වාර්තා කර තිබීමත් මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

කිරි නිෂ්පාදකයන් මුහුණ දී ඇති බරපතල ම ගැටලුවක් වන්නේ ගවයින්ට ආහාර (විශේෂයෙන් ම තෘණ වර්ග) ලබාදීම ය. ග්‍රාමීය මට්ටමේ සුළු පරිමාණයෙන් ගව පාලනයේ යෙදෙන

ගොවියන් සතුන්ගේ ආහාර අවශ්‍යතාව සපුරාගන්නේ මාර්ග දෙපස වැවෙන තෘණ සහ රනිල ප්‍රභවයන් මගිනි. එයට අමතරව, කුඹුරු නියරවල ඇති තෘණ මගින් හෝ රජයේ හා පෞද්ගලික අංශයේ ඉඩම්වලින් හෝ මෙම අවශ්‍යතාව පිරිමසා ගැනීමට ද ඔවුහු යොමු වී සිටිති. එ නමුත්, විශාල වශයෙන් ගවයින් හදන කිරි නිෂ්පාදකයින් විසින් මෙම අවශ්‍යතාව සපුරාලන්නේ ඉතාමත් අසීරුවෙනි. විශේෂයෙන් ම, මෙම ගැටලුව හම්බන්තොට වැනි දිස්ත්‍රික්කවල බහුල වශයෙන් නිරීක්ෂණය කළ හැකි ය. මෙයට පෙර ගවයින් පෝෂණය සඳහා යොදාගත් බොහෝ බිම් දැන් ඉඩම් ජාවාරම්කරුවන්ගේ සහ වෙනත් අයගේ ආක්‍රමණවලට ගොදුරු වී තිබේ. එහෙයින් තමන් හදන ගවයන්ට අවශ්‍ය ආහාර වෙනුවෙන් තෘණ සම්පත් ලබාගැනීම සඳහා තම ප්‍රදේශයෙන් බැහැරට පවා ගමන් කරන ගොවීහු සිටිති.

තම ගවයන් වෙනුවෙන් ගුණාත්මක ආහාර ලබාදීම සඳහා ශ්‍රී ලංකාවේ ගොවියන් සතුව විශාල ප්‍රාග්ධනයක් හෝ ඉඩම් හෝ නොමැත. එහෙයින් විකල්ප වශයෙන් ඔවුන් සපයනු ලබන සත්ත්ව ආහාරවල ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවය පිළිබඳ ගැටලු පවතියි. මෙය ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය කෙරෙහි ඉතාමත් නිෂේධනාත්මක අයුරින් බලපාන කරුණකි.

විවිධ දුෂ්කරතා නිසා තෘණ වර්ග වගාකිරීම ද ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කළ නො හැකි වී තිබේ. මෙයට ප්‍රධාන වශයෙන් ම බලපා ඇත්තේ තෘණ වගා කිරීමට අවශ්‍ය ජලය ලබාගැනීමේ අපහසුවයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් භෝගයක් ලෙසින් තෘණ වර්ගීකරණය කර නොමැති බැවින් තෘණ වගාව සඳහා වාරි ජලය නිදහස් කිරීමක් ද සිදු නොවෙයි. මේ හේතුවෙන් තෘණ වගාව වෙත ගොවියන් යොමුවන්නේ නැත.

කිරි යනු ඉතා කෙටි කලකින් නරක් විය හැකි නිෂ්පාදනයක් නිසා ඒවා වෙනත් නිෂ්පාදන සඳහා යොදාගන්නා තෙක් සෙල්සියස් අංශක 4 ත් 6 ත් අතර උෂ්ණත්වයක් යටතේ ගබඩා කළ යුතු වෙයි. මෙම උෂ්ණත්වය යටතේ වුව කිරි කොපමණ කාලයක්

තබා ගත හැකි ද යන්න තීරණය වන්නේ ඒවායේ ආරම්භක ක්ෂුද්‍ර ජීවී ගුණාත්මකභාවය මත ය. එහෙයින් ගොවීන්ගෙන් ලබාගන්නා කිරි හැකි ඉක්මනින් සැකසුම් කම්හල් වෙත ප්‍රවාහනය කළ යුතුව තිබේ. එ නමුත්, මේ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීමත් මෙම අංශයේ පවත්නා බරපතල ගැටලුවකි.

නිසි පරිදි කිරි ශීතකිරීමේ පහසුකම් ශ්‍රී ලංකාව තුළ නොපැවතීම ද ගැටලුවකි. මේ වන විට, රට පුරා ඇත්තේ සිසිල් කිරීමේ මධ්‍යස්ථාන තුන් සියයකට අඩු ප්‍රමාණයකි. කිරි නිෂ්පාදනය හොඳින් සිදු කෙරෙන රටවල සෑම ගොවිපොළක ම ශීත කිරීමේ ටැංකි පවතින බව මෙහි දී අප විසින් දැනගත යුතු කරුණක් වෙයි. එවැනි පහසුකම් පවතින්නේ නම් සැකැසුම් සඳහා බවුසර් මගින් කිරි එකතු කළ යුතු වන්නේ දින තුනකට වතාවකි.

කිරි නිෂ්පාදනයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපැයීම ද විධිමත් සහ ප්‍රමාණවත් අයුරින් සිදු නො කෙරෙයි. කිරි ගවයින්ගෙන් ආදායම් සහ ලාභ ඉපැයිය හැක්කේ එයට අදාළ යම් කාල රාමුවක් තුළ ය. එහෙයින් කිරි ගොවියන් විසින් ලබාගන්නා ණය ආපසු ගෙවීම ද එයට අනුගත වෙයි. මූල්‍ය ආයතන විසින් මෙම මූලික කරුණ නො තකා ණය ලබාදීම සිදු කරන බැවින් ඒ ඇසුරින් තමන්ට අවශ්‍ය ප්‍රාග්ධන සම්පත් ලබාගැනීමට ගොවියන් පෙළැඹෙන්නේ නැත. මේ නිසා කිරි ගොවි අංශයේ වර්ධනය අඩාල වී තිබේ.

කිරි ගව පාලනයට අදාළ දැනුම සහ හැකියාව ලබාගැනීමේ ප්‍රවේශ මාර්ග ද ඉතාමත් සීමිත ය. විශ්වවිද්‍යාල මට්ටමින් අදාළ අධ්‍යාපනය ලබාගන්නා අය සිටිය ද එම දැනුම බිම් මට්ටමට බෙදාදීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවෙයි. එහෙයින්, මෙම අංශයට අදාළ දැනුම සහ හැකියාවන් නිසි ලෙස ප්‍රචලිත නොවීමේ ගැටලුවක් ද පවතියි.

උක්ත කරුණු සළකා බලා අප විසින් සම්පාදනය කරනු ලබන කිරි ගව පාලන ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ මේවා ය.

- කිරි ගව පාලන අංශයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය.
- කිරි ගොවීන්ට අවශ්‍ය දැනුම සහ හැකියාව ලබාදෙන මාර්ග ප්‍රචලිත කිරීම.
- කිරි ගවයින්ගේ ආහාර අවශ්‍යතා නිසි පරිදි ලබාදීම සහතික කිරීම.
- කිරි ගව පාලන අංශයේ සෞඛ්‍ය අවශ්‍යතා නිසි පරිදි ලබාදීම.
- කිරි නිෂ්පාදන ගබඩා කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම.
- කිරි ගව පාලනයට අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය තහවුරු කිරීම.
- කිරි ගොවියන් දිරිගැන්වීම

ඉදිරිමග

1. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකාවේ වාස්තවික තත්ත්වයන්ට ගැළපෙන අයුරින් කිරි ගව පාලනය සිදුකිරීම සඳහාත් ඒ මගින් තිරසාර, අඛණ්ඩ හා ලාභදායි කිරි නිෂ්පාදනයක් ලැබීම තහවුරු කිරීම සඳහාත් උඩරට, මැදරට, පහතරට තෙත්, පහත රට වියළි, පොල් ත්‍රිකෝණය, සහ යාපනය යන කිරි ගව කලාප හය පදනම් කරගත් පර්යේෂණ සහ සංවර්ධන ආයතන පිහිටුවිය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. හරිත කෘෂිකර්මය සහ චක්‍රීය කෘෂිකර්ම සංකල්පය මත පදනම්ව කිරි ගව පාලනය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම සහ මාදිලි හඳුන්වාදීම ද මේ තුළින් සිදු කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

2. කිරි ගොවි අධ්‍යාපනය සහ පුහුණුව

කිරි ගව පාලනය සඳහා ගොවීන්ට අවශ්‍ය වන දැනුම සහ නිපුණතාව ලබාදීමේ ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන ජාලයක්

පිහිටුවිය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. මේ සඳහා දැනට පවතින ප්‍රවර්ධක පද්ධතිය කාර්යක්ෂම කොට වර්තමාන අවශ්‍යතා සඳහා ගැළපෙන අයුරින් ක්‍රියාත්මක කළ හැකි ය. ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක රජයේ සහ පුද්ගලික අංශයේ සත්ත්ව ගොවිපොළ තුළ දී කිරි ගොවියන්ට අවශ්‍ය පුහුණුව ලබාදිය යුතු ය. දැනට තිබෙන අධ්‍යාපන ක්‍රමවේද කාර්යක්ෂම කිරීම මගින් සහ යෝජිත නව ක්‍රම මගින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමා කිරි ගව කර්මාන්තය ආශ්‍රිත දැනුම ඇති වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම ද සිදු කළ යුත්තේ ය.

අලුතින් කිරි ගව පාලනයට අවතීර්ණ වීමට බලාපොරොත්තු වන අය සඳහා සුදුසු පාඨමාලා සංවිධානය කර අවශ්‍ය වෘත්තිය පුහුණුව ලැබීමෙන් පසු ඒ සඳහා අනුගත කළ යුතු බව ද මෙයින් යෝජනා කෙරෙයි. එ මෙන් ම, දැනට කිරි ගව පාලනයේ නිරත වන අය සතු පාරම්පරික සහ භාවිත දැනුම ද යොදාගනිමින් එයට සමගාමීව නවීන විද්‍යාත්මක දැනුම ද ලබා දී ඒ අනුව ගොඩ නැගූ වෘත්තීය සුදුසුකම් සහිත පදනමක් මත කර්මාන්තය පවත්වාගෙන යා යුතු බව ද මෙයින් නිර්දේශ කෙරෙයි.

3. කිරි ගව ආහාර ගැටලුව විසැඳීම

තෘණ වගාව සඳහා වාරි මාර්ග පහසුකම් සැපැයිය යුතු බව රජය විසින් ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති සහ ආයතනික ක්‍රමවේද සම්පාදනය කළ යුතු ය. එ මෙන් ම, අඛණ්ඩ ජල සැපයුමක් සහිත තෘණ වගාව සඳහා ද යෝග්‍ය ඉඩම් පමණක් කිරි ගව පාලනය සඳහා ලබාදීමට රජය ක්‍රියා කළ යුතු ය. ධාන්‍ය, එළවළු වැනි බෝග වගා කිරීම සඳහා ජලය අවශ්‍ය වන්නේ එම කාර්යය සිදු කෙරෙන කාල සීමාව (කන්නය) තුළ දී පමණකි. නමුත් කිරි ගව පාලනයේ දී සත්ත්වයින්ගේ පරිභෝජනය වෙනුවෙන් තෘණ මූලික කරගත් ආහාර සැපැයීම සඳහා වසර මුළුල්ලේ ම අඛණ්ඩ ජල සැපැයුමක් ලබාදිය යුතු ය. මෙම නිර්දේශය සපුරාලිය නොහැකි අවස්ථාවල දී තෘණ වගා කිරීම, සත්ත්ව ආහාර සැකැසීම සහ සැපැයීම සඳහා සුදුසු ආයතන බිහි කිරීමට ද කටයුතු කළ යුතු ය. 1986

අංක 15 දරන සත්ත්ව ආහාර පනත මගින් හෝ අමතර අවශ්‍යතා වෙනුවෙන් එයට සිදු කරනු ලබන සංශෝධනවලින් අනතුරුව හෝ උක්ත කාර්යය සිදු කළ හැකි ය.

4. කිරි ගව අංශයේ සෞඛ්‍ය අවශ්‍යතා ලබාදීම

කිරි ගව කර්මාන්තය පදනම් කරගත් දැනට පවතින පශු වෛද්‍ය හා පසු උපදේශන සේවා දීප ව්‍යාප්තව කාර්යක්ෂමව ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුත්තේ ය. පශු උපදේශන, අදාල නීති රෙගුලාසි හා නිර්දේශිත ක්‍රමවේදයන්ට යටත්ව කිරි ගව පාලනය සිදු කරන්නේ ද යන වග නියාමනය කළ යුත්තේ ය. මෙම නියාමන කාර්යය විධිමත් අයුරින් සිදු කිරීම සඳහා අවශ්‍ය ආයතනික පදනම සහ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කළ යුත්තේ ය. තව ද, කිරි ගව පාලනය සඳහා අදාළ වන ආචාර ධර්ම සහ සත්ත්ව සුබසාධන නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න විමර්ශනය ද උක්ත නියාමනයට අන්තර්ගත කළ යුත්තේ ය.

5. ගබඩාකිරීම සහ ප්‍රවාහනය

නිෂ්පාදනය කරන ප්‍රදේශ තුළ ම කිරි නිෂ්පාදන (විශේෂයෙන් ම, දියර කිරි) සැකසීමත් ඒවා එම ප්‍රදේශයේ පරිභෝජන අවශ්‍යතා ඉක්මවා නො යන්නේ නම් අදාළ ප්‍රදේශය තුළ ම ඒවා බෙදාහැරීම සඳහාත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු ය. ප්‍රාදේශීය මට්ටමින් කිරි ශීතාගාර ඉදිකිරීම ද සිදු කළ යුත්තේ ය. කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම්කරුවන්ට සහ පාරිභෝගිකයන් වෙත දියර කිරි බෙදාහැරීමේ ජාලය කාර්යක්ෂම කිරීම ද එය විධිමත් අයුරින් නියාමනය කිරීම ද සිදු කළ යුත්තේ ය. උක්ත නියාමනයට කිරි සැපැයුම් ජාලය මෙන් ම කිරි සැකසුම් ජාලය ද කිරි සහ ආශ්‍රිත නිෂ්පාදන බෙදාහැරීමේ ජාලය ද ලක් කළ යුත්තේ ය. ඒ සඳහා අනුමත නීති රෙගුලාසිවලට අනුකූලව සියලු කටයුතු සිදු කෙරෙන බව එ ලෙසින් තහවුරු කළ යුත්තේ ය.

6. ප්‍රාග්ධන සම්පාදනය

කිරි ගව පාලනය සඳහා ම විශේෂිත වූ මූල්‍ය පහසුකම් සැපයීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතු ය. මෙම කර්මාන්තයේ ආයෝජනය සහ ආදායම් ලැබීම අතර පරතරය අවුරුදු කීපයක් වන බැවින් අදාළ මූල්‍ය පහසුකම් සැපැයීමේ දී එම කරුණු සැළැකිල්ලට ගත යුත්තේ ය. තත්ත්ව නියාමන ක්‍රමවේදයක් යටතේ අභිජනන පහසුකම්, යන්ත්‍රෝපකරණ, සැකසුම් උපකරණ වැනි අවශ්‍ය සම්පත් කිරි ගොවීන් සඳහා සැපයීමේ දී ඒ සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ප්‍රමාණවත් පරිදි ලැබෙන්නේ ද යන වග රජයේ අවධානයට ලක්විය යුත්තේ ය.

7. කිරි ගොවියන් දිරිගැන්වීම

කිරි ගව පාලනයට අදාළ ඉලක්ක සහ නිර්ණායක පදනම් කරගෙන වසරේ හොඳ ම කිරි ව්‍යවසායකයා තෝරා ප්‍රදාන සහ සහතික පිරිනැමීම් වැනි කාර්යයන් මගින් ගොවීන් උනන්දු කර තිරසාර සහ අඛණ්ඩ නිෂ්පාදනයක් සපුරාගැනීමේ අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීමට රජය සහ අනෙකුත් ආයතන කටයුතු කළ යුතු ය. මෙවැනි කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රචාරය ලබාදීමට සියලු මාධ්‍ය අංශ ද දිරිමත් කළ යුත්තේ ය. එ මෙන් ම, කිරි ගව පාලනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් රජය විසින් ලබා දී මෙම අංශයට ගොවියන් පුද්ගලික මට්ටමින් සහ සාමූහිකව පෙළැඹවීම ද රජය විසින් සිදු කළ යුත්තේ ය.

නීල ආර්ථිකය

හැඳින්වීම

බොහෝ විට, ශ්‍රී ලංකාව හඳුන්වනු ලබන්නේ වර්ග කිලෝ මීටර් 65,610 ක භූමි ප්‍රමාණයකින් සීමාවුණු කුඩා රටක් ලෙසිනි. කෙසේ වුව ද, සත්‍යය වනුයේ අප ජලජ සම්පත්වලින් ඉතා පොහොසත් ජාතියක් වීම ය. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය ජල සම්පත වර්ග කිලෝ මීටර් 2,600 ක වපසරියක් පුරා පැතිරී තිබේ. එයට අමතරව, අපට කිලෝ මීටර් 1,585 ක් දිග වෙරළ තීරයක් ද, වර්ග කිලෝ මීටර් 517,000 කින් (එනම්, රටේ භූමි ප්‍රමාණය මෙන් අට ගුණයක විශාලත්වයකින්) සමන්විත විශේෂ සමුද්‍රීය ආර්ථික කලාපයක් ද හිමි වී තිබේ. මෙම විශේෂ සමුද්‍රීය ආර්ථික කලාපය මුහුදු ආහාර වර්ග රාශියක නිවහන ලෙසින් ද වටිනා ස්වභාවික වායු, ඉන්ධන සහ ඛනිජ ලවණ නිධි සමූහයක් ගබඩා වුණු නිධානයක් ලෙසින් ද සැළැකිය හැකි ය. බලශක්ති නාවික මාර්ග, මුහුදු පතුළ යටින් දිවෙන තන්තු යනාදියෙන් සමන්විත, ඒ හේතුවෙන් ප්‍රවාහන සහ සන්නිවේදන අංශ සඳහා උපායමාර්ගික වශයෙන් වැදගත් ප්‍රදේශයක් ලෙසින් ද මෙම විශේෂ සමුද්‍රීය ආර්ථික කලාපය හඳුනාගත හැකි ය.

ස්වභාව ධර්මයෙන් ලැබුණු මෙම මහා දායාද හිමි වී තිබුණ ද, ශ්‍රී ලංකාව තම ජනතාවගේ යහපත උදෙසා ඒවා උපයෝජනය කරගෙන ඇත්තේ ඉතා අල්ප වශයෙනි. ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ සංඛ්‍යාලේඛනවලට අනුව, ගෝලීය සත්ත්ව ප්‍රෝටීන

අවශ්‍යතාවයෙන් සියයට 17 ක් සපයා ගනු ලබන්නේ ජලජ ආහාරවලිනි. ශ්‍රී ලංකාවේ සත්ත්ව ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් සියයට 50 ක් ම සපයා ගනු ලබන්නේ මත්ස්‍ය සම්පත්වලිනි. මත්ස්‍ය සම්පත සඳහා මෙ තරම් භාවිත වටිනාකමක් තිබුණ ද, පසුගිය අවුරුදු කිහිපය තුළ ම ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 400,000 ක සීමාවේ වෙනස් නොවී පවතියි. ඉන්දියානු සාගරය තුළ නවීන නෞකා යොදාගෙන මහා පරිමාණයෙන් මසුන් අල්ලන සහ පිරිසැකසුම් සිදු කරන ජපානය, කොරියාව, සහ ප්‍රංශය යන රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ සාගර ධීවර කර්මාන්තය තවමත් කාර්මිකකරණය වී නොමැත.

1990 ගණන්වල සියයට 20 කට සීමා වී තිබුණු ගෝලීය මුහුදු ආහාර නිෂ්පාදනය සඳහා වන ජලජීවී දායකත්වය 2020 වන විට සියයට 50 දක්වා සුවිසල් පිම්මක් පැන ඉදිරියට පැමිණ තිබේ. නවීන තාක්ෂණය සහ ශිල්පීය ක්‍රම භාවිතා කරමින්, නිවැරැදි ආයතනික සහ දිරිගැන්වීම් රාමුවක් ස්ථාපනය කිරීමට හැකි වූ රටවල්වලට ජලජීවී වගාව අතිශයින් ම ලාභදායි කර්මාන්තයක් බවට පත් වී තිබේ. කෙසේ වුව ද, සමස්ත ධීවර නිෂ්පාදනයට ජලජීවී වගාවේ දායකත්වය සියයට 5 කටත් අඩු බැවින්, ශ්‍රී ලංකාව සිටින්නේ එම ප්‍රවනතාවයේ බොහෝ පසුපසිනි. කෙටි සහ මධ්‍යකාලීනව සළකා බලන කල, ජලජීවී වගාවට ශ්‍රී ලංකාවේ අපනයන බල කේන්ද්‍රයක් සහ විදේශ මුදල් ඉහළින් උපයාගත හැකි මූලාශ්‍රයක් වීමේ හැකියාව පවතියි.

තව ද, ලෝක සාගර ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් තම සාගර ගවේෂණය සම්පූර්ණ කළ යුතු ය. ඒ තුළින් අපට හිමි සාගර භූමි ප්‍රමාණය රටේ භූමිය මෙන් 8 ගුණයේ සිට 22 ගුණයක් දක්වා ප්‍රසාරණය කරගැනීමේ හැකියාව වෙයි. ඒ අනුව, අප සතු ස්වභාවික සම්පත් සමුදාය විශාල වශයෙන් ඉහළ නංවාගැනීමටත් ආර්ථික විභවය ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කරගැනීමටත් අප හට පුළුවන.

අපගේ ධීවර ප්‍රතිපත්තිය පහත සඳහන් අරමුණු ඉලක්ක කරගත් එකකි.

- **ශ්‍රී ලංකාව සතු සමුද්‍රීය සම්පත් නිසි පරිදි හඳුනාගැනීම සහ ඒවා තිරසර ලෙසින් කළමනාකරණය**
- **දේශීය පරිභෝජනය සහ අපනයනය වෙනුවෙන් මුහුදු ආහාර නිෂ්පාදනය සහ ඒවායේ අගය එකතුකිරීම ඉහළ නැංවීම**
- **රට මුහුණ පා සිටින විදේශ විනිමය අර්බුදය විසැඳීම සඳහා කෙටි හා මධ්‍යකාලීන උපාය මාර්ගයක් ලෙසින් ජලජීවී වගාව සංවර්ධනය කිරීම.**
- **සාම්ප්‍රදායික ධීවර ප්‍රජාවන් ආරක්ෂා කරමින් ඔවුන් හට ධීවර කර්මාන්තයේ සංවර්ධනයෙන් ප්‍රතිලාභ ලබාගත හැකි බව සහතික කිරීම**

ඉදිරිමග

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් මෙහි ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති තුළින් සාගර ධීවර කර්මාන්තය, ජලජීවී වගාව, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය, ඒවා ආශ්‍රිත වෙළෙඳපොළ සහ පරිභෝජනය යන අංශවල සංවර්ධනය සහතික වන පරිදි යෝජනා කෙරී තිබේ.

1. සම්පත් හඳුනාගැනීම සහ කළමනාකරණය

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශය වැනි ආයතන යොදාගනිමින් රටේ අභ්‍යන්තර සහ සමුද්‍රීය ජලජ සම්පත් පිළිබඳ පූර්ණ විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීමට රජය කටයුතු කළ යුතු ය. පවත්නා ඛනිජ නිධිවල ස්වභාවය සහ ප්‍රමාණය, වාර්ෂිකව ලබාගත හැකි ධීවර අස්වැන්නේ ප්‍රමාණය සහ වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවක්, මේ ආශ්‍රිත සංචාරක ව්‍යාපාරයෙන් ලබාගත හැකි ආදායම් පිළිබඳ ඇස්තමේන්තුවක්, සැපැයුම් සහ වෙනත් සේවා පිළිබඳ ඇගැයීමක් මෙම සමීක්ෂණවල අරමුණු තුළට ඇතුළත් කළ යුතු ය. මෙ ලෙසින් ලබාගන්නා තොරතුරු මධ්‍යගත දත්ත ගබඩාවක ස්ථානගත කළ යුතු අතර පුළුල් නීල ආර්ථිකයක්

වෙනුවෙන් සැලැස්මක් සම්පාදනය කරගැනීමේ පදනම් කරුණු ඒ තුළින් ලබාගත යුතු ය.

2. ආයතනික ධාරිතා සංවර්ධනය

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශයට අනුබද්ධව අන්තර් ආයතනික මෙහෙයුම් කමිටුවක් පිහිටුවිය යුතු අතර අමාත්‍යංශ සහ අදාළ ව්‍යාපාරික ආයතනවලට තොරතුරු ලබාගත හැකි අයුරින් කාර්යය-ඉලක්කගත පර්යේෂණ සිදු කරනු ලබන සහ ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන බුද්ධි මණ්ඩලයකට සමාන කාර්යභාරයක් සහිත ආයතනයක් බවට එය පත් කළ යුතු ය. තව ද, ධීවර අංශයට අදාළ කරුණු පිළිබඳව සියලු දෙනා හට තනි මතයක් ප්‍රකාශ කළ හැකි සමුපකාර ව්‍යුහයක් සහිත ජාතික මට්ටමේ ආයතනයක් ස්ථාපිත කළ යුතු ය.

3. නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම

විද්‍යාත්මක තාර්කිත්වය මත පදනම් වී ධීවර අංශයට අදාළ ශිල්පීය ක්‍රම නවීකරණය සඳහා රජය විසින් ඉහතින් සඳහන් කළ මධ්‍යම දත්ත ගබඩාව සහ ආයතනික ව්‍යුහය භාවිතා කළ යුතු ය. මසුන් ඇල්ලීම සඳහා අදාළ පාර්ශ්වවලට මගපෙන්විය යුත්තේ ඉල්ලුම සහ සැපැයුම පිළිබඳව පවත්නා සංඛ්‍යාලේඛන පදනම් කරගත් පුරෝකථනයන් මාර්ගයෙනි. නවීන උපකරණ භාවිතයෙන් මසුන් ඇල්ලීමට හැකි වන අයුරින් සාම්ප්‍රදායික ධීවර කර්මාන්තය වැඩි දියුණු කළ යුතු ය. මත්ස්‍ය ගහනයේ චිරස්ථායි බව සහ ප්‍රතිජනනය සහතික කරනු වස් යෝග්‍ය ක්‍රම හඳුන්වා දිය යුතු ය.

විශේෂයෙන් ම, රටවැසියන්ගේ පරිභෝජන සහ පෝෂණ අවශ්‍යතා සඳහා ස්ථාවර මත්ස්‍ය සැපැයුමක් සහතික කරනු වස් නිෂ්පාදන ඉලක්ක ලබාදීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය. ඵලදායිතාව ඉහළ නැංවීමේ අතරමැදි පියවරක් ලෙස, රජය විසින් ධීවර ප්‍රජාව ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව දැනට මත්ස්‍ය අස්වැන්නෙන් සියයට 40 ක් පමණ වන පශ්චාත්-නිෂ්පාදන හානිය අවමකිරීමේ වැඩසටහනක් දියත් කළ යුතු වේ.

අවසාන වශයෙන්, ජාතික ආහාර සුරක්ෂිතතාව සඳහා, නිෂ්පාදනය අඩු කාලවල දී සහ ස්වභාවික විපත් වැනි අනපේක්ෂිත සිදුවීම්වල දී භාවිතා කළ හැකිවන අයුරින් රජය විසින් සංඛ්‍යාලේඛන මත පදනම් වූ පුරෝකථන අනුව ස්වාරක්ෂක තොග පවත්වාගෙන යා යුතු ය.

4. ගුණාත්මකභාවය ඉහළ නැංවීම

තත්ත්ව කළමනාකරණය යනු දේශීය ධීවර අංශයේ අගය ඉහළ නැංවීම සඳහා සහ එය ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී මට්ටමකට ගෙන ඒම සඳහා අනුගමනය කළ යුතු ඉතා වැදගත් පියවරකි. දිවයින මුළුල්ලේ පැතිරුණු ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා එය HAACP, GMP, සහ MSC වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීමේ අවශ්‍යතාව රජය විසින් දිරිමත් කළ යුතු ය. මෙම ප්‍රමිතීන් හඳුනාගෙන, ඒවා ක්‍රියාවට නංවන්නේ කෙසේ ද යන්න පිළිබඳව නිෂ්පාදකයන් සහ පාරිභෝජිකයන් දැන්වත් කිරීමේ වැඩසටහනක් සමඟ මෙය සම්බන්ධ කළ යුතු ය.

බෝට්ටුවේ සිට වෙළෙඳපොළ දක්වාත්, වෙළෙඳපොළේ සිට පිඟාන දක්වාත් පැමිණෙන මත්ස්‍ය නිෂ්පාදනයේ ගමන හඳුනාගැනීම ද ඇතුළත් වන පරිදි සම්පූර්ණ සැපැයුම් දාම ක්‍රියාදාමයේ දෘශ්‍යතාව සහතික කරනු වස් නූතන පාරිභෝගික අපේක්ෂාවන්ට අනුකූල වන යාන්ත්‍රණයක් ද හඳුන්වාදිය යුත්තේ ය. ඉහළ මට්ටමේ ආධාරක යටිතල පහසුකම් (උදා: වරාය, වෙළෙඳපොළ, ප්‍රවාහනය, ශීත ගබඩා, ශීත ප්‍රවාහන සේවා යනාදිය) සපයාදීම සහතික කිරීමට ද රජය ක්‍රියා කළ යුත්තේ ය. මේ සඳහා අවශ්‍ය තාක්ෂණය සහ ක්‍රමවේද රාජ්‍ය - පුද්ගල හවුල්කාරීත්වය තුළින් ලබාගත හැකි ය. අදාළ රාජ්‍ය බලධාරීන් විසින් ගොඩබෑමේ ස්ථානවල, නැංගුරම් පොළවල, වරායවල සහ කලපුවල අත්‍යවශයෙන් පැවැතිය යුතු සෞඛ්‍ය, සනීපාරක්ෂක තත්ත්වයන් නිරන්තරයෙන් පරීක්ෂා කිරීම ද පවත්වාගෙන යෑම ද කළ යුත්තේ ය.

5. වෙළෙඳපොළ පහසුකම් ඉහළ නැංවීම

නව වෙන්දේසි ස්ථාන නිර්මාණයෙන්, යාත්‍රා හිමියන් ශ්‍රේණිගත කිරීමෙන්, සහ තොග ගැනුම්කරුවන් හා තොග විකුණුම්කරුවන් සම්බන්ධ කෙරෙන ඩිජිටල් වේදිකා ඉදිකිරීමෙන් දේශීය මුහුදු ආහාර වෙළෙඳපොළ තුළ ජනතා සහභාගීත්වය ඉහළ නැංවීමටත් එය සංවර්ධනයටත් රජය ක්‍රියා කළ යුත්තේ ය. මෙහි අරමුණ වන්නේ අතරමැදියන් විසින් සිදු කරනු ලබන සූරාකෑම වළක්වා, නිෂ්පාදක සහ පාරිභෝගික දෙපාර්ශ්වයට ම වාසිදායක මිල ගණන් ඇතිකිරීමයි.

6. අගය එකතුකිරීම් සහ අපනයන ප්‍රවර්ධනය

පිරිසැකසුම් සහ ඇසුරුම් ආකාරයෙන් තවදුරටත් අගය එකතු කිරීම් සඳහා පදනමක් ලෙසින් භාවිතා කළ හැකි ගුණාත්මක මුහුදු ආහාරවල ස්ථාවර සැපැයුමක් සහතික කිරීම පිණිස රාජ්‍ය ප්‍රතිපත්ති පෙළගැස්විය යුතු ය. නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගීකරණය, වෙළෙඳපොළ උපාය මාර්ග, සහ ඉහළ විභවතාවක් ඇති අපනයන වෙළෙඳපොළ හඳුනාගැනීම ඇතුළු කරුණු ගැන විමර්ශනයට ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යංශය අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සහ පුද්ගලික අංශය සමඟ එකතු වී පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කළ යුතු ය. ධීවර අපනයන අංශයේ උසස් සන්නාම සංවර්ධනය සඳහා ප්‍රබල රාජ්‍ය අනුග්‍රහයක් ලබාදිය යුත්තේ ය. කාබනික සහ තිරසාරත්වය රකින නිෂ්පාදනවලට යොමුවීම වැනි ගෝලීය පාරිභෝජන ප්‍රවනතා ද අපනයන අංශය විසින් ප්‍රයෝජනයට ගත යුතු ය.

7. ජලජීවී වගා ප්‍රවර්ධනය

ගෝලීය ධීවර නිෂ්පාදනය තුළ ජලජීවී වගාවට හිමිවෙමින් තිබෙන ඉහළ පිළිගැනීම, ශ්‍රී ලාංකික ජනතාවගේ පෝෂණ අවශ්‍යතා, සහ විදේශ මුදල් ඉපැයීම සඳහා වන හදිසි අවශ්‍යතාව යනාදිය සැළැකිල්ලට භාජනය කර රජය විසින් ජලජීවී වගාව ප්‍රචලිත කිරීමත් එයට අවශ්‍ය කෙරෙන ආධාරක යටිතල පහසුකම් සහ සේවා සංවර්ධනයත් සිදු කළ යුත්තේ ය. අදාළ අනෙකුත්

රාජ්‍ය ආයතන සමඟ එක් වී ධීවර සහ ජලජීවී අමාත්‍යාංශය විසින් ජලජීවී වගාව සඳහා සුදුසු අභ්‍යන්තර ජලාශ හඳුනාගැනීම සහ ඒවා සිතියම් ගතකිරීම සිදු කළ යුත්තේ ය. ඉහළ තාක්ෂණය යොදාගෙන නවීන අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමත් කීටයන් / පැටවුන් බෙදාහැරීමත් රජය විසින් සිදු කළ යුත්තේ ය. ජලජීවී වගා ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය නිෂ්පාදන සහ අලෙවිකරණ ශිල්ප පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීම ඉලක්ක කරගෙන සේවක සහ වෘත්තීයවේදී සංගම් ද ඇති කළ යුත්තේ ය. දිගු කාලීනව, පශු ඖෂධ සහ සත්ත්ව ආහාර නිෂ්පාදනය වැනි ආර්ථිකයේ අනෙකුත් අංශ සමඟ සිරස් ඒකාබද්ධතාවක් ඇති වන අයුරින් ද ජලජීවී වගා අංශය සංවර්ධනය කළ යුතු ය.

8. ධීවර ප්‍රජාව සඳහා සමාජ ආරක්ෂණය

යාත්‍රාවල සේවය කරන ධීවරයන් සහ කාර්මිකයන් ඇතුළු ධීවර අංශයේ ශ්‍රමිකයන් සඳහා විශේෂිත ඩිජිටල් හැඳුනුම්පතක් නිකුත් කිරීම ද රජය විසින් ආරම්භ කළ යුත්තේ ය. ක්ෂේත්‍රයේ නියුතු ශ්‍රමිකයන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන විසින් විධිමත් පුහුණු පාඨමාලා සකසා ඉගැන්වීම් කටයුතු සිදු කළ යුතු ය. අඩු ආදායම්ලාභී ධීවරයන් ඉලක්ක කරගත් මිල පාලනයක් සහ සහනාධාර වැඩසටහනක් රජය විසින් සම්පාදනය කළ යුත්තේ ය. ධීවර අංශයේ ඉපැයීම් යොදාගෙන ස්වභාවික විපත් ඇතිවන සහ මත්ස්‍ය අස්වැන්න අඩුවෙන අවස්ථාවල දී ධීවර ප්‍රජාවට පිහිටවීම සඳහාත් ඔවුන්ගේ සාමාන්‍ය දරිද්‍රතාව පිටුදැකීම සහ ප්‍රජා සංවර්ධනය සඳහා වැඩසටහන් හඳුන්වාදීම සඳහාත් යොදාගත හැකි අරමුදලක් ඇතිකිරීමට රජය ක්‍රියා කළ යුත්තේ ය. මත්ස්‍ය කර්මාන්තය වැඩි වැඩියෙන් යාන්ත්‍රිකකරණයට යොමුවීම සහ කර්මාන්තයේ අවධානය ජලජීවී වගාවට යොමුවීම හේතු කොටගෙන ඇතිවන රැකියා අහිමිවීම වැනි බාහිර පිරිවැය වෙනුවෙන් ද මෙම අරමුදල යොදාගත හැකි ය. මෙම ක්‍රියාදාමවල දී රැකියා අහිමිවන ධීවරයන් නිසි පරිදි පුහුණු කර නව නිෂ්පාදන ඉසව් වෙත යොමු කළ යුත්තේ ය.

9. පාරිසරික තිරසාරත්වය ප්‍රවර්ධනය

ධීවර කර්මාන්තය යනු මූලික වශයෙන් ම ස්වභාවික සම්පතක් වන බැවින් මෙම ස්වභාවික නිධානයෙහි චිරස්ථායි බව සහ අඛණ්ඩ පුනර්ජීවනය සහතික කිරීම පිණිස රජය විසින් ශක්තිමත් (an denfore) නීතිමය රාමුවක් සකස් කළ යුතු ය. සාගර සහ ආශ්‍රිත අනෙකුත් පාරිසරික ප්‍රදේශ දූෂණයවීම අවම කිරීම සඳහා සියලු ආකාරයේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය භාවිතය සහ බැහැර කිරීම තහනම් කිරීමේ නීති හඳුන්වාදිය යුතු ය. විදුලිය සහ සූර්යය බලය වැනි අඩු විමෝචන තාක්ෂණ ක්‍රම භාවිතා කළ හැකි අයුරින් ධීවර යාත්‍රා ක්‍රම ක්‍රමයෙන් වැඩිදියුණු කළ යුතු ය. ගැඹුරු දැල් එලීම (Bottom trawling) සහ අධික ලෙස මසුන් ඇල්ලීම වැනි හානිකර වානිජ ධීවර කටයුතු දැඩි ලෙසින් තහනම් කළ යුතු ය. මසුන් ඇල්ලීමේ දී සහ සැකැසුම්වල දී ඉතිරිවෙන අපද්‍රව්‍ය දේශීය අවශ්‍යතා සඳහා කාබනික පොහොර නිෂ්පාදනයට යොදාගත යුතු ය. ධීවර කර්මාන්තය පදනම් කරගත් කලාපීය හා ගෝලීය ජගත් සංවිධාන සමග (IOTC, FAO, UN) ක්‍රියාකාරීව සබඳතා පවත්වා ගැනීම හා ඒ හරහා දේශපාලනික බලපෑම්, අනවසර සම්පත් නෙලා ගැනීම සහ පරිසර දූෂණය අවම කර ගැනීම.

10. නීල ආර්ථිකය හා බැඳුණු සංවර්ධන අවස්ථා

නීල ආර්ථිකය සඳහා ධීවර කර්මාන්තයෙන් ඔබ්බෙහි ඇති ආර්ථික අවස්ථා ද රජය විසින් ගවේෂණය කළ යුතු ය. මේ සඳහා පහත සඳහන් ඉසව් ඇතුළත් කරගත හැකි ය. එ නමුත්, ඒවාට සීමාවිය යුතු නොවේ.

- චිරස්ථායි පාරිසරික සංචාරක ව්‍යාපාරය සහ ජල ක්‍රීඩා යනාදිය වෙනුවෙන් යොදාගත හැකි වන පරිදි වෙරළබඩ ධීවර කර්මාන්තය සහ අභ්‍යන්තර ජලාශ සංවර්ධනය
- දේශීය ජලජ ශාක සහ විශේෂ යොදාගනිමින් ඖෂධ නිෂ්පාදනය දිරිගැන්වීම
- ධීවර හා ජලජීවී මත්ස්‍ය කර්මාන්තය

- සාගර භාණ්ඩ ප්‍රවාහනය හා ගමනාගමනය (යටිතල පහසුකම් සැපයීම, යාත්‍රා නිෂ්පාදනය, අලුත්වැඩියාව ඇතුළුව)
- මුහුද හා බැඳුණු සංචාරක කර්මාන්තය
- ගැඹුරු මුහුදේ ඛනිජ ලවණ ගවේෂණ / ඛනිජ තෙල් ගෑස් (බලශක්තිය)
- සාගරය පදනම් කරගත් පුනර්ජනනීය බලශක්තීන්
- මුහුදු පැලෑටි හා ආශ්‍රිත ආහාර සහ ඖෂධ නිෂ්පාදනය
- සාගරය පදනම් කරගත් සන්නිවේදනයන් හා තොරතුරු තාක්ෂණය

ඉහත නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජාත්‍යන්තර සහයෝගිතාව, සම්බන්ධීකරණය හා නෛතික තත්ත්වයන් ප්‍රශස්ථව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කඩිනමින් සිදුකර ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.

මෙමගින් බිහිවන නව රැකියා සඳහා අවශ්‍ය වන මානව සම්පත පිළිබඳ පුරෝකථනයන් හරහා දෙස් විදෙස් දැනුම ඒකරාශී කරගැනීම හා ඒමගින් සන්නද්ධ වූ මානව සම්පත් ඒ ඒ ක්ෂේත්‍රයන් සඳහා බිහි කරගැනීම නීල ආර්ථිකයේ අනාගත ඵලයන් සඳහා අතිශය වැදගත් වනු ඇත.

රතු ආර්ථිකය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පැවැතුණු කර්මාන්ත බ්‍රිතාන්‍යයෝ විනාශ කළහ. ඔවුන්ගේ නික්ම යෑමෙන් අනතුරුව, ධනයට සහ බලයට හිමිකම් පෑ ස්වදේශීය ප්‍රභූ පැලැන්තිය ද රට කාර්මිකකරණය කිරීමට අසමත් වූහ. 1956 සිට 1977 දක්වා කාලය තුළ හැරුණු විට, ශ්‍රී ලංකාව විසින් තම කාර්මික පදනම සැළැකිය යුතු ලෙසින් වර්ධනය කර නොගත්තේ ය. ඇඟලුම්, ආහාර පාන නිෂ්පාදනය හැරෙන්නට වෙනත් අගය කළ හැකි කර්මාන්ත අංශයක් වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට නොමැත.

ශ්‍රී ලංකාවේ නූතන කාර්මික ධනේශ්වරයක් නොමැතිවීමත් අඩු ආයෝජනයකින් වැඩි ප්‍රතිලාභ අපේක්ෂා කරමින් වෙළෙඳ, දේපල, සහ මූල්‍ය අංශවල අතපතගාමින් සිටීමට ව්‍යාපාරිකයන් පෙළැඹීමත් නිසා මෙය සිදු වී තිබේ. අඩු කාලයකින් වැඩි පිරිවැටුමක් අපේක්ෂා කිරීමේ මෙම ප්‍රවේශය නිසා ආයෝජන ප්‍රතිලාභය ඉහළ ගියා පමණක් නොව දළ දේශීය නිෂ්පාදිතය ද අස්වාභාවික අයුරින් ඉහළ නැංවීය. කෘෂිකර්ම සහ කාර්මික අංශ බිල්ලට දී ඒ වෙනුවට සේවා අංශය ඉහළ නැංවීමට බ්‍රෙට්න්වුඩ්ස් නියෝජිතායතන වැඩි කැමැත්තක් දක්වති.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ ධනේශ්වරය බොහෝ දුරට ඒකාධිකාරී, කුලී සැපයුම්කාරී, සමපේක්ෂක පංතියක් ලෙසින් ක්‍රියා කරයි.

රාජ්‍ය නිලධාරී තන්ත්‍රයේ ආරක්ෂාව ලබන එය කාටල සමූහයක ස්වරූපයෙන් තම ඒකාධිකාරී පැවැත්ම තහවුරු කරගනියි. නිෂ්පාදනය විකිණීම සහ ණය ලබාදීම මත අධිකාරිත්වයක් පවත්වාගෙන යෑම තුළින් එය ගොවියන්ගේ නිෂ්පාදනයට බාධා කරයි. දේශීය නිෂ්පාදනවලට වඩා ආනයන බෙහෙවින් ලාභදායි කිරීමේ අරමුණ පෙරටු කරගෙන තම සිතැඟි පරිදි තීරුබදු සහ අනෙකුත් බදු හසුරුවන එය කර්මාන්ත අංශයේ වර්ධනයට බාධා කරයි.

කෙසේ වුව ද, පැවැති ඓතිහාසික තත්ත්වයන් හේතු කොටගෙන කර්මාන්තයට ඇතුළු වූ බැවින් ඇඟලුම් නිෂ්පාදකයින් වැනි ධනේශ්වරයට අයත් ඉතා සුළු පිරිසක් නිෂ්පාදන කාර්යය කෙරෙහි කැපැවී කටයුතු කරති. කෙසේ වුව ද, ආනයනික යෙදවුම් සහ අපනයනය කරනු ලබන නිමැවුම් පිළිබඳ වැරැදි ඉන්වොයිස් කිරීම ඔස්සේ තම ඉපැයීම් විදේශවල තබාගැනීමට හැකි බැවින් මෙම අංශය ද සැපැයුම් දාමය දිගේ සිරස් අතට ඒකාබද්ධවීමට උත්සාහ නො කරයි. ලාබ ශ්‍රමය සහ වෙළෙඳපොළට වඩා හොඳ ප්‍රවේශයක් ඇති රටවල ආයෝජනය කිරීමට ද ඔවුහු පෙළැඹෙති.

කාර්මිකකරණය පිළිබඳ දැක්මක් නොමැති බැවින්, රජයන් විසින් කාර්මික සංවර්ධනය යනු හුදෙක් ම වෙළෙඳාම සහ සේවා සැපැයීම, යටිතල පහසුකම් සහ දේපල සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලබන උපායමාර්ග සැලැසුමක පරිධියේ විෂයයක් පමණක් බවට පත් කර තිබේ.

කාර්මික කරණය දිරිගැන්වීම සඳහා නැඹුරුවක් නැති රාජ්‍ය යාන්ත්‍රණය කාර්මික නැපැයුම් ආනයනයටත් ඒවා බෙදාහැරීමටත් සහාය දක්වයි. දේශීය කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තවල ප්‍රගමනයට බාධා කරමින්, විදේශීය ආයෝජකයන් වළක්වමින් කටයුතු කරනු ලබන ආනයන කාටල සමූහයට දූෂිත රාජ්‍ය යාන්ත්‍රණය ද සම්බන්ධ බැවින් ගැටලුව තවත් උග්‍ර කරවයි. එ මෙන් ම, නිෂ්පාදනයේ පිරිවැය තවත් ඉහළ නංවයි.

සැපැයුම් දාමවල පැවැත්ම සහතික කරන්නා වූ ද, අලුත්වැඩියා කිරීමේ පහසුකම්වලින් සමන්විත වන්නා වූ ද, නවීන

තාක්ෂණයට ප්‍රවේශ ඇත්තා වූ ද පහසුවෙන් නිෂ්පාදන සිදු කළ හැකි කාර්මික පාරිසරික පද්ධතියක් නොමැතිවීම ද දේශීය කර්මාන්ත දියුණුකිරීමට පවතින ප්‍රධානතම බාධාවකි. සැපයුම් දාමය විදේශීය එකක් වන විට, නිෂ්පාදන කාලය කෙටි කරගැනීම සහ නිමැවුම් තොග අඩු කරගැනීම අපහසු ය. එහෙයින්, අමුද්‍රව්‍ය සැපැයුමේ සිට යාන්ත්‍රික කොටස් සහ අමතර කොටස් දක්වා ද, අවසාන නිමි යන්ත්‍ර දක්වා ද දේශීය සැපැයුම් දාම සංවර්ධනය අත්‍යවශ්‍ය වේ.

කාර්මික පරිසර පද්ධතියක් නැති බැවින් ද, මිල සහ මුදල් ස්ථාවර බවක් නොමැති බැවින් ද, කාර්මික නිෂ්පාදනය සඳහා කැපී පෙනෙන අයුරින් විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමට ශ්‍රී ලංකාව අසමත් වී තිබේ.

නිෂ්පාදකයින් හට එකිනෙකා හා තරග කළ හැකි වෙළෙඳපොළක් ද කාර්මික පාරිසරක පද්ධතියක් සඳහා අත්‍යවශ්‍ය වෙයි. ආනයන කර විකුණා ඉහළ ලාභ ඉපැයීමේ අවස්ථාව හැරුණු විට, නිමි ද්‍රව්‍ය අලෙවිය සඳහා යෝග්‍ය වන පරිදි අභ්‍යන්තර වෙළෙඳපොළ සංවර්ධනය කිරීමට පවත්නා ප්‍රධාන බාධාවක් වන්නේ කෘෂිකර්මාන්ත අංශයේ පවත්නා අඩු සංවර්ධනය සහ ඒ අනුව ම පවත්නා අඩු ඵලදායිත්වයයි. කෙසේ වුව ද, කෘෂිකාර්මික අංශයේ අඩු යාන්ත්‍රිකකරණය සහ විදේශීය ශ්‍රමිකයන් උපයන ප්‍රේෂණ අතරමැදි ප්‍රභූ ආයතන වෙත නොගොස් සෘජුව ම ජනතාව වෙත ගලායෑම යන සාධක දෙක හේතුවෙන් මෙම වාතාවරණය ඉතා සීඝ්‍රයෙන් වෙනස්වෙමින් පවතියි.

ආහාර පාන නිෂ්පාදන අංශය හැරුණු විට, ගොවිජන වෙළෙඳපොළෙහි වර්ධනය වන අවශ්‍යතා සපුරාලීමට දේශීය කර්මාන්ත අසමත් වී තිබේ. ඉහළ වෙළෙඳපොළ ඉලක්ක කරගෙන දේශීය නිෂ්පාදකයින් තම නිෂ්පාදන කටයුතු කරන විට ශ්‍රී ලාංකික නිෂ්පාදන ඉතා මිල අධික වන බැවින් බැංකොක්වලින් ආනයනය කරනු ලබන ලාභ ඇඟලුම් මිල දී ගැනීමට පවා ග්‍රාමීය පාරිභෝගිකයෝ පෙළැඹී සිටිති.

වෙළෙඳාමට වඩා සැළැකිය යුතු මට්ටමින් ඉහළ ආයෝජනයක් අවශ්‍ය බැවින් නිෂ්පාදන කටයුතු සඳහා පවතින ප්‍රාග්ධන හිඟය ඉතාමත් තීරක ගැටලුවකි. වෙළෙඳාමට ගැලැපෙන අයුරින් නියම කර ඇති පොලී අනුපාත නිෂ්පාදනය සඳහා අවශ්‍ය දිගුකාලීන ආයෝජන සම්බන්ධයෙන් ගත් කල ඉතාමත් ඉහළ ය. එහෙයින්, පවත්නා ණය ක්‍රමය නිෂ්පාදකයන්ට දැරිය නොහැකි එකකි. වෙළෙඳාම සහ මූල්‍ය ක්ෂේත්‍රයේ කටයුතු තුළින් ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි බැවින් නිෂ්පාදන කටයුතු සඳහා ආයෝජනය කිරීම ආකර්ෂණීය පෙළැඹවීමක් ඇති කාර්යයක් නොවේ.

මේ අතර, ප්‍රධාන වශයෙන් ම විදේශගත ශ්‍රමිකයන් විසින් එවනු ලබන ප්‍රේෂණ නිසා ශ්‍රී ලංකාවේ විශේෂිත වර්ධනයක් ද වාර්තා විය. ඒ හේතුවෙන්, ශ්‍රී ලංකාව මධ්‍ය මට්ටමේ ආදායම් ලබන රටක් බවට ද පත්විය. දේශීය නිෂ්පාදනය සැළැකිය යුතු අයුරින් ඉහළ නොගොස් සිදු වූ මෙම වර්ධනය තුළ රට 'මැදි ආදායම් උගුලට' ද හසුවිය. ඒ අනුව, වැටුප් සහ වේතන ඉහළ ගිය නිසා, තවදුරටත් ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය ශ්‍රම-සූක්ෂම නිෂ්පාදනය වෙනුවෙන් ශ්‍රම සංචිතයක් නිර්මාණය කරගැනීම ගැටලුවක් බවට පත් වී තිබේ.

එහෙයින්, ශ්‍රම ඵලදායිත්වය ඉහළ නංවන උසස් තාක්ෂණික අංශවලට ශ්‍රී ලංකාව පිවිසිය යුතුව තිබේ. පුහුණු කම්කරුවන්, කාර්මික ශිල්පීන්, සහ තාක්ෂණික දැනුම් හැකියාව, නවෝත්පාදනයට ඉඩ සළසන පර්යේෂණ සහ සංවර්ධන රාමුවක් ද අනෙකුත් අත්හැරුණු සාධක අතර වෙයි. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන් ප්‍රමාණවත් දේශීය පර්යේෂණ සහ සංවර්ධන පහසුකම් ද, පුහුණු ශ්‍රම බලකායක් නිර්මාණය කරගත හැකි තාක්ෂණික වශයෙන් උගත් ජනගහනයක් ද නොමැති බැවින් රටට එම අවශ්‍යතා සපුරාගත නොහැකි වී තිබේ. තාක්ෂණය යනු රික්තයක් තුළ ඇතිවන්නක් නොවේ. ඒ සඳහා තාක්ෂණයට සහජීවනයෙන් වර්ධනය විය හැකි සජීවී නිෂ්පාදන අංශයක් ද පැවැතිය යුතු වෙයි.

නව, පරිවර්තනීය තාක්ෂණික විප්ලවයේත් එක්සත් ජනපදය සහ යුරෝපය මුල් කරගෙන පැවැති ලෝක ආර්ථික පිළිවෙළ

පරිවර්තනය කරමින් එහි මූල කේන්ද්‍රය නැගෙනහිර ආසියාතික කලාපයට මාරුවීමේත් අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ දිය යුතු වෙයි.

අපගේ කාර්මික ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේඃ

- **ඉහළ වර්ධනයක් සහ සේවා නියුක්තියක් ඉලක්ක කරගත් කාර්මික පරිසර පද්ධතියක් නිර්මාණය**
- **ආනයන මත රඳාපැවැතීම අඩුකිරීම**
- **අපනයනය සඳහා විවිධාංගීකරණය කළ සහ අගය එකතු කළ නිෂ්පාදන දියුණුකිරීම**
- **දේශීය වෙළෙඳපොළ සංවර්ධනය සහ අපනයන වෙළෙඳපොළ විවිධාංගීකරණය**
- **දේශීය සම්පත් මත පදනම් වූ කර්මාන්ත සංවර්ධනය**
- **කාර්මික නිෂ්පාදනයේ පාරිසරික තිරසර බව සහතික කිරීම**

ඉදිරිමග

කාර්මිකකරණය යනු හුදෙක් කර්මාන්ත එකතු කිරීමකට වඩා සමාජයක් කෘෂිකාර්මික මට්ටමක සිට කාර්මික මට්ටමකට පරිවර්තනය කරන සමාජ-ආර්ථික විපර්යාසයක් සනිටුහන් කරනු ලබන කාල පරිච්ඡේදයකි. ශ්‍රම විභජනය සඳහා ඉහළ ධාරිතාවක් ඇති, එ මෙන් ම, මහා පරිමාණ නිෂ්පාදනයට සරිලන පරිදි ආර්ථිකය පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කිරීම ද එයට ඇතුළත් වේ. මෙය සාක්ෂාත් කරගත හැක්කේ ඒ සඳහා අවශ්‍ය සාධක කිහිපයක් හිතකර වශයෙන් පවතින්නේ නම් ය. කාර්මීකකරණය සඳහා ඉඩම්, ශ්‍රමය, ප්‍රාග්ධනය, තාක්ෂණය සහ සම්බන්ධතා අවශ්‍ය වේ. නවීන කර්මාන්තවල අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය මෙම සාධක සුලභව සැපයීම සහ ඒවා සම්බන්ධීකරණය කෙරෙන කාර්මික පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමෙන් තොරව සමාජයක් කාර්මිකකරණය කළ නො හැකි ය. භාණ්ඩ නිෂ්පාදනය

පමණක් නොව ඒවා නිපදවන යන්ත්‍ර නිෂ්පාදනය ද සිදු කළ යුතු ය. යන්ත්‍ර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා බලශක්ති සැපැයුමත් සේවකයන් සක්‍රියව තබාගැනීම සඳහා ආහාර සැපැයුමත් ස්ථාවරව පැවැතිය යුතු ය. තව ද, එම නිෂ්පාදන අලෙවිය සඳහා වෙළෙඳපොළ ද අවශ්‍ය වෙයි.

1. කාර්මික ප්‍රතිපත්තිය

අපනයන-නැඹුරු (සහ ආනයන-ආදේශක) කාර්මිකකරණය ක්‍රියාදාමයක් මත කාර්මිකකරණ උපායමාර්ගය ස්ථාපිත කළ යුතු ය. කෙසේ වුව ද, ආර්ථිකයේ සහ සමාජයේ අනෙකුත් අංශවල සහාය ලබාගත අයුරින් සියලු අංශ පිරිවසා කාර්මික සංවර්ධනය සිදු කළ යුතු වෙයි. කාර්මික අංශය සඳහා අවශ්‍ය ආහාර සහ අමුද්‍රව්‍ය ලබාගැනීමටත් කාර්මික නිෂ්පාදන සඳහා වෙළෙඳපොළක් නිර්මාණය කරගැනීමටත් දේශීය කෘෂි කර්මාන්තය දියුණු කළ යුතු ය. ඒ අතර ම, ප්‍රමාණවත් ලාභ ප්‍රාග්ධනය ලබාගැනීම සඳහා මූල්‍ය අංශය ද සූදානම් කළ යුතු ය.

වෙනත් රටවල අත්දැකීම් මාර්ගෝපදේශ ලෙසින් ලබාගත හැකි ය. මධ්‍යම සැලසුම්කරණය මගින් වේගවත් වර්ධනයක් ඇති කළ හැකි නමුත් එය නිසි පරිදි ක්‍රියාත්මක නොකළ හොත් නිලධාරි තන්ත්‍රය විසින් එය අක්‍රීයත්වයට පත් කළ හැකි අතර, බැර කර්මාන්ත කෙරෙහි වැඩියෙන් නැඹුරු වී, ඇති කළ හැකි නොගැලපීම් නිසා පාරිභෝගික භාණ්ඩ හිඟයකට මඟපාදනු ඇත්තේ ය. අනෙක් අතට, බැර සහ සැහැල්ලු කර්මාන්ත තුලනය කළ හැකි බැවින් වෙළඳපොළ ආර්ථික ද වේගයෙන් වර්ධනය විය හැක. කෙසේ වුව ද, වෙළෙඳපොළ ක්‍රමය, ජාතික ආර්ථික සංවර්ධනයට වඩා ලාභයට යොමුවුණු එකක් වන බැවින් කුලියට සහ පොලියට දීම් සහ ඒකාධිකාරයන් ඇති කිරීම ඉහළ දමන අතර ම ප්‍රජාවට අහිතකර ලෙස බලපෑම් ඇති කෙරෙන සහ කුසලතා නැතිවීමට මඟපාදන අයුරින් ආර්ථික වශයෙන් ලාභදායි නොවන කම්හල් බංකොලොත් වීමට හෝ වසාදැමීමට හෝ කටයුතු කිරීමට ද යොමුවිය හැකි ය. සාමාන්‍යයෙන්, විශිෂ්ට ප්‍රතිඵල ලබාගත හැක්කේ මිල සහ කාර්යක්ෂමතාව තීරණය කිරීම

සඳහා වෙළෙඳපොළට ඉඩ සළසන අතර ම රාජ්‍ය නියාමනය සහ සැලසුම් කරණය ඒ සමඟ ඒකාබද්ධ කිරීමෙනි.

රාජ්‍ය ව්‍යවසාය හෝ පෞද්ගලික ප්‍රාග්ධනය හෝ තෝරාගැනීම විසින් ආර්ථික වර්ධනයේ සැළැකිය යුතු වෙනසක් සිදු නොවන අතර, සමතුලිත කාර්මීකරණය, සිරස් ඒකාග්‍රතාව සහ සමාජ ඉලක්කවලට අනුගත වීම සහතික කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය අංශයක් අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා ආර්ථිකයේ පසුගාමීත්වය විසින් ප්‍රාග්ධනය රැස්කිරීම සඳහා කුඩා නමුත් ප්‍රබල ධනේශ්වර පංතියක් සහිත මිශ්‍ර ආර්ථිකයක් ඉල්ලා සිටී. කාර්මික ධනේශ්වරයක් නැති බැවින් එහි හිලව්වට ශක්තිමත් සමුපකාර අංශයක් සමඟ එක් වී, ඉතිරි වී ඇති ධනේශ්වර අංශ, ප්‍රධාන වශයෙන් ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ද සම්බන්ධ කරගෙන ක්‍රියා කිරීමට රජය කටයුතු කළ යුතුය.

කිසිදු නැඹුරුවක් නොමැති වෙළෙඳ ධනේශ්වරය නිෂ්පාදනයට සම්බන්ධ කරවීමේ අභියෝගය ජයගැනීම සඳහා දකුණු කොරියාවේ 'කැරට්' ප්‍රවේශය (එනම්, කර්මාන්ත පිහිටුවීම සඳහා පුද්ගලික අංශයට අරමුදල් සැපයීම) හෝ සිංගප්පූරුවේ 'පොල්ල' ප්‍රවේශය (එනම්, වෙළෙඳුන්ට නිෂ්පාදකයන් වීමට බලකිරීම) හෝ සමහර විට ඒ දෙක ම හෝ භාවිතා කළ හැකි ය.

කාර්මිකකරණ ක්‍රියාවලිය වෙනුවෙන් සැපයුම් දාමය ඔස්සේ ආපස්සට යමින් අවශ්‍ය යෙදවුම් නිපැදවීම අවශ්‍ය වෙයි. එබැවින්, ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ මෙ ලෙසින් අවශ්‍ය යෙදවුම් නිෂ්පාදනය කළ හැකි කර්මාන්ත සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

2. වෙළෙඳපොළ

කර්මාන්ත අංශයට අමුද්‍රව්‍ය සපයන අතර ම නිෂ්පාදන භාණ්ඩ සඳහා වෙළෙඳපොළක් සැපැයීම සඳහා කෘෂිකාර්මික අංශය නිෂ්පාදන ක්‍රියාදාමයට සම්පූර්ණයෙන් ම ඒකාබද්ධ කිරීම අවශ්‍ය වෙයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇති අධික ආනයන බර නිසා නිසැකව ම ආනයන ආදේශක විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය සඳහා ඉඩ සලසයි. අවාසනාවකට මෙන්, දේශීය වෙළෙඳපොළ

දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව කිසිසේත් ම යොමු වී නොමැත. ඇඳුම් පැළඳුම් සහ පාවහන් වැනි මූලික අවශ්‍යතා සම්බන්ධයෙන් සැළැකීමේ දී ද, දේශීය ජනයාගේ ශරීර ප්‍රමාණයට ගැලැපෙන සම්මත අනුගමනය කර නොමැති අතර ඒ සඳහා යුරෝපයේ සහ උතුරු ඇමරිකාවේ සම්මත ඍජුව ම අදාළ කර ගනු ලැබේ.

අභ්‍යන්තර වෙළෙඳපොළ පූර්ණ වශයෙන් උපයෝජනයේ දී පවා එහි කුඩා ප්‍රමාණයට ගැලැපෙන පරිද්දෙන් හෝ අපනයන සිදුකිරීම ද අවශ්‍ය වේ. මෙයින් අදහස් කෙරෙන්නේ බාහිර වෙළෙඳපොළට අවශ්‍ය දේ සපයමින් ඇතිවෙන ප්‍රවණතා සහ තාක්ෂණික දියුණුව සමඟ එකට ගමන් කළ යුතු බවයි. ඒ අතර ම, අපනයන දිශානති ප්‍රශස්ත ලෙස විවිධාංගීකරණය කිරීමත් සමඟ ම බාහිර වෙළෙඳපොළ මත අධික ලෙස යැපීම ද මගහරවා ගත යුතු ය. විදේශීය වෙළෙඳපොළ අතරින්, ශ්‍රී ලංකාව 1991 සිට බටහිර යුරෝපය සහ උතුරු ඇමරිකාව ඉලක්ක කරගෙන තිබේ. තම දේශපාලන අවශ්‍යතා මුල් කරගෙන ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සීමාකිරීමට එම රටවල් කටයුතු කළ හැකි බැවින් එම වෙළෙඳපොළවල සීමා අප විසින් තේරුම්ගත යුතු වෙයි.

එබැවින් අවශ්‍ය වන්නේ නිෂ්පාදිත භාණ්ඩ සඳහා විකල්ප වෙළෙඳපොළ හඳුනාගැනීමයි. මේ සඳහා සිටින සුදුසුතම අපේක්ෂකයන් වන්නේ, විශේෂයෙන් ම සමාන දේශගුණයක් ඇති, ඒ මෙන් ම, එම වෙළෙඳපොළ තුළ පවතින නිෂ්පාදන සීමා වඩාත් පහසුවෙන් ව්‍යාප්ත කිරීමට ඉඩ සලසන අනෙකුත් තුන්වැනි ලෝකයේ රටවල් ය. චීනයේ මාවතක් සහ තීරයක් වැඩසටහන සමඟ එක් වී තටයුතු කිරීම එම වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීම සඳහා පවතින හොඳ ම මාර්ගය වේ. මෙම වෙළෙඳපොළ තුළට ඇතුළුවීම සඳහා චීන සමාගම් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු ය. ඇත්ත වශයෙන් ම, වෙළෙඳාම යනු භාණ්ඩ හුවමාරුව සඳහා පවත්වාගෙන යනු ලබන ද්විපාර්ශ්වික ගනුදෙනුවක් විනා යටත්විජිතවාදී පන්නයේ සූරාකෑමක් නොවේ. සම්පත් ඒකරාශී කිරීම මෙන් ම වෙළෙඳපොළ ඒකාබද්ධ කිරීමේ වාසිය ඇති භාණ්ඩ හවුලේ-නිෂ්පාදනය ද වෙළඳපොළ පුළුල් කිරීම සඳහා වන එක් මාර්ගයක් වේ.

3. කාර්මිකකරණය සඳහා මූල්‍ය සම්පත්

කාර්මීකරණය සඳහා සිදු කළ යුතු දුෂ්කර ම කාර්යයක් වන්නේ මූල්‍ය සම්පත් සොයාගැනීම ය. මූලික මූල්‍ය වියදම්වලට අමතරව, තාක්ෂණික දැනුම ලබාගැනීම සඳහා ද අමතර අරමුදල් රැස් කළ යුතු ය. සෘජු විදේශ ආයෝජන සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර හඳුනාගත යුතු අතර, ව්‍යාපාර ආරම්භ කිරීම සහ ව්‍යාපාර කිරීම පහසුකිරීම, වෙළෙඳපොළ සැපයීම සහ කාර්මික පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය විදේශීය ආයෝජකයින් සඳහා ආකර්ශණීය එකක් බවට පත් කළ යුතුය. ආයෝජකයින් පැමිණෙන තෙක් බලා නො සිට උපාය මාර්ගික වශයෙන් වැදගත් ක්ෂේත්‍ර සඳහා ආයෝජකයින් සෙවීම වෙනුවෙන් ආයතනික රාමුව වඩාත් ක්‍රියාශීලී එකක් බවට පත් කළ යුතුය.

4. කාර්යක්ෂමතාව ඉහළ නැංවීම

මේ සියල්ල සඳහා ම, ප්‍රමුඛතා අංශ හඳුනාගනිමින් රජය විසින් ආයෝජන පාලනයකිරීම අවශ්‍ය වන අතර යම් ප්‍රමාණයකට නිෂ්පාදන ඉලක්ක ලබාදීම ද සිදු කළ යුතු වේ. මේ හේතුවෙන්, ප්‍රමාණවත් ලෙසින් සහ වේගවත් අයුරින් ප්‍රතිචාර දැක්විය නොහැකි නිලධාරීකරණයක් වර්ධනය විය හැකි අතර, හිතකර ප්‍රජාතන්ත්‍රවාදී බලපෑම් ක්‍රමයක් මඟින් එය දමනය කළ යුතු ය.

a) ප්‍රජාතාන්ත්‍රික සැලසුම්කරණය

ශ්‍රී ලංකාවේ සැලසුම්කරණ ක්‍රියාදාමය නිලධාරිවාදී සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී එකක් බවට පත් වී ඇති බැවින් ආයෝජනවලින් අපේක්ෂිත අරමුණු සපුරා ගැනීමට එය අසමත් වී තිබේ. ප්‍රචලිත විකල්ප පවතින අවස්ථාවල දී පවා, උදාහරණයක් ලෙස පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා (EIA) ලබාදීමේ දී, ඒවා සංවර්ධනය හැඩගැස්වීමේ ක්‍රියාවලීන් ලෙසින් සළකනවාට වඩා ප්‍රගතියට බාධාවන් ලෙසින් සැළැකෙයි. සැලසුම්කරණය සිදු කළ යුත්තේ අවශ්‍යතා හඳුනාගනිමින් සහ ඒවා හැකියාවන් සමඟ ගලපමින්, පහළ සිට ඉහළට සිදු කෙරෙන ක්‍රියාවක් වශයෙනි. නවීන තාක්ෂණය විසින් ප්‍රජාතන්ත්‍රවාදී සැලසුම්කරණ ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකි බොහෝ ප්‍රයෝජනවත් මෙවලම් සපයයි.

b) විසල් දත්ත (Big Data)

විශාල දත්ත යනු සාම්ප්‍රදායික ක්‍රමවලින් ග්‍රහණය කර ගැනීමට, කළමනාකරණය කිරීමට සහ ක්‍රියාවට නැංවීමට අපහසු, එ මෙන් ම, ඉතා විශාල පරිමාවක් සහිත, අධික ප්‍රවේගයකින් නිපැදවෙන, සහ ඉතා පුළුල් විවිධත්වයක් සහිත දත්ත වන අතර ඒවායේ අර්ථ ග්‍රහණය සඳහා උසස් විශ්ලේෂණ ශිල්පීය ක්‍රම භාවිතාකිරීම අවශ්‍ය වේ.

වේගවත් තීරණ ගැනීම, ආකෘති නිර්මාණය සහ අනාගත ප්‍රතිඵල පිළිබඳ පුරෝකථන සිදුකිරීම සඳහා Big Data Analytics යොදා ගනු ලැබේ. වෙළෙඳපොළ ඉල්ලුමට වේගයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා Uber සහ AirBnB වැනි සමාගම්වලට හැකියාව ලැබී ඇත්තේ මෙම ක්‍රමය ඇතුළත් විවිධ යෙදුම් භාවිතාවෙනි. පාරිභෝගික ඉල්ලුම සමඟ නිෂ්පාදන ඉලක්ක වඩාත් නිවැරදිව ගැලපීම සඳහා මෙන් ම ඉල්ලුම සහ මිල ගණන් පුරෝකථනය කිරීම සඳහා විශාල දත්ත විසින් ඉඩ සලසයි. නිෂ්පාදන සහ පරිභෝජන සංඛ්‍යා පිළිබඳ ක්ෂණික ප්‍රතිපෝෂණ සපයමින්, දේවල අන්තර්ජාලය (IOT) සමඟ ඒකාබද්ධ වී රට පුරා පවතින විශාල දත්ත පද්ධතියක් විසින් නිෂ්පාදනය සහ ආයෝජනය යන අංශ දෙකෙහි ම සැලසුම් නම්‍යශීලීව සකස් කිරීම පිණිස සැලසුම්කරණ බලධාරීන්ට උපකාර කරනු ලබයි.

c) කණ්ඩායම් තාක්ෂණය

රේඛීය නිෂ්පාදනයට සමාන කාර්යක්ෂමතාවක් කණ්ඩායම් නිෂ්පාදනය සඳහා ද ලබාගැනීමට කණ්ඩායම් තාක්ෂණය (GT) උපකාර කරයි. සමාන හැඩයක් හෝ ව්‍යුහයක් හෝ සහිත භාණ්ඩ නිෂ්පාදනය සඳහා යන්ත්‍ර කුටි සකස්කිරීම ඨඔ මගින් සිදු කරයි. වෙනස්වන ඉල්ලුමට ඉක්මනින් අනුවර්තනය වීමට හැකි, ඉතා නම්‍යශීලී නිෂ්පාදන පද්ධතියක් සඳහා මෙයින් ඉඩ සැලසෙයි. ශ්‍රී ලංකාව තුළ වඩාත් දියුණු ඇඟලුම් කම්හල් GT අනුගමනය කරනු ලබන අතර වරකට එක ඇඳුම් අයිතමයක් සකස් කිරීම පිණිස, ඔවුන් තම කර්මාන්තශාලා කුඩා නිෂ්පාදන රේඛාවක් වැනි යන්ත්‍ර කුටි ගණනාවකට බෙදා, කාණ්ඩගත කර ඇත. පරිපාලන

කාර්යයන් සඳහා මෙම කුටි කාණ්ඩගත කර ඇති අතර එක් එක් කණ්ඩායම සඳහා නඩත්තු සේවකයින් වෙන්කර එ මඟින් කාර්ය මණ්ඩලය අතර සහජීවනය වර්ධනය කරනු ලබයි. මෙම ක්‍රමය කාණ්ඩ නිෂ්පාදනය භාවිතා කරන සියලුම කර්මාන්ත සඳහා ව්‍යාප්ත කළ යුතුය.

d) කම්කරුවන්ගේ සහ නිෂ්පාදකයන්ගේ සමුපකාර

කම්කරුවන්ට හිමි සමුපකාර යනු සේවකයින්ට හිමි සහ සේවකයන් විසින් පාලනය කරනු ලබන ව්‍යවසායයන් ය. මෙම ව්‍යවසායයන් සතු පොදු ලක්ෂණ දෙකක් වෙයි. එනම්, (අ) සාමාජිකයින් එක්ව ව්‍යවසායයේ ආයෝජනය කරමින් එහි හිමිකාරත්වය දරන සහ එහි ලාභ බෙදාහදා ගැනීම, සහ (ආ) සෑම සාමාජිකයකුට ම එක ඡන්දයක් බැගින් ඇති අතර ප්‍රජාතන්ත්‍රවාදීව තීරණ ගැනීම ය. නිෂ්පාදක සමුපකාරය ගොඩ නගා, ඒවා මෙහෙයවනු ලබන්නේ සහ ඒවායේ හිමිකාරීත්වය දරනු ලබන්නේ, තමන්ගේ ම නිෂ්පාදන සැකසීමට, අලෙවි කිරීමට සහ බෙදාහැරීමට සංවිධාන ගතවෙන සමාන වර්ගවල භාණ්ඩ නිෂ්පාදනය කරන පුද්ගලයින් විසිනි. මෙවැනි ආයතනවල නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙන් ම විශාල වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ලබාදීමෙන් අලෙවිකරණ හැකියා වැඩි දියුණු කිරීමට උපකාරී වන පරිදි ද මිල ගණන් පිළිබඳව වඩාත් ඵලදායී ලෙසින් කේවල්කිරීම සඳහා ද එක්ව හෝ වෙන වෙන ම හෝ වැඩ කරන්නේ ද යන වග සාමාජිකයින්ට තීරණය කළ හැකිය. අගය එකතු කිරීමෙන් සහ නිෂ්පාදක ප්‍රතිලාභ වැඩි කිරීමෙන් තම නිෂ්පාදන තවදුරටත් වර්ධනය කිරීමට ද ඔවුන් හට පුළුවන. මහා පරිමාණ ව්‍යවසායයන්ගේ කාර්යක්ෂමතාව ලබාදෙමින් තනි පුද්ගල ධාරිතා වර්ධනය කිරීමේ මාර්ගයක් ද මේ තුළින් නිර්මාණය වෙයි..

e) සේවක සභා

සහභාගීත්ව කළමනාකරණ ක්‍රමවලට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වඩ වඩාත් විමධ්‍යගත කරවීමේ ක්‍රමවලට ඉඩ ලබාදෙන්නා වූ සේවක සභා විසින් ව්‍යවසායයන් තුළ තිබෙන

කාර්ය සාධනය මන්දගාමී කරවන ධුරාවලිය සහ අධිකාරී ව්‍යුහය වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී, ජනතාවට වඩාත් සමීප සම්බන්ධතා ඇති ආයතනික පද්ධති බවට පරිවර්තනය කරවයි. සේවක සභා විසින් සිය ව්‍යාපාරවල දිශානතිය තීරණය කිරීමට අදාළ යම් පාලනයක් ලබා ගන්නා විට ඒවායේ ඵලදායීතාව ද වැඩිවෙයි. එහෙයින්, ව්‍යවසායයන්ගේ පාලක මණ්ඩල තුළ සේවක සභා සඳහා ද නියෝජනයක් ලබාදීමට ඉඩ සළසන අයුරින් සේවක අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ජර්මානු නීතියට සමාන ක්‍රමයක් හඳුන්වා දීමට ද හැකි විය යුතු ය. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත තුළින් පනවන ලද නීතිමය විධිවිධාන දැනටත් පවතින නමුත් පුද්ගලික සමාගම් විසින් විශේෂයෙන් ම එය භාවිතා කරනු ලබන්නේ වෘත්තීය සමිතිවලට ආදේශකයක් වශයෙන් කම්කරුවන් සංවිධාන ගතවීම වැළැක්වීම සඳහා ය.

5. අංශ

ආර්ථිකයේ විවිධ අංශවල සාපේක්ෂ වැදගත්කම විසින් සමාජයන් සංවර්ධනය වන ආකාරය සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ලාභ චේතනාව කෙරෙහි ඉහළ ප්‍රමුඛතාවක් ලබා නොදෙන හෙයින් රාජ්‍ය අංශයේ වැඩි මැදිහත්වීම විසින් වැඩි මහජන සුබසාධනයකට මග පාදයි. කාර්මීකරණ ක්‍රියාවලියේ දී රාජ්‍ය, සමුපකාර සහ පෞද්ගලික අංශවලින් ඉටු කළ යුතු කාර්යභාරය බෙහෙවින් ම වෙනස් ය. ඓතිහාසික වශයෙන් ම, රාජ්‍ය ව්‍යවසාය නිෂ්පාදනයේ පුරෝගාමී කාර්යයක් ඉටු කළේ ය. සාම්ප්‍රදායිකව ඉතා බයාදු පෞද්ගලික අංශය අඩු පුරෝගාමී කාර්යයක් ඉටු කළ අතර, එය තම මූලික අරමුණ කරගත්තේ ප්‍රාග්ධනය පොදි බැඳීම ය. පුද්ගලික අංශයට ජනතා විකල්පයක් සැපයීමේ සහ වඩා තාර්කික නිෂ්පාදන සංවිධාන ගත කිරීමක් සඳහා මග පෙන්වීමේ කාර්යභාරය සමුපකාර අංශය සතු ය.

a) බැර කර්මාන්ත

1980 සහ 90 දශකවල පුද්ගලීකරණය කරන තෙක් ම බැර කර්මාන්තවලින් වැඩි ප්‍රමාණයක් රජය විසින් මෙහෙයවන ලදී.

නිදසුනක් වශයෙන් චානේ සංස්ථාව තුළින් ප්‍රකාශ කෙරුණු ආකාරයට පෞද්ගලිකකරණයෙන් පසු සැපැයුම් දාමය දිගේ ආපස්සට යෑමට උත්සාහ කර නැති තරම් ය. ප්‍රාග්ධන සූක්ෂම බැර කර්මාන්ත ආර්ථිකයට අත්‍යවශ්‍ය නමුත් ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම සඳහා දිගු කාලීන සූදානමක්, මිල අධික උපකරණ, සහ එකවර සිදු කළ යුතු විශාල ආයෝජනයක් අවශ්‍ය වන අතර එවැනි කටයුතු වෙළෙඳපොළට පමණක් තනිවම සාක්ෂාත් කරගත නො හැකි ය. රාජ්‍ය අංශය ප්‍රාග්ධන-සූක්ෂම කර්මාන්ත ඇතිකිරීම සඳහා සම්පත් සංචලනය උපරිම කරයි. නිෂ්පාදනය සහ ප්‍රාග්ධනය රැස්කිරීම පමණක් සීමා නොවී, රාජ්‍ය ව්‍යවසාය විසින් ජාතික ඉලක්ක සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් සවිඥාණකව සහායවෙමින් සංවර්ධන ප්‍රයත්නය සඳහා මඟ පෙන්වීමක් ද සිදු කරනු ලබයි. එයට අමතරව, දේශීය තාක්ෂණය දියුණු කිරීමට සහායවෙමින්, සැපයුම්කරුවන්ගේ වර්ධනය සඳහා සහාය වන කාරක ලෙසින් ද ඒවා ක්‍රියා කරයි. ඛනිජමය ධනය ශ්‍රී ලංකාව සන්තකව තබාගැනීමේ උපායමාර්ගික අවශ්‍යතාවට අනුගත වෙමින් බැර කර්මාන්ත අංශය දියුණුකිරීමට පෞද්ගලික අංශයේ උනන්දුවක් නොමැති හෙයින් එම අංශය හැකිතාක් දුරට රාජ්‍ය සන්තකව ම පැවැකිය යුතු ය. මෙ මගින් සැපයුම් ජාලයේ පසුපසට ඒකාබද්ධතාව පාලනයේ හැකියාව රජයට ලබාදෙයි. බැර කර්මාන්ත සඳහා පෞද්ගලික (විශේෂයෙන්ම විදේශීය) ප්‍රාග්ධනය සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වූ විට, හැකිතාක් දුරට එය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ලෙස සිදු කළ යුතු අතර, එ මඟින් රජයට යම් පාලනයක් පවත්වා ගත හැකි ය. පුද්ගලික අංශය බැර කර්මාන්ත අංශයේ විශේෂිත ක්ෂේත්‍රවල ස්ථානගත වූ විට, උසස් තාක්ෂණික දැනුම පුළුල් කිරීමට සහ සංවර්ධනය කිරීමට එය දිරිමත් කළ යුතු ය.

කෘෂිකාර්මික යන්ත්‍ර, නිෂ්පාදන පිරිසැකසුම සහ ගබඩා කිරීම සඳහා යන්ත්‍ර, තේ සහ රබර් නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර, ඖෂධ නිෂ්පාදනය සඳහා යන්ත්‍ර, කැණීමේ සහ ඉදිකිරීමේ යන්ත්‍ර සහ උපකරණ, ඛනිජ සැකසීමේ යන්ත්‍ර, නැව් තැනීම සහ ප්‍රවාහන උපකරණ, යාන්ත්‍රික මෙවලම්, උසස් ඉලෙක්ට්‍රොනික

සහ ස්වයංක්‍රීය තාක්ෂණය, විදුලි සංදේශ උපාංග, රසායන ද්‍රව්‍ය සහ පෙට්‍රෝ-රසායන ද්‍රව්‍ය, ආයුධ සහ හමුදා උපකරණ යනාදී ක්ෂේත්‍රවලට රාජ්‍ය ව්‍යවසායයන්ගේ අවධානය යොමු කළ හැකි ය.

ඉ) ලුහු කර්මාන්ත

පාරිභෝගික ඉල්ලුමට විගසින් ප්‍රතිචාර දැක්විය හැකි පරිදි ලුහු කර්මාන්ත අතිශයින් ම නම්‍යශීලී විය යුතු බැවින් මෙම අංශයේ වගකීම පුද්ගලික අංශයට වෙන් කළ යුතු ය. සමුපකාර සහ සේවක සමුපකාර වැනි රාජ්‍ය නොවන, එ මෙන් ම පුද්ගලික නොවන අංශ සඳහා ද මෙහි ඉඩක් වෙයි. ලුහු කර්මාන්තවල නියුතු නිෂ්පාදකයන් හට තම ආයෝජනවලින් ඉක්මන් ප්‍රතිලාභ ලබාගත හැකි බැවින් ඔවුහු බැර කර්මාන්තවලට වඩා ස්වභාවයෙන් ම මෙම ක්ෂේත්‍රයට ලැදියාවක් දක්වති. බැර කර්මාන්ත සඳහා වෙළෙඳපොළක් ද සපයන බැවින්, ප්‍රාග්ධනය ශීඝ්‍රයෙන් රැස් කර ගැනීම සඳහා පුද්ගලික අංශයට වඩාත් ම විවෘතව තැබිය යුතු ක්ෂේත්‍රය මෙය විය යුතු ය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ලුහු කර්මාන්ත අංශය තුළ ඉටු කළ හැකි විශාල කාර්යභාරයක් තිබේ. මහා පරිමාණ ව්‍යවසාය තරම් කාර්යක්ෂම නොවුනත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වඩාත් ජවසම්පන්න වීමට නැඹුරු වෙති. බොහෝ විට නිෂ්පාදනය සඳහා හිමිකරුවන් ම සම්බන්ධ වන බැවින්, මහා පරිමාණ ව්‍යවසායයන්ගේ කළමනාකරණයට වඩා ඔවුන් කැපවී සිටිය හැකි ය. සුළු ප්‍රමාණයේ මෙහෙයුම් අවශ්‍ය කරන සහ ශ්‍රම අතිරික්තය වඩාත් තීව්‍ර ලෙස ලබා ගත යුතු අවස්ථාවල දී ඒවා වඩාත් කාර්යක්ෂම විය හැකි ය.

Amazon, ebay හෝ AliExpress මට්ටමින් අන්තර්ජාලය හරහා කුඩා නිෂ්පාදන ප්‍රමාණයක් අපනයනය කිරීමට නොහැකි වීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් පීඩා වින්ද ද විද්‍යුත්-වාණිජ්‍යය යනු ලොව පුරා ඩොලර් බිලියන 4.3 ක් වටිනා ගනුදෙනු සිදුවන, 2024 වන විට සිල්ලර වෙළෙඳාමෙන් සියයට 23 ක ප්‍රමාණයක් අත්පත් කරගැනීමට අපේක්ෂා කරන්නා වූ ද, වේගයෙන් වර්ධනය වෙමින් පවතින්නා වූ ද, ඉතා ලාභදායි වෙළෙඳපොළකි. මෙම අංශයෙන් ඵල ලැබීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

c) හස්ත කර්මාන්ත නවීකරණය

සාම්ප්‍රදායක රසයක් ගෙන එන මෝස්තරකාර අයිතමවලට කැමත්තක් දක්වන සුවිශේෂිත, ඉහළ වටිනාකමක් ඇති සේවාදායක පිරිසක් සඳහා හස්ත කර්මාන්ත ඉතා ආකර්ශණීය ද්‍රව්‍යයන් වේ. හස්ත කර්මාන්ත යනු වාර්ගික අරුමෝසම්වලට කැමැති, ඒවා වෙනුවෙන් ඉහළ මිලක් වියදම් කිරීමට කැමැති පාරිභෝගක පිරිසක් සිටින, ඉතා කුඩා සුවිශේෂිත නිෂ්පාදන අංශයකි. 'හස්ත කර්මාන්ත' අංශය වඩ වඩාත් යාන්ත්‍රිකකරණය වීම ලෝක ප්‍රවණතාවක් බවට පත් වී තිබේ. නිදසුනක් වශයෙන්, ඕස්ට්‍රේලියාවට පැමිණෙන අයට අලෙවි කරන සංකේතාත්මක 'ඩිගර්' තොප්පි ඇතුළු සිහිවටන බොහොමයක් නිෂ්පාදනය කරනු ලබන්නේ චීනයේ ය.

විදුලි රෙදි වියන යන්ත්‍ර මඟින් අත්යන්ත්‍ර රෙදි කඩිනමින් ප්‍රතිස්ථාපනය කිරීමත් සමඟ 1970 ගණන්වල මුල් භාගයේ දී ශ්‍රී ලංකාව තුළ, මෙම සංක්‍රාන්තිය ආරම්භ විය. මෙය සිදු වූයේ දේශීයව ලබා ගත හැකි රෙදිවලින් වැඩි ප්‍රමාණයක් අත්යන්ත්‍ර රෙදිවලින් සපයන විට ය. මෙම යාන්ත්‍රිකකරණ ක්‍රියාවලිය අනෙකුත් ක්ෂේත්‍රවලට ද, විශේෂයෙන් ම මිනිසුන්ගේ දෛනික අවශ්‍යතා සපුරාලන හට්ටි මුට්ටි සහ ගුරුලේත්තු වැනි මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා ද ව්‍යාප්ත කළ යුතු ය. නිෂ්පාදකයින්ගේ සමුපකාර සහ සේවක සමුපකාරවලට ද මෙහි දී ඉටු කළ යුතු කාර්යභාරයක් ඇත.

මේ අතර, ප්‍රමාණවත් වේතනයක් ලබන කලාකරුවන්/ශිල්පීන් යොදා ගනිමින් ඉහළ වටිනාකමකින් යුත් අත්කම් භාණ්ඩ නිෂ්පාදනය අඛණ්ඩව කරගෙන යා හැකි ය. රුමේනියාවේ අති සාර්ථක අයුරින් ක්‍රියාත්මක 'අත්කම් ශිල්පීන්ගේ සමුපකාර ජාතික සංගමය' වැනි නිෂ්පාදක සමුපකාර ලෙස ද මෙම අංශය සංවිධානය කළ හැකි ය.

d) නව ඇරැඹුම් (Start-ups)

නව-ඇරැඹුමක් යනු විශාල වශයෙන් වර්ධනය කිරීමේ අදහසින් ව්‍යාපාර ආකෘතියක් සංවර්ධනය කිරීම සඳහා

ව්‍යවසායකයකු හෝ කිහිප දෙනකු හෝ විසින් මුල පුරනු ලබන සමාගමක් හෝ ව්‍යාපෘතියකි. බොහොමයක් නව-ඇරැඹුම් ඉහළ අවිනිශ්චිතතාවකට මුහුණ දී අසාර්ථක වෙයි, එ නමුත් එවැනි සුළු නව-ඇරැඹුම් සංඛ්‍යාවක් සාර්ථක සහ ඉතා බලගත් ව්‍යාපාර දක්වා වර්ධනය වෙයි. මෙම විෂයයට අදාළ පෙර පුහුණුවක් ලබාදීමෙන් විශාල වෙනසක් සිදු කළ හැකි ය. ඒ සඳහා ව්‍යවසායකයින්, ආයෝජකයින්, ළදරු කර්මාන්ත සුරක්ෂිත අයුරින් වර්ධනය කරවීමේ පද්ධති, කඩිනම්කාරක, අධ්‍යාපන ආයතන සහ සාර්ථක නව-ඇරැඹුම් ඇතුළත් නව-ඇරැඹුම් පාරිසරික පද්ධතියක අත්‍යවශ්‍ය වෙයි.

නව-ඇරැඹුමකින් නිතර ම නවෝත්පාදක වෙනසක් ඇති කරනු ලබන බැවින් ඒවා ආර්ථිකයක ගතිකත්වය සඳහා ඉතා වැදගත් වෙයි. ඒවායේ ස්වභාවය අනුව, සම්පත් අවසන්වීමට පෙර නව-ඇරැඹුම් විශාල වේගයකින් ඉගෙනගත යුතු ය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙසින් නව-ඇරැඹුම් තම ව්‍යාපාරික කටයුතු පටන්ගැනීමට නැඹුරු වෙයි. අසාර්ථකවීමකට එරෙහිව රක්ෂණයක් ලෙසින් දැනුම සහ අනෙකුත් සම්පත් මව් සංවිධානයකින් ලබා ගත හැකි අභ්‍යන්තර නව-ඇරැඹුම් යනු විශේෂිත කාර්යක්ෂම නව-ඇරැඹුම් වර්ගයකි. මෙය රාජ්‍ය ව්‍යවසායයන් හට යම් විශ්වාසයකින් යුතුව ප්‍රවේශ විය හැකි සහ ඔවුන්ට තම ආයතනික කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට මග සලසන ක්ෂේත්‍රයකි.

6. ගමට කර්මාන්ත

ග්‍රාමීය / නාගරික භේදය අවසන් කිරීම සහ කාර්මීකරණ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල කර්මාන්ත ස්ථානගත කිරීම යෝග්‍ය වේ. ඛනිජ නිස්සාරණ කර්මාන්ත සංවර්ධනය රජය සන්තකව තබාගැනීමෙන්, සහ ද්විතීයික කර්මාන්ත ඇතිවීමට ඉඩ සැළැසීමෙන් ග්‍රාමීය කාර්මීකරණයට ඉඩ සළසනු ඇත්තේ ය. නිෂ්පාදන උපාංග නිපැදවීම සඳහා ගොවියන් යොමු කළ හැකි ය. නව කර්මාන්ත-නගරවලින් කෘෂිකාර්මික නිෂ්පාදන සැකැසීම සඳහා වන ග්‍රාමීය කාර්මික නාගරික ප්‍රදේශ පූර්ණත්වයට පත් කළ හැකි ය.

ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් කෘෂිකාර්මික විය හැකි අතර ඒ ආශ්‍රිත අගය එකතු කරන කර්මාන්ත ද ගම්බද ප්‍රදේශවලට ගෙන යා හැකිය. තේ නිෂ්පාදනය, මිශ්‍රකිරීම සහ ඇසුරුම් කිරීම තේ වතුවල හෝ ඒ ආශ්‍රිතව හෝ සිදු කළ හැකිවීම, එළවළු සහ පළතුරු ටින් කරන කර්මාන්ත ඒවා වගා කරන ප්‍රදේශ ආසන්නයේ පිහිටුවීම මේ සඳහා උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.

තව ද, විශේෂයෙන් ම ප්‍රාදේශීයව ලබාගත හැකි අමුද්‍රව්‍ය අවශ්‍ය වන අනෙකුත් සැකැසුම් කර්මාන්ත ද ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපනය කළ හැකි ය. පිඟන් මැටි නිධිවලට ආසන්නව පිඟන් භාණ්ඩ කර්මාන්තය ද, යපස් නිධිවලට ආසන්නව යකඩ පිරිපහදු කර්මාන්තය ද, මිනිරන් පතල්වලට ආසන්නව ඒවා ආශ්‍රිත කර්මාන්ත ද ස්ථාපිත කිරීම මේ සඳහා උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.

ග්‍රාමීය කාර්මික පරිසරයක් සඳහා රජය විසින් යටිතල පහසුකම් සැපයීමට සමගාමීව ග්‍රාමීය ප්‍රදේශවල කර්මාන්තකරණය සිදුවිය යුතු ය.

a) නිස්සාරක කර්මාන්ත

ගතානුගතික පිළිගැනීම්වලට අනුව ශ්‍රී ලංකාව යනු ඛනිජ සම්පත් ඌන රටකි. කෙසේ වුව ද, සත්‍ය තත්ත්වය මෙය නොවේ. ග්‍රාමීය කාර්මීකරණය සඳහා මූලික පදනම සැපයිය හැකි ඛනිජ ප්‍රභවයන් ගණනාවක් ම ශ්‍රී ලංකාවේ තිබේ. මේ ඛනිජ සම්පත් නිස්සාරණය හැකිතාක් දුරට රජය සන්තක විය යුතු ය. මේ අංශයේ කර්මාන්ත සඳහා පුද්ගලික අංශයට (විශේෂයෙන් විදේශීය) ඉඩදීමෙන් ආර්ථිකයට බොහෝ විට සිදුවන්නේ අවාසියකි. බොහෝ ඛනිජ ද්‍රව්‍යවල පැවැත්ම ද්විතියික රසායනික හා ලෝහ කර්මාන්ත මහා පරිමාණයෙන් ස්ථාපිත කිරීමට ඉඩ සළසයි. නිස්සාරණ කර්මාන්ත සඳහා උපකරණ නිෂ්පාදනය කිරීමේ හැකියාව ද ශ්‍රී ලංකාව තුළ පවතියි. ශ්‍රී ලංකාව සතුව යකඩ, මිනිරන්, ඛනිජ වැලි, ලුණු, හුණුගල්, පොස්පේට් වැනි ප්‍රධාන ඛනිජ වර්ග මෙන් ම ක්වාර්ට්ස්, ෆෙල්ඩ්ස්පාර්, මයිකා, බෝල මැටි,

පිඟන් මැටි, සිලිකා වැලි, ගාර්නට් වැලි, මයිකා, ඩොලමයිට් සහ මැග්නසයිට් ඇතුළු සුළු ඛනිජ වර්ග රාශියක් ඇත. මෙම සම්පත් සංවර්ධනය කරන අතරතුර, දේශීය වශයෙන් ඒවා පිරිසැකසුමත් ඒවාට අගය එකතුකිරීමත් අත්‍යවශ්‍ය වෙයි.

b) කර්මාන්තයෙන් ගොවියාට

ගොවීන්ට තමන්ගේ අමතර කාලය තුළ දී කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය මුදල් සහ අනෙකුත් පහසුකම් ලබාදීම කර්මාන්ත ග්‍රාමීය ප්‍රදේශවලට ගෙන යාමේ එක් ක්‍රමයකි. ගොවියන්ගේ ජීවන මට්ටම ඉහළ දැමීමට හැකි වන පරිදි ඔවුන්ට අමතර ආදායම් මාර්ගයක් සැපැයීමේ වාසිය මේ තුළ වෙයි. ඒ මඟින්, කාර්මික භාණ්ඩ සඳහා වෙළෙඳපොළ පුළුල්වන අතර ගොවියා හට එයින් ලැබෙන අමතර ප්‍රාග්ධනය තමන්ගේ ගොවිපොළවල ආයෝජනය කළ හැකි ය. කම්හල් නිෂ්පාදනය ආශ්‍රිත මූලික වියදම් මඟහරවා ගැනීමට මෙන් ම ගොවියා හට තමන්ගේ ම කර්මාන්තයක නියැලීමට හැකිවීමේ හේතුවෙන් මිල ගණන් අඩු මට්ටමක රඳවා ගැනීමට ද මෙය උපකාරී වෙයි.

c) ග්‍රාමීය කාර්මික නගර සහ නව නගර

බොහෝ අවස්ථාවන්හි දී, ග්‍රාමීය සහ ඒ ආශ්‍රිත නාගරික ප්‍රදේශ කාර්මික නගර බවට පරිවර්තනය කරමින් ඒවායේ කර්මාන්තශාලා ඉදිකිරීම අවශ්‍ය වේ. මේවා සඳහා අවශ්‍ය ශ්‍රමය වැඩි වශයෙන් අදාළ ප්‍රදේශවලින් ම බඳවාගත හැකි අතර පිටතින් සීමිත සේවක සංඛ්‍යාවක් පමණක් බඳවාගත හැකි ය. හැකි සෑම අවස්ථාවක දී ම, කර්මාන්තශාලා, අමුද්‍රව්‍ය ප්‍රභවයන් ආසන්නයේ පිහිටුවිය යුතු ය. ප්‍රාදේශීය මධ්‍යස්ථාන, නිවාස, වෙළෙඳපොළ ආශ්‍රිත පහසුකම්, බැංකු, සෞඛ්‍ය පහසුකම් යනාදිය මෙම නගරවලට ක්‍රියා කළ හැකි ය. ඇතැම් අවස්ථාවල දී, ග්‍රාමීය නාගරික ප්‍රදේශ සහ ග්‍රාමීය ප්‍රදේශ නව නගර බවටත් ජනාවාස ප්‍රදේශ බවටත් සීමා නිර්ණය කර, කර්මාන්ත සඳහා විශේෂයෙන් වෙන් කරන ලද ප්‍රදේශ (කාර්මික ජනපද) බවට පත් කළ හැකි ය. සාමාන්‍යයෙන් අතිරික්ත ග්‍රාමීය ජනගහනය වඩා දියුණු ප්‍රදේශවලට සංක්‍රමණය වීමේ කාරණය සැළැකිල්ලට ගත්විට

මෙම කර්මාන්ත සඳහා කම්කරුවන් පැමිණෙනු ඇත්තේ පිටස්තර ප්‍රදේශවලින් බව පැහැදිලි ය. ඒවා ඔවුන් රැඳී සිටින ග්‍රාමීය ප්‍රදේශ සඳහා මධ්‍යස්ථාන ලෙසින් සේවා සැපැයිය හැකිය.

7. තාක්ෂණය

කාර්මිකකරණය තාක්ෂණය මත රඳා පවතින අතර එය සමාජ වෙනසක් සඳහා මෙන් ම ආර්ථික වර්ධනය සඳහා ද මග පෙන්වන සාධකයකි. එය විදේශයන්ගෙන් අත්පත් කරගැනීමට හෝ දේශීය වශයෙන් වර්ධනය කරගැනීමට හෝ පුළුවන. තාක්ෂණයේ ශීඝ්‍ර වෙනස්වීම් කර්මාන්තවල ක්‍රියාකාරීත්වය කෙරෙහි ද ශ්‍රමය යෙදවීම සහ පුහුණුකිරීම කෙරෙහි ද බලපායි. තාක්ෂණය දියුණු කළ යුතු ආකාරය සහ කර්මාන්තවලට ඒවා අදාළ කරගත හැකි ආකාරය තීරණය කරනු ලබන්නේ ඉතා සංකීර්ණ ක්‍රියාදාමයන් විසිනි. විශේෂයෙන් ම, ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකිරීම මඟින් තාක්ෂණික ප්‍රතිපත්තියට බලපෑම් කළ හැකි ය. දේශීය පර්යේෂණ නිමැවුම් හඳුනාගැනීම, අරමුදල් සැපයීම සහ නවෝත්පාදන සංවර්ධනයට සහායවීම සහ දේශීය නවෝත්පාදන වාණිජකරණය සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාව විසින් යාන්ත්‍රණයක් ආරම්භ කළ යුතුය.

a) තාක්ෂණය මිල දී ගැනීම

තාක්ෂණික හුවමාරුව පිළිබඳ අදහස මුල් කරගෙන, තාක්ෂණය සහ තාක්ෂණය සහිත සමාගම් මිල දී ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් අරමුදලක් ස්ථාපිත කළ යුතුය. මෙම අරමුදල සඳහා මූල්‍ය හා තාක්ෂණ විශේෂඥයන්ගෙන් සමන්විත බහුවිධ විෂයීය කණ්ඩායමක් මෙන් ම දේශපාලන මඟපෙන්වීම ද ශ්‍රමයේ දායකත්වය ද අවශ්‍ය වේ. තාක්ෂණය හුවමාරු කරගැනීම හෝ ලබාගැනීම හෝ අරමුණු කරගෙන විදේශීය පර්යේෂණ නිමැවුම් හඳුනාගැනීම, විදේශීය නවෝත්පාදන රටට හඳුන්වාදීමේ ක්‍රමවේද සංවර්ධනය, සහ ශ්‍රී ලංකා රජය විසින් හෝ දේශීය සමාගම් විසින් හෝ ඒ දෙකෙහි ම හවුල්කාරීත්වයක් විසින් හෝ විදේශයන්හි කුඩා

විශේෂිත නවෝත්පාදන සමාගම් හඳුනාගැනීම සහ ඒවා අත්පත් කරගැනීම එහි කාර්යයභාරය විය යුත්තේ ය.

b) විශේෂිත කර්මාන්ත

සාපේක්ෂව ඉහළ වැටුප් අනුපාත සමඟ බැඳුණු වෙළෙඳපොළේ කුඩා බව නිසා ශ්‍රී ලංකාවට බොහෝ ක්ෂේත්‍රවල තරඟකාරී විය නොහැකි බවට අදහසක් වෙයි. එබැවින් සුවිශේෂී කර්මාන්ත පදනම් කරගත් ආර්ථිකයක් වඩාත් හිතකර බැවින්, එවැනි කර්මාන්ත දියුණුකිරීම අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ යට ඇඳුම් සහ ක්‍රීඩා ඇඳුම් කර්මාන්ත, ඝන ටයර් කර්මාන්තය, ආරක්ෂිත වායු මළු පිපිරවීමේ කර්මාන්තය හෝ ගුවන් යානා සුක්කානම විභ්‍රමණ කර්මාන්තය වැනි නිදර්ශනවලින් මේ බව සනාථ කර තිබේ. අතීතයේ තේ යන්ත්‍ර කර්මාන්තයට තිබුණු ආකාරයේ සුවිශේෂී නිෂ්පාදන සඳහා දේශීය වෙළෙඳපොළක් තිබේ නම් මෙම ප්‍රවේශය වඩාත් සාර්ථක විය හැකි ය.

8. හරිත කර්මාන්ත

කර්මාන්තශාලා විසින් ඛනිජ සහ අනෙකුත් සම්පත් පරිභෝජනය කරනු ලබන අතර, ඒ මඟින් ද ඒවායේ නිෂ්පාදන විසින් ද වායුගෝලය සහ පෘථිවි පෘෂ්ඨය යන දෙක ම අපද්‍රව්‍යවලින් දූෂණයට ලක් කර තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වී තිබෙන දේශගුණික විපර්යාස හේතුවෙන් පෘථිවිය හරිතකරණය කිරීම එහි පැවැත්ම පිළිබඳ කාරණයක් බවට පත්ව තිබේ. විශේෂයෙන් ම, 21 වැනි සියවසේ ධනවාදයේ වර්ධනය මෙන් ම චීනය වැනි රටවල අත්දැකීම්වලින් පෙන්නුම් කරන්නේ දූෂණය සහ සම්පත් භාවිතය යන දෙක ම කළමනාකරණය කළ හැකි බවයි. සංස්ථාපිත ගිජුකම පාරිසරික පරිහානිය කෙරෙහි බලපාන ප්‍රධානතම හේතුව වුව ද රාජ්‍ය ක්‍රියාමාර්ග මඟින් එය ප්‍රකෘතිමත් කිරීමට කටයුතු කළ හැකිය. කර්මාන්තය සඳහා තාක්ෂණයන් තෝරාගැනීම මේ සඳහා වන සරල සහ කෙටි කාලීන ම විසඳුම වේ. හරිත විකල්ප තෝරා ගැනීම තුළින් සම්පත් නිස්සාරණය සහ දූෂණය විශාල වශයෙන් අඩු කළ හැකි ය. කෙසේ වුව ද, නිස්සාරණයේ

සහ දූෂණයේ දිගුකාලීන අඩුකිරීමක් සඳහා ආර්ථිකයන් ක්‍රියා කරන ආකාරය පිළිබඳ මූලධර්මීය ප්‍රතිව්‍යුහගත කිරීමක් අවශ්‍ය වේ. නූතන ධනවාදය නාස්තිකාර එකක් වන අතර, අධික නිෂ්පාදනයේ අර්බුදය ප්‍රමාද කිරීම සඳහා 'සැලසුම් සහගත කල් ඉකුත් කිරීම' සහ අර්වණකාමය හරහා ප්‍රයෝජනවත් භාණ්ඩ ඉවතට විසිකිරීමට පෙළැඹවීම මත එය රඳා පවතී. කල් පවතින භාණ්ඩ නිෂ්පාදනයෙන් ද, 'සැලසුම් සහගත කල් ඉකුත් කිරීම' වැනි උපක්‍රම අත්හැර දැමීමෙන් ද, අනවශ්‍ය විච්චූරණ ඇසුරුම් භාවිතයෙන් ඉවත් කිරීමෙන් ද දේශගුණ පරිහානිය වැළැක්වීම සඳහා විශාල වෙනසක් ඇති කළ හැකි ය.

මූල්‍ය සහ බැංකු කටයුතු ප්‍රතිපත්තිය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ය. බලපත්‍රලාභී වාණිජ බැංකු 26 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින් මෙම මූල්‍ය පද්ධතියේ ප්‍රධාන ම අංශය සැකැසී තිබේ. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සමස්ත වත්කම්වලින් වැඩි ම ප්‍රමාණයකට හිමිකම් කියන්නේ මෙම බැංකු 32 ය. එයට අමතරව බලපත්‍රලාභී මුදල් සමාගම්වලින්, ලියාපදිංචි කල්බදු සමාගම්වලින්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වලින්, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන්, විදේශ විනිමය සඳහා බලයලත් අලෙවිකරුවන්ගෙන්, බලයලත් මුදල් හුවමාරුකරන්නන්ගෙන් සහ බලයලත් මුදල් තැරැව්කරුවන්ගෙන් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සකස් වී තිබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට නතු නොවන බැංකු සහ මූල්‍ය ආයතන පද්ධතියක් ද ශ්‍රී ලංකාවේ වෙයි. මේ අතරට සමුපකාර බැංකු, සණස සමිති වැනි දෑ අයිති ය. මෙයින් බාහිරව නීති විරෝධී අයුරින් පවත්වාගෙන යන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ඇතුළු ආයතන පද්ධතියක් ද ශ්‍රී ලංකාවේ පවතියි.

මහජන බැංකුව ඇති කිරීමට ද ලංකා බැංකුව ජනසතු කිරීමට ද එ කල පැවැති රජයන් කටයුතු කළේ ජනතාවගේ

ආයෝජන අවශ්‍යතා තෘප්තකිරීමේ අරමුණ ඇතිව ය. ඒ තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කටයුතු ශක්තිමත් කිරීමත් රටේ ආර්ථික වර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමත් අපේක්ෂා කෙරිණි. කෙසේ වුව ද, මේ වන විට එම රාජ්‍ය බැංකු පවා හුදු වානිජ බැංකු බවට පත් වී ඇති අතර නිෂ්පාදන කටයුතුවල නිරත බිම් මට්ටමේ නිෂ්පාදකයන්ට අවශ්‍ය මූල්‍ය සම්පත් ලබාගැනීම පිළිබඳ ගැටලු විශාල ප්‍රමාණයක් ඉස්මතු වී තිබේ.

ගැටලු

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආර්ථිකය දිගුකාලීන ණය නොලැබීමේ අඩුපාඩුවෙන් පීඩා විඳියි. වාණිජ බැංකුවලින් බෙදා දෙන ණය සැපැයෙන්නේ ආනයන සහ පරිභෝජනය වෙනුවෙනි. ඉහළ හා අස්ථාවර පොළී අනුපාත පැවතීම නිසා කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට ණය ලබාගැනීම සහ තම ආයෝජන සැලසුම් කරගැනීම අපහසු වී තිබේ.

කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත අංශය වෙනුවෙන් වෙන් වූ සංවර්ධන බැංකුවක් නොමැති ආසියානු රටවල් කිහිපය අතුරින් ශ්‍රී ලංකාව ද එකකි. මෙයට පෙර, සංවර්ධන බැංකුවක් ස්ථාපිත කිරීමට දැරූ සෑම ප්‍රයත්නයක් ම දේශපාලන කඩාකප්පල්කිරීම් නිසා හෝ පුද්ගලීකරණයවීම නිසා හෝ වාණිජ බැංකුවක් බවට පරිවර්තනය කිරීම නිසා හෝ සාර්ථක කරගැනීමට නො හැකි විය.

ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රමය ණය ලබා දෙන්නේ ආනයනය සහ පරිභෝජනය සඳහා බැවින් මුදල් අවප්‍රමාණයවීමේ විසම චක්‍රයට හසුවීම නිසාත් වත්කම් මිල උද්ධමනයත් හටගැනීම නිසාත් එයින් වාසි සැළැසෙන්නේ වෙළෙඳුන් කිහිප දෙනකු, මූල්‍ය අංශයේ කූට සමපේක්ෂකයින් කිහිප දෙනකු සහ ඉඩම් හිමි පැලැන්තිය පමණකි.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන මහ බැංකුකරණ සහ මූල්‍ය ප්‍රතිපත්තියේ මූලික ඉලක්ක වන්නේ,

- මූර්ත ආර්ථිකයේ ඵලදායිතාව වැඩි කිරීම
- පූර්ණ රැකියා නියුක්තිය සැලසීම
- තිරසර වෘද්ධියක් සැලසීම
- මිල ස්ථාවරත්වය පාලනය
- විනිමය අනුපාතය පාලනය

ඉදිරිමග

1. ප්‍රතිපත්ති පාදක බැංකු

ශ්‍රී ලංකාවේ ආර්ථික අංශයේ සාපේක්ෂ ඵලදායිතාව පිළිබඳව ශ්‍රී ලංකා මහා බැංකුව විසින් කඩිනම් සමීක්ෂණයක් පවත්වා කාර්මීකරණය උදෙසා මූල්‍ය ආකෘතියක් සකසා එයට "එක්සිම්" (අපනයන සහ ආනයන) බැංකු සහ සංවර්ධන බැංකු පිහිටුවීමත්; එහි දී කෘෂිකර්ම, ධීවර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ අපනයන අභිමුඛ නිෂ්පාදන ක්ෂේත්‍ර සඳහා එම බැංකු වෙන් කළ යුතු ය. ක්‍රමෝපායික ක්ෂේත්‍රවල සමාගම් සඳහා ව්‍යාපෘති ශක්‍යතාව මත දිගුකාලීන සහන පොළී සැපැයීම මෙකී සංවර්ධන බැංකුවල කාර්ය විය යුතු ය.

2. ඩොලරය මත රැඳියාවෙන් ඉවත් වීම

සංචිත වත්කම් විවිධාංගීකරණය කිරීමට ඉඩ සලසමින්, ක්‍රමයෙන් ප්‍රති ඩොලරකරණයට සුදුසු පියවර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වහාම සැකැසිය යුතු ය. අනන්‍යෝන්‍ය මුදල් වර්ගය යොදාගෙන මිතුරු රටවල් සමග වෙළෙඳ ගනුදෙනු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකසා ගත යුතු ය.

3. බහුවිධ පොළී අනුපාත

දේශීය ආහාර නිෂ්පාදනය සහ අපනයන නිෂ්පාදන වැනි ක්‍රමෝපායික අංශ වෙත වැඩි සහනයක් සැපැයෙන පරිදි අඩු පොළී අනුපාත ලබාදෙමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තනි පොළී අනුපාත පදනම වෙනුවට විවිධ (විචල්‍ය) පොළී අනුපාත පදනමක් භාවිතා කළ යුතු ය.

4. හරිත මූල්‍ය ප්‍රතිපත්තිය

කාබන් විමෝචන හානිය අවම කරගැනීම සහ හරිත ප්‍රතිපත්තියකට යොමුවීම අරභයා ශ්‍රී ලංකාවේ ක්‍රමෝපායක් සකස්කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදෙස් මාලාවක් ඉදිරිපත් කළ යුතු ය. විමෝචන ගතිකතා මත දැඩිව සළකා සුදුසු ණය ශ්‍රේණිකරණ ක්‍රමවේදයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුග මනය කළ යුතු ය. තව ද කාබන් විමෝචනය අධික කර්මාන්ත සඳහා ණය සැපැයීමේ උපරිම සීමාවක් ශ්‍රී ලංකා මහ බැංකුවට පවත්වා ගත හැකි අතර එවැනි කර්මාන්තවලින් ඉවත්ව යන සංක්‍රාන්ති කාර්මික අංශ සඳහා අඩු පොළී ණය නිකුත් කළ හැකි ය. තව ද "හරිත බැඳුම්කර" වැනි හරිත මූල්‍ය සාධන පත්‍ර සැකැසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාකාරී අන්දමින් පර්යේෂණ කළ යුතු ය.

5. ඩිජිටල්කරණය

ඩිජිටල් මුදල්

තම මූල්‍ය ප්‍රතිපත්ති මෙවලමක් වශයෙන් මහ බැංකු ඩිජිටල් මුදලක් නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කළ යුතු ය. එවැනි මහා බැංකු ඩිජිටල් මුදලක් ඇති විට නම්‍යශීලී පොළී අනුපාත නියම කිරීමටත්, දේශ සීමා ඔස්සේ සිදුවන ගනුදෙනු ආවේක්ෂණයටත්, තොග වශයෙන් ක්‍රම ලේඛ කළ හැකි කාසි නිකුත් කිරීමටත්, දේශීය ආර්ථිකය ක්‍රියා කරන ආකාරය පිළිබඳ තීව්‍ර දත්ත ප්‍රතිවේදයක් නිර්මාණය කර ගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුවට පහසු වනු ඇත.

6. ඩිජිටල් ගෙවුම් ක්‍රම

මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය ක්‍රමයට සැම දෙනා ම ඇතුළත් කරගැනීම අරමුණු කරගනිමින් ජාතික ඩිජිටල් ගෙවුම් ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා උචිත ප්‍රතිපත්ති ප්‍රඥප්තියක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැකැසිය යුතු ය. මූල්‍ය පද්ධතියේ ඝර්ෂණය සමබර කර ගැනීමට ජාතික ඩිජිටල් ගෙවීමේ ක්‍රමයක් උපකාරී වනු ඇති අතර එමගින් ප්‍රාග්ධනය සංසරණය ද වැඩි දියුණු කෙරෙනු ඇත.

එ විට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ස්වයං රැකියා නියුක්තිකයන් විධිමත් මූල්‍ය පද්ධතියට යොමු කර ගත හැකි ය.

7. යාන්ත්‍රික බුද්ධිය සහ යාන්ත්‍රික ඉගෙනුම

පවත්නා සාර්ව ආර්ථික දර්ශක නිතිපතා හොඳින් අධීක්ෂණය කිරීම තුළින් ආර්ථික ප්‍රවණතා පිළිබඳ පුරෝකථනය පහසු කරලීම සඳහා නවීන යාන්ත්‍රික බුද්ධිය සහ යාන්ත්‍රික ඉගෙනුම්-පාදක තාක්ෂණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයෝජනය කළ යුතු ය. චක්‍රීය ප්‍රතිපත්තිවලට එරෙහිව කටයුතු කිරීමේ ප්‍රතිප්තිත සම්පාදනය සඳහා එකී දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට උපයෝගී කරගත හැකි ය. ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පෙර අතත්‍ය ලෙස ඒවා පරීක්ෂා කිරීමට ද, ශ්‍රී ලංකා ආර්ථිකය උසස් ක්‍රමවේද මත ආකෘතිගත කිරීමට ද එය යොදාගත හැකි ය.

8. මූල්‍ය තාක්ෂණය

මූල්‍ය තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා උපකාර කර ගත හැකි නිසා නියාමන සංරචක නිර්මාණය කර ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලාරම්භයෙන් සිදුවිය යුතු ය. දේශීය ආර්ථිකයේ අනන්‍ය තත්ත්වයන් මත රටේ මූල්‍ය තාක්ෂණය පදනම් විය යුතු අතර රාජ්‍ය කාර්මික ප්‍රතිපත්තියෙන් එහි සුවිශේෂී අභිමතාර්ථ පැහැදිළිව සඳහන් විය යුතු ය.

9. වංචා සහ නීතිවිරෝධී ගෙවීම්

'උන්ඩියෙල්' සහ 'හවාලා' වැනි කූට උපක්‍රමවලින් මුදල් ප්‍රේෂණය නීතියට හසු කරගැනීම සඳහාත් වැරැදි අගයන්ගෙන් ගනුදෙනු සටහන් තැබීම සහ නීතිවිරෝධී මුදල් හුවමාරු නතර කිරීමට ද උචිත ප්‍රායෝගික නියාමන ක්‍රම වේදයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දිය යුතු ය.

ඩිජිටල් පරිවර්තන ප්‍රතිපත්තිය

හැඳින්වීම

වර්තමානයේ ගෝලීය ආර්ථිකය 4 වැනි කාර්මික විප්ලවය (Industry 4.0) සඳහා සූදානම් වෙමින් සිටියි. 4 වැනි කාර්මික විප්ලවය යනු යාන්ත්‍රික බුද්ධිය සහිත, දත්ත මගින් හසුරවනු ලබන, අන්තර් සම්බන්ධිත සහ සිරස් අතට මෙන් ම තිරස් අතට ද ජාලගත කර ඇති යන්ත්‍රසූත්‍ර මගින් මෙහෙයවනු ලබන, කාර්මික සංවර්ධනයේ මී ළඟ අවධියයි. කාර්මික සංවර්ධනයේ මෙම අවධිය හසුරවනු ලබන්නේ දත්ත මගින් තීරණ ගෙන, යාන්ත්‍රික බුද්ධිය සහ වෙනත් ආකාරවලින් විවිධ අංශ පුරා ඇති දත්ත සංකලනය කරගැනීම හරහා තම නිෂ්පාදන ධාරිතාවයන් තමන් විසින් ම වැඩිදියුණු කර ගන්නා ස්වයංක්‍රීය යන්ත්‍ර මගිනි.

4 වැනි කාර්මික විප්ලවයට පහසුකම් සැලැසීම සඳහා ආර්ථිකයන් ඒවායෙහි ඊ ළඟ මට්ටමේ යටිතල පහසුකම් ගොඩනගා ගත යුතු ය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තවමත් ස්වකීය විදුලි සංදේශ පද්ධතිය සම්පූර්ණයෙන් ගොඩනගා ගෙන නැත. එම නිසා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති කඩිනම් කළ යුතුව ඇත. ආනයනය කරන ලද උපාංග යොදාගෙන වුව ද, ශ්‍රී ලංකාවේ සෑම ගෘහයකට ම සහ නිෂ්පාදන ඒකකයකට ම නොමිලයේ අධිවේගී

අන්තර්ජාල පහසුකම් සැපයිය හැකි, තමන්ගේ ම චන්ද්‍රිකා හෝ ඩ්‍රෝන් පදනම් කර ගත් 4G විදුලි සංදේශ ජාලයක් ගොඩනැගීමට ශ්‍රී ලංකාවට කුසලතාව සහ හැකියාව ඇත. විදේශීය පාර්ශ්වයක සුළු සහයෝගීතාවයක් ඇතිව මෙය 5G තාක්ෂණය දක්වා වැඩිදියුණු කළ හැක.

ගැටලු

උක්ත අරමුණු සාක්ෂාත් කරගැනීමට පවතින මූලික ම අඩුපාඩුව වන්නේ, රාජ්‍ය අනුග්‍රහය නොමැතිකම සහ දේශීය නව්‍යකරණයන්ට හෝ නිෂ්පාදනයට වඩා ආනයනය කෙරෙහි යොමු වූ ආර්ථිකයේ ව්‍යුහයයි. උදාහරණයක් ලෙස, යම් විදුලි සංදේශ නිෂ්පාදනයක් තැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා ගත් ආරක්ෂක නිෂ්කාශනයක් සමග විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබා ගත් (එක් එක් නිෂ්පාදනය සඳහා වෙන වෙනම) බලපත්‍රයක් අවශ්‍ය වන අතර එම ක්‍රියාවලිය සම්පූර්ණ කර ගැනීම සඳහා මාස ගණනාවක් ගත විය හැක. දහස් ගණනක් වූ ආනයනික උපාංගවලට එම ක්‍රියාවලිය අනුගමනය පහසු නොවේ.

ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ අංශය මුහුණ දෙන අභියෝග කිහිපයක් පහත දැක්වේ:

- **ශ්‍රී ලංකාවේ ඩිජිටල් යටිතල පහසුකම් ප්‍රධාන වශයෙන් ම වෙළෙඳපොළ දිරිගැන්වීම් මත පුද්ගලික සමාගම් විසින් ගොඩ නගා ඇති අතර, ඒ හේතුවෙන් අන්තර්ජාලය සඳහා ඇති ප්‍රවේශයෙහි අසමානතා ඇත. නමුත්, සංවර්ධිත රටවල රජය සතු විදුලි සංදේශ සමාගම් විසින් ඩිජිටල් යටිතල පහසුකම් ගොඩනගා ඇති අතර එහි දී සැමට සාධාරණ ප්‍රවේශයට ප්‍රමුඛත්වය දී ඇත.**
- **ශ්‍රී ලංකාවේ තාක්ෂණික අංශය දේශීය කර්මාන්තවල ඵලදායිත්වයට සහාය දැක්වීමේ අරමුණෙන් ගොඩනැගී නැත. එබැවින්, තොරතුරු තාක්ෂණ කර්මාන්තය දේශීය ආර්ථිකය සමග කිසිදු**

සම්බන්ධයක් හෝ සහායක් නොමැතිව, වැව්ලි කර්මාන්තයක් මෙන් දියුණු විය. තොරතුරු තාක්ෂණ අංශය විදේශීය සමාගම් මත රඳා පවතින අතර, දේශීය සමාගම්වලට එකතු කරන වටිනාකම අල්ප ය.

- රාජ්‍ය වියදම් අඩුකිරීමේ රජයේ ප්‍රතිපත්තිය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ ඩිජිටල්කරණය සඳහා රාජ්‍ය ආයෝජන සිදුකිරීම කෙරෙහි බාධා නිර්මාණය කර ඇත. තව ද, අධ්‍යාපන ප්‍රතිපත්ති මගින් තොරතුරු තාක්ෂණ විසඳුම් පුළුල්ව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා නිසි ලෙස පෝෂණය කර නැත.
- දුර්වල කාර්මික සැලසුම්කරණය හේතුවෙන් පුද්ගලික සමාගම් විසින් සපයා දෙනු ලබන නිෂ්පාදන හා සේවා සහ වෙළඳපොළ අවශ්‍යතා අතර නොගැළපීමක් ඇතිවී තිබේ. මෙය බොහෝ දුරට දත්ත වෙත ප්‍රවේශය නොමැතිකම නිසා සිදු වන අතර, එය සමාගම්වල අසාර්ථකත්වයට සහ සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදා හැරීමට හේතු වෙයි.

ඉදිරිමග

1. පොදු ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම

ශ්‍රී ලංකාව තුළ 4 වැනි කාර්මික විප්ලවය සඳහා අවශ්‍ය කරන අත්තිවාරම් ගොඩනැගීම සඳහා සහ ගෝලීය වෙළෙඳපොළ තුළ රටේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකාවේ ඩිජිටල් යටිතල පහසුකම් විශාල වශයෙන් පුළුල් කළ යුතු යැයි යෝජනා කරනු ලැබේ.

- විදුලි සංදේශ ජාල පුළුල්කිරීම

විදුලි සංදේශ ජාලය සහ 5G තාක්ෂණය ව්‍යාප්ත කිරීම පුළුල්

කළ යුතු ය. ග්‍රාමීය ප්‍රදේශවලට අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

- චන්ද්‍රිකාවක්

ශ්‍රී ලංකාවට ම අයත් චන්ද්‍රිකාවක් ගුවන්ගත කර, ශ්‍රී ලංකාවට වෙන් කර ඇති විදුලි සංදේශ කලාප වපසරිය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත යුතු ය. මුළු දිවයින ම සහ ඒ අවට ඇති අනන්‍ය ආර්ථික කලාපය සම්පූර්ණයෙන් ම ආවරණය කිරීම සඳහා ගොඩබිම් පාදක රිපීටර් සහ ඩ්‍රෝන යානා භාවිතා කළ යුතු ය. චන්ද්‍රිකා පද්ධති භාවිතා කරමින් ශ්‍රී ලංකාව පූර්ණ පරිමාණයේ භූමි සමීක්ෂණයක් සිදු කළ යුතු අතර, එමගින් මානව භූ දර්ශනය සහ ස්වභාවික භූ දර්ශනය පිළිබඳ වටිනා තොරතුරු සපයාගත හැකි වනු ඇත. පසුව මෙම දත්ත ජාතික ස්ථාන නිර්ණයනය සඳහා සහ මං සෙවීමේ පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා භාවිතා කළ හැක.

- ඊ-පාලනය

රජය විසින් ඩිජිටල් යටිතල පහසුකම් සහ සේවා සඳහා කළමනාකරණ, ආරක්ෂක සහ නියාමන රාමුවක් සකස් කළ යුතු ය. රජය ස්වකීය සේවා සැපයීමේ ධාරිතාවය ඉහළ නංවා ගැනීම සඳහා යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණතක් (application programming interface) ගොඩනැගිය යුතු ය. ඩිජිටල් ජාල විගණනය කිරීම සහ නියාමනය කිරීම පිණිස රජය විසින් ජාල කළමනාකරණ යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු ය. විනිවිදභාවය සහතික කිරීම පිණිස විද්‍යුත් පාලනය සඳහා බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය භාවිතා කළ යුතු ය. රාජ්‍ය අංශය විගණනය කිරීම සඳහා වෙනස් කළ නොහැකි ලෙජර් තාක්ෂණ යෙදුම් භාවිත කළ යුතු ය.

- ඩිජිටල් අනන්‍යතාව

ඩිජිටල් අනන්‍යතාව සහ සත්‍යාපනනය සඳහා පද්ධති සකස් කළ යුතු ය. එමඟින් සේවා වෙත ඩිජිටල් ප්‍රවේශය සක්‍රීය කිරීමට, අනුකූලතාව සම්බන්ධ සංකූලතා අවමකිරීමට සහ පුරවැසියන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීමට හැකි වේ. ඩිජිටල් අනන්‍යතාව

තුළින් ෆින්ටෙක්, රෙග්ටෙක් සහ ඊ-පාලන සේවා අනුගත කර ගැනීම කඩිනම් කරයි.

- රජය සතු දත්ත විශ්ලේෂණ

ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ ව්‍යවසායකයින්ට යන දෙ අංශයට ම දත්ත මගින් හසුරුවනු ලබන තියුණු අවබෝධයන් සපයාදීම සඳහා රජය නවීන තාක්ෂණය සපයා දෙමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නවීකරණය කළ යුතු ය.

- අන්තර්ජාල ආරක්ෂාව (සයිබර් සෙක්‍යුරිටි)

ශක්තිමත් දත්ත සහ සයිබර් ආරක්ෂක පාලන පද්ධතියක් ස්ථාපනය කළ යුතු ය.

- ඩිජිටල් ටෙන්ඩර්

රාජ්‍ය අංශයේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා රජය වෙළඳපොළ ඉලක්ක කරගත් විද්‍යුත් ටෙන්ඩර් ලංසු තැබීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය.

2. කොළඹ වරාය නගරය ඩිජිටල්කරණය කිරීම පරීක්ෂා කිරීමේ ප්‍රදේශයක් ලෙස භාවිතා කිරීම

කොළඹ වරාය නගරය ඩිජිටල්කරණය කළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ පහසුකම් සපයන ස්ථානයක් ලෙස භාවිතා කළ යුතු ය. වරාය නගරය සුහුරු නගරයක් ලෙස ගොඩනගා ඇති බැවින් එය විවිධ ඩිජිටල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන පරීක්ෂණාගාරයක් ලෙස භාවිතා කිරීමේ විශාල විභවයක් ඇත. පුද්ගලික අංශය තුළ ඇති විසල් දත්ත (Big Data), යාන්ත්‍රික ඉගෙනීම සහ කෘතිම බුද්ධිය අනුගත කර ගැනීම දිරිගැන්වීම සඳහා රජය දත්ත හුවමාරු සහ වෙළඳ කටයුතු වේදිකාවක් ද වරාය නගරය තුළ ගොඩනැගිය යුතු ය.

3. අධ්‍යාපනය ඩිජිටල්කරණය කිරීම

අධ්‍යාපන පද්ධතිය මගින් සර්ව ඩිජිටල් සාක්ෂරතාව ඇතුළු

තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධනය කිරීමට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය. පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තීය හා තාක්ෂණ පුහුණු ආයතන ඇතුළු සියලු ම අධ්‍යාපන ආයතන සඳහා උසස් තත්ත්වයේ ඩිජිටල් ඉගෙනුම් සම්පත් සපයා දිය යුතු ය.

4. ඩිජිටල්කරණය සහ කාර්මිකකරණය

ස්වකීය නිෂ්පාදන සහ බෙදාහැරීමේ ක්‍රියාවලීන්හි දී "ඩිජිටල් චින්තනය" ඇතුළත්කර ගැනීමට නව ව්‍යාපාර සහ ආරම්භක ව්‍යාපාර දිරිමත් කළ යුතු ය. ඵලදායිතාව වැඩි දියුණු කිරීම පිණිස කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ ඉදිකිරීම් යන ක්ෂේත්‍ර තුළ IOT, Big Data, සහ ස්වයංක්‍රීයකරණය (automation) වැනි නවීන තාක්ෂණික ක්‍රම දියුණු කිරීම සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා කාර්මික ප්‍රතිපත්ති පෙළගැස්විය යුතු ය. මෙම විසඳුම් යොදාගැනීම කඩිනම් කිරීම සඳහා සහනාධාර, බදු හර ක්‍රම සහ දිගු කාලීන ණය වැනි දිරිගැන්වීම් යොදා ගත යුතුය.

5. තාක්ෂණ අංශයේ නවෝත්පාදන දිරිමත් කිරීම

විශ්වවිද්‍යාල මට්ටමෙන් නවෝත්පාදන දිරිගැන්වීම සඳහා ආණ්ඩුව විසින් බැංකු සහ විශ්වවිද්‍යාල සමග සහයෝග යෙන් යුතුව නව පහසුකම් සැලසීමේ ජාල සකස් කළ යුතු ය. ආරම්භකයින් සඳහා පුළුල් පරාසයක් තුළින් ප්‍රාග්ධනය සපයාග ැනීමට උපකාර කිරීම සඳහා වන වේදිකා නිර්මාණය කළ යුතු ය. මෙම පහසුකම් සැලසීම් සහ දේශීය හා විදේශීය ව්‍යාපාර ප්‍රාග්ධන සහ පුද්ගලික කොටස් අරමුදල් අතර සම්බන්ධයක් ද ගොඩනැගිය යුතු ය.

6. මූල්‍ය ඩිජිටල්කරණය

මූල්‍ය අන්තර්කරණය පුළුල් කිරීම සඳහා අන්තර්ජාලය හරහා සේවා ආවරණය ව්‍යාප්ත කිරීමට බැංකු සහ මූල්‍ය ආයතන දිරිමත් කළ යුතුය. එමෙන්ම, ජාල වෙන්කර දීම සඳහා සහ අන්තර්ජාල පාරිභෝගිකයින්ට පහසුකම් සැලසීම සඳහා රජය විසින් නීතිමය රාමුවක් ද සකස් කළ යුතුය. එක් එක් පුද්ගලයා පදනමින් ණය

ගැනුම්කරුවන්ගේ ණය සුදුසුකම ඇගයීම නවීකරණය කිරීම සඳහා Big Data තාක්ෂණය සහ යාන්ත්‍රික බුද්ධිය (AI) භාවිත කළ යුතු ය. ඒ සමගම, මූල්‍ය පාරිභෝගික ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම හරහා අන්තර්ජාල මූල්‍ය පාරිභෝගික අයිතිවාසිකම් සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වූ නීතිමය රාමු ශක්තිමත් කළ යුතුය.

7. සෞඛ්‍ය සේවා ඩිජිටල්කරණය

රජය,සෞඛ්‍ය සේවා සඳහා පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශයේ ද රෝගීන්ගේ දත්ත ඒකාබද්ධ කරන ඒකාබද්ධ ඩිජිටල් දත්ත පද්ධතියක් නිර්මාණය කළ යුතු ය. එමගින් පුද්ගලික සහ රාජ්‍ය අංශ අතර සේවා සැපයීම වඩාත් ක්‍රමවත් කර ගැනීමට මෙන් ම සෞඛ්‍ය සේවා පරිපාලන ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීමට ද හැකියාව ඇති කළ යුතු ය. එ මෙන් ම, පුරෝකථන විශ්ලේෂණය හරහා පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීමට අමතරව, පුද්ගලික සහ සාමූහික සෞඛ්‍ය ප්‍රවනතා පිළිබඳ දිගුකාලීන වර්ධනයන් සොයාගැනීමට ද මෙය උපකාර විය යුතු ය.

8. ඊ-වාණිජ්‍යය

ආණ්ඩුව, B2C සහ B2B B-වාණිජ්‍යය යන දෙක ම සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කළ යුතු ය. ප්‍රසම්පාදන සහ බෙදාහැරීමේ ක්‍රමය ප්‍රශස්ත මට්ටමට ඉහළ නැංවීම සඳහා ඊ-වාණිජ්‍ය වේදිකා ක්‍රියාකාරී ලෙස භාවිතා කිරීමට සියලු ම ආර්ථික අංශ දිරිමත් කළ යුතු ය. එ මෙන් ම, රජය අපනයන ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, සියලු ම වර්ගවල දේශසීමාන්තර ඊ-වාණිජ්‍යය සංවර්ධනය කිරීම දිරිමත් කළ යුතු ය. රජය, දේශසීමාන්තර ඊ-වාණිජ්‍යය රේගු නිෂ්කාශනය, පරීක්ෂාකිරීම සහ නිරෝධායනය, බේරුම්කරණය යන ක්ෂේත්‍රවල සහ දේශසීමාන්තර ඊ-වාණිජ්‍යය අංශයෙහි අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍රවල තනි අභ්‍යන්තර පද්ධතියක් නිර්මාණය කළ යුතු ය.

9. තිරසාර බව සඳහා ඩිජිටල් විසඳුම්

රජය, විවිධ IoT යෙදුම් සහ පවතින දත්ත මූලාශ්‍රවලින් රැස්

කරන ලද විසල් දත්ත (Big Data) උපයෝගී කර ගන්නා මාර්ගගත දූෂණ නිරීක්ෂණ පද්ධතියක් නිර්මාණය කළ යුතු ය. එවැනි නිරීක්ෂණ පද්ධතියක් ප්‍රතිවිපාක ප්‍රතිවර්ත කිරීමේ යාන්ත්‍රණය ඉහළ නැංවීමට සහ දූෂක විසර්ජනයෙහි ගතිකත්වය අවබෝධ කර ගැනීමට උපකාරී වෙයි. මෙම යාන්ත්‍රණවලින් ලබා ගන්නා දත්ත වෙත ප්‍රසිද්ධියේ ප්‍රවේශවීමට අවස්ථාව තිබිය යුතු අතර, එම දත්ත දූෂක ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා දිරිගැන්වීම් ව්‍යුහ නිර්මාණය කිරීම සඳහා පරිපාලන කලාප මෙන්ම නිෂ්පාදන ඒකක ශ්‍රේණිගත කිරීමට ද යොදා ගත හැකි ය.

ප්‍රවාහන ප්‍රතිපත්තිය

හැඳින්වීම

පොදු ප්‍රවාහන සේවයේ ඇති වාසි ගණනාවකි. ඒ මගින් මාර්ග තදබදය සහ වාහන තදබදය අඩු කිරීමටත්, ඉන්ධන වැයවීම, පරිසර දූෂණය, ධාවන කාලය අඩු කිරීමටත් හැකි ය. ගාල් කර තැබීම සඳහා අවශ්‍ය වන්නේ කුඩා ඉඩකඩකි. (එක බසයක උපරිමව 90 දෙනෙක් යා හැකි අතර එම මගීන් සංඛ්‍යාව කාර් / ත්‍රිරෝද රථ 18 ක හෝ යතුරුපැදි 45 කට සමාන වේ.) පොදු ප්‍රවාහනයෙන් මගී ආරක්ෂාව, සුවපහසුව හා ඵලදායිතාව වර්ධනය වන අතර කාලය ඉතිරි කර, සමාජ සබඳතා වර්ධනය කර, සෞඛ්‍ය වර්ධනය කර, ව්‍යාපාර වැඩි කරන අතර ම හැමට සම අවස්ථාවක් සපයා දෙයි. සතිපතා සාප්පු යාමට පෞද්ගලික ප්‍රවාහනය වාසි සහගතය. නමුත් රිය පැදවීම හා නඩත්තුව දරාගත යුතු ය. වාහනය නවතා තැබීමට තැනක් සොයාගැනීම ඉතා අපහසු ය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය යන රටවල තම වාහනය 95% තරම් කාලයක් නවතා තබාගනී. මේ දෙයාකාරයේ ම මිශ්‍රිත ක්‍රමයක් අප යොදාගත යුතු ය.

ප්‍රවාහනය පොදු හිමිකමක් වශයෙන් පවත්වාගෙන යාමෙන් එය ලාභ අරමුණකින් නොව සේවාවක් වශයෙන් සැළකෙයි. එහි මූලික පරමාර්ථය වන්නේ මගීන් සහ භාණ්ඩ සුරක්ෂිතව

ගමනාන්තය කරා රැගෙන යාමයි. මහජනයාගේ හිතසුව පිණිස සේවය කරන්නේ ද යන්න නියාමනය වන ප්‍රමාණය මත ඊට ආසන්න මට්ටමක් වන කර්මාන්ත සහ වාණිජ අංශයට සේවය කරන්නේ ද යන්න කෙරෙහි වැඩි අවධානයක් යොමු වනු ඇත. (උදාහරණ: සූරිච් සහ මිලාන් නගරවල වාණිජ ක්ෂේත්‍රයට වැඩි ප්‍රමුඛතා ලබා දෙන ප්‍රවාහන සේවය, මගීන් සඳහා ද ප්‍රශස්ත සේවාවක් සපයයි.)

ගැටලු

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ පවතින්නේ ඉතාමත් ව්‍යාකූල වාතාවරණයකි. ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන සේවය ප්‍රමාණවත් නොවන අතර නාගරික ප්‍රදේශවල වාහන තදබදය අධික ය. මේ නිසා ප්‍රවාහන පහසුකම ලබාගැනීමේ මූලික අවශ්‍යතාව සැම දෙනාට ම නො ලැබී යයි. වාහන තදබදය නිසා රුපියල් බිලියන 400 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 10 ක පමණ වාර්ෂික පාඩුවක් සිදුවන බව ඇස්තමේන්තු කර තිබේ.

කොළඹ නගරයට දිනපතා මිලියන 1.9ක ජනතාව මෙන් ම වාහන මිලියන අඩක් පමණ ඇතුළු වන අතර එයින් සියයට 90 ක් පමණ පුද්ගලික වාහන බව ඇස්තමේන්තු කර තිබේ. නගරය තුළ ධාවනය වන වාහනවල වේගයේ සාමාන්‍ය අගය පැයට කිලෝ මීටර් 15 දක්වා පහත වැටී තිබේ.

අධික තදබදය සහ තම ගමනාන්තයට ළඟාවීමේ ප්‍රමාදය නිසා මගීන් දුෂ්කරතා විඳී. උදේ 7.00 ට පාසලට ළඟාවීමට පාන්දර 4.00 ට අවදිවීමට පාසල් ළමුන්ට සිදුව තිබේ. සේවකයන් තෙහෙට්ටු වී පැමිණීම තම සේවයේ ඵලදායිතාව අඩු කරයි. වෑන් සහ බස් රථ මගින් සේවක ප්‍රවාහනය සිදු කරගන්නා සමාගම් බෙහොමයකි. ඉහළ වැටුප් ලබන සේවකයින් කාර්යාල වෑන් ප්‍රවාහනය ලබා ගනී.

රාත්‍රී පොදු ප්‍රවාහන සේවා නොමැති තරම් වන අතර වීදි ආලෝකය ද ක්‍රියා විරහිත මට්ටමක පවතී. පොදු ප්‍රවාහනයෙන් ග්‍රාමීය ප්‍රවාහන අවශ්‍යතා ඉටු නොවේ. ජනගහනයෙන් 8% ක්

පමණ ආබාධිත, විශේෂ අවශ්‍යතා ඇති අය වුවත්, බස්, දුම්රියවලට බස් නැවතුම්පොළ, දුම්රියපොළවලට පහසුවෙන් පිවිසෙන ක්‍රම සපයා නැත. ප්‍රධාන බස් නැවතුම්පොළ කීපයක හැර ආවරණ සහිත ඒවා නොමැත.

ඇවිදීම සහ පාපැදියෙන් ගමන් කිරීම කලක් ප්‍රචලිතව පැවතිය ද ඒවා ව්‍යායාම ලෙස නොව ප්‍රවාහන ක්‍රමයක් ලෙස යොදාගැනීම කෙරෙහි ආණ්ඩුවෙන් ලබාදෙන දිරිගැන්වීමක් නො පෙනේ. පාපැදි මංතීරු හා පදිංක වේදිකා අපහසුතා නිසා එය අවදානම් කටයුත්තකි. අලුතින් නිමැවූ මාර්ගවල පදික තීරු සහ පාපැදි මංතීරු දක්නට ලැබුණ ද ඒවායේ අඛණ්ඩ පොදු ලක්ෂණයක් නොමැති නිසාත් මාර්ගය පදික වේදිකාව ආක්‍රමණය කිරීමත් නිසා මගහැරී යයි.

පෞද්ගලික වාහන, විශේෂයෙන් ම යතුරුපැදි සහ ත්‍රිරෝද රථ අලෙවිය වැඩිවීම මේ අපහසුතාව තීව්‍ර කර ඇති අතර ජනගහනයෙන් සියයට 50 ක් තවමත් පොදු ප්‍රවාහන සේවා භාවිතා කරයි. මෙහි දී කුඩා වාහනවලට අමතරව ලොරි සහ බහලුම් ලොරිවලින් විශාල මාර්ග තදබදයක් ඇති කරයි.

ප්‍රවාහන සේවය පෞද්ගලිකරණය යනු ප්‍රායෝගික පියවරකට වඩා දෘෂ්ටිවාදී ක්‍රමෝපායකි. බ්‍රිතාන්‍යයේ, ප්‍රතිගාමී තැචර්ගේ පාලන සමයේ දී එරට දුම්රිය සේවය පෞද්ගලීකරණය නිසා ඛේදවාචක ඉරණමකින් නිමා වී අවසානයේ දී පෞද්ගලික දුම්රිය සමාගම් නැවත රජයට පවරාගැනීමට සිදුවිය.

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සේවය පෞද්ගලීකරණය ද ඛේදවාචකයකි. පුද්ගලික බස් සේවකයින්ගේ විනය පිරිහීම නිසා මත්ද්‍රව්‍ය අපයෝජනය, හදිසි අනතුරු සහ අවිනීත ධාවනය ඉහළ ගොස් ඇත. වැඩි ආදායමක් නො ලබන ග්‍රාමීය සහ අර්ධ නාගරික මාර්ගවල සහ රාත්‍රී සේවාව සැපයීමෙන් ඉවත්වන ඔවුන් ජනාකීර්ණ මාර්ගවල දී අතුරු සිදුරු නැතිව මගීන් පටවාගෙන යාමටත් ඊට ඉඩ සැලසෙන පරිදි බස් නැවතුම්වල සෙනග රැස්වීමට සලස්වා බස් රථ දෙකක් අතර පරතරය සෙමෙන් ධාවනය කරමින් පවත්වාගෙන යාමත් දැකිය හැකි ය. මාර්ගය අද්දර

නවතා තබන බස් රථ සහ අතරමගදී ක්ෂණිකව නවතා මගීන් පටවාගැනීමත් නිසා මාර්ගයේ අනෙකුත් වාහන ගමනාගමන ඉඩ ඇහිරීයෑම නිතර සිදුවන කරදරයකි.

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ව්‍යුහය හා ඊට බද්ධ වූ දේශපාලනය, යථාර්ථවාදී ප්‍රවාහන ප්‍රතිපත්තියක් සැකසීමෙහි ලා බලපායි. ධනපති පංතිය ආනයන ආදායම තුළින් ධනය උපයයි. මේ නිසා "පංචිකාවත්ත මාෆියාව" වැනි කුප්‍රකට වාහන ආනයනකරුවන් පාපැදි වෙනුවට පුද්ගලික වාහන ගෙන්වීමට පෙළඹී තිබේ. තව ද කිසිදු ආකාරයකින් දේශීය වාහනයක් නිපදවීමට දිරිදෙන්නේ නැති බැවින් අපේ රටේ ප්‍රවාහනය පිළිබඳ ප්‍රතිපත්ති තීරණය වන්නේ පිටස්තර තැනකිනි. ආනයනකරුවන්ගේ මාෆියාව සමග කිට්ටු සබඳතාවක් පවතින පෞද්ගලික ප්‍රවාහන ව්‍යාපාරිකයන් ද අර්ථාන්විත ප්‍රවාහන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට බාධා පමුණුවයි.

ප්‍රවාහන ගැටලු විසඳීම සඳහා ගෙන එනු ලබන යෝජනා බොහොමයක් පෞද්ගලික වාහන, පාලම් සහ ගුවන් පාලම්, රථගාල් අංගන ඉදිකිරීම, බහලුම් ලොරි තදබදය සීමාකිරීම සහ පදික වේදිකා පටුකිරීම යනාදිය සඳහා මිස පාපැදි මංතීරු ගැන සඳහන් නො කරයි.

ශ්‍රී ලංකාවට මූල්‍ය සම්පත් සහ අනෙකුත් සම්පත් හිඟතාවක් පවතී. කැපී පෙනෙන, මිල අධික අධිවේගී මාර්ග සහ තනි පීලි දුම්රිය වැනි ව්‍යාපෘති ඵලදායී නොවන අතර වාහන තදබදය අවම කර ගැනීමේ, නාගරික සැලසුම් සහ තදබදය ලිහිල් කිරීමට උපරිම සේවකයන් යෙදවීම යනාදී පියවර සංයුතියකින් පවත්නා යටිතල පහසුකම් නඩත්තුව සහ ප්‍රවර්ධනය වෙත යොමු විය යුතු ය.

නාගරික සැලසුම්කරණය, බලශක්තිය සහ සුභසාධන ප්‍රතිපත්ති ආවරණය වන පරිදි, කළමනාකරණ, තාක්ෂණික සහ සැලසුම් විසඳුම් යනාදී ජනප්‍රිය සමතාව අනුකලනය කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී, සාකල්‍ය ප්‍රවාහන ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට අවශ්‍ය කෙරේ.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රවාහන ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ,

- **දෛනික ගමන් අවශ්‍යතා අඩුකිරීම**
- **පදිකයන්ට සහ පාපැදිකරුවන්ට පහසුකම් සැළැසීම**
- **දුම්රිය සේවයට ප්‍රමුඛතාවක් ලබාදීම**
- **මාර්ග තදබදය අවමකිරීම**
- **බස් ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම**
- **කාර්යසම්පාදන මධ්‍යස්ථාන ඉදිකිරීම**
- **නව ප්‍රවාහන ව්‍යාපෘති හඳුන්වාදීම**
- **නවීන තාක්ෂණය හඳුන්වාදීම**
- **ජනතා දායකත්ව කළමනාකරණය**

ඉදිරිමග

1. දෛනික ගමන් අවශ්‍යතා අඩුකිරීම

ප්‍රවාහනය ආශ්‍රිත ගැටලු බොහොමයක් පැන නගින්නේ මගීන්ගේ හෝ මගී භාණ්ඩ ගමනාන්තවලිනි. උදාහරණයක් වශයෙන් සේවා මුර ක්‍රමය, නිවසේ සිට වැඩ ක්‍රමය නිසා රැකියාවට යාම සහ පෙරළා නිවෙසට පැමිණීමේ කාර්ය බහුල කලයේ මගී ප්‍රවාහනය අඩු කරයි.

කඩ සාප්පුවල සිට නිවසට ම භාණ්ඩ ගෙන්වා ගැනීමේ ක්‍රමය නිසාත්, මගී ප්‍රවාහනය අඩු කරයි. සම්ප්‍රදායික පාලක තීරණගැනීමේ සහ ගැටලු විසඳීමේ ක්‍රියාවලියට ඔබ්බෙන් සිට

සාකල්‍යමය වශනේ සිතා, ප්‍රවාහන ගැටලු විසඳිය යුතු ය.

සේවා ස්ථාන සහ පාසල් පරිශ්‍ර

පෞද්ගලික වාහනවලින් ප්‍රවාහනය සපයාගැනීමට අමතරව වාහන තදබදය ඇතිවීමට බලපාන මූලික හේතුව වන්නේ සේවා ස්ථාන මධ්‍යගතකරණය සහ වැඩ කරන පන්තියේ පදිංචි නිවාස

මධ්‍යම පාංතික මුහුණුවරකට ප්‍රතිසංස්කරණය විමසහ අවිධිමත් නාගරික තදබදයයි. තම සේවා ස්ථානය ආසන්නයේ ජීවත්වන්නේ අල්පයකි. බොහෝ දෙනා ඈත දුරක සිට වාහන මගියෙක් ලෙස පැමිණේ. දස ලක්ෂ සංඛ්‍යාත පාසල් සිසුන් පිරිසක් උදෑසන 4:30 පමණ සිට නාගරික මධ්‍යයක පිහිටි පාසලකට පෙ.ව. 7:00 පමණ වන විට පැමිණීමට දුක් විඳිති.

නගරාසන්නයේ මහජන නිවාස ඉදිකර, කුඩා නිවාස මධ්‍යම පාන්තික නවීකරණයට ලක් කිරීම දුර්මුඛ කළ යුතු ය. තව ද, ගම් සහ නව නගර ආශ්‍රිතව කර්මාන්තපුර ඉදි කරමින් පයින් හෝ පාපැදියෙන් සේවයට යාමට මුල්තැන ලබා දිය යුතු ය.

නාගරික සීමාවෙන් ඔබ්බෙහි තිබෙන පාසල් නවීකරණය සඳහා රජය විසින් අරමුදල් වැඩි වශයෙන් වැය කර ඒවා ග්‍රාමීය සිසුන්ට වැඩි අවස්ථා සම්පාදනය වන අයුරින් නාගරික පාසල්වල පවතින පහසුකම් සැපයිය යුතු ය. මේ සඳහා ඊනියා ජාතික පාසල් නගරයෙන් ඈත පිහිටුවිය යුතු ය.

2. පදිකයන්ට සහ පාපැදිකරුවන්ට පහසුකම් සැළැසීම

බොහෝ දියුණු රටවල පදිකයින් සහ පාපැදිකරුවන්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාව ලබා දෙන්නේ එ මගින් වාහන තදබදය අඩුවීම සහ පරිසර හිතකාමී බැවිනි. මේ නිසා බොහෝ නගර මධ්‍යස්ථාන වෙත අනෙකුත් වාහන ඇතුළුවීම වළක්වා ඇත. පදිකයින් සහ පාපැදිකරුවන්ට අවම දුරක් යා හැකි වන පරිදි පදික වේදිකා සහ පාපැදි මංතීරු සළකුණු කිරීමට ප්‍රමුඛතාව දිය යුතු ය. අලුත් නාගරික ගොඩනැගිලි ඉදිකිරීමේ දී ඒවායේ දොරකොඩ පදිකයින්ට සෙවණ සැලසෙන ආකාරයටත් ඉදිරිපස පාරේ ගැටි සහිත බාධක ඉවත් කර පහසුවෙන් ළඟා විය හැකි ආකාරයට නිම විය යුතු ය.

ව්‍යායාම කිරීම සඳහා විශේෂිතව සැකසූ පදික වේදිකා පැතිකඩක් ඉදි කළ යුතු ය. බොහෝ දියුණු රටවල මෙන් පදික වේදිකා නිර්මාණය විය යුත්තේ සමාජ සාමීචිය පහසු කරවන පහසුකම් ඇතිව ය. විවේක ආසන, දිග බංකු, ආහාර ගත හැකි

කුඩා භෝජන කුටි ආදිය ඉදි විය යුතු ය. පදික වේදිකා අද්දර සෙවණ සැපයෙන මාවත්වලින් සාප්පුවලට අවතීර්ණ විය හැකි විය යුතු ය.

3. දුම්රිය සේවයට ප්‍රමුඛතාවක් ලබාදීම

රාජ්‍ය වත්කම් ඌන භාවිතයක් පවතින දුම්රිය සේවයේ එංජින්, මැදිරි, පීලි, දුම්රිය ස්ථාන යනාදී පහසුකම් මෙහි දී අවධාරණය කළ යුතු ය. දුම්රිය ස්ථාන 1977ට පෙර පැවතියාක් මෙන් ආසන්න බස් මධ්‍යස්ථානයක් සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක විය යුතු ය. සාප්පු, පාසැල්, පුස්තකාල සහ රෝහල්වලට බසයෙන් හෝ දුම්රියෙන් පහසුවෙන් ළඟා විය හැකි විය යුතු ය.

(අ) පවත්නා දුම්රිය සේවාව වැඩි දියුණු කිරීම

දුම්රිය රෝද සහ පීලි ගෙවීමේ රටාව අනුව ඒවා මනා නඩත්තුව සහ අලුතින් සවිකිරීම, දුම්රිය නවීකරණය සහ සංඥා පද්ධතිය නවීකරණය විය යුතු ය. දුම්රිය සේවය ගරු කටයුතු ලෙස පවත්වාගෙන යා යුතු අතර මනාව නඩත්තු කරන අර්ධ සුඛෝපභෝගී දුම්රිය සේවාවක් තුළින් මගීන්ට වඩා සුරක්ෂිත, තදබදයෙන් තොර, කඩිනම් සේවාවක් සැපයිය යුතු ය.

දුම්රිය භාණ්ඩ ප්‍රවාහනය බහාලුම්කරණය

ග්‍රාමීය සහ වතුකරයේ දුම්රියපොළවල දී භාණ්ඩ දුම්රියට පැටවීම හා බෑම සඳහා අඩු මිල ක්‍රේන් යන්ත්‍ර යොදාගත හැකි ය. මෙ රට නිපදවන එළවළු, තේ, වී, පොහොර සහ සිමෙන්ති යනාදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සහ කුඩා ප්‍රමාණයේ බහලුම් ලොරි යොදා ගත හැකි ය.

විදුලි දුම්රිය

වැඩි මගීන් ගණනක් ගමනාගමනය සිදුවන මාර්ග ක්‍රමයෙන් විදුලි දුම්රියට පරිවර්තනය කළ යුතු ය. මේ සඳහා විදුලි / ඩීසල් සහ එකී දෙමුහුම් ක්‍රමයක් යොදා ගත හැකි ය.

4. මාර්ග තදබදය අවමකිරීම

- **මාර්ග සංඥා සවිකිරීමේ ස්ථාන නිර්මාණය**

මාර්ග සංඥා ඇති ස්ථාන හැකිතාක් වටරවුම් බවට පරිවර්තනය කළ යුතු අතර ප්‍රශස්ත වාහන ප්‍රවාහයක් පාලනය වන අයුරින්, පවතින මාර්ග සංඥා වඩා සුහුරු විය යුතු ය. හැකි සෑම ස්ථානයක ම පාර හරහා මාරු වන තැන් මගීන්ට සහ පාපැදිවලට පාලම් හෝ බිම් ගෙවල් ස්වරූපයෙන් තැනිය යුතු ය.

- **මාර්ග තදබදය නියාමන විය යුතු ය.**

මාර්ගය අතරමග හදිසියේ ම නවතා, මගීන් පටවාගන්නා බස් රියදුරන්, වැරදි මං තීරුවේ ධාවනය, අතුරු මාර්ගවලින් හිටි හැටියේ ප්‍රධාන මාර්ගයට පිවිසීම නිසා වාහන අනතුරු සිදුවීමේ ප්‍රවනතා වැනි වැරදි කරන රියැදුරන් ඇතුළු නරක රියැදුරන් දමනය කිරීම සඳහා මෝටර් වාහන දෙපාර්තමේන්තුව සහ රථවාහන පොලිසිය පියවර ගත යුතු ය.

- **බහුකාර්ය සේවා සැපයෙන ප්‍රවාහන කේන්ද්‍ර**

මගීන්ගේ පහසුව සඳහා නිර්මාණය කළ සාප්පු, භෝජනාගාර, අඩු වියදම් හෝටල් කාමරයක රැයක් ගත කිරීමේ පහසුකම් යනාදී සේවා සමග ක්‍රමෝපායික ස්ථානවල, බහු කාර්ය සේවා ප්‍රවාහන කේන්ද්‍ර පිහිටුවිය යුතු ය.

- **බස් රථ මං තීරු සහ බස් කඩිනම් හුවමාරුව**

කාර්යබහුල වේලාවට පමණක් සීමා නොවී බස් රථ මං තීරු ක්‍රියාත්මක විය යුතු අතර ඊට පොලිසියේ අධීක්ෂණය පැවතිය යුතු ය. ප්‍රධාන මාර්ග. දුම්රිය ස්ථාන දෙකක් අතරමැදි මාර්ග සහ ජනතාව බහුල අතුරු මාර්ගවල බස් රථ හදිසි හුවමාරු ස්ථාන සැකසිය යුතු ය. මේවා ට්‍රෑම් මාර්ග හෝ කුඩා දුම්රිය සේවාවට සම්බන්ධ කළ යුතු ය.

5. බස් ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම

රාජ්‍ය ප්‍රවාහන සේවාව පෞද්ගලික අංශයෙන් වෙන් කර තරඟයෙන් ඈත් කර පැවතිය යුතු ය. ශ්‍රී.ලං.ග.ම සඳහා බස් රථ

අඩු සංඛ්‍යවක් ප්‍රමාණවත් වන්නේ එහි පෙරළා පැමිණීමේ කාලය අවම බැවිනි. පෞද්ගලික බස් රථවල එම කාලය වැඩි බැවින් තම වාරය එනතුරු ඔවුන් වැඩි කාලයක් එක් ගමනාන්තයක රැඳී සිටී. ඉක්මනින් පෙරළා පැමිණි විට ලාභය / මගීන් අඩු ය. ග්‍රාමීය සහ අඩු මගී පිරිසක් සිටින ප්‍රදේශවලට යන එන අධිවේගී අන්තර් නගර සේවාව ශ්‍රී ලං ග ම විසින් පමණක් සේවාව සැපයිය යුතු ය.

බස් රථ

බස් රථවලට පහසුවෙන් ගොඩ විය හැකි පරිදි එහි පාපුවරුව සහ තට්ටුව පහතින් නිමවා, දොර ස්වයංක්‍රීයව පාලනය අයුරින් තිබිය යුතු අතර වායු සමනය අනිවාර්ය විය යුතු ය. දිගු හෝ මැදිරි ඇමිණූ බස් රථ, මගීන් බහුල මාර්ගවලට යෙදිය හැකි ය. පැරණි බස් රථ සහ උස පතුල් ඇති බස් රථ, සෙනග අඩු ප්‍රදේශවලට යෙදවිය යුතු ය. බස් මාදිලි අවම ප්‍රමාණයකට සීමා කළ යුතු අතර අමතර කොටස් ලාභදායී වන අයුරින් මාදිලි තුන හතරකට පමණක් සීමා විය යුතු ය.

- **බස් සේවා ව්‍යාප්තිය**

සෑම ගමකට ම, ගම්බද පිට පළාත්වලට ද පාඩු ලබන මාර්ගවලට ද බස් සේවාව ව්‍යාප්ත විය යුතු අතර කුඩා බස්රථ, වෑන් රථ හෝ ජීප් රථ යොදාගෙන ජංගම දුරකථනයෙන් ගෙන්වාගත හැකි සේවාවක් යොදාගත යුතු ය.

- **බස් නැවතුම්**

මගීන් ප්‍රශස්ත සංඛ්‍යාවකට රැඳී සිටීමට හැකිවන පරිදි මෙන් ම මාර්ග තදබදයට හේතු නොවන පරිදි බස් නැවතුම් ස්ථාපිත විය යුතු ය. බස් නැවතුම් මගීන්ගේ අයිතියක් ලෙස සළකා නඩත්තු කළ යුතු අතර, ඒවා මගී කාන්තාවන් සඳහා සුරක්ෂිත ස්ථාන ලෙස ද රාත්‍රී කාලය පුරා ආලෝකය තිබෙන, අව්වෙන් / වැස්සෙන් රැකවරණය ලැබිය හැකි මෙන් ම හදිසි අවස්ථාවක දුරකථන පහසුකම් ලබාගත හැකි පහසුකම් ද පැවතිය යුතු ය. එම ස්ථානවල ආසන සැපයීම ද අවශ්‍යතාවකි.

6. කාර්යසම්පාදන මධ්‍යස්ථාන ඉදිකිරීම

මාර්ග සහ දුම්රිය සමග ගුවන් සහ සාගර ප්‍රවාහන ශක්‍යතා එක් කර ශ්‍රී ලංකාව, භාණ්ඩ ප්‍රවාහනයේ බහුවිධ ආකෘතියක් යොදා ගන්නා මර්මස්ථානයක් විය යුතු ය. හම්බන්තොට, ත්‍රිකුණාමලය සහ ඔළුවිල් වරාය නගර මේ සඳහා අගය එකතු කරන අපනයන කර්මාන්ත ලෙස යොදාගත යුතු ය. උදාහරණයක් වශයෙන් චීනයෙන් මුහුදෙන් එන භාණ්ඩ තොග, යුරෝපයට ගුවනින් රැගෙන යාම සඳහා පිරිසැකසුම සහ ඇසුරුම කළ හැකි ය.

දුම්රිය මාර්ග ආශ්‍රිත පිටිසරබද නගරවල බහාලුම් ප්‍රවාහන ඇතුළු ප්‍රවාහන මර්මස්ථාන පිහිටුවිය හැකි ය. මෙම බහාලුම්කරණය ඵලදායීවීමට නම් දුම්රිය ස්ථාන දෙපස ගබඩා සහ කම්හල් පිහිටුවිය යුතු ය. ගුවන් තොටුපොළ සහ ධීවර වරාය, බහුවිධ ආකෘතියක් ගත යුතු ය.

විශේෂයෙන් ම ග්‍රාමීය නිෂ්පාදන වෙළෙඳපොළ සහ ඒකාබද්ධ භාණ්ඩ ප්‍රවාහන සේවා සඳහා රාජ්‍ය අංශයේ සහ සමූපකාර අංශයේ ලොරි හිමියන් විසින් ඒකාබද්ධ සේවා පවත්වාගත යුතු ය.

7. නව ප්‍රවාහන ව්‍යාපෘති හඳුන්වාදීම

- **නාගරික හදිසි ප්‍රවාහන භුවමාරු**

කොළඹ නගරයේ මාර්ග ඔස්සේ අතීතයේ තැප්‍රොබේන් හෝටලයේ සිට පිටකොටුව හරහා නාගලම් වීදිය දක්වා සහ කොටුව දුම්රියපොළ සිට බොරැල්ල දක්වා දිව ගිය ට්‍රෑම් රථ සේවාව ප්‍රතිස්ථාපනය කළ යුතු ය. බස් රථවලට වඩා ට්‍රෑම් රථයේ ආසන සහ ඇතුළත ඉඩකඩ වැඩි අතර පරිසර දූෂණය ද අඩු කාර්යක්ෂමතාවෙන් ඉහළ, නඩත්තුව පහසු, පීලි සවිකිරීම වඩා ලාභදායී, නැවතුම්පොළ මගීන්ට ආබාධිත අයට වඩා පහසු මෙහෙයුම් පිරිවැය අතින් උමං හෝ හිසට උඩින් ඉදි කළ මාර්ග ක්‍රමයට වඩා ලාභ ක්‍රමයකි. බත්තරමුල්ල සහ පෑලියගොඩ දක්වා මෙකී ට්‍රෑම් රථ සේවාවදීර්ඝ කළ හැකි ය. හිසට උඩින් ඉදි කරන සැහැල්ලු දුම්රිය පද්ධතියකින් මධ්‍යම පාංතික සහ ඉහළ පංතියේ

මගීන් තම කාර් රථවලින් ගමනාගමනය වෙනුවට හුරු කළ හැකි වුවත් එය එහි ඉදි කිරීම් පිරිවැය මේ ක්‍රමයට වඩා ඉතා ඉහළ ය.

- **ගුවන් තොටුපොළ දක්වා අධිවේගී නාගරික දුම්රිය සේවයක්**

දෙමං දුම්රිය මාර්ගයක් සවි කරමින් ගුවන් තොටුපොළ ඊට ආසන්නතම නගරයට යා කළ යුතු ය. කටුනායක ගුවන් තොටුපොළ සිට කිලෝ මීටර් 35 ක දුරින් පිහිටි කොළඹ නගරය වෙත විනාඩි 30කින් එනම් පැ/කි.මී. 100-150 ක වේගයෙන් පැමිණිය හැකි දුම්රිය මාර්ගයක් ඉදි කළ යුතු ය.

- **පොල්ගහවෙල සිට පානදුර දක්වා දුම්රිය මාර්ගය විදුලි දුම්රියට හැරවීම**

මෙම දුම්රිය මාර්ගයෙන් විශාල මගී පිරිසක් දෛනිකව ගමන් ගන්නා බැවින් එය විදුලි දුම්රිය සේවාවක් බවට පත් කිරීම කඩිනම් කළ යුතු ය.

- **කැළණිවැලි දුම්රිය මාර්ගය දියුණු කිරීම**

පාදුක්ක සිට කොටුවට කැළණිවැලි මාර්ගයේ පැමිණෙන මගීන්ගේ පහසුව තකා එම මගී සංඛ්‍යාව දසගුණයකින් වැඩි කිරීමටත්, මාර්ගයට වඩා දුම්රියෙන් කොළඹ වෙළෙඳ නගරයට පැමිණීම කඩිනම් කිරීමටත් දුම්රිය සේවය වැඩි දියුණු කළ යුතු ය. (දැනට මගීන් 15,000 ක් පමණ භාවිතා කරන නමුත් කාර්ය බහුල වේලාවේ දී ප්‍රමාණවත් මැදිරි සංඛ්‍යාවක් නොමැතිවීම, ප්‍රමාදවීම, දුම්රිය ස්ථානවල පිවිසීමේ අපහසුතා පවතී.)

- **කොළඹ කොටුවට ළඟා වන දුම්රිය මාර්ග ප්‍රතිස්ථාපනය**

කොටුව දුම්රියපොළ සිට එලිසබෙත් ජැටිය දක්වාත් ඊසාන දිග දියකඩනය දක්වාත්, ඔරුගොඩවත්ත, දක්වාත් ප්‍රධාන මාර්ග යේ පැවැති දුම්රිය මාර්ග ප්‍රතිස්ථාපනය කළ යුතු ය. එ විට මාර්ග තදබදයට ඉඩ නොදී කොළඹ මූල්‍ය නගරය වෙත දුම්රිය මගින් බහාලුම් රැගෙන යාමත්, නගරයේ සිට නගරයෙන් පිටත දක්වා

රැගෙන යාමත් හෝ වෙනත් කර්මාන්තපුර වෙත හෝ වෙනත් වරාය වෙත රැගෙන යාමත් පහසු කරවයි. මෙ මගින් 30-75% ක පමණ ඉන්ධන දහනය සහ වායු විමෝචනය අඩු කර ගත හැකි ය.

- **කැළණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම**

කැළණිවැලි දුම්රිය මාර්ගය පාදුක්ක සිට රත්නපුර දක්වාත්, ඇඹිලිපිටිය හරහා මත්තල දක්වාත් දීර්ඝ කිරීමෙන් වරාය සිට සබරගමුව දක්වා නව මාර්ගයක් විවෘතවීමත්, කොළඹට ළඟාවීමේ දුම්රිය මාර්ගයේ දුර අඩුවීමත් සිදු වේ.

- **කුරුණෑගල සිට දඹුල්ල දක්වා නව දුම්රිය මාර්ගය**

කුරුණෑගල සිට දඹුල්ල හරහා හබරණට පවතින දුම්රිය මාර්ග සැලසුම ක්‍රියාත්මක කළ යුතු ය. මින්නේරිය ගුවන් තොටුපොළ, සහල් සහ එළවළු ගොවිබිම් සහිත කඩිනමින් දියුණු වන නාගරික ප්‍රදේශයක් වන දඹුල්ල යා කෙරෙන දුම්රිය මාර්ග යකි. මහනුවර සිට මාතලේ දක්වා දුම්රිය මාර්ගය නාලන්ද සහ නාඋල හරහා දඹුල්ල වෙත දීර්ඝ කළ යුතු ය.

- **මාන්කුලම සිට මුලතිව් දක්වා නව දුම්රිය මාර්ගයක්**

රටේ ජන ශූන්‍ය නමුත් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් මාන්කුලම සිට මුලතිව් ප්‍රදේශය අතර නව දුම්රිය මාර්ග යක් ස්ථාපිත කිරීමෙන් මගී, නිෂ්පාදන සහ කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කළ හැකි ය.

- **රත්නපුර සිට කළුතර දක්වා නව දුම්රිය මාර්ගයක්**

දිස්ත්‍රික්ක දෙකේ ග්‍රාමීය ප්‍රදේශවලට සෙත සැලසෙන පරිදි මෙම නව දුම්රිය මාර්ගය ඉදිවිය යුතු ය.

- **උඩපුස්සැල්ලාව දුම්රිය මාර්ගය ප්‍රතිස්ථාපනය**

ප්‍රදේශයේ වැවෙන තේ, එළවළු ආදී නිෂ්පාදන ලාභදායී මිලකට නගරයට එවිය හැකි පරිදි නානුඔය, නුවරඑළිය, කඳපොල සහ රාගල හරහා උඩපුස්සැල්ලාව වෙත දුම්රිය මාර්ගය තැනීමෙන්

වාෂ්ප එන්ජින් දුම්රිය යොදාගෙන සංචාරකයින් ආකර්ෂණයද වනු ඇත.

- **වටරවුම් මාර්ග සෑදීම මගින් පවත්නා දුම්රිය මාර්ග දීර්ඝ කිරීම**

කතරගම දුම්රිය මාර්ගය සහ බදුල්ල දුම්රිය මාර්ගය මඩකලපුව දක්වා දීර්ඝ කළ යුතු අතර, පුත්තලම දුම්රිය මාර්ගය අනුරාධපුරය දක්වා දීර්ඝ කිරීමෙන් බොහෝ ඌන සංවර්ධිත ගම්වාසීන්ට ප්‍රයෝජනවත් වන අතර විශේෂයෙන් ගංවතුර වැනි ආපදා තත්ත්වයක දී මෙම වටමාර්ග විකල්ප දුම්රිය මාර්ග වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ය.

8. නවීන තාක්ෂණය හඳුන්වාදීම

- **දුම්රිය මැදිරි සහ එන්ජින් නිෂ්පාදනය**

දුම්රිය මැදිරි සහ එන්ජින් දේශීය වශයෙන් නිපදවීමට පියවර ගත යුතු අතර පැරණි මැදිරි වෙනුවට ඒවා යොදාගත හැකි ය. විදුලි දුම්රිය හඳුන්වාදීමත් සමග එම දුම්රියේ කොටස් දේශීයව නිපදවීම ඇරඹිය හැකි ය.

- **අධිවේගී දුම්රිය මාර්ග**

කොළඹ සිට කන්කසන්තුරෙයි, ත්‍රිකුණාමලය සහ මඩකලපුව දක්වා පැයට කි.මී. 200ක වේගයෙන් දිවෙන අධිවේගී දුම්රිය හඳුන්වා දිය යුතු ය. කටුනායක සිට මත්තල / හම්බන්තොට සහ අනුරාධපුර සිට තලෙයිමන්නාරම ද එවැනි මාර්ග දෙකකි. ඉන්දියාවේ සිට පැමිණෙන මගීන් තලෙයි මන්නාරමෙන් රට තුළට ප්‍රවාහනය පහසු කරවනු ඇත. ඩීසල් විදුලි බලයෙන් ධාවනය සඳහා යොමුවීමෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවයට මුදල් ඉතිරි කරගෙන, ධාරිතා සහ අත්දැකීම් වර්ධනය කළ හැකි ය. විදුලි දුම්රිය ක්‍රියාත්මක වීමත් සමග දෙවැදෑරුම් බලශක්ති ප්‍රභව එන්ජින් යොදාගෙන, අතුරු ප්‍රවේශයක් ගත හැකි ය.

- **මාර්ග ඉදිකිරීමේ වාහන නිපදවීම**

ආණ්ඩුවේ ප්‍රතිපත්තියට අනුකූලව මාර්ග ප්‍රවාහනය ඉටු

කිරීමට නම් මාර්ග ඉදිකිරීමේ වාහන දේශීයව නිපදවා, ආනයනය මත රැඳියාව නතර කළ යුතු ය. අමතර කොටස් ලාභදායී ලෙස නිපදවා තාක්ෂණ දියුණුව මත කීප වතාවක් පාවිච්චියට ගත යුතු ය. එ මගින් දිගු කාලයක් පවතින අමුද්‍රව්‍ය යොදාගෙන මුදල් ඉතිරි කර ගත හැකි ය.

- **විදුලි වාහන**

වාහන විදුලි බලයෙන් දිවීම සඳහා පරිවර්තනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු අතර බස් සහ ලොරි රථ සඳහා නව කෝෂ යොදා ගැනීම, ආරෝපණ කාලය අවම කිරීම හා ඉක්මනින් ගමන නිමා කර ආපසු පැමිණීම මෙහි අරමුණයි. මහා පරිමාණ ආරෝපණ මධ්‍යස්ථාන පිහිටුවිය යුතු අතර ඉන්ධන පිරවුම්හල් සමග තරඟ කළ හැකි පරිදි කාඩ්පතක් මගින් ආරෝපණය කළ හැකි උපකරණ සහ ත්‍රිරෝද රථ ගාල්වල දී ආරෝපණය කළ හැකි උපකරණ සවි කළ යුතු ය.

- **හයිඩ්‍රජන් වාහන**

පොසිල ඉන්ධන මත රැඳියාව අවම කිරීම සඳහා හයිඩ්‍රජන් ඉන්ධනවලට පරිවර්තනය දිරිගැන්විය යුතු ය. හයිඩ්‍රජන් දහනය සඳහා එංජින් පහසුවෙන් පරිවර්තනය කළ හැකි ය. එම එන්ජින් පහසුවෙන් බස්, ලොරි, දුම්රිය සහ නැව් සඳහා යොදාත හැකි ය.

- **විසල් දත්ත**

විවිධ මූලාශ්‍රවලින් ලැබෙන දත්ත සමුදායක් හොඳින් කළමනාකරණය කළ හැකි විශාල පරිමාවක්, විශාල ප්‍රවේගයක්, විශාල විවිධතාවක් විශ්ලේෂණය පහසු කරන විසල් දත්ත ක්‍රමය යොදාගෙන ප්‍රවාහන සේවයේ කාර්යක්ෂමතාව දියුණු කිරීමටත්, වාහනය මාර්ගයේ කොතැනක ඇත්දැයි ආවේක්ෂණය කිරීමත්, මගීන්ගේ පහසුව අධීක්ෂණය කර, ඉල්ලුම වැඩි අවස්ථාවක සැපයීම කඩිනම් කිරීමත් කළ හැකි ය. මෙම ක්‍රමය සඳහා ප්‍රවේශ පත්‍ර අවශ්‍ය නොවේ. දුරකථන සහ ගමන් කාඩ් ක්‍රමය යොදා ගැනේ.

විසල් දත්ත ක්‍රම වේදය යොදාගෙන මංසන්ධිවල මාර්ග

තදබදය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව මාර්ග සංඥා දැල්වෙන කාලය අඩු / වැඩි කිරීමටත් පහසු ය.

9. ජනතා දායකත්ව කළමනාකරණය

(අ) මහජන අදහස් විමසීම

මගී නියෝජිතයන්, ප්‍රවාහන සමාගම් නියෝජිතයන්, පළාත් පාලන නියෝජිතයන්, නගර සැලසුම් නිලධාරීන් සහ විශ්වවිද්‍යාල අධ්‍යයන කණ්ඩායම්වලින් නිතිපතා තොරතුරු ලබාගන්නා ක්‍රම වේදයක් සැකැසිය යුතු ය. මන්ත්‍රීවරු සහ ඉහළ නිලධාරීන්ට පොදු ප්‍රවාහනය භාවිතා කිරීමට උනන්දු කරවිය යුතු ය.

(ආ) ශ්‍රී.ලං.ග.ම. විමධ්‍යගතකරණය

එකිනෙක ඩිපෝවෙන් ධාවනය වන බස් රථ පරිපාලනය එම ඩිපෝවට ම ලබාදීමෙන් කඩිනම් ප්‍රතිචාර කාලයක් ලබාගත හැකි ය. නමුත් විසල් දත්ත ක්‍රමවේදය යොදාගෙන මධ්‍යම පාලන අධිකාරියකින් බස් රථ ආවේක්ෂණය, ස්ථානීය පරීක්ෂාව (අතරමග ඇණ හිටීම් / අලුත්වැඩියා, රාත්‍රියේ පමණක් කළ හැකි අලුත්වැඩියා), අමතර කොටස් මිල දී ගැනීමේ දී සහ ගර්හිත අමතර කොටස් පරීක්ෂා කර පිරිවැය පාලන ක්‍රමයක් සහ දූෂණ අවම කර ගැනීම සිදු කළ යුතු ය. සෑම කලාපයක ම අලුත්වැඩියා මධ්‍යස්ථානයක් තුළ දිගුකාලීන අලුත්වැඩියා සිදු කර මධ්‍යම අධිකාරියෙන් සුපරීක්ෂා කළ හැකි විය යුතු ය. අභ්‍යන්තර විගණකවරු ද මාර්ගස්ථ පරීක්ෂාවට එක් විය යුතු ය.

(ඇ) දිරි දීමනා යෝජනා ක්‍රම

සේවා විනය, කාර්යසාධනය සහ කාර්යක්ෂමතාව මෙන් ම ගාස්තු රැස්කිරීම ප්‍රවර්ධනය උදෙසා දිරි දීමනා හඳුන්වා දිය යුතු ය. මෙහි දී මූල්‍ය නොවන දිරිගැන්වීම්, නිල ඇඳුම්, හිස් ආවරණ යනාදිය ද ඇතුළත් විය යුතු ය.

(ඈ) ස්වයං කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලයට සේවක සභාවලින් රහසිගත ඡන්දයෙන් පත්වන සේවකයින් ඇතුලත් වන පරිදි ස්වයං කළමනාකාරිත්වය යළි හඳුන්වා දිය යුතු ය.

(ඉ) විනය

දිරිදීමනා සහ ස්වයං කළමනාකාරිත්වය සමග සමගාමීව අපක්ෂපාතීව විනයක් පවත්වාගැනීම, දේශපාලන ඇඟිලිගැසීම්වලින් තොරව පත්කිරීම් සහ උසස්වීම් සේවකයාගේ කුසලතා මත පමණක් ලබා දිය යුතු ය. උගත්, ගුණගරුක, විනීත මෙන් ම තද තීන්දු ගත හැකි සේවක කණ්ඩායමකින් සැදුම්ලත් කඩාපනින පරීක්ෂකවරු විසින් හදිසි ස්ථානීය පරීක්ෂා කළ යුතු ය. සිවිල් ඇඳුම සහ නිල ඇඳුම අඳින කණ්ඩායම් දෙකක් යොදාගැනීම වැදගත් වේ.

(ඊ) ලිංගික අඩන්තේට්ටම්

පොදු ප්‍රවාහන සේවාවේ දී ලිංගික අඩන්තේට්ටම් සිදුවන අවස්ථා පිලිබඳව විමසිලිමත්ව පරීක්ෂාකාරීව සිටින ආකාරය බස් කොන්දොස්තර සහ දුම්රිය නියාමකවරුන්ට ඉගැන්විය යුතු ය. ස්ථානීය පරීක්ෂා සඳහා කඩාපනින කන්ඩායම් සහ සිවිල් ඇඳුමින් සිටින කන්ඩායම් පත් කළ යුතු ය.

(උ) ප්‍රාග්ධනය

ප්‍රවාහන සේවයට ප්‍රමාණවත් තරම් ප්‍රාග්ධන විභජනයට පියවර ගත යුතු ය. වාහන නවීකරණය සහ නඩත්තුව නිසි වේලාවට නො කළහොත් දිගුකාලීන පාඩු සිදුවිය හැකි අතර ඉන්ධන සහ නඩත්තු පිරිවැයක් දැරිය යුතු වනු ඇත. නවීන යන්ත්‍ර සවිකිරීම තුළින් කාර්යක්ෂමතාව වැඩි කර පිරිවැය අඩු කළ හැකි ය.

බලශක්ති ප්‍රතිපත්තිය

හැඳින්වීම

බලශක්තිය සඳහා පොදුවේ පවතින ඉල්ලුම සහ එය තෘප්තිමත් කිරීම සඳහා කරනු ලබන සැපැයුම ආවරණය වන පරිදි මෙම අංශයේ ප්‍රතිපත්ති සම්පාදනය විය යුතු ය. ඉල්ලුම් පාර්ශ්වයට අදාළ උප අංශ වනුයේ (අ) ගෘහ, (ආ) වාණිජ, (ඇ) කර්මාන්ත සහ (ඈ) ප්‍රවාහනය වේ. මෙම ඉල්ලුම් හුදු නිෂ්පාදිත බල ශක්තියක ස්වරූප කිහිපයකින් සමන්විත වුව ද ඒ සඳහා වන සැපැයුම විවිධ වූ මූලාශ්‍රවලින් ලබාගත හැකි ය. සැපයුම් පාර්ශ්වයේ උප අංශ වන්නේ (අ) ඛනිජ තෙල් සහ අනෙකුත් සෘජු දහන ද්‍රව්‍ය, සහ (ආ) විදුලිය වැනි ජනනය කළ ශක්තිය වේ.

ශ්‍රී ලංකාව ස්වදේශික බලශක්ති ප්‍රභවයන්ගෙන් ආශීර්වාද ලත් ජාතියකි. නිසි ලෙස කළමනාකරණය කරන්නේ නම්, මෙම ප්‍රභවයන්ගෙන් ලබාගත හැකි ශක්ති ප්‍රමාණය රටේ සමස්ත අවශ්‍යතාවට වඩා බෙහෙවින් වැඩි ය. ඒ අතරින්, ජල විදුලිය යනු දැනට වඩාත් ම වැඩගන්නා ප්‍රභවය වන අතර අවශ්‍ය නම් සූර්ය, සුළං, තරංග සහ ස්වාභාවික වායු භාවිතයෙන් ඉතා විශාල බලශක්ති ප්‍රමාණයක් ප්‍රවාහයට එක් කිරීමට හැකි ය. ස්වභාවික වායු සහ න්‍යෂ්ටික බලශක්ති සඳහා යොදාගත හැකි තෝරියම් තැන්පතු ද ශ්‍රී ලංකාවේ ඇති බවක් පැවැසෙයි.

විදුලි සැපයුමේ ප්‍රමාණවත් බව රඳා පවතින්නේ ධාරිතාව සහ ශක්තිය යන තාක්ෂණික දර්ශක දෙක මත ය. ඕනෑ ම අවස්ථාවක පවතින පාරිභෝගික ඉල්ලුමට හරියට ම සරිලන ප්‍රමාණවත් ජනන ධාරිතාවක් නිපැදවිය යුතු අතර එය බෙදා හරිමින් ද තිබිය යුතු ය. පුනර්ජනනීය බලශක්තිය පදනම් වූ ජනක යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම තුළින් නිෂ්පාදනය කරන්නේ නම් ඒ සඳහා වන ජනන ධාරිතාවට ප්‍රමාණවත් තරමින් ජලය, සුළං හෝ සූර්ය ආලෝකය හෝ තිබිය යුතු ය. තාප උත්පාදනය මත එය සිදු කරන්නේ නම් ගල් අඟුරු, ඛනිජ තෙල් සහ ජෛව ස්කන්ධ ආදී ඉන්ධන සම්පත් ප්‍රමාණවත් තරමින් තිබිය යුතු ය.

පාරිභෝගිකයා විසින් සැපයුම ඉල්ලා සිටින අවස්ථාවේ දී ම හරියට ම නිෂ්පාදනය කළ යුතු එක ම භාණ්ඩය වන්නේ විදුලිය ය. පාරිභෝගිකයා තම අවශ්‍යතාව (යම් උපකරණයක් ක්‍රියාත්මක කිරීමෙන්) ප්‍රකාශ කිරීම සහ එම උපකරණයට විදුලිය සැපයීම අතර කිසිදු කාල ප්‍රමාදයක් පැවැතිය නො හැකි ය. ජලාශයක ජලය, ටැංකියක තෙල් හෝ ගෑස්, ජෛව ස්කන්ධ, ගල් අඟුරු තොග හෝ බැටරියක රසායනික ශක්තියක් ලෙස එහි ප්‍රාථමික ස්වරූපයෙන් ම විනා විදුලිය ඒ ආකාරයෙන් ම ගබඩා කළ නොහැකි ය, විදුලි ගබඩා තාක්ෂණයන් පිළිබඳ සිදු කෙරෙන හඳුනාගැනීම් පර්යේෂණ මට්ටමේ පවතී.

2021 දී, ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල විදුලි පරිභෝජනය සියලු ම සමාජ හා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පුද්ගල කිලෝ වොට් 685 ක් වූ අතර, එය ඉන්දියාවේ (පුද්ගල කිලෝ වොට් 972; 2020) සහ මැලේසියාවේ (පුද්ගල කිලෝ වොට් 5100; 2019) පරිභෝජනයට වඩා අඩු වූ අතර උතුරු ඇමරිකාවට සහ යුරෝපයට වඩා විශාල වශයෙන් අඩු ය. පාලිත බිඳවීම් සහ ආර්ථික පසුබෑම හේතුවෙන්, 2022 දී ශ්‍රී ලංකාවේ විදුලි අලෙවිය සැළැකිය යුතු ලෙසින් පහත වැටුණු නමුත්, දිගු කාලීනව, විදුලි ඉල්ලුම සහ අලෙවිය ආර්ථික වර්ධන වේගය මෙන් 1.2 ගුණයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

එබැවින් විශ්වසනීය සහ කාර්යක්ෂම අයුරින් පාරිභෝගික

ඉල්ලුම සැපැයීම සඳහා වැඩි උත්පාදන ධාරිතාවක් එකතු කළ යුතු වෙයි. අවසාන-භාවිත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙන් පරිභෝජනය අඩු කළ හැකි වුව ද, ශ්‍රී ලංකාවේ දැනට පවතින අඩු විදුලි පරිභෝජනය සඳහා සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා වැඩිවන ඉල්ලුමට සරිලන පරිදි නව ජනනය කිරීම් එකතු කිරීම අවශ්‍ය වෙයි. කාර්මික සංවර්ධනයට සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට විදුලිය නිෂ්පාදනය වැඩි කිරීම අත්‍යවශ්‍ය වේ.

මේ වන විට, අපි අපගේ ජල විදුලි විභවය බොහෝ දුරට උපරිමයෙන් භාවිතයට ගෙන ඇත්තෙමු. එ නමුදු, අනෙකුත් දේශීය බලශක්ති ප්‍රභවයන් වෙත අත නොතබා ආනයනික ඉන්ධන යැපීමට අපි යොමු වී සිටිමු. එ හෙයින්, ඒ සඳහා අවශ්‍ය වන තාප බලාගාර ගොඩනංවා ආනයන බිලට තව තවත් බර පැටැවීම අපි අපගේ ජාතික ප්‍රතිපත්තිය බවට පත් කරගෙන සිටිමු. ශ්‍රී ලංකාව තම මුහුදු වෙරළ ආසන්නයෙන් ප්‍රයෝජනයට ගත හැකි හයිඩ්‍රොකාබන් (ප්‍රධාන වශයෙන් ස්වාභාවික වායු) තැන්පතු සොයාගත්ත ද, අද දක්වා ඉදිකරන ලද අපගේ සියලු තාප බලාගාර සැලසුම් කර ඇත්තේ ද්‍රව පොසිල ඉන්ධන හෝ ගල් අඟුරුවලින් ක්‍රියාත්මක කිරීම සඳහා ය.

ලංකා විදුලි බල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ආයෝජන සිදු කෙරෙන්නේ ඉතා අල්ප වශයෙනි. ඒ තුළින් එම ආයතනවල පැවැත්ම, ආරක්ෂාව සහ මූල්‍ය ස්ථාවර බව අභියෝගයට ලක් වී තිබේ. ප්‍රධාන ඛනිජ තෙල් නල මාර්ගවල පවත්නා තත්ත්වය මේ සම්බන්ධයෙන් දැක්විය හැකි උදාහරණයකි. අපේක්ෂිත ආයු කාලය ඉක්මවා දශක ගණනාවක් තිස්සේ භාවිතා කරනු ලබන ඒවා කාන්දුවීම්වලින් පීඩා විඳියි. එ මෙන් ම, සාධාරණ කාල සීමාවක් තුළ දී සැපයුම් ටැංකිවලට තෙල් සැපැයීමට ද ඒවා ප්‍රමාණවත් නො වේ. එ බැවින් සෑම අවස්ථාවක දී ම අනවශ්‍ය ප්‍රමාද ඇතිවෙයි.

කර්මාන්ත වෘත්තිකයන්ගෙන් සමන්විත ස්වාධීන නියාමකයකු ලෙසින් ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් හා ගෑස් ගවේෂණ වැඩසටහන

අධීක්ෂණය කිරීම සඳහා 2021 දී ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය පිහිටුවීමට ප්‍රථම ස්වාභාවික වායු සොයාගැනීමේ සිට වසර 10 ක කාලයක් ගතවිණි. කීර්තිමත් ජාත්‍යන්තර බලශක්ති සමාගම්වල ආයෝජන උනන්දුව තිබියදීත් අදාළ සේවක සහ අනෙකුත් සම්පත් සපයමින් මෙම අධිකාරිය ක්‍රියාත්මක වීමට සැලැස්වීම සඳහා තවත් කාලයක් ගතවනු ඇත.

ශ්‍රී ලංකාවේ වත්මන් බලශක්ති යටිතල ව්‍යුහය පරිපාලන අකාර්යක්ෂමතාවයෙන්, දූෂණ, අඩු ආයෝජන සහ යල් පැන ගිය තාක්ෂණයෙන් පීඩා විඳියි. ජල විදුලිය යනු සෘතුමය සැපැයුමක් වන අතර මහා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති තවදුරටත් ව්‍යාප්ත කිරීම පාරිසරික අභියෝග විශාල ප්‍රමාණයක් නිර්මාණය කරනු ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලි බල මණ්ඩලය වැනි දැනට පවතින රාජ්‍ය ව්‍යවසාය වෙනත් රටවල බලශක්ති අංශයේ රාජ්‍ය ව්‍යවසාය මෙන් නවීකරණය කර හෝ එම මට්ටමේ සැලසුම් සහ වෘත්තීය මට්ටමකින් ක්‍රියාත්මක වන්නේ හෝ නැත. පවත්නා ගැටලුවලට විසඳුම වන්නේ රාජ්‍ය ආයතන තොග මට්ටමින් පුද්ගලිකරණය කිරීම නොවේ. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා එම ආයතනවල ධාරිතාව සහ තාක්ෂණය දියුණුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ නවීකරණ හඳුන්වා දිය යුතුව තිබේ.

කෝවිඩ් - 19 වසංගතය විසින් බලශක්ති කර්මාන්තයේ කාබන්හරණය වේගවත් කිරීම සඳහා ගෝලීය ප්‍රතිපත්තියේ විශාල වෙනසක් ඇති කළේ ය. 2050 වන විට කාර්බන් විමෝචනයට ශුද්ධ ශුන්‍ය ඉලක්කයක් ලබාදෙමින් 2030 වන විට 70% පුනර්ජනනීය බලශක්ති ඉලක්කයක් ඇති කර ගැනීමට ශ්‍රී ලංකාව සැලසුම් කර ඇත. මෙම ඉලක්ක නිශ්චිත සැලසුම් සමග බද්ද කළ යුතුව තිබේ. ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වැඩිවන බලශක්ති පරිභෝජනය සමඟ දැඩි ලෙස සම්බන්ධ වේ. ඒ අතර ම, වර්තමාන වෙළෙඳපොළ ප්‍රවණතා අනුව, අපගේ අපනයන සඳහා ගෝලීය වශයෙන් තරඟකාරීව සිටීමට දැරිය හැකි බලශක්ති ප්‍රභවයන් සහ 'හරිත' සහතිකය අවශ්‍ය වනු ඇත.

උක්ත අරමුණු මුල් කරගත් ප්‍රවේශයක් වර්තමානයේ දක්නට නො ලැබුණ ද, කලාපීය හරිත බලශක්ති කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමට තරම් අවශ්‍ය විභවයන් ශ්‍රී ලංකාව සතුව තිබේ. එබැවින් බලශක්ති ප්‍රභවයන්ගේ ශුද්ධ අපනයනකරුවකු වීම අරමුණු කරගෙන ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභවයන් වර්ධනය කිරීම සඳහා ශක්තිමත් සහ ස්ථාවර ප්‍රතිපත්තියක්, නායකත්වයක් සහ ආයෝජනයක් ආරම්භ කර ඉදිරි දශක කිහිපය තුළ පවත්වාගෙන යාමට රටට අවශ්‍ය වේ.

ගැටලු

1. අප්‍රමාණවත් විදුලි ජනන ධාරිතාව

සාම්ප්‍රදායික සහ පුනර්ජනනීය බලශක්ති බලාගාර දෙකෙහි ම ප්‍රසම්පාදනය ලංසු ක්‍රියාවලියේ අයථා ක්‍රියා තුළින් පීඩාවට පත් වී ඇති අතර, ඒවායින් බොහොමයක් අවසානයේ දී නව බලාගාර ව්‍යාපෘති ප්‍රමාද කිරීමට හෝ සම්පූර්ණයෙන් අවලංගු කිරීමට හෝ හේතු වී තිබේ. 2022 වන විට, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ජනන ධාරිතාවේ පැවැති හිඟය මෙගාවොට් 500ක් පමණ විය. එයට අමතරව, වැඩි පුනර්ජනනීය බලශක්ති පදනම් වූ ජනන ධාරිතාවක් විසින් මිල අධික ඉන්ධන-දහන උත්පාදනයෙන් බලශක්තිය නිපැදවීම විස්ථාපනය කළ යුතුව තිබේ.

2. මහජන උපයෝගිතා කොමිසම සහ ලංකා විදුලි බල මණ්ඩලය අතර ගැටුම්

වසර 20ක විදුලි ජනන ව්‍යාප්ති සැලැස්මක් සකස් කර වසර දෙකකට වතාවක් එය යාවත්කාලීන කරමින්, මහජන උපයෝගිතා කොමිසමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසින් ලංකා විදුලි බල මණ්ඩලයට නියම වී තිබේ. මෙම අනුමත කිරීමේ ක්‍රියාවලිය තර්ක ප්‍රතිතර්කවලින් අඩපණ වී ඇති අතර, සැලැසුම අනුමත කර ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමට හේතුවක් වී තිබේ. ප්‍රධාන බලාගාර සඳහා (ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් කිරීම, නිෂ්කාශන, මූල්‍යකරණය, ලංසු තැබීම සහ ඉදිකිරීම් සඳහා) වසර දහයක

සම්පූර්ණ සංවර්ධන කාලයක් අවශ්‍ය වන බැවින් සියලු බලාගාර ව්‍යාපෘති සැළැකිය යුතු ලෙස ප්‍රමාද වන අතර පාලිත බිඳවීම් වැළැක්වීම සඳහා මිල අධික තෙල් දහන බලාගාර ක්‍රියාත්මක කිරීමට සිදුවෙයි.

3. මහජන උපයෝගිතා කොමිසමේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ දුර්වල පාලනය

විදුලිබල ක්ෂේත්‍රය සඳහා අවැසි ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය හෝ මූල්‍ය ක්ෂේත්‍රය යන විෂයයන්ගේ පළපුරුද්දක් ඇති එක් කොමසාරිස්වරයකු මහජන උපයෝගිතා කොමිසමට නොමැත. එබැවින්, කොමිසම් සභාව මුළුමනින් ම වසර 12 කට වැඩි කාලයක් එක තැන පල්වෙන ප්‍රධාන කාර්යය මණ්ඩලයක් සහිත එහි ලේකම් කාර්යාලය මත රඳා පවතියි. මූලික කාර්ය සාධන දර්ශක ස්ථාපිත කර නිරීක්ෂණය කරන සහ ඒවායේ වැඩිදියුණු කිරීම් පරීක්ෂා කෙරෙන ක්‍රමවේදයක් ලංකා විදුලි බල මණ්ඩලයෙහි ද නොමැත. නිදසුනක් වශයෙන්, ලංකා විදුලි බල මණ්ඩලය 2015 දී, සිය කාර්යය මණ්ඩලය 16,000 ක් ලෙසින් වාර්තා කරයි, 2021 දී, සමස්ත කාර්ය මණ්ඩලය 21,000 ක් දක්වා ඉහළ ගොසින් තිබුණ ද ජාල දිග හෝ පාරිභෝගිකයින් සංඛ්‍යාව 2015-2021 ට වඩා සැළැකිය යුතු ලෙසින් වර්ධනය වී නොමැත.

4. මිල වැඩිකිරීම වැළැක්වීමේ රාජ්‍ය බලපෑම්

2014 වසරේ සිට විදුලි මිල වැඩිකිරීම් සඳහා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කළ ඉල්ලීම්වලට මහජන උපයෝගිතා කොමිසම සහ රජය විසින් වසර 9 ක පමණ කාලයක් අවසර ලබාදුන්නේ නැත. 2016 දී, පාරිභෝගික මිල නියම කිරීමේ වගකීම මහජන උපයෝගිතා කොමිසම විසින් භාර ගත් අතර, පිරිවැය පිළිබඳ වගකීම පමණක් ලංකා විදුලි බල මණ්ඩලයට පැවැරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අවශ්‍ය ආකාරයේ බලාගාර ඉදි නො කෙරුණු අතර, කාර්ය මණ්ඩලය අධික වීම සහ උද්ධමනය හේතුවෙන් පිරිවැය කවත් ඉහළ ගියේ ය. මිල වැඩි කර පිරිවැය කළමනාකරණය කරගැනීමට නො හැකිවීමේ හේතුව නිසා ලංකා

විදුලි බල මණ්ඩලය අඛණ්ඩව අලාභ වාර්තා කළේ ය. 2021 වන තෙක්, විදුලි මිල පැවැතියේ පිරිවැයෙන් 70% ක් පමණ වූ අගයක වන අතර ඉන්ධන මිල සහ උද්ධමනය සීඝ්‍රයෙන් ඉහළ යාමත් සමඟ 2022 දී විදුලි මිල පිරිවැයෙන් 35% ක් පමණක් බවට පත්විය. එ හෙයින්, 2015 සිට මාස හයකට වරක් සිදු විය යුතු මිල වැඩි කිරීම සිදු නො කළ බැවින්, මිල-පිරිවැය තුලනය පිළිබිඹු කිරීම සඳහා එක් පියවරකින් සියයට 200 ක පමණ මිල වැඩි කිරීමක් අවශ්‍ය විය. මෙම ක්‍රියාව විසින් මහජනතාව තුළ ඇති කළ කම්පනය අපි අත් දුටුවෙමු. මෙම කාල සීමාව තුළ අනෙකුත් සියලු ම සේවා සහ උපයෝගිතා සඳහා කාලෝචිත මිල වැඩිවීම් ලැබී ඇති බව ද සැළැකිය යුතු වෙයි. රාජ්‍ය බැංකුවලින් ණය ගැනීම් හරහා මූල්‍ය පහසුකම් ලබාගෙන ඇති අතර, එ මගින් එවැනි බැංකුවලට පීඩනයක් ඇති කර විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අධික පිරිවැයක් ද එක් කර තිබේ.

5. පුනර්ජනනීය බලශක්ති උත්පාදනය මන්දගාමී සංවර්ධනය

පුනර්ජනනීය බලශක්ති උත්පාදන පහසුකම් වර්ග තුනක් තිබේ. එනම්, (අ) 1996 - 2013 කාලය තුළ ප්‍රමිතිගත සැපැයීම මත ගාස්තු යන පදනමින් ගිවිසුම් අත්සන් කෙරුණු මෙගාවොට් 10 ට අඩු ධාරිතාවකින් යුත් බලාගාර, (ආ) 2015 සිට තරඟකාරී පදනම මත සේවා ලබාගන්නා බලාගාර ගිවිසුම්, සහ (3) වහළ මත ඒකක යනුවෙනි. 2021 වසරේ දී, ශ්‍රී ලංකාවේ නිපදවුණු විදුලියෙන් 16%ක් පමණ උක්ත ක්‍රමවලින් සැපැයිණි. ලංකා විදුලි බල මණ්ඩලය සතු ජලවිදුලි බලාගාර සහ සුළං බලාගාරවල දායකත්වය සමඟ සැළැකූ කල, 2021 දී නිෂ්පාදනය කරන ලද විදුලියෙන් 52% ක් පුනර්ජනනීය බලශක්තිය නියෝජනය කරයි. එ සේ වුව ද, බලාගාර සංවර්ධනයේ සැළැකිය යුතු ප්‍රමාදයන් සිදු වී ඇත; ලංසු තැබීමේ අදියරට එළැඹ තිබුණු බලාගාර (මන්නාරම, පුනරීන්, සියඹලාණ්ඩුව) ප්‍රමාද වී ඇත. තරඟකාරී ලංසු තැබීමට සූදානම් කර තිබුණු බලාගාරවලට ලංසු තැබීම සඳහා මාස ගණනකින් අමාත්‍ය අනුමැතිය ලැබී නැත. වහලයේ

සූර්ය බලශක්ති වැඩසටහන බොහෝ විට බෙදාරීම් ජාලවල ධාරිතාව විසින් සීමා කෙරෙයි. පුනර්ජනනීය බලශක්ති උත්පාදන පහසුකම් සංවර්ධනය වේගවත් කිරීමට, ජාල සංවර්ධන සඳහා අවශ්‍ය ආයෝජන සිදු කිරීමට සහ කාර්යය ප්‍රමාද වැළැක්වීමට නිශ්චිත උත්සාහයක් තිබිය යුතු ය.

6. බලාගාර මිල දී ගැනීම සඳහා තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමයක් නොමැතිකම

දේශපාලන අධිකාරිය/ඔවුන්ගේ නිලධාරීන් සහ සේවකයන් අතර මෑත කාලීන බොහෝ ආරවුල් ඇති වී තිබෙන්නේ, ප්‍රසම්පාදනයේ දී, විශේෂයෙන් ම බලාගාර මිල දී ගැනීමේ කාර්යයේ දී, තරඟකාරී ක්‍රියාවලිය මගහැරීම හේතුවෙනි. මේ සම්බන්ධයෙන් දැක්විය හැකි මෑත කාලීන උදාහරණ දෙකක් වෙයි. (අ) ද්‍රව ස්වභාවික වායු පර්යන්තය ඉදිකිරීම සඳහා පාර්ශ්වයක් සමඟ ගිවිසුමක් අත්සන් කරන ලද අතර, එම ව්‍යාපෘතිය සඳහා ම නිල තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් ද ක්‍රියාත්මක විය. (ආ) සුළං බලාගාරයක් ඉදිකිරීම සඳහා ඉන්දියානු සමාගමක් විසින් කරන ලද යෝජනාවකට ඉඩ සැලැසීම සඳහා විදුලිබල පනත සංශෝධනය කිරීම. වසර 20 ක් පුනර්ජනනීය බලශක්තිය සඳහා සැපැයීම මත ගාස්තු පිරිනැමීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමෙන් පසු, 2016 දී හඳුන්වා දෙන ලද තරඟකාරී ලංසු තැබීම නිසා මිල ගණන් 50% කින් අඩු විය. ලංසු තැබීම 2019 පමණ වන තෙක් ක්‍රියාත්මක කරන ලද අතර, එතැන් සිට, තරඟකාරී නොවන පදනම මත තෝරාගත් පාර්ශ්වයන්ට ලබා දුන් කොන්ත්‍රාත්තු ක්‍රමයකට යොමුවීම නිසා ලංසු තැබීමේ ක්‍රමය පීලි පැන්නේ ය. එ ලෙස හිතු හිතු පරිද්දෙන් කළ කටයුතු හේතුවෙන්, ශ්‍රී ලංකාව පළමු වතාවට, විදේශ මුදල් ගෙවා පුනර්ජනනීය බලශක්ති පදනම් කරගත් විදුලිය මිල දී ගැනීමට බොහෝ දුරට ඉඩ තිබේ.

7. බලශක්ති (තෙල් සහ ගෑස්) උත්පාදනය සඳහා ප්‍රමාණවත් තරමින් ප්‍රමුඛත්වයක් නොලබීම

බලශක්ති මූලාශ්‍රයන් පිළිබඳ සමුද්‍රීය ගවේෂණ දිගුකාලයක්

පුරා සිදු විය. එම සම්පත් ශ්‍රී ලංකා මුහුදු සීමාව තුල සොයාගැනී අවුරුදු ගනනාවක් ගෙවී ඇති නමුදු, මෙතෙක් එම නිශ්පාදනයන් සිදුවන්නේ නැත. මුහුදේ කැනීම් මගින් කනිජතෙල් සහ ගෑස් නිශ්පාදනය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවනවාට අමතරව, ඒ සඳහා දියුණු තාක්ෂණය අවශ්‍ය වනු ඇත. අදාළ ක්ශේත්‍රයේ විශේෂඥ දැනුම අවශ්‍ය වනු ඇත. මේ සෑම අංශයකම රටට පිටින් සහයෝගය අවශ්‍ය වනු ඇත.

අපගේ බලශක්ති ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ:

- **බලශක්ති උත්පාදන ධාරිතාව වැඩි කිරීම සහ නිෂ්පාදකයින් හා පාරිභෝගිකයින් සඳහා පිරිවැය අඩු කිරීම**
- **දැනට හඳුනාගෙන ඇති මූලාශ්‍රවලින් තෙල් හා ගෑස් ලබාගැනීමට ප්‍රමුඛතා පදනමින් අවශ්‍ය පියවර ගැනීම සහ එවැනි මූලාශ්‍ර හඳුනාගැනීමේ ප්‍රයත්නය නොකඩවා ඉදිරියට ගෙනයාම**
- **බලශක්ති උත්පාදනයේ සහ තාක්ෂණයේ ස්වෛරීත්වය වර්ධනය කිරීම**
- **මිනිස් සෞඛ්‍යයට සහ ස්වභාවික පරිසරයට අඩු හානියක් වන බලශක්ති උත්පාදන ආකාර වෙත සංක්‍රමණය වීම**
- **දූෂණ, අයථා ක්‍රියා වළක්වා ආයතනික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම**
- **මිලකරණය සහ සහනාධාර ලබාදීම් විධිමත් කිරීම**

ඉදිරිමග

1. ජාතික කාබන්හරණ ප්‍රතිපත්තිය

මුළුමනින් ම ක්‍රියාත්මක කිරීම සඳහා යථාර්ථවාදී කාල රාමුවක් ඇතුළත් පරිපූර්ණ ජාතික කාබන්හරණ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය. රාජ්‍ය ව්‍යවසාය, ආයතන සහ අමාත්‍යාංශ

විසින් අනුගමනය කරනු ලබන තාවකාලික සහ නොගැළපෙන ක්‍රියාකාරකම් ඒ තුළින් නැවැත්විය යුතු ය. අදාළ ක්‍රියාකාරී සැලැස්ම වෘත්තික නායකත්වයක් විසින් සකස් කළ යුතු අතර න්‍යෂ්ටික බලශක්තිය, ස්වාභාවික වායු, සූර්ය, සුළං සහ ජල විදුලි බලය සඳහා ප්‍රතිපත්ති ඒ තුළට ඇතුළත් කළ යුතු ය. අනාගත කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍යතා, ගෘහස්ථ පරිභෝජනය සහ අපනයනය සඳහා අතිරික්තයක් උපයා ගැනීමේ හැකියාව ද මෙම සැලැස්ම සැකැසීමේ දී සැළැකිල්ලට ගත යුතු ය.

2. බලශක්ති (තෙල් සහ ගෑස්) නිශ්පාදනය

දැනට තෙල් සහ ගෑස් නිදි සොයගෙන ඇති සහ නැති ප්‍රදේශ වල නිශ්පාදනය හා ගවේෂණය කඩිනමින් ආරම්භ කිරීමට ප්‍රමුඛතා පදනමින් ක්‍රියා කල යුතුය. ඒ සඳහා තාක්ෂණය, දැනුම හා මූල්‍යමය වශයෙන් ආයෝජනයන් කලහැකි ආසියානු හා එයුරේශියානු කලාපීය මිත්‍ර රටවල් සමග, එම සම්පත්වල අයිතිවාසිකම ශ්‍රීලංකාව වෙත රැකෙන ආකාරයට, ගිවිසුම්ගත වෙමින් නොපමාව ක්‍රියා කලයුතුව ඇත.

3. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය

බලශක්ති උත්පාදනය, සැපයුම සහ බෙදාහැරීම යන ක්ෂේත්‍රවල රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර වගකීම් තාර්කිකව බෙදීයන ආකාරයට අදාළ නීති සහ ප්‍රතිපත්ති යාවත්කාලීන කළ යුතු ය. සාර්ථක කාර්මික ආර්ථිකයන් තුළ බලශක්ති අංශය ක්‍රියාත්මක වන ආකාරය හොඳින් අධ්‍යයනය කොට මෙම රාමුව සකස් කළ යුතු වේ. විදේශීය සමාගම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය යුතු ආකාරය ද මෙම නීතිමය රාමුවෙන් ගෙනහැර දැක්විය යුතු ය. තාක්ෂණය සහ දැනුම රටට ලබාදීමට පෞද්ගලික සහ විදේශීය පාර්ශවකරුවන් දිරිමත් කළ යුතු ය.

4. න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන

ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැමති රුසියාව හෝ චීනය වැනි සුදුසු තාක්ෂණය සහ දැනුම ඇති

රටවල සහයෝගය ලබාගෙන ශ්‍රී ලංකාවේ තෝරියම් සම්පත් යොදා ගනිමින් න්‍යෂ්ටික බලාගාර මගින් විදුලි බලය නිපදවීමේ හැකියාව ගවේෂණය කළ යුතු ය.

5. පුනර්ජනනීය බලශක්ති වැඩසටහන

ප්‍රමුඛ රටවලින් තාක්ෂණය ලබාගැනීමේ උපායමාර්ගික සැලැස්මක් සහිත පුනර්ජනනීය බලශක්ති වැඩසටහනක් රජය විසින් ආරම්භ කළ යුතු ය. සූර්ය පැනල වැනි පුනර්ජනනීය බලශක්ති උපකරණ නිෂ්පාදනය කිරීමේ ගෝලීය සැපයුම් දාමයට ශ්‍රී ලංකාව ඒකාබද්ධ කිරීම ගැන ද එවැනි වැඩසටහනකින් සළකා බැලිය යුතු ය. පුනර්ජනනීය බලශක්ති සැලසුම් කෙටුම්පත් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ යටතේ විශේෂ ආයතනයක් පිහිටුවිය යුතුය.

6. රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ නවීකරණය

කාර්යක්ෂම කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සහ දේශපාලනීකරණය සහ දූෂණය අවම කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ව්‍යුහය වෙනස් කළ යුතු ය. රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්ය මණ්ඩල සමන්විත විය යුත්තේ සුදුසු සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් වන අතර ඔවුන්ගේ සුදුසුකම් අදාළ රෙගුලාසි මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය. උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන නව බලශක්ති කර්මාන්තයට අවශ්‍ය නිපුණතාවන්ට ගැළැපෙන පරිදි තම වැඩසටහන් සකස් කළ යුතු ය. බලශක්ති කර්මාන්තයේ, විශේෂයෙන් පුනර්ජනනීය සහ සංවර්ධනය වන තාක්ෂණයේ පර්යේෂණ, අධ්‍යාපනය සහ පුහුණු අවස්ථා සඳහා බලශක්ති විශිෂ්ටතා මධ්‍යස්ථානයක් නිර්මාණය කළ යුතුය.

7. ආයතනික ස්වාධීනත්වය

මහජන උපයෝගිතා කොමිසමේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ ස්වාධීනත්වය තහවුරු කළ යුතු ය. මේ සඳහා ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම සඳහා වග කියන ලංකා විදුලි බල මණ්ඩලයේ ඒකක රජය සතු සමාගම් ලෙසින් සංස්ථාගත

කිරීම ද ඇතුළත් කළ හැකි ය. තම ආයතනවල පාලනය සහ කාර්යක්ෂමතාව පිළිබඳ පැහැදිලි ඉලක්ක සපුරාගැනීමේ වගකීම පවරමින් මහජන උපයෝගිතා කොමිසමේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ කොමසාරිස්වරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ලෙස ස්වාධීන වෘත්තිකයන් පත් කළ යුතු ය.

8. මිලකරණය

පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර අනුමැතියක් අවශ්‍ය වන ජාතික හදිසි අවස්ථාවකදී හැර බාධාවකින් තොරව විදුලි මිල තීරණය කිරීමට මහජන උපයෝගිතා කොමිසමට සහ ලංකා විදුලි බල මණ්ඩලයට රජය විසින් බලය දිය යුතුය.

9. සෘජු සහනාධාර

සියලු දෙනා හට පොදුවේ විශ්වීය සහනාධාරයක් ලබාදීම වෙනුවට විදුලි පිරිවැය ලැබිය යුතු යැයි හඳුනාගන්නා තෝරාගත් පාරිභෝගිකයින් හට රජය විසින් සෘජු විදුලි සහනාධාර ලබා දිය යුතු ය. දරිද්‍රතාව පිටුදැකීම සහ කාර්මික ප්‍රතිපත්ති සළකා බැලීම මත එවැනි සහනාධාර තීරණ ගත හැකි ය.

10. තරගකාරී ලංසු තැබීම

හිතුමතයේ ගන්නා තීරණවලින් ඉවත් වී බලශක්ති නිෂ්පාදන ව්‍යාපෘති සඳහා තරගකාරී ලංසු තැබීම සඳහා වන හොඳ යාන්ත්‍රණයක් රජය විසින් හඳුන්වා දිය යුතු ය.

සංචාරක කර්මාන්තය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය රටට රැකියා බිහි කරන සහ විදේශ විනිමය උපදවන ප්‍රධාන මූලාශ්‍රයක් බවට පත්ව තිබේ.

කෙසේ වුව ද, දූෂණය සහ දේශපාලනීකරණය හේතුවෙන් මෙම අංශය වර්ධනය වී ඇත්තේ අක්‍රමවත් සහ නියාමනය නොකළ ආකාරයකිනි. කුඩා ව්‍යාපාර ඇතුළු විවිධ කණ්ඩායම් විශාල ප්‍රමාණයකින් සංචාරක කර්මාන්තය සමන්විත වන අතර, මෙම අංශය මෙහෙයවන ආයතනවල ප්‍රධාන කේන්ද්‍රස්ථාන සියල්ල සුවිසල් නිවාඩු නිකේතන හිමිකරුවන් සුළු පිරිසකගේ කතිපයාධිකාරයක ග්‍රහණයට ලක් වී තිබේ. ඒ අනුව, එකී කතිපයාධිකාරීහු තමන්ගේ සුවිසල් සමාගම්වල ලබාගත හැකි වාසි වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය සම්පත් තමන්ට අවශ්‍ය පරිදි හසුරුවනු ලබන අතර, මෙම අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායවල දියුණුව සහ කර්මාන්තය තුළ තිබිය යුතු පුළුල් විවිධාංගීකරණය වළක්වති. රටේ පවතින සාපේක්ෂ දේශපාලන අස්ථාවරත්වය සමඟ බද්ධ වී සිටින මෙය සංචාරක කර්මාන්තයේ වර්ධනයට ප්‍රධාන බාධාවක් බවට පත්ව තිබේ.

සංචාරක ක්ෂේත්‍රය සහ සමස්ත දේශීය ආර්ථිකය අතර පවතින්නේ ඉතාමත් සීමිත සම්බන්ධයක් වීම හේතුවෙන් ද ශ්‍රී

ලංකා සංචාරක කර්මාන්තයේ වර්ධනය අඩාල වී තිබේ. බොහෝ සංචාරක ව්‍යාපාරිකයෝ ආහාර පාන, ඇඳ ඇතිරිලි වැනි මූලික දේ සඳහා පවා ආනයනය මත දැඩි ලෙස රඳා සිටිති. එයට අමතරව, සංචාරක ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන සහ කර්මාන්ත සඳහා අතිරේක වෙළෙඳපොළක් සැපයීමට ද අසමත් වී තිබේ.

එහෙයින් අපගේ සංචාරක කර්මාන්ත ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ,

- **ප්‍රාදේශීය ප්‍රජාවන්ට ප්‍රතිලාභ සළස්වන්නා වූ ජනතා කේන්ද්‍රීය සහ තිරසාර සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම.**
- **ශ්‍රී ලාංකික කෘෂි නිෂ්පාදන, අත්කම්, සහ අනෙකුත් නිපැයුම් ද ඇතුළත් වන පරිදි ශ්‍රී ලංකාව වෙළෙඳ සන්නාමයක් ලෙසින් ලෝකය පුරා ප්‍රචලිත කරවීම.**

ඉදිරිමග

1. පරිපාලනය, සැලසුම්කරණය සහ නියාමනය

කතිපයාධිකාරීත්වයේ බලය බිඳ දැමීම සඳහා නවමු උප අංශවල ව්‍යවසායකයන් හට ද සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හට ද වැඩි නියෝජනත්වයක් ලැබෙන පරිදි සංචාරක අංශයේ ප්‍රධාන පාලන ආයතන සහ නියාමන ආයතන ප්‍රජාතාන්ත්‍රීකරණය කළ යුතු ය.

2. සංචාරක පර්යේෂණ සහ අලෙවිකරණය

දේශීයව හා විදේශීයව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කළ හැකි මාර්ග පිළිබඳව පර්යේෂණ සිදුකිරීම සහ හඳුනාගන්නා දේ සඳහා ප්‍රචාරය ලබාදීම අරමුණු කරගෙන සංචාරක මණ්ඩලය තුළ සංචාරක පර්යේෂණ අංශයක් ස්ථාපිත කළ යුතුය. මෙම පර්යේෂණ අංශයේ ප්‍රධාන අරමුණ විය යුත්තේ වැටුප් මට්ටම්, දේශපාලන ස්ථාවරත්වය, ජනවිකාස විපර්යාස, විනිමය අනුපාත

යනාදී විචල්‍යයන්ගේ බලපෑම් විමර්ශනය කරමින් ශ්‍රී ලංකාව සඳහා අනාගත සංචාරක වෙළෙඳපොළ බවට පත්විය හැකි ප්‍රභවයන් අධ්‍යයනය කිරීම ය. ඒ අනුව කර්මාන්තයේ චක්‍රීය බව නිසා ඇතිවිය හැකි වෙනස්කම් සුමට කිරීමට උපකාරී වන අතර ම ගෝලීය ප්‍රවණතා සහ ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිපත්ති සැලසුම් කිරීම පිණිස ද මෙම පර්යේෂණ යොදා ගත යුතු ය. මෙම ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාව සමග තරග කරන අනෙකුත් පාර්ශ්ව පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම සහ දේශීය සංචාරක සමාගම් සඳහා නව ව්‍යාපාර ආකෘති සැකසීමට උපකාර කිරීම ද මෙම පර්යේෂණ අංශයේ අනෙකුත් අරමුණු අතර තිබිය යුත්තේ ය.

3. නියාමිත මිල යාන්ත්‍රණය

තාර්කික මිල කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීමට, සහ අධික ලාභ ඉපැයීම සහ මිල වැඩිකිරීම නියාමනය කිරීමට රජය කටයුතු කළ යුතු ය. සංචාරක වෙළෙඳපොළේ එක් එක් කොටස සඳහා වෙන් වෙන් වශයෙන් මිල නියම කිරීම ගෝලීය සංචාරක කර්මාන්තයේ චාරිත්‍රයකි. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ එවැනි ඇතැම් කොටස් අතර පරතරය ඇතැම් විට සියයට 300 ටත් වැඩි ය. මෙවැනි අසාධාරණ මිල ක්‍රම හේතුවෙන් ශ්‍රී ලංකාව විසින් තම වෙළෙඳපොළ කොටස ඉතා අඩු කාමර ගාස්තු ඇති රටවල්වලට පිරිනමනු ඇත්තේ ය. එබැවින් කුඩා හා විශාල ව්‍යාපාරිකයන් ඇතුළු සියලු පාර්ශ්වකරුවන්ගේ ද අදහස් විමසා සකසාගත් රාජ්‍ය ප්‍රතිපත්තියක් මත කාමර ගාස්තු තීරණය කළ යුතු ය. තව ද, රජය විසින් සියලු අංශ සඳහා පැහැදිළි ප්‍රමිතීන් හඳුන්වා දිය යුතු අතර සියලු සේවා ලබාදීම් එම ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කළ යුතු ය.

4. විදේශීය මුදල්වලින් ගෙවීමට ඉඩදීම

විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට සහ ශ්‍රී ලංකාව මුළුමනින් ම ඩොලර් මත රඳාසිටීම වැළැක්වීමට සහය වනු පිණිස විදේශිකයන්ට එක්සත් ජනපද ඩොලර්, යුරෝ, රන්-මින්-පී, ඉන්දියානු රුපියල් සහ රූබල් ඇතුළු විදේශ ව්‍යවහාර

මුදල්වලින් සංචාරක සේවා සඳහා ගෙවීම් කිරීමට ඉඩ සලසන මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ රජය මගින් හඳුන්වා දිය යුතු ය. මෙම ක්‍රියාවලියට සහායවීම සඳහා සංචාරක ආයතනවලට නවීන ඩිජිටල් ගෙවීම් පද්ධති හඳුන්වා දිය යුතු ය.

5. සංස්කෘතික සහ පුරාවිද්‍යාත්මක උරුම ප්‍රවර්ධනය

වැඩි සංචාරකයින් පිරිසක් ආකර්ෂණය කර ගැනීම පිණිස රජය විසින් ශ්‍රී ලංකාවේ අද්විතීය සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුමයන් යොදාගත යුතු ය. එ හෙයින්, සංස්කෘතික ප්‍රකාශන සහ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන ආරක්ෂා කරන අදාළ අමාත්‍යංශ සමඟ සම්බන්ධීකරණයෙන් ඒවා සංචාරකයින් සඳහා ලෝක උරුමයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට සංචාරක අමාත්‍යාංශය කටයුතු කළ යුතු ය. කෙසේ වුව ද, මේ සඳහා අදාළ කරගන්නා ප්‍රාදේශීය ප්‍රජාවන්ට නිසි ගෞරවයක් ලැබෙන ආකාරයකින් සහ සංස්කෘතික සිදුවීම් සහ පුරාවිද්‍යාත්මක ස්ථානවල සමාජ වැදගත්කම හෑල්ලුවට පත් නොවන ආකාරයකින් මෙය සිදු කළ යුතු ය.

6. අධ්‍යාපනය සහ පුහුණුව

ජීවනෝපාය සඳහා සංචාරක ව්‍යාපාරයේ ඇති වැදගත්කම සැළැකිල්ලට ගෙන, දරුවන්ට කුඩා කාලයේ දී ම එම කර්මාන්තය පිළිබඳව උගන්වා රට වෙනුවෙන් තානාපතිවරුන් ලෙස කටයුතු කිරීමට හැකි වන අයුරින් ඔවුන්ව සූදානම් කළ යුතු ය. ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික මට්ටම්වල දී විෂයයන් ලෙස ශ්‍රී ලාංකීය නොවන ඉංග්‍රීසි, හින්දි, චීන සහ රුසියානු ඇතුළු අමතර භාෂා හැදෑරීමට අවස්ථාව දරුවන්ට ලබා දිය යුතු ය. මේ අතර, ජනප්‍රිය සංචාරක ස්ථාන ආශ්‍රිතව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංචාරකයන්ට ලබාදෙන සේවා ඉහළ නැංවීමට රජය ක්‍රියා කළ යුතු ය. වෘත්තීය පුහුණුව තුළින් උසස් මට්ටමේ දැනුවත්භාවයක් සහ සේවා තත්ත්වයක් ඇති කළ යුතු ය. සංචාරක ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ලබාදෙන බලපත්‍රය කාර්ය මණ්ඩලය සහ අයිතිකරුවන් යන අංශ දෙක ම ආවරණය

වන පරිදි ප්‍රමිතිගත සහ අනිවාර්ය අධ්‍යාපන අවශ්‍යතා සමඟ සම්බන්ධ කළ යුතු ය. මේ අතර, පුහුණුව ලබා ඇති, එ මෙන් ම, නව සංකල්ප සහ ව්‍යාපාරික අදහස් ඇති ව්‍යවසායකයින් සඳහා සහනදායී පදනමින් මූල්‍ය පහසුකම් ලබාදෙන යෝජනා ක්‍රමයක් ද රජය විසින් හඳුන්වා දිය යුතු ය.

7. පහසුකම් සහ යටිතල පහසුකම් ප්‍රවර්ධනය

සිවිල් යුද්ධයේ අවසානය විසින් නව යටිතල පහසුකම් ගොඩනැඟීමට සහ සංචාරක ව්‍යාපාරයේ පුනර්ජීවනයට මඟපෑදුන ද යටිතල පහසුකම් සංවර්ධනය මූලික වශයෙන් ම මාර්ග සහ අධිවේගි මාර්ගවලට පමණක් සීමා විය. එ බැවින්, දුම්රිය, ට්‍රෑම් රථ, තොටුපළ සහ ගොන් කරත්ත, අශ්වයින් පැදීම සහ බූරුවන් පිට යාම වැනි වෙනත් සම්ප්‍රදායික ක්‍රම ද ඇතුළුව දේශීය හා විදේශීය සංචාරකයින්ට ප්‍රයෝජනවත් විය හැකි ප්‍රවාහන විවිධාංගීකරණ සඳහා වන මාර්ග සංචාරක අමාත්‍යාංශය මඟින් ගවේෂණය කළ යුතුය.

8. විවිධාංගීකරණය සහ අගය එකතු කිරීම

සංචාරකයින්ට ශ්‍රී ලංකාව තුළ දී ලබාගැනීමට හැකි අත්දැකීම් ඉතා බහුල වන බැවින්, ලොව පුරා ජනප්‍රිය වෙමින් පවතින නව්‍ය හා සුවිශේෂී අත්දැකීම් ඇතුළත් කිරීම අරමුණු කරගෙන සංචාරක අංශය විවිධාංගීකරණය කළ යුතු ය. මෙ ලෙස හඳුන්වා දිය හැකි දෑ අතර පහත දැක්වෙන ඒවා ද වෙයි.

- බැලුන පැදයාම, පැරෂුට්, අහසේ පාවී යාම, ඩෙල්ටා යානා, කම්බියේ ලුහුටායෑම, පර්වත තරණය, කඳු නැගීම, කඳවුරු සෑදීම වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වික්‍රමාන්විත සංචාරක කටයුතු.
- පාවෙන හෝටල්, දිය යට හෝටල්, කෙළිනැව් නවාතැන්, ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම, කිමිදීම, වායු උපකරණයක් සමඟින් පිහිනීම, ඩොල්ෆින් සහ තල්මසුන් නැරඹීම වැනි දෑ සමඟින් සමුද්‍රීය සංචාරක කටයුතු ප්‍රවර්ධනය

- බටහිර වෛදකම මෙන් ම ආයුර්වේදය, යෝග වැනි දේශීය වෛද්‍ය ශාස්ත්‍ර භාවිතා කරමින් වෛද්‍ය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය
- පාරිසරික වශයෙන් තිරසාර හෝටල් සහ නිවාඩු නිකේතන, ගොවිපල සංචාරක නවාතැන් ස්ථාන, ආක්‍රමණශීලී නොවන සෆාරි, කාබනික ආහාර ආදිය ඇතුළත් පරිසර සංචාරක ව්‍යාපාරය හා කෘෂි සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය.
- ආගමික වන්දනා ගමන් සහ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන ලෙසින් දේශීය ආගමික ස්ථාන ප්‍රවර්ධනය
- බුද්ධාගම, හින්දු, සිංහල, දෙමළ, පාලි සහ සංස්කෘත භාෂා අධ්‍යයනය සඳහා පුස්තකාල ඇති කරමින් සහ පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධ කරගනිමින් අධ්‍යාපන සංචාරක කටයුතු ප්‍රවර්ධනය

නිවාස සහ නාගරික සංවර්ධන ප්‍රතිපත්තිය

හැඳින්වීම

නිදහස ලැබීමෙන් ගත වූ කාලය තුළ ජනතාවගේ නිවාස අවශ්‍යතා සපුරාලීමේ අරමුණ ඇතිව විවිධ ප්‍රතිපත්ති සම්පාදනය කර තිබෙන අතර ඒවා මත පදනම් වූ විවිධ ව්‍යාපෘතින් ද ක්‍රියාත්මක කර තිබේ. මුල් කාලයේ පැවැති රජයන් විසින් තමන්ගේ වැඩි අවධානය යොමු කර තිබුණේ නාගරික මධ්‍යම පංතිය සහ වැඩකරන ජනතාවගේ නිවාස අවශ්‍යතා වෙනුවෙනි. මෙම විෂයයට අදාළව විවිධ ආයතන පිහිටුවීම ද පැවැති රජයන් විසින් සිදු කෙරිණි. පාර්ලිමේන්තු නිවාස අනුකාරක සභාවේ නිර්දේශ මත 1953 දී මුල් වරට නිවාස විෂයය වෙනුවෙන් ම වෙනම අමාත්‍යාංශයක් පිහිටුවනු ලැබීය. එම කාර්යය තවත් ඉදිරියට මෙහෙයවමින් 1954 අංක 34 දරණ ජාතික නිවාස පනතින් ජාතික නිවාස දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. 1961 වසරේ දී රජය විසින් ග්‍රාමීය හා නාගරික නිවාස අවශ්‍යතා සොයා බලා වාර්තා කිරීමට කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ නිර්දේශ මත ජාතික නිවාස දෙපාර්තමේන්තුව විසින් සහ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා අණ පනත් ගණනාවක් හඳුන්වා දෙනු ලැබූ අතර ඒවා මත පදනම් වී නිවාස සංවර්ධනය වැඩසටහන් ගණනාවක් ම ක්‍රියාත්මක කරනු ලැබීය.

කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ නාගරික නිවාස අවශ්‍යතා සපුරාලීමේ විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරුණේ 1970 දී බලයට පැමිණි සමගි පෙරමුණු රජයේ නිවාස සහ ගොඩනැගිලි ඇමැතිවරයා බවට පත්වුණු පීටර් කේනමන් මහතාගේ නායකත්වයෙනි. ඒ අනුව, කම්කරුවන් සහ දිළිඳු ජනතාව ඉලක්ක කරගත් නිවාස ව්‍යාපෘති ගණනාවක් ම එම යුගයේ දී ක්‍රියාත්මක කෙරිණි. පසුව රණසිංහ ප්‍රේමදාස මහතාගේ නායකත්වයෙන් කොළඹ නගරයේ දිළිඳු ජනතාව මෙන් ම ගම්බද ජනතාව ද ඉලක්ක කරගත් නිවාස සම්පාදන වැඩපිළිවෙළක් ආරම්භ කෙරිණි.

එයින් පසු බලයට පත් වූ රජයන් විසින් ද නාගරික මහල් නිවාස ඉදිකිරීම කෙරෙහිත් මුඩුක්කුවලට සීමා වී සිටි ජනතාවට මහල් නිවාස ලබාදීමටත් වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. මෙවැනි බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණේ මුඩුක්කුවලට යට වී තිබුණු භූමි ප්‍රදේශ විවිධ ආයෝජන අවස්ථා සඳහා ලබාදීමේ අරමුණ මුල් කරගෙන ය.

1978 අංක 41 දරන පනත මගින් නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. මෙම ආයතනය පිහිටුවීමේ අරමුණ වූයේ නාගරික විෂයයට අදාළ ප්‍රදේශවල ආර්ථික, සමාජ සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධව සැලසුම් කිරීමත් එම සැලසුම් ක්‍රියාවට නැංවීමත් ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට නාගරික අධිකාරිය පත්විය. පසුව මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය පිහිටුවනු ලැබුවේ ද නාගරික අංශයේ අවශ්‍යතා සපුරාලීම වෙනුවෙනි.

ගැටලු

නිවාස විෂයයට අදාළ රාජ්‍ය මැදිහත්වීමේ ඉතිහාසය දශක හතක කාලයක් ඈතට දිව ගිය ද මේ පිළිබඳ විධිමත් සහ ස්ථාවර රාජ්‍ය ප්‍රතිපත්තියක් සහ ඒ මත ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් සමුදායක් අප විසින් නිර්මාණය කරගෙන නොමැත. මේ වනවිට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් ලක්ෂ හැටක් පමණ උග්‍ර නිවාස ගැටලුවකට මුහුණ පා සිටියි. ඒ අතරින් ලක්ෂ අටක

පිරිසකට හිසට සෙවනක් ඇත්තේ ම නැත. තවත් ලක්ෂ පහක පමණ පිරිසක් තම නිවාස අලුත්වැඩියා කරගැනීමට නො හැකිව පීඩාවට පත් වී සිටින අතර මධ්‍යම පංතික නිවාස අවශ්‍යතාව ද ලක්ෂ දෙකක් පමණ වෙයි.

මේ අතර ම, දුප්පත් - පොහොසත් බෙදීමට නාගරික - ග්‍රාමීය බෙදීම ද එක් වී ඇති බැවින් නිවාස සම්පාදනයේ සහ නාගරික සංවර්ධනයේ ගැටලු තවත් උග්‍ර කර තිබේ. " බස්නාහිර පළාත් මහානගර" සැලැසුමෙන් අපේක්ෂා කෙරුණේ වරප්‍රසාද ලත් අයට නගර අභ්‍යන්තරයේත් මධ්‍යම පංතියට උප නගරවලත් දිළින්දන්ට උස් ගොඩනැගිලි ස්වරූපයේ මුඩුක්කුත් නේවාසිකාගාරත් ඉදිකිරීමට ය. ඒ අනුව, ලක්ෂ පහක පමණ ජනතාවක් ඔවුන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කිරීමට අපේක්ෂා කෙරිණි.

නාගරික සැලසුම් ක්‍රියාවලියේ පවතින්නේ අඩු ජනප්‍රිය පාලන ක්‍රම ය. සාමාන්‍යයෙන් නිලධාරීන් විසින් සකසන සැලසුම් ව්‍යුහයන් තුළින් ව්‍යාපාරික අවශ්‍යතා, ඉහළ හෝ ඉහළ මධ්‍යම පාංතික අවශ්‍යතාවලට ප්‍රමුඛතාව සැපයෙන නමුත් අනෙකුත් අවශ්‍යතා බැහැර වී යයි. නාගරික සංවර්ධන යෝජනාක්‍රම සැකසීමේ දී ඊට පාදක වන ප්‍රදේවාසීන් (පංගුකාර පාර්ශ්ව) මැදිහත් කරගැනීමක් සිදු නොවේ. මේ හේතුවෙන් පොදු පහසුකම්, එනම් මාර්ග සහ කාණු නඩත්තුව දුර්වල මට්ටමකට වැටීමත් මහජන වැසිකිළි වැනි පහසුකම් අහිමි කිරීමත් සිදු වේ.

ජාතික, භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පුළුල් "ජාතික සැලසුම්" සකස් කළ ද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම වගකීම් බොහොමයක් පවරාගෙන තිබුණ ද, අද ඔවුන් පූජා භූමි සැලසුම් සැකසීමට ඌනනය වී තිබේ. නාගරික සංවර්ධන අධිකාරිය දූෂිත ආයතනයක් ලෙස පිලිගැනෙන අතර, ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, සහ ප්‍රාදේශීය සභා) සැලසුම් ක්‍රියාවලියට ඔවුන් මැදිහත්වූවත් එහි ප්‍රත්‍යාවර්ත ස්වරූපයක් නොපවතී. නිලධාරිවාදී සැලසුම් ව්‍යුහයන්හි පවතින යටි අරමුණු නිසා එ

මගින් ජනතා අවශ්‍යතා කෙරෙහි බාධාකාරී අයුරිනුත්, ජාතික ප්‍රතිපත්ති බොහෝ විට උල්ලංඝනය වන අයුරිනුත් ක්‍රියාත්මක වේ. උදාහරණ වශයෙන්, පාපැදි මංතීරු සලකුණු නොවීම, නීතිවිරෝධී සැලසුම් අනුමත වීම නිසා පදිකයින් බාධාකාරී වන ලෙසින් පදික වේදිකා ආක්‍රමණය වන අයුරින් කඩසාප්පු ඉදි වී තිබීම පෙන්වා දිය හැකි ය.

සේවක ජනතාව, පාරිභෝගික ජනතාව සහ සිසු දරුවන් යනාදී මිලියන 1.5ත් 3ත් අතර ජනකායක්, රටේ, වාණිජ, ආර්ථික සහ අධ්‍යාපනික මධ්‍යස්ථානය වන කොළඹ මහ නගර ප්‍රදේශයට පැමිණීම නිසා අධික තදබදයක් දෛනිකව නිර්මාණය වේ. වෙනත් අවශ්‍යතා නිසා මේ ගැටලුව විසැඳිය නොහැකි තරම් උග්‍ර වී තිබේ. කොළඹ නගරය ආශ්‍රිත ව්‍යාපාරික අවශ්‍යතා නිසා පදිංචිකරුවන්ගේ සහ දෛනිකව පැමිණෙන ජනතාව ඉහළ යෑම තුළින් පාරිභෝගික සංඛ්‍යාව ඉහළ යාම වාසි සහගත ය. "කොළඹ පාසල්" කීර්තිනාමය නිසාත්, අධ්‍යාපන සුදුසුකම් නිසාත් ජාලගතවීම පහසුවීම නිසාත් තම දරුවන් කොළඹ යැවීමට දෙමාපියන් පෙළැඹේ.

ගස්වැල්, තණතීරු වැනි හරිත වටපිටාවක ජීවත්වීම, මිනිසා මානසික, ශාරීරික අතින් සෞඛ්‍ය සම්පන්න කරන බවත් සතුටින් තබන බවත් අධ්‍යයනවලින් සනාථ වේ. නාගරික පරිසරයේ පැවති හරිත හාත්පස මහජන, අවකාශ, ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම්කරුවන් විසින් කොල්ලකා තිබේ. ගාලු මුවදොර හරිත පිටිය හැකිලී යන පරිද්දෙන් වෙළඳ කුටි සඳහා ඉඩ දී තිබේ. කොන්ක්‍රීට් වනාන්තර ඉදි කරන ව්‍යාපාරික සමාගම් මහජන අවකාශ ඉඩකඩ අහුරා ඒවා පෞද්ගලික ඉඩකඩ හෝ ව්‍යාපාරික ස්ථාන බවට පත් කිරීමට මාන බලා සිටින බැවින් කලක් තිස්සේ කොළඹ නගරයේ සහ තචාසන්න ප්‍රදේශවල පැවති කුඩා පිට්ටනි හැකිලී ගොස් හෝ හංග වී ගොස් ඇත. නාගරික දරුවන් සහ තරුණ ප්‍රජාවට ක්‍රීඩා පිට්ටනි අවකාශය අහිමි කර ඇති අතර වැඩිහිටියන්ට නාගරික "පෙනහළු" අහිමි කර තිබේ. සැලසුම්කරුවන් මෙන් ම වාස්තු විද්‍යාඥයින් විසින් තම නගර

සහ ගෘහ නිර්මාණවල දී සර්ම කලාපීය දේශගුණ ලක්ෂණ අමතක කර ඇත.

නාගරික දිළිඳු ජනතාව තුළින් ජීවත් වූ පදිංචි ස්ථානවලින් ක්‍රම ක්‍රමයෙන් කුඩා ඉඩකඩකට සිර කර තිබේ. ඉඩම මිල හා කුලී ගාස්තු ගිණි ගණන් නිසා කොළඹ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කයට පැමිණෙන සේවක ජනයාට අඩු මිලකට තේ බීමට හෝ කෑම ගැනීමට හැකි ස්ථාන සොයාගැනීම දුෂ්කර වී තිබේ. මධ්‍යම සහ ඉහළ පංතිය අරභයා පෞද්ගලික අංශයේ ඉදිකිරීම් සමාගම් විසින් නිමැවූ නිවාස ඉතා ඉහළ මිල නිසා කොළඹ නගරයේ වෙසෙන මධ්‍යම පංතිය සහ වැඩ කරන පංතිය කොළඹට තදාසන්න ප්‍රදේශ වෙත පදිංචියට යෑමට පොළඹවා ඇත. පැල්පත් ප්‍රමාණයේ නිවාස මධ්‍යම පාංතික රුචියට සරිලන පරිදි නවීකරණය කෙරේ. ප්‍රවාහනය ද පංති භේදයට ලක් වී තිබේ. ගාස්තු ගෙවීම දරාගත නොහැකි ජනතාවට දිගු ගමන් කාලයක් ද ඉහළ ගාස්තුවක් ගෙවිය හැකි නම් කෙටි ගමන් කාලයක් ද තීරණය වේ.

මේ අතර වර්ග මීටර් 40ක වපසරියකට කොටු කරමින් මහල් නිවාස සපයමින් ආණ්ඩුව විසින් පැල්පත්වාසීන්ට සපයන නිවාස ඒකකවලින් මනා අසල්වාසී වටපිටාවක් නොමැති සබඳතා බිඳවැටෙන වටපිටාවක් මතුවීම නිසා විවේක සුවය සඳහා ඉඩකඩ නොමැති බැවින් පදිංචිකරුවන් ඒ සඳහා වෙනත් ස්ථාන වෙත ගමන් කළ යුතු වේ.

මනස්කාන්ත අයුරින් ඇවිදින මංතීරු, උද්‍යාන ආශ්‍රිතව මහජන ශාරීරික අභ්‍යාසාගාර යනාදිය අඩංගු ප්‍රභූ ව්‍යාපෘති, සැලසුම්කරුවන් විසින් ඉදි කරන නිසා නාගරික සුළු ධනේෂ්වර පංතියට අස්වැසිල්ලක් ලැබෙන නමුත් බහුතර ජනතාවගේ සැබෑ අවශ්‍යතා වන පදික වේදිකා, අඩිපාර, පාපැදි මංතීරු යනාදිය මග හැරේ. එවැනි ප්‍රභූ ව්‍යාපෘති සඳහා යොදවන වියදම, යන්ත්‍රෝපකරණ ආදියෙන් බොහොමයක්, වඩා ප්‍රායෝගික අවශ්‍යතා (වැව් පිළිසකර කිරීම වැනි) වෙනුවෙන් යෙදවිය හැකි ය.

ග්‍රාමීය දිවි පැවැත්මේ ප්‍රධානතම බාධකය වන්නේ යටිතල පහසුකම්, එනම්, ප්‍රවාහන, සෞඛ්‍ය සේවා, පාසල් යනාදියේ

හිඟකමයි. ඒ නිසා නාගරික තදබදය, වාහන තදබදය හට ගනී. ග්‍රාමීය ප්‍රදේශවලට විදුලිබලය, ජල සම්පාදනය සහ ග්‍රාමීය මාර්ග වැනි ප්‍රයෝජ්‍ය පහසුකම් සැපයීම මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ඇඟලුම් කම්හල් ඉදිකිරීම මගින් රැකියා අවස්ථා ඇති කිරීම වැනි ප්‍රතිපත්තිවලින් මෙම ගැටලුවට සහනයක් ලැබේ.

නව සීතල යුද සන්දර්භය තුළ ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ගේ ප්‍රහාරයකට ඉලක්ක නොවීමට පියවර ගත යුතු ය. රාජ්‍ය සහ ආර්ථික ක්‍රියාකාරිත්වය, සමස්තය ම පාහේ කොළඹ කේන්ද්‍රව පවතී. ආරක්ෂක අමාත්‍යාංශයේ සියළු හමුදාමය සහ පරිපාලන කටයුතු එක ගොඩනැගිල්ලකට රැගෙන ආව ද, සුරක්ෂිතතාව විසිර පවතී. රටේ ජනතාව, සම්ප්‍රදායික හෝ න්‍යෂ්ඨික ප්‍රහාරයකින් රැකගැනීම සඳහා ප්‍රජා ආරක්ෂක පියවර ගෙන නොමැත. තරඟකාරී හෝ ආපදාමය අවස්ථාවක දී හැර විවිධ ප්‍රජාවන් අතර අන්තර්ක්‍රියා අඩුවීම ජාතික ඒකාග්‍රතාවට ඇති බාධාවකි.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන නිවාස සහ නාගරික සංවර්ධන ප්‍රතිපත්තියේ මූලික ඉලක්ක වන්නේ,

- **ඉක්මන් නිවාස සම්පාදන වැඩපිළිවෙළක් හඳුන්වාදීම**
- **විධිමත් නාගරික, ග්‍රාමීය සැලසුම්කරණයක් හඳුන්වාදීම**
- **දේශගුණික විපර්යාසවලට අනුගත සැලසුම්කරණයක් හඳුන්වාදීම**
- **කොළඹ නගරය ප්‍රතිසැලසුම් කිරීම**
- **නව නගර ඉදිකිරීම**
- **ආරක්ෂාව වෙනුවෙන් සැලසුම් සහගත විසිරණය**
- **පිටිසරබද නාගරික (ගම්මැද්ද) සංවර්ධනය**

ඉදිරිමග

මහජනයා අරමුණු කරගත් ප්‍රජාතන්ත්‍රවාදී සැලසුම්කරණයක් තුළින්, සියළු දෙනාගේ ම සැපපහසුව, සන්තෘප්තිය සහ යහපැවැත්ම වෙනුවෙන් සම අවස්ථා සම්පාදනය, නිවාස සහ නාගරික සැලසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙන් පිලිබිඹු විය යුතු ය.

1. නිවාස සම්පාදනය

වසරකට නිවාස 200,000 ක් පමණ ඉදි කර නිවාස අවශ්‍යතාව වසර දහයක දී සැපරීමට හදිසි සැලසුම් සකස් කළ යුතු ය. සුඛෝපභෝගී නිවාස ව්‍යාපෘතිවලින් 5% ක බද්දක් අය කරමින් මේ සඳහා වැය වන අරමුදලින් කොටසක් උපයා ගත හැකි අතර මෙහි දී පදිංචිකරුවන් සහ හවුල්කාර පාර්ශ්වයන්ගේ අදහස් ඇතුළත් කර ගත යුතු ය. නාගරික නිවාස උපරිම මහල් 5කට සීමා විය යුතු අතර, විවිධ ජන වර්ග සමාජීය වශයෙන් මිශ්‍ර විය හැකි පරිදි පහසුකම් පැවතිය යුතු ය. ආලින්ද, ආහාර ගැනීම, ඉගෙන ගැනීම සහ විවේකය ගත කිරීම සදහා හිතකර පොදු ඉඩකඩ සහ අර්ධ - පොදු අවකාශ මෙකී පොදු නිවාස පහසුකම් තුළින් සැපයිය යුතු ය.

අදටත් ජනප්‍රිය, සෝවියට් සංගමයේ පවතින "කෘෂ්චෙව්කා" ආකෘතියේ මහල් 3-5 පෙර සැකසුම් නිවාස අපගේ සැලසුම්කරුවන්ට ආදර්ශයට ගත හැකි ය. ජපාන ආණ්ඩුවේ සමාජ - මධ්‍යම පාංතික "ඩැංචි" නිවාස / අසල්වැසි පරිසර ආකෘතිය ද ආදර්ශයට ගත හැකි ය. තව ද, යුගොස්ලෝවැකියානු IMS "ජිජෙල්ජි" තාක්ෂණය, පෙර සැකසූ කුළුණු සහ කොන්ක්‍රීට් තට්ටු මගින් සිරස් සහ තිරස් අතට මහල් නිවසේ මූලික ආකෘතිය සවි කර ගෘහ නිර්මාණ සැලසුම් අවශ්‍ය පරිදි සකසා ගැනීමේ ක්‍රමය තුළින් වඩා ලාභදායී වූත්, එකිනෙකට වෙනස් වූත් නිවාස සකස් කර ගැනීමත්, නිවැසියාට අවශ්‍ය පරිදි මනා පරිශ්‍රයක්, දෘෂ්ඨි පථයක්, පරිශ්‍ර නම්‍යතාවක් ලබා දේ.

මෙකී නිවාස ආකෘති ආශ්‍රිත පාරිසරික සහ ප්‍රජා ප්‍රමිතීන්

වුව ද සැලසුම්කරුවන්ට ආදර්ශයට ගත හැකි ය. මහල් නිවාස පමණක් වශයෙන් ඉදි කරනවා වෙනුවට ඊට ආනුෂංගිකව සමාජීය අවකාශ, පාසල්, තුරුලතා හා තණතීරු, දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ප්‍රජා ශාලා, සාප්පු විනෝදාස්වාද / ක්‍රීඩා පහසුකම් වැනි පහසුකම්ද , හරිත මංතීරු, පාපැදි මංතීරු යනාදී යටිතල පහසුකම් මෙහි දී යොදාගත හැකි ය.

2. සැලසුම්කරණය

නගර සහ ග්‍රාම සැලසුම්කරණය, ගම සහ අසල්වැසි මට්ටමින් සහභාගිත්වය සහ මහජන අධීක්ෂණය පවතින පාරදෘශ්‍ය සහ ප්‍රජාතන්ත්‍රවාදී විය යුතු ය. මේ තත්ත්වය යම්තාක් දුරට හෝ සාක්ෂාත් කර ගැනීමට නම්, (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී සහ විවිධ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල වශයෙන් පළාත් පාලන සභිකයින් ඇතුළත් කරගැනීම සහ (ආ) ආශ්‍රිත පාර්ශ්ව සහභාගිත්වය තුළින් පාරිසරික බලපෑම තක්සේරුව ආකාරයේ ක්‍රියාවලියක් යොදා ගැනීම කළ යුතුය. වඩා දියුණු රටවල පවතින ආකාරයේ සැලසුම්කරණ අවසර ප්‍රදානය කිරීමේ දී ඒ බව ප්‍රසිද්ධ කිරීමේ ආශ්‍රිත පාර්ශ්වවලට තම අදහස් සැපයීමත් මැදිහත්වීමත් කළ හැකි ය.

සැලසුම්කරණයේ දී, පදික වේදිකා, පදික මංතීරු, පාපැදි මංතීරු. මහජන උද්‍යාන යනාදී පොදු පහසුකම් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ වෙන් කළ යුතු අතර, ඒවා මධ්‍යම පාංතික රුචියට සීමාවීම වැළැක්විය යුතු ය. මෙහි දී පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභාවක් විසින් භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්ති පුළුල් ලෙස විග්‍රහ කර නිලධාරීන් එකිනෙකාට පැවරෙන විකල්ප පිළිබඳව එකිනෙක තලයේ දී අපක්ෂපාතී උපදෙස් සැපැයෙන යන්ත්‍රණයක් සකස් කළ යුතු ය.

භෞතික සැලසුම් ක්‍රියාවලියේ වැඩි බලතල පැවරෙන පරිදි ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වගකීම් ප්‍රබල කළ යුතු අතර ඊට ආනුෂංගික සැලසුම් සකසන ආයතන, එනම්, නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, වෙරළ

සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය වැනි ආයතනවල බලතලවලට වඩා උඩින් ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවේ බලතල පැවතිය යුතු ය.

3. දේශගුණික සැලසුම්කරණය

ගොඩනැගිලි සැලසුම් පාලනය නීතිගත කිරීම තුළින් ගුණාත්මක ගොඩනැගිලි බිහි වේ. සැලසුම්කරුවන් සහ වාස්තු විද්‍යාඥයින් බොහෝ විට අමතක කරන වැදගත් සාධකයක් වන දේශගුණ විපර්යාසවලට උචිත අයුරින් ගොඩනැගිලි නිර්මාණය විය යුතු ය. විදේශ සැලසුම් අනුකරණය කරමින් ගොඩනැගූ නිවාස, තට්ටු නිවාස, සාප්පු, කාර්යාල ආදියට වායු සමන යන්ත්‍ර සවිකර අධික වියදමක් දැරීමට සිදුව ඇත. මහජනතාවට සෙවණ සඳහා ගොඩවිය හැකි පියැසි පැවතීම මාර්ගය දෙපස වාණිජ ගොඩනැගිලි සඳහා අනිවාර්ය කළ යුතු ය. තව ද, වැසි ජලය ගබඩා පහසුකම සහ සූර්ය බල/ සුළං බල විදුලි උත්පාදන පහසුකම ද නීතියට ඇතුළත් කළ යුතු ය.

4. කොළඹ නගරය ප්‍රතිසැලසුම් කිරීම

කොළඹ යනු සැලසුම් සහගත අසමමිතික චතුරස්‍රාකාර හැඩයෙන් යුත් දෙපසකින් පමණක් පිවිසිය හැකි නගරයකි. වාහන ගමනාගමනය, ජලනල සහ විදුලිය යනාදිය මේ දෙපසින් ඇතුළු වී කොළඹ ව්‍යාපාරික මධ්‍යස්ථානය නැමති ගුරුත්ව කේන්ද්‍රය වෙත අභිසාරී වේ. එහි ඵල විපාකයක් ලෙස කොළඹ මතුවන භූගෝලීය ගැටලු අඩු කරගැනීම සඳහා ගත හැකි පියවර කීපයකි.

අ) කොළඹ ව්‍යාපාරික මධ්‍යස්ථානයේ පිහිටා ඇති සේවා ස්ථාන, වඩා පහසුවෙන් ළඟා විය හැකි පර්යන්ත ස්ථාන වෙත විතැන් කිරීම

ආ) කොළඹ ව්‍යාපාරික මධ්‍යස්ථානය ඇතුළත සහ පිටත පිහිටි පැල්පත් නිවාස ප්‍රතිසංවර්ධනය කර ඒවායේ වත්මන් පදිංචිකරුවන්ටම පැවරීම

ඇ) නාගරික ව්‍යාප්ති ප්‍රදේශයෙන් බැහැරව ජනගහන මධ්‍යස්ථාන පිහිටුවා කොළඹ පදිංචියට ආ හැකි ග්‍රාමීය ජනතාව ඊට ආකර්ෂණය කර ගැනීම

සමතුලිත නගරයක් නිර්මාණය වීමට නම් විවිධ ආදායම් තලයන්හි ජනතාව ආසන්නව ජීවත්විය යුතු ය. පැල්පත් නිවාස මධ්‍යම පාංතික රුචියට අනුව ප්‍රතිසංස්කරණය සීමා කර, ධනවත් නිවාස ආසන්නයේ වැඩ කරන පංතියේ ජනතාවට පවා උචිත අසල්වැසි වටපිටාවක් සැකසිය යුතු ය.

මේ අනුසාරයෙන් ගත් විට, වාහන අමතර කොටස් වෙළෙඳසල් සහ ආශ්‍රිත ප්‍රදේශවාසීන් ඔවුන්ගේ නිවාස ආසන්නයේ ම යළි පදිංචි කරවන, පංචිකාවත්ත ත්‍රිකෝණය ව්‍යාපෘතිය මගින් අවට මුඩුක්කු ප්‍රදේශ මිශ්‍ර වාණිජ සංවර්ධන නව හැඩයකට දියුණු කළ හැකි ය. කැළණි ගඟ සහ බේස්ලයින් මාර්ගය ආසන්න ප්‍රදේශ හෙවත්, කොළඹ උතුරු - දකුණු ධමනි දෙක මනා ලෙස යොදාගෙන වාණිජ කාර්යාල සහ සාප්පු සඳහා පහසුවෙන් ළඟා විය හැකි ප්‍රදේශයක් ලෙසත් පැල්පත් වාසී ජනතාවට වැදගත් නිවාස සහ රැකියා අවස්ථා සඳහා උචිත ආකාරයෙනුත් සංවර්ධනය කළ හැකි ය.

ගාලු පාර, කොටහේන, මෝදර වැනි සමුද්‍රාසන්න භූ පිහිටීම උපයෝගී කරගනිමින් හැකිතාක් දුරට නිවාස, විනෝදාස්වාද සහ සංචාරක ප්‍රදේශ මුහුදුබඩ පැත්තට පිහිටුවීමෙන් උදේ - සවස මුහුදු සුළඟ විඳ ගැනීමේ අවස්ථාව සැපයේ. වාණිජ සහ සාප්පු සඳහා පහසුවෙන් ළඟා විය හැකි පරිදි නැගෙනහිර පැත්ත යොදා ගත යුතු ය. පැල්පත් සංවර්ධනය කිරීමේ දී සහස්පුර සංකල්පය අනුගමනය කළ යුතු ය. සෑම මහලක් ම කලින් අසල්වැසි පවුල් ලෙස සිටි අය සඳහා වෙන්විය යුතු ය. පොදු ළිඳ හෝ ජල කරාමය වටා අසල්වැසි ජනතාව රැස්වී භාජනයට යොමුවූ වටපිටාව, සහස්පුර තුළ සැපයෙන විශාල ගරාදි ඉඩකඩෙන් ඉටු කෙරේ.

මෙම නව නිවාස සැපයීමේ දී පැනනැගිය හැකි දූෂිත ගනුදෙනු එනම්, හිස්ව පවත්වා ගැනීම, පදිංචිකරුවන් නොවූ ධනවත් අයට ප්‍රති-කුලියට සැපැයීම පිළිබඳව සැළැකිලිමත්

විය යුතු ය. තෙවැනි පාර්ශ්වයකට විකිණීම වැළැක්වෙන දැඩි අධීක්ෂණ පියවර අඩංගු විය යුතු ය.

5. සැලසුම් සහගත විසිරණය :

රටේ පරිපාලන, ආර්ථික සහ දේශපාලනික ක්‍රියාකාරිත්වය ව්‍යාප්තව පැවතීම රාජ්‍ය ආරක්ෂාවට, ආර්ථිකයට මෙන් ම ජනතාවට ද අස්වැසිල්ලකි. ආණ්ඩුවේ කාර්යාල සහ ආරක්ෂක ආයතන එක් ගොඩනැගිල්ලකට සංකේන්ද්‍රණය නොවී ව්‍යාප්තව පැවතිය යුතු අතර ආර්ථික අංශය ද එ ලෙස ව්‍යාප්ත විය යුතු ය. කර්මාන්ත පවා රට වටා ව්‍යාප්තව පැවතිය යුතු අතර ආයුධ නිපදවන කර්මාන්ත වැනි ක්‍රමෝපායික ස්ථාන කඳුකරයේ පිහිටුවිය හැකි ය. නගරයෙන් ඈත ප්‍රදේශ කරා නාගරික සංවර්ධනය ව්‍යාප්ත කිරීමද මීට ඉවහල් වේ.

6. නව නගර

කම්කරු පංතියට හරිත වටපිටාවක පදිංචිවීමේ පහසුව සපයෙන පරිදි බ්‍රිතාන්‍යයින් විසින් හඳුන්වා දුන් නව නගර සංකල්පය, සැලසුම්කරුවන්ට ආදර්ශයට ගත හැකි ය. නව නගර සැලැස්මක ආකෘතිය වන්නේ කි.මී. 2 ක විෂ්කම්භය ඇති ප්‍රදේශයක සෑම ස්ථානයකට ම පයින් ළඟා විය හැකි කි.මී. 1.5ක හරිත අවකාශයක් සඳහා වෙන් වූ ඉතිරි භූමියේ නිවාස ගොඩනැගුණු ක්‍රමයකි. වර්ග කිලෝ මීටර් එකක 3,000 දෙනා බැගින් 35,000 ක ජනතාවක් පදිංචි කෙරේ. මෙ කී සෑම නගරයක ම නගර මධ්‍යස්ථානයක්, දුම්රියපොළක්, ප්‍රධාන සාප්පු සහ සේවා සමග සෑම අසල්වැසි පරිශ්‍රයක ම 5000-7000 අතර පදිංචිකරුවන්, සෑම පරිශ්‍ර ඒකකය ම පාසලක් සහ ආසන්න කඩ සාප්පු පිහිටා තිබේ. සෑම නගරයක ම කර්මාන්ත පුරයක් ඇති බැවින් පදිංචිකරුවන්ට රැකියා සොයාගත හැකි ය.

මෙම සංකල්පය ශ්‍රී ලංකාවේ ද ක්‍රියාත්මක කළ හැකි ය. මෙහි දී වඩා අවධානය යොමු කළ යුතු වන්නේ, භූගෝලීය වශයෙන් වාසි සහගත පිහිටීමක් ගෙවන පරිසරයක දී නව පදිංචිකරුවන්ට යෙදිය හැකි ක්‍රියාකාරකම් නොමැති නම්

එවැනි නාගරික ප්‍රදේශ සාර්ථක නොවන බවයි. උදාහරණයක් වශයෙන්, ගිරාඳුරුකෝට්ටේ නව නගරය අසාර්ථක ව්‍යාපෘතියක් වූයේ ඊට කිලෝ මීටර් 20ට වඩා කිට්ටුවෙන් පිහිටි මහියංගන නගරයට ස්වභාවයෙන් ම ආකර්ෂණය යොමු වන බැවිනි. එ බැවින් ඕනෑම නව නගරයක් මුඛ්‍ය කර්මාන්ත, කෘෂිකර්මාන්ත, පතල් කැණීම් හෝ ධීවර යනාදී නිෂ්පාදන කටයුතුවලට පහසුකම් සැපැයෙන පරිදි පිහිටුවිය යුතු ය. සෑම නගරයක ම, බස් නැවතුම් පොළක්, රෝහලක්, අභ්‍යාස විද්‍යාලයක් හෝ වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් සහ හැකි නම් මධ්‍ය විද්‍යාලයක් ඉදි කර තිබිය යුතු ය. මෙම නගර ඉදි කළ යුත්තේ ප්‍රධාන මාර්ගයකින් පිවිසුම් පහසුකම් ලබාගත හැකි ලෙසය. විශේෂයෙන් දුම්රිය මාර්ගයකට ආසන්නව ඉදිකළ හැකි නම් එය සුවිශේෂී අතිරේක වාසියක් වනු ඇත. තනි හෝ යුගල වශයෙන් හෝ මහල් දෙක තුනක් උස මහල් නිවාස ඉදි කළ යුතු ය.

සෑම නගරයක ම උස් බිමේ සිට පල්ලම් දක්වා ජල සම්පාදනය සැපයිය යුතු ය. මළාපවාහනය පහත් බිමේ දී එකතු කර නගර සභා ඝන අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර කර ජීව වායු සහ පොහොර නිපදවිය හැකි ය.

නගර බොහොමයක් ඉදි කළ යුත්තේ ජන ශූන්‍ය වියළි කලාපයේ හෝ තෙත් කලාපයේ දුෂ්කර පැතිවලය. මෙවැනි නව නගර සියයක් ඉදි කිරීමෙන් සංක්‍රමණික පදිංචිකරුවන් මිලියන 3.5 ක් පමණ ප්‍රධාන නගරවලින් ඈත් කර තැබිය හැකි ය. හලාවත සිට අරුවක්කාලු, මහව සිට කිලිනොච්චි, මැදවච්චිය සිට මන්නාරම, මහව සිට තඹලගමුව, ගල්ඔය සිට පුනානි සහ මාතර සිට කතරගම සහ හැටන් සිට බදුල්ල යනාදී දුම්රිය මාර්ගවලින් මෙම නව නගර වෙත පහසුවෙන් ළඟා විය හැකි ය.

7. ගම්මැද්ද

දඹුල්ල නව නගරය සැලසුම් කිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් "ගම්මැද්ද" සංකල්පය හඳුන්වා දුනි. "ගම්මැද්ද" යනු ශ්‍රව්‍ය - දෘශ්‍ය පහසුකම් සහිත වෙළෙඳපොළ තොරතුරු

යාවත්කාලීනව සැපයෙන සමාජීය සහ ආර්ථික කටයුතුවල දී රැස්වීමට පහසුකම් ඇති ප්‍රජා ශාලාවක් ඇති, අතිරික්ත නිෂ්පාදනය ගබඩා කර තැබිය හැකි ගබඩා පහසුකම්, ආයුර්වේද මධ්‍යස්ථානයක්, පෙර පාසලක් සහ සාප්පු සහිත මහජන චතුරස්‍රයකි. නගරයේ පවතින පහසුකම් ගමට සපයාදීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දුන් මෙම සංකල්පයේ අරමුණ විය.

මෙම "ගම්මැද්ද" සංකල්පයට ආණ්ඩුවේ කාර්යාල, තැපැල් කාර්යාලය, ග්‍රාමීය බැංකුව, සායනය, ප්‍රාථමික පාසල, අන්තර්ජාල සබඳතාව වැනි තවත් පහසුකම් එක් කරමින් කෘෂිකාර්මික ප්‍රදේශවලට සහ ප්‍රවාහන මාර්ගවලට පහසුවෙන් ප්‍රවේශවිය හැකි කුඩා පිටිසරබද නාගරික පිහිටුවිය යුතු ය.

නාගරික වැසියන් හට ස්වභාව ධර්මය මග මුසු විය හැකි පරිදි වැඩි වැඩියෙන් මහජන අවකාශ සඳහා ඉඩකඩ සැපයීමට ක්‍රමානුකූල පියවර ගත යුතු වේ. විහාරමහාදේවි උද්‍යානය සහ ගාලු මුවදොර (යම්තාක් තරමින්) මෙම පහසුව පවතින්නේ කොළඹ නගරයේ පමණි. නාගරික උද්‍යාන, ක්‍රීඩා පිටි සහ නාගරික වනාන්තර භූමි සඳහා කුඩා බිම්කඩක් වෙන් කළ යුතු ය. මෙවැනි, විශේෂිත උද්‍යාන, ගොවිපල, නාගරික වනාන්තර ආදිය "හරිත තීරු" යනුවෙන් විශේෂිතව හැඳින්විය යුතු ය. දැනට පවත්නා කෘෂි බිම්, ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ නිවාස ඉදිකිරීම සඳහා ලබා නො දී පවත්වාගත යුතු ය.

සමාජ සුබසාධන ප්‍රතිපත්තිය

හැඳින්වීම

තමන්ට අවැසි රැකවරණය සහ පෝෂණය ස්ව-ශක්තියෙන් හෝ පවුලක් තුළින් හෝ සළසාගත නොහැකි පුරවැසියන් (දරුවන්, මහල්ලන් සහ ආබාධිතයන්) සඳහා අවශ්‍ය සේවා ලබාදෙමින් ඔවුන් රැක බලාගැනීම සහ තෘප්තිමත් අයුරින් ජීවත්වීමේ පරිසරයක් නිර්මාණය කරදීම ශිෂ්ට සමාජයක යුතුකමකි. මෙම කාර්යය සිදුවිය යුත්තේ එම විශේෂිත පිරිස ද සමස්ත සමාජයේ ම පාර්ශ්වකරුවන් ලෙසින් සළකා මිස එයින් පිටස්තර පිරිසක් බවට පත්කිරීමෙන් නොවේ.

රටට සහ සමාජයට වැඩක් ඇති පුරවැසියන් බවට දරුවන් පත්වන්නේ ඔවුන්ට ලැබිය යුතු ආදරය, රැකවරණය, සමානයන් අතර කෙළිදෙලින් ගතකිරීමේ අවස්ථාව, රස වින්දනය, අදීන වූ චින්තන වර්ධනය සහ අධ්‍යාපනය නිසි පරිදි ලැබෙන්නේ නම් ය. දෙමව්පියන් සහ අනෙකුත් ස්වකීය වැඩිහිටියන් අහිමි වූ, එසේත් නැතිනම් අභ්‍යන්තර යහපැවැත්ම සහ ආර්ථීක ශක්තිය බිඳවැටුණු නිවාසවල වසන දරුවන් හට උක්ත අවශ්‍යතා සපුරාගැනීම අපහසු ය. එවැනි ගැටලු මැද දරුවන්ගේ නිරෝගිමත් වර්ධනය අභියෝගයට ලක්විය හැකි අතර එ ලෙසින් හැදී වැඩුණු දරුවන් වැඩිහිටියන් බවට පත් වූ විට සමාජය සමඟ නොපෑහුණු පිටස්තරයන් පිරිසක් බවට ද පත්විය හැකි ය. මෙවැනි "පිටස්තරයන්" පිරිසක් බිහිවීම

සමාජයේ යහපැවැත්මට ඉතාමත් අහිතකර ලෙසින් බල පෑ හැකි ය.

සමාජයේ පැවැත්ම සහ වර්ධනය වෙනුවෙන් විවිධාකාරයෙන් කැපැවුණු අය මහළු වී විට නො සළකා හැරෙන්නේ නම්, සතුටින් සහ සැහැල්ලුවෙන් ගතකිරීමේ අවස්ථාව ඒ අයට ලබා නො දෙන්නේ නම් එයින් ප්‍රකාශවෙන්නේ අදාළ සමාජය අශිෂ්ට එකක් බව ය. ශිෂ්ට සමාජයක් යනු කෘතගුණ සැළැකීමට මුල් තැනැක් දෙන එකකි. තව ද, වර්තමානයේ ඉතා ශක්තිමත් සහ ක්‍රියාකාරී ඇතැමුන් වයසට පත් වූ කල විවිධ ගැටලුවලට මුහුණ දී අසරණභාවයට පත්විය හැක්කේ ය. රැකවරණය සහ අනෙකුත් අවශ්‍යතා සමාජය විසින් සළසා දෙන්නේ නම් එය සමාජයේ වර්තමානයට මෙන් ම අනාගතයට ද, අන්‍යයන්ට මෙන් ම තමන්ට ද එක ලෙසින් පිහිටවීමකි.

ආබාධිත බව උපතින් ම ද ජීවිතය අතරමැද දී ද හිමිවිය හැකි දෙයකි. තාවකාලික ආබාධ නිසා අප පීඩාවට පත්වන අවස්ථා ද වෙයි. මෙවැනි ආබාධ කායික ඒවා මෙන් ම මානසික ඒවා ද විය හැකි ය. ආබාධ නිසා විවිධ අයුරින් සීමාවෙන පිරිසට රැකවරණය සහ අනෙකුත් අවශ්‍යතා නො අඩුව සපයාදීම ද නිරෝගී, ශක්තිමත් සහ ගුණවත් සමාජයක යුතුකමකි.

උක්ත පාර්ශ්ව තුන සහ තවත් එවැනි පිරිස් හඳුනාගෙන ඔවුන් ද සමාජයේ ම ක්‍රියාකාරී, ප්‍රීතිමත් සාමාජිකයන් බවට පත් කරගැනීම වෙනුවෙන් ඕනෑ ම රටක සමාජ සුබසාධන අංශය කැපැවිය යුත්තේ ය.

ගැටලු

දෙමාපිය රැකවරණය සහ අනෙකුත් වැඩිහිටියන්ගේ අවධානය අහිමිවුණු දරුවන් සාම්ප්‍රදායික ළමා නිවාස තුළට ගාල් කෙරෙන හෝ මුළුමනින් ම නො සළකා හැරෙන හෝ තත්ත්වයක් වර්තමානයේ දී අප රට තුළ පවතී. සාම්ප්‍රදායික ළමා නිවාස ක්‍රමය පවත්වාගෙන යන්නේ සමාජයෙන් වෙන් කෙරුණු ආයතන විශේෂයක් වශයෙනි. මහජනතාව විසින් විවිධ ආධාර

උපකාර ලබාදුන්න ද එම කාර්යයන් සිදුවන්නේ ද පිටස්තර අසරණ පිරිසකට කෙරෙන උපකාරයක ස්වරූපයෙනි. වැඩිහිටි නිවාසවල තත්ත්වය ද මේ හා සමාන ය.

ළමා නිවාසවලට ඇතුළු නො කෙරුණු දරුවන් පිරිසක් ද සමාජය තුළ විවිධ අයුරින් අසරණ වී සිටිති. ආදායම් ඉපැදිය හැකි වැඩිහිටියා (බොහෝ විට පියා) මියගිය හෝ ආබාධිත තත්ත්වයට හෝ රෝගී බවට හෝ පත්වුණු ඇතැම් පවුල්වල දරුවෝ මේ අතර සිටිති. රජයේ සුබසාධන වැඩපිළිවෙළ තුළින් බොහෝ විට මෙවැනි දරුවෝ මග හැරෙති. අසරණ වූ දරුවන් හට විවිධ අයුරින් උපකාර කරන මහජනතාව ද මෙම පිරිස ගැන නො දනිති. විසිරී, හුදකලා වී සිටින මෙම පිරිස අදාළ පාර්ශ්වවල අවධානයට ලක් නොවීම ද වටහාගත හැකි කාරණයකි. කෙසේ වුව ද, මෙම පිරිසට අවැසි සමාජ රැකවරණය නිසි පරිදි නො ලැබීම බලවත් ගැටලුවකි.

සමාජ රැකවරණය අවැසි ඇතැම් වැඩිහිටියෝ සංස්කෘතික හේතු නිසා වැඩිහිටි නිවාසවලට නොයෑමේ ප්‍රවනතාවක් ද පවතියි. ඇතැම් වැඩිහිටියන් හුදකලා වී, අසරණ වී සිටින්නේ ආර්ථික හේතු නිසා නොවේ. තම දරුවන්ගේ කාර්යබහුල බව, දරුවන් විදේශගත වීම වැනි හේතු නිසා හුදකලා වුණු වැඩිහිටියන් ද මේ පාර්ශ්වයට අයත් ය.

වැඩිහිටි නිවාස පවත්වාගෙන යන්නේ ද සමාජයෙන් පිටස්තර වූ පිරිසක් රැක බලාගන්නා ආකාරයෙනි. මේ අයට උපකාරකිරීමට මහජනතාව මැදිහත්වන්නේ ද ආහාර, රෙදිපිළි වැනි ද්‍රව්‍යමය අවශ්‍යතා සැපැයීමට සීමාවෙමිනි. මෙම සංස්කෘතික භාවිතය අගය කළ යුතු අතර ඒවා තුළ පවතින සීමාසහිත බවේ ගැටලුව සමාජයේ අවධානයට ලක්විය යුතු ය.

මානසික සහ කායික ආබාධවලින් පෙළෙන්නෝ සමාජය තුළ විසිරී, බොහෝ විට නිවාසවලට කොටු වී ජීවත්වෙති. මානසික ආබාධවලින් පෙළෙන්නන් කෙරෙහි සමාජය තුළ වන වැරැදි ආකල්ප සහ ප්‍රතිචාර ද සුබවාදී ලෙසින් වෙනස් වී නොමැත. එහෙයින් මානසික ආබාධවලින් පෙළෙන්නන් සමාජයේ ගර්භාවට

සහ පීඩාවට පත්වෙන අවස්ථා ද නො මඳ ය. මෙම ගැටලුව විසැඳීම සඳහා සාධනීය මැදිහත්වීමක් හෝ වැඩපිළිවෙළක් සමාජය තුළ ක්‍රියාත්මක නොවෙයි.

මාර්ග ඇතුළු යටිතල පහසුකම්වල සීමා, පොදු ප්‍රවාහනයේ සහ ස්ථානවලට ප්‍රවේශවීමේ ගැටලු ආදිය විසින් ද කායික අබාධිතයන්ගේ එක්තැන්වීම කුළුගන්වා තිබේ. රෝද පුටු ආදිය ඇත්තේ ද ඉතා ප්‍රාථමික මට්ටමක ය.

ආගමික කටයුතු, කලා කටයුතු, ක්‍රීඩා සහ අධ්‍යාත්මික තෘප්තිය සළසන අනෙකුත් කාර්යයන් ආබාධිත පිරිස ආවරණය පරිදි සංවිධානය වෙන්නේ ඉතාමත් කලාතුරකිනි. මෙම ගැටලුව නිසා ද ඔවුන්ගේ සමාජ පිටස්තර බව වර්ධනය වෙයි.

සමාජ සුබසාධනයට අදාළ රාජ්‍ය මැදිහත්වීම මූලික වශයෙන් කෙරෙන්නේ පළාත් සභා ක්‍රමය හරහා ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ 7 වැනි අයිතමය තුළ අදාළ බල සීමා දක්වා තිබේ. පළාත් සභා ක්‍රමය ජනතාවගෙන් ඉතා ඈත් වූ ක්‍රමයක් බැවින් මෙම කාර්යය පිළිබඳ අදාළ බලධාරීන්ගේ අවධානය යොමුවන්නේ ද දුරස්ථ වූ නිලධාරිවාදී ආකාරයකිනි. එහෙයින් ඉතා කාර්යක්ෂම සහ ජනතාවට කිට්ටු ආකාරයකින් සමාජ සුබසාධනයට අදාළ ගැටලු විසැඳීමේ අවස්ථාව අහිමි වී තිබේ.

උක්ත නිරීක්ෂණ සහ අවබෝධය මත පදනම් වී අපගේ සමාජ සුබසාධන ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ මේවා ය.

- රාජ්‍ය මැදිහත්වීම කාර්යක්ෂම කිරීම.
- නිවැරැදි දත්ත සහ තොරතුරු සම්පාදනය.
- ජනතා මැදිහත්වීම් දිරිගැන්වීම.
- රැකවරණය අහිමි වූ දරුවන්ට ආදරය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රැකවරණය
- ආබාධිත පුරවැසියන්ට සමතැන

- සමාජානුයෝජනය සහතික කිරීම.
- සමාජ දැනුම සහ යහපත් ආකල්ප වර්ධනය කිරීම.

ඉදිරිමග

1. රාජ්‍ය මැදිහත්වීම කාර්යක්ෂම කිරීම

සමාජ සුබසාධන සේවා සැපැයීමේ පූර්ණ වගකීම බිම් මට්ටමේ ජනතාව සමඟ සමීප සබඳතාවක් ඇති නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතනවලට පැවැරිය යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. මෙම කාර්යයට අදාළ සියලු පරිපාලන වගකීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවැරිය යුතු ය. මෙම අංශයේ පාලන කටයුතු සඳහා ජනතා සහභාගීත්වය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් "ග්‍රාමීය සමාජ සුබසාධන ස්වේච්ඡා සේවා කමිටු" පිහිටුවිය යුතු බව ද මෙයින් යෝජනා කෙරෙයි. උචිත ප්‍රවේශ අනුව සිදු කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයනයන්ගෙන් හඳුනාගන්නා අදාළ ආචාර ධර්ම, සම්මත, නීති සහ රෙගුලාසි සම්පාදනයේ සහ සමාජ සුබසාධන සේවා සැපැයීම් අධීක්ෂණයේ අවසාන වගකීම රජය විසින් භාරගත යුත්තේ ය.

2. නිවැරැදි දත්ත සහ තොරතුරු සම්පාදනය

සමාජ සුබසාධන සේවා අවශ්‍ය අය සහ ඔවුන්ගේ ගැටලු පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් ඔවුන් ඇසුරෙහි ජීවත්වන ජනතාවට තිබේ. එම ජනතාව අතරින් පත් කරනු ලබන "ග්‍රාමීය සමාජ සුබසාධන ස්වේච්ඡා කමිටුව" ද මෙම හැකියාවෙන් යුක්ත ය. එහෙයින් ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් සිටින සමාජ සුබසාධන සේවා අවශ්‍ය දරුවන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, සහ ආබාධිතයන් හඳුනාගෙන අදාළ තොරතුරු වාර්තා කිරීමේ වගකීම "ග්‍රාමීය සමාජ සුබසාධන ස්වේච්ඡා කමිටුව" වෙත පැවැරිය යුතු ය. මෙම විෂයයට අදාළ මහජන දුක්ගැනැවිලි සහ පැමිණිලි භාරග න්නා අංශයක් සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ම ස්ථාපිත කළ යුතු ය. තව ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම

විෂයයට අදාළ සියලු තොරතුරු සහ සංඛ්‍යාලේඛන තහවුරු කර රජය, පළාත් පාලන ආයතනය සහ සාධනීය මැදිහත්වීම් සඳහා විමසීම් කරන පුන්‍යායතන වෙත ලබාදිය යුතු ය.

3. ජනතා මැදිහත්වීම් දිරිගැන්වීම

සමාජ සුබසාධනය සඳහා විවිධාකාරයෙන් දායකවන මහජනතාව වෙත පිළිසරණ අවශ්‍ය දරුවන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, සහ ආබාධිතයන් පිළිබඳ තොරතුරු ලබාදෙමින් එම ජනතා දායකත්වය විධිමත් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මූලික විය යුත්තේ ය. "ග්‍රාමීය සමාජ සුභසාධන ස්වේච්ඡා කමිටුව" විසින් තමන් වෙත ලබාදෙන තොරතුරු පදනම් කරගෙන උක්ත කාර්යය සිදුකිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හැකි ය. දැනට ජනතාව විසින් පිළිසරණ අවශ්‍ය අය වෙත බොහෝ විට ලබාදෙන්නේ ආහාර, රෙදිපිළි වැනි ද්‍රව්‍යමය ආධාර පමණකි. මෙම ද්‍රව්‍යමය ආධාර ලබාදීමේ සීමාව ඉක්මවා වෙනත් සේවා ලබාදීම සඳහා ද මහජනතාව දිරිමත් කළ යුතු ය. නිදසුනක් ලෙස පිළිසරණක් අවශ්‍ය දරුවන්ට අනෙකුත් දරුවන් සමඟ එක් වී විනෝද චාරිකාවල යෙදීමේ අවස්ථා සැළැසීම වැනි සේවා සැපැයීමට මහජනතාව පෙළැඹිය යුතු ය. රජයේ සහ අනෙකුත් ආයතනවල මූලිකත්වයෙන් ජනතා දායකත්වය ඇගැයීමේ ක්‍රම ද හඳුන්වා දිය යුත්තේ ය. මෙම කාර්යය සඳහා මාධ්‍ය ආයතනවල සහාය ලබාගැනීමට ද කටයුතු කළ යුතු වෙයි.

4. රැකවරණය අහිමි වූ දරුවන්ට ආදරය

රැකවරණය අහිමි දරුවන් සඳහා සෙනෙහස සහ ආධාර උපකාර ලබාදෙන කැපකරු මාපිය ක්‍රමයක් හඳුන්වාදීමට රජය, අනෙකුත් ආයතන සහ පුන්‍යායතන විසින් ක්‍රියා කළ යුත්තේ ය. "අනාථ නිවාසය" වැනි යෙදුම් භාවිතයෙන් ඉවත්කර ඒ වෙනුවට "ළමා නේවාසිකාගාර" වැනි නම් භාවිතයට එක් කිරීමට අදාළ සියලු අංශ (විශේෂයෙන් ම මාධ්‍ය ආයතන) කටයුතු කළ යුතු ය. මෙම ළමා නේවාසිකාගාරවල වාසය කරන ළමයින්ගේ අධ්‍යාපන, ක්‍රීඩා සහ කලා කටයුතුවල සාධනය අධීක්ෂණය කර ඒ අනුව ඒවා

ශ්‍රේණිගත කිරීමට රජය කටයුතු කළ යුතු ය. ළමා නේවාසිකාගාරවලට ඇතුළත් නොවී නිවෙස්වල අසරණ වී සිටින දරුවන් හට සේවා සැපැයීම සහ සේවා උපකාර ලබාදීමට කැමැති පාර්ශ්ව අතර මැදිහත්වීමේ වගකීම "ග්‍රාමීය සමාජ සුබසාධන ස්වෙච්ඡා කමිටුව" වෙත පැවැරිය හැකි ය.

5. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට රැකවරණය

වැඩිහිටි නිවාසවලට යෑමේ අවශ්‍යතාවක් නැතත් දහවල් කාලයේ දී නිවැසියන් රාජකාරී කටයුතුවලට යෑම නිසා තනි වන වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් "වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන" ආරම්භ කිරීමට රජය සහ අනෙකුත් ආයතන ක්‍රියා කළ යුත්තේ ය. මෙම මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ජනතා දායකත්වය ද ලබාගත හැකි ය. මෙම වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානවල සේවය ලබන වැඩිහිටියන් සඳහා තේ, කෝපි සකස්කරගැනීමට අවශ්‍ය පහසුකම්, දාම් ලෑලි, කැරම් බෝඩ්, කාර්ඩ් පැක් වැනි ක්‍රීඩා භාණ්ඩ, බැඩ්මින්ටන් වැනි ක්‍රීඩාකිරීමට පිට්ටනි, දිනපතා සහ සතිපතා පුවත්පත්, ගුවන්විදුලි යන්ත්‍ර සහ රූපවාහිනි යන්ත්‍ර, කුඩා පුස්තකාල, වැසිකිලි - කැසිකිලි පහසුකම්, ස්නානයට උණු වතුර, ඇඳන් සහ හාන්සි පුටු, සහ ප්‍රථමාධාර පහසුකම් වැනි දේ ලබාදිය යුත්තේ ය.

වැඩිහිටි නිවාස සහ ඒවායේ අධීක්ෂණ කටයුතු ඇගැයීමක් වර්තමානයේ දී සිදු නොවෙයි. මේ හේතුව නිසා ඒවායේ පාලනය අකාර්යක්ෂ සහ දූෂිත වී ඇති අතර වැඩිහිටියන්ට අවශ්‍ය පහසුකම් සැපැයීමට ද ඒවා අසමත් වී තිබේ. මෙම ගැටලුව විසඳීම සඳහා වැඩිහිටි නිවාසවල ප්‍රියමනාප බව, පිරිසිදුතම, අංග සම්පූර්ණ බව, සහ අලංකාරය සළකා ඒවා ඇගැයීමටත් ඒවා පවත්වාගෙන යෑමේ වගකීම පැවැරුණු පළාත් පාලන ඇගැයීමටත් ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය. එ මෙන් ම, පිරිසිදුකම, අලංකාර බව, සහ ලබාදෙන සේවයේ ගුණාත්මක බව අනුව වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ශ්‍රේණිගත කර ඒවා සම්මානයට පාත්‍රකිරීමේ වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතු ය.

වර්තමානයේ දී වැඩිහිටි නිවාසවලට ජනතා දායකත්වය ලැබෙන ආකාරයෙන් ම වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථානවලට ද ජනතා සහයෝගය ලබාගැනීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය. වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන තුළත් වැඩිහිටි නිවාස තුළත් ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් එම ස්ථානවල සිටින වැඩිහිටියන් රෝගී වූ විට ප්‍රතිකාර සඳහා රෝහල්වලට සහ වෛද්‍යවරුන් වෙතට යොමුකිරීමටත් වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතු ය.

ඉහළ ආදායම් ඇති මධ්‍යම පාන්තික සහ ධනවත් පවුල්වල වැඩිහිටියන් සඳහා වැඩි මුදලක් ගෙවා නවාතැන් ලබාගත හැකි අර්ධ සුඛෝපභෝගී සහ සුඛෝපභෝගි වැඩිහිටි නිවාස ඉදිකිරීම ද සිදු කළ යුත්තේ ය. ප්‍රාදේශීය මට්ටමින් මෙම කාර්යය සඳහා මුල්වීමේ වගකීම පළාත් පාලන ආයතනවලට පැවැරිය හැකි ය. එ මෙන් ම, සුඛෝපභෝගී වැඩිහිටි නිවාසවලට විදේශිකයන් ගෙන්වාගැනීම සඳහා වැඩපිළිවෙළක් ද ආරම්භ කළ හැකි ය.

නිරෝගී, වැඩකිරීමේ හැකියාවෙන් යුතු වැඩිහිටියන් අර්ධකාලීන රැකියාවක් කර ආදායම් උපයාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා අවස්ථා හඳුන්වාදීම ද කළ යුත්තේ ය.

6. ආබාධිත පුරවැසියන්ට සමතැන

ආබාධිත පුරවැසියන්ට සමාන ඉඩ ප්‍රස්ථා සැලැසීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ ඇති කරගත් ගිවිසුමේ ඉලක්ක සපුරාලීම සඳහා කටයුතු කළ යුත්තේ ය. මගී වාහනවලට ගොඩවීම සඳහා ආබාධිත අයට අවශ්‍ය අත්වාරු, රෝද පුටු ඇතුල්කරවීමේ පහසුව, සහ ඒවා එම වාහන තුළ තබාගැනීමේ ඉඩකඩ ලබාදීමට කටයුතු කළ යුතු ය. ආබාධිත අයට සියලු රජයේ සහ පුද්ගලික අංශයේ ගොඩනැගිලිවලට පිවිසීමේ පහසුකම් ඇති කළ යුතු ය.

තම බල ප්‍රදේශයේ ජීවත්වන ආබාධිත පුරවැසියන්ගේ අවශ්‍යතා සළකා රෝද පුටු, අත්වාරු, කිහිළිකරු, ත්‍රිරෝද සයිකල්, කොමඩ් පුටු, කෘත්‍රිම පාද/කෘත්‍රිම අත්, ඇවිදීමේ රාමු, ශ්‍රවණ ආධාර උපකරණ, සුදුසැරයටි, අක්ෂි කාච, ඇස් කණ්නාඩි සහ

වෙනත් විශේෂිත උපකරණ සැපැයීමේ වගකීම පළාත් පාලන ආයතනවලට පැවැරිය යුතු ය. තම බල ප්‍රදේශයේ ජීවත්වන ආබාධිතයන් හට ලබාදෙන සේවාවල ගුණාත්මක බව සළකා අදාළ පළාත් පාලන ආයතන ඇගැයීමට වැඩපිළිවෙළක් ද ආරම්භ කළ යුත්තේ ය.

ආබාධිත දරුවන් ඉගෙනුම ලබන විශේෂිත පාසල් සඳහා අවශ්‍ය සියලුම පහසුකම් ලබාදිය යුතු ය. මේ සඳහා පුද්ගලික අංශයේ, පුන්‍යායතනවල සහ ජනතාවගේ දායකත්වය ලබාගැනීමට රජය කටයුතු කළ යුතු ය. ආබාධිත අයට අවශ්‍ය තරමින් සියලු පහසුකම් සහිතව පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ නේවාසිකාගාර ඉදිකිරීමට වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතු ය. මෙවනි පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ නේවාසිකාර ඉදිකරන අයට අවශ්‍ය සම්පූර්ණ අනුග්‍රහය ලබාදීමට රජය කටයුතු කළ යුත්තේ ය.

ආබාධිත පුරවැසියන්ගේ අධ්‍යාපන සහ රැකියා අවස්ථා සහතික කිරීම රජයේ ද අනෙකුත් අංශවල ද වගකීමකි. මෙවැනි අයට යෙදිය හැකි ස්වයං-රැකියා හඳුන්වා දීම ද ඒවාට අවශ්‍ය පහසුකම් ලබාදීම ද රජය විසින් සහ අනෙකුත් ආයතන විසින් සිදු කළ යුත්තේ ය.

7. සමාජානුයෝජනය සහතික කිරීම

යෝග්‍ය විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර රැකවරණය අහිමි දරුවන්ගේ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ, සහ ආබාධිතයන්ගේ සමාජානුයෝජනය සහතික කිරීම රජය, අනෙකුත් ආයතන සහ ජනතාවගේ වගකීමක් බව අපි විශ්වාස කරමු. මේ අනුව, මෙම පාර්ශ්ව තුනට සහභාගී විය හැකි විනෝද ගමන්, අධ්‍යාපන සංචාර, වන්දනා ගමන්, ක්‍රීඩා සහ කලා උත්සව සංවිධානය කිරීමට අදාළ සියලු පාර්ශ්ව කටයුතු කළ යුත්තේ ය. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධිතයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, දිස්ත්‍රික්ක, පළාත්, සහ ජාතික මට්ටමින් වැඩිහිටි ක්‍රීඩා තරග පැවැත්වීම ද නැටුම්, ගැයුම්, සහ වැයුම් තරග පැවැත්වීම ද සිදු කළ යුත්තේ ය.

8. සමාජ දැනුම සහ යහපත් ආකල්ප වර්ධනය කිරීම

රැකවරණය අහිමි දරුවන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, සහ ආබාධිතයන් රැක බලාගැනීම ශිෂ්ට සමාජයක් විසින් කළ යුත්තක් බැවින් ඒ පිළිබඳ සමාජ දැනුමක් සහ යහපත් ආකල්ප වර්ධනයක් ඇති කිරීමේ වැඩපිළිවෙළක් ද හඳුන්වා දිය යුතු වෙයි. සමාජ සුබසාධන අංශයේ කටයුතු සඳහා පාසල් දරුවන් සම්බන්ධ කර ඔවුන්ට ඒ සම්බන්ධ ප්‍රායෝගික දැනුමක් සහ අවබෝධයක් ලබාදීම මේ අරභයා අනිවාර්යයෙන් ම කළ යුතු කාර්යයක් වෙයි. නිදසුනක් වශයෙන්, වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන වෙත පාසල් දරුවන් කණ්ඩායම් වශයෙන් යොමු කර අදාළ කරුණු ගැන ප්‍රායෝගික අවබෝධයක් ලබාගැනීමටත් වැඩිහිටියන් හා බැඳුණු තමන්ගේ සමාජ වගකීම අවබෝධ කරගැනීමටත් අවස්ථාවක් දරුවන්ට ලබාදීම මේ වෙනුවෙන් කළ හැකි ය. මෙම අංශයට සම්බන්ධ සාහිත්‍යය, කලා නිර්මාණ වැඩි වැඩියෙන් සිදුකිරීමට අදාළ පාර්ශ්ව උනන්දු කරවීම ද මේ අරභයා කළ යුතු වෙයි.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආබාධිතයන් සඳහා අවශ්‍ය සේවා සැපැයීම හොඳින් පුරුදු වී කළ යුතු වෘත්තීමය කාර්යයකි. එහෙයින් මෙම ක්ෂේත්‍රයට අවශ්‍ය සේවා ලබාදීම සඳහා රජය විසින් සත්කාර සේවයක් ආරම්භ කළ යුතු බව මෙයින් යෝජනා කෙරෙයි. මෙම සත්කාර සේවයට සම්බන්ධ වෙන අයට අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදෙන පාසලක් ද රජය විසින් ආරම්භ කළ යුත්තේ ය.

සංස්කෘතික සංවර්ධනය

හැඳින්වීම

ස්වභාවික වශයෙන් තමන් අවට පවත්නා සම්පත් පරිභෝජනය ඉක්මවා අවශ්‍යතා අනුව ද්‍රව්‍යමය සහ ද්‍රව්‍යමය නොවන විවිධ දේ සකස් කරගෙන තම ජීවිත පොහොසත් කරගැනීමට මිනිස්සු පෙළැඹෙති. මෙ ලෙස මිනිසුන් විසින් සකස් කරගන්නා සියල්ලේ එකතුව පුළුල් අර්ථයෙන් 'සංස්කෘතිය' යනුවෙන් හැඳින්විය හැකි ය. අනෙක් සත්ත්වයන්ගෙන් වෙන් වූ විශේෂත්වයක් මිනිසුන් හට අත්පත් කර දෙන්නේ ඔවුන්ට හිමි සහ ඔවුන් විසින් ආරක්ෂා කරගෙන, පෝෂණය කරන්නා වූ සංස්කෘතිය විසිනි. එහෙයින් මිනිසා හැඳින්විය හැක්කේ සංස්කෘතික සත්ත්වයෙක් වශයෙනි.

කිසියම් නිශ්චිත මිනිස් සමාජයකට මෙන් ම රාජ්‍යයකට ද අනන්‍යතාවක් ලබාදෙන්නේ එයට හිමි සංස්කෘතියෙනි. එ මෙන් ම, රාජ්‍යයක ආධිපත්‍යය තහවුරු කෙරෙන්නේ ද සංස්කෘතික සීමා තුළ ය. රාජාණ්ඩුවක නම් එයට අදාළ බල ව්‍යූහය ද, ජනරජයක නම් ජනතාවගේ පරමාධිපත්‍යය ද සංස්කෘතික වශයෙන් අර්ථ දැක්වෙයි. සංස්කෘතික නිර්ණායකවලින් තොරව ජාතියක් සහ රාජ්‍යයක් නිර්වචනය කළ නො හැකි ය.

සංස්කෘතිය යනු මිනිසාගේ සාමූහික හිමිකමකි. ජාතියේ සහ එහි බලයෙන් ගොඩනැගෙන රාජ්‍යයේ අනන්‍ය බව මෙම සාමූහික

හිමිකම විසින් තහවුරු කෙරෙයි. එහෙයින් ඕනෑම ජාතියක් සහ රාජ්‍යයක් සතු සංස්කෘතිය ආරක්ෂා කර, පෝෂණයකිරීම එහි පාලන බලතල හිමි සියලු ආකාරයේ ආයතනවල ප්‍රමුඛතම වගකීමක් වෙයි.

වසර දෙදහස් පන්සීයකට වැඩි අඛණ්ඩ ඉතිහාසයක් හිමි ජාතියක් වශයෙන් ශ්‍රී ලංකා රාජ්‍යය පිහිටුවා, අනන්‍ය වූ ස්වරූපයකින් එය පවත්වාගෙන යාමට මෙහි පෙර විසූ සහ වර්තමානයේ වසන ජනයා සාමූහික වශයෙන් දායක වී තිබේ. අනන්‍ය වූ භාෂාවක් ගොඩ නඟාගෙන, ආගමික දර්ශන වර්ධනය කරගෙන, තමන්ගේ ම ඇගැයීම් පද්ධතියක් තුළින් හැඩ ගැස්වුණු ශක්තිමත් ජාතියක් බිහි කරගෙන, ඒ ආශ්‍රිතව විවිධ වූ විචිත්‍ර සංස්කෘතික අංගෝපාංග නිර්මාණය කරගැනීමට මෙම උදාර වූ දායකත්වය ඉවහල් වී තිබේ.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික අංශයේ පවත්නා ගැටලු

වසර පන්සීයකට පමණ පෙර ඇරැඹී වර්ධනය වුණු බටහිර යටත්විජිත ව්‍යාපෘතිය මේ වන විට තම ආධිපත්‍යය ලොව පුරා පතුරුවන්නේ මූලික වශයෙන් ම සංස්කෘතික ස්වරූපයකිනි. මෙම සංස්කෘතික ආක්‍රමණයේ අරමුණ වන්නේ අධිරාජ්‍යවාදී සහ නව යටත්විජිතවාදී බලවේග ඔවුන්ගේ ආධිපත්‍ය බලය තහවුරු කර ගැනීමත්, අන්‍ය ජන කොටස් අතර ව්‍යාජ විඥානයක් මුල් බැස්සවීමත්, ඔවුන්ව කොම්ප්‍රදෝරු හැසිරීම්වලට පොළඹවා ගැනීමත් ය. 'මෘදු බලය' (Soft power) ලෙසින් හැඳින්වෙන මෙම බල ව්‍යාපෘතිය තුළින් නවමු ආකාරයක බටහිර අධිරාජ්‍යයක් ගොඩ නංවා, එය බලවත් කරමින් සිටියි. සංස්කෘතික ආකර්ෂණය තුළින් අනෙකුත් ජාතීන් තමන් වෙත වසඟ කරවාගැනීම මේ තුළ සිදුවෙයි. ඒ උදෙසා ලිබරල් සංස්කෘතික ඇගැයීම් මූලික කරගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනය තුළ සහ මාධ්‍ය තුළ තමන්ගේ බලය තහවුරු කරගැනීම මඟින් බටහිර ආධිපත්‍යය විසින් තමන්ට අවනත පිරිස් අධ්‍යාපනයේ, චිත්‍රපටි, සංගීතය

සහ ප්‍රචාරණය ඇතුළු කලා ප්‍රකාශන අංශවල සහ මාධ්‍ය සන්නිවේදනයේ ස්ථාපිත කර, බලවත් කර තිබේ. දේශීය භාෂා භාවිතය දුර්වල කර, අනන්‍ය ආගමික විශ්වාස හෑල්ලුවට ලක්කරමින් පවතියි. එයට අමතරව, ජාතියේ සංස්කෘතික ඇගැයීම් සහ සිරිත් විරිත් ගර්හාවට පත්කරමින් සිටියි.

මෙම දැවැන්ත අධිරාජ්‍යවාදී සංස්කෘතික ප්‍රහාරය තුළ සමස්ත සමාජය ම චින්තනමය අර්බුදයකට ගොදුරු වී, ස්ව-අභිමතයට අනුව පැවැතීමට ඇති හිමිකම අහිමිවීමේ දරුණු තර්ජනයකට ගොදුරුවෙමින් පවතී. ස්ව-භාෂා භාවිතය දුර්වල වී තිබේ. දේශීය ආගමික සංස්ථා අර්බුදයට ලක් වී තිබේ. අධ්‍යාපනයේ සහ කලා ප්‍රකාශනයේ බලය මුළුමනින්ම මෙන් ලිබරල් ආධිපත්‍යයට ගොදුරු වී තිබේ. මෙම ලිබරල් සංස්කෘතික ආධිපත්‍යය විසින් අපගේ සමාජය ඉතා ව්‍යාකූල තත්ත්වයකට පත් කර තිබේ. මෙම වියවුල තුළ ස්වදේශිකයන්ගේ තීරණගැනීමේ ශක්තිය ඉතා දරුණු මට්ටමින් දුර්වල කර තිබේ.

සංස්කෘතික ක්ෂේත්‍රයේ අභියෝග ජයගැනීම

උක්ත අභියෝග ජයගෙන, ජාතියේ සහ රාජ්‍යයේ අනන්‍යතා බලය (ආධිපත්‍යය) තහවුරු කරගත හැක්කේ ඉතා සංවිධානාත්මකව සහ සියලු පාලන ආයතන මූලිකත්වයෙන් සහ අනෙකුත් සමාජ සංවිධානවල දායකත්වයෙන් ස්වදේශීය සංස්කෘතිය ආරක්ෂා කරගෙන එය පෝෂණය කොට බලවත්කිරීමෙන් පමණකි.

උක්ත අවබෝධය ඇතිව, ශ්‍රී ලංකා ජනරජයේ සංස්කෘතිය ආරක්ෂා කර, පෝෂණයකිරීමට ඉවහල් වන පහත සඳහන් යෝජනා අපි මෙයින් ඉදිරිපත් කරමු.

- **ස්ව-භාෂා ප්‍රවර්ධනය, දේශීය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම සුරැකීම, මාධ්‍ය අංශයේ ගුණාත්මක බව ඉහළ නැංවීම, ස්වදේශීය උත්සවවල අනන්‍යතා සුරැකීම සහ ප්‍රවර්ධනය, සහ දේශීය ආහාර සංස්කෘතියේ පවත්නා ගැටලු විසැඳීම වැනි ක්‍රමවලින් දේශීය සංස්කෘතිය බලවත් කිරීම.**

- **භෞතික අනන්‍යතා ප්‍රකාශනයට ක්‍රියාකාරී අයුරින් රජය මැදිහත් කරවීම, සාහිත්‍ය කලා ප්‍රවර්ධනය, සහ මෙම අංශයේ ප්‍රගමනය උදෙසා සංස්කෘතික කර්මාන්ත අංශය දිරිමත් කරවීම**

- **රටේ ප්‍රතිරූපය වර්ධනය කෙරෙන අයුරින් දේශීය සංස්කෘතික නිර්මාණ විදේශික ජනතාව අතර ප්‍රචලිත කිරීමත්, විදේශික සංස්කෘතික නිර්මාණවල ආභාසයෙන් දේශීය සංස්කෘතිය පෝෂණය කරගැනීමත් අරමුණු කරගෙන අන්තර්ජාතික සංස්කෘතික හුවමාරු ඇරැඹීම.**

ඉදිරිමග

1. ස්ව-භාෂා ප්‍රවර්ධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කර තිබෙන රාජ්‍ය භාෂා භාවිතය ඒ ආකාරයෙන් ම ක්‍රියාවට නැංවිය යුතු ය. එයට බාධා කරන අමතර විධිවිධාන ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය. නිදසුනක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 24. (1) අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත අධිකරණයේ භාෂාව පිළිබඳව විධානය වෙනස්කිරීම සඳහා විෂයය භාර අමාත්‍යවරයාට බලය පැවැරීමේ අමතර විධානය ඉවත්කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු ය.

අධ්‍යාපන කාර්යයන්හි දී ද, රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සේවා සැපැයීමේ දී ද දේශීය භාෂා භාවිතය ප්‍රවර්ධනය කිරීම රජය විසින් දිරිගැන්විය යුතු අතර ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනය ද සිදු කළ යුතු ය.

ස්වභාෂා ප්‍රවීණතාව ඇගැයීමේ ක්‍රියාදාමයක් රජය විසින් හඳුන්වා දිය යුතු ය. ඒ සඳහා,

- ස්ව-භාෂා භාවිතය ප්‍රචලිතකිරීම සහ ජනතාව එහි ප්‍රවීණයන් බවට පත්කිරීම අරමුණු කරගත් මට්ටම් කිහිපයකින් සමන්විත විවෘත විභාග ක්‍රමයක් හඳුන්වාදිය යුතු ය.

- රැකියා ලබාදීමේ දී සහ අනෙකුත් ඇගැයීම්වල දී මෙම විභාගවලින් සමත් වී ප්‍රවීනතා සහතික ලබාගන්නා අයට ප්‍රමුඛතාව ලබාදිය යුතු ය.

විදේශීය භාෂාවලින් ලියැවුණු පාඨ ග්‍රන්ථ සහ සාහිත්‍ය කෘති දේශීය භාෂාවලට පරිවර්තනය කිරීම සඳහා වැඩසටහන් ආරම්භ කළ යුතු ය. භාෂා ප්‍රවීණයන්ගේ මූලිකත්වය ලබාගෙන ආරම්භ කරන මෙම වැඩසටහනට රජය විසින් අරමුදල් සැපැයිය යුතු ය.

දේශීය භාෂාවලින් සම්පාදිත ලේඛන සහ කථන සටහන් අනෙකුත් භාෂාවලට පරිවර්තනය කිරීමත්, විදේශීය භාෂාවලින් සම්පාදිත ලේඛන සහ කථන සටහන් දේශීය භාෂාවලට පරිවර්තනය කිරීමත් අරමුණු කරගත් මෘදුකාංග නිර්මාණය කළ යුතු ය. භාෂා ප්‍රවීණයන්ගේ සහ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ දායකත්වය ලබාගෙන මෙය සිදු කිරීමට රජය මුල් විය යුත්තේ ය.

2. දේශීය සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම සුරැකීම

පිරිවෙන් වැනි ස්වදේශීය ආගමික අධ්‍යාපන ආයතන ඒවාට ආවේනික, අනන්‍ය ක්‍රම අනුව පවත්වාගෙන යෑමට අවශ්‍ය අනුග්‍රහය ලබාදීම සහ ඒවායේ ඉගෙනගන්නා අයට අවශ්‍යතාව අනුව බාහිර විෂයයන්ගේ ප්‍රවීනතා ලබාගැනීම සඳහා බාහිර විභාග ක්‍රමයක් හඳුන්වාදීම.

3. මාධ්‍ය අංශයේ ගුණාත්මක බව ඉහළ නැංවීම

මාධ්‍ය ආයතන විසින් අත්පත් කරගෙන තිබෙන විශාල සමාජ බලය සහ ව්‍යාප්තිය නිසා, ඒ ඔස්සේ ඇති කරනු සංස්කෘතික බලපෑම ඉතාමත් තීරණාත්මක එකකි. එහෙයින් මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් විසින් ලබාදෙන සේවයේ ගුණාත්මක බව ඉහළ නැංවිය යුතු බවට සැකයක් නැත. මේ අරභයා මාධ්‍ය අංශයේ යහපත් කාර්යය සාධනය දිරිමත් කළ යුතු අතර අයහපත් භාවිතාවන් වැළැක්විය යුතු ය. ජනමාධ්‍ය අමාත්‍යංශය, අදාළ අනෙකුත් ආයතන, මාධ්‍ය වෘත්තිකයන්, සහ වෘත්තීය සමිති එක් වී ඇති කරගන්නා කතිකාවක් මත පදනම් වී මාධ්‍ය ආයතනය

සහ මාධ්‍යවේදීන් සඳහා චර්යා සංග්‍රහයක් හඳුන්වා දිය යුතු ය. එම චර්යා සංග්‍රහයේ නිර්ණායක මත පදනම් වී මාධ්‍ය ආයතන සහ මාධ්‍යවේදීන් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු ය.

උක්ත ඇගැයීම සඳහා මාධ්‍ය ආයතනවල භාෂා භාවිතය ද සළකා බැලිය යුතු අතර මාධ්‍යවේදීන්ගේ ස්ව-භාෂා භාවිතය ඉහළ නැංවීමේ අධ්‍යාපන වැඩසටහනක් ද ආරම්භ කළ යුතු ය. එයට අමතරව මාධ්‍යවේදීන්ගේ ද්විතීයික සහ විදේශ භාෂා දැනුම වර්ධනය කරවීමේ වැඩසටහනක් ද ආරම්භ කළ යුතු ය. වර්තමානයේ සිටින මාධ්‍යවේදීන් අතරින් සළැකිය යුතු පිරිසකගේ දැනුම ද ප්‍රමාණවත් නැති බව පැහැදිළි ය. එහෙයින් භාෂා අධ්‍යාපනයට අමතරව, දේශීය සහ ජාත්‍යන්තර සමාජ - ආර්ථික කරුණු පිළිබඳ පරිපූර්ණ දැනුමක් මාධ්‍යවේදීන් හට ලබාදෙන වැඩහටහනක් ද ආරම්භ කළ යුත්තේ ය.

බටහිර ආධිපත්‍යයට නතු නොවන චීනය, රුසියාව, ඉරානය වැනි රටවල මාධ්‍ය ආයතනවලින් ප්‍රවෘත්ති සහ විවිධ වැඩසටහන් ලබාගැනීමට ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් දේශීය මාධ්‍ය ආයතන දිරිමත් කළ යුතු ය. මහ ජනතාවගේ සංස්කෘතික ඥානය සහ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා යොදාගත හැකි එවැනි වැඩසටහන් (විශේෂයෙන් ම, වාර්තා චිත්‍රපට) ස්ව-භාෂාවලින් හඬ කවා ප්‍රචාරණයට ද කටයුතු කළ යුතු ය.

4. ස්වදේශීය උත්සවවල අනන්‍යතා සුරැකීම සහ ප්‍රවර්ධනය

අදාළ අමාත්‍යංශ සහ ආයතනවල මූලිකත්වයෙන් ස්වදේශීය උත්සව සහ අනෙකුත් සංස්කෘතික අංග අස්පර්ශනීය (Intangible) ලෝක උරුම බවට පත්කිරීම සඳහා රජය කටයුතු කළ යුතු ය. මෙම සංස්කෘතික උත්සව සහ ඒවාට ඇතුළත් අංග තවදුරටත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ද හඳුන්වා දිය යුතු ය.

5. ආහාර සංස්කෘතියේ ගැටලු විසැඳීම

ප්‍රාදේශීයව විසිරී තිබෙන දේශීය ආහාර සංස්කෘතියට අදාළ

දැනුම, දේශීය ආහාරවල සෞඛ්‍ය ප්‍රතිලාභ, ස්වදේශීය අමුද්‍රව්‍ය යොදාගෙන සැකැසෙන නිසා ඒවායේ ආර්ථික ප්‍රතිලාභ යනාදී දැනුම ලබාදෙන අධ්‍යාපන ආයතනයක් පිහිටුවිය යුතු ය.

දේශීය ආහාර (එහි කලාපීය ප්‍රභේද ද ඇතුළත් වන පරිදි) අපනයනය කිරීමත් සංචාරක ආකර්ෂණයක් ලෙසින් ඒවා යොදාගැනීමත් තුළින් ඒවාට අදාළ වෙළෙඳපොළ ශක්තිමත්කිරීම සඳහා ද ඒ තුළින් දේශීය ආහාර සංස්කෘතිය තව තවත් පෝෂණය කිරීම සඳහා ද වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතු ය.

දේශීය ආහාර සංස්කෘතියේ ඉදිරි වර්ධනය අරමුණු කරගෙන ආහාර සංස්කෘතිය දියුණු රටවලින් අදාළ දැනුම ලබාගෙන ඒවා දේශීය ආහාර සංස්කෘතිය තුළට අවශෝෂණය කරගැනීමේ වැඩපිළිවෙළක් ද හඳුන්වා දිය යුතු ය.

ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීමෙන් සහ එය දැඩිව ක්‍රියාත්මක කිරීමෙන් දේශීය අවන්හල්වල ගුණාත්මක බව සහ සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීමට ද රජය ක්‍රියා කළ යුතු ය.

දේශීය ආහාර නිර්මාණයේ සහ ප්‍රවර්ධනයේ නිපුණතා පෙන්වන අය හඳුනාගෙන, ඒ අය ඇගැයීමේ සම්මාන ක්‍රමයක් රජය විසින් හඳුන්වා දිය යුතු ය.

6. භෞතික අනන්‍යතා ප්‍රකාශනයට රජය මැදිහත්වීම

දේශීය ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම සහ ආකෘති භාවිතයටත්, ඒවා තවදුරටත් සංවර්ධනය කිරීමටත් රජය මුල්විය යුතු ය. විශේෂයෙන් ම, රාජ්‍ය ආයතන සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේ දී දේශීය වාස්තු කලා ශිල්ප භාවිතය අනිවාර්යය කළ යුතු ය. මේ තුළින් රටේ භෞතික අනන්‍යතාව ලොවට ප්‍රකාශ කෙරෙනු ඇති අතර, ඒ හේතුවෙන් දේශීය ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වෙළෙඳපොළක් ද නිර්මාණය වනු ඇත්තේ ය.

නිදහසත් සමඟ සමාජගත කිරීමට උත්සාහ කෙරුණු ජාතික ඇඳුම රටේ බහුතරයක් විසින් පිළිගෙන නැත. එහෙයින්, ජනතාවගේ අදහස්වලට කන් දී විචිත්‍ර ජාතික ඇඳුමක් නිර්මාණය

කිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් ආරම්භ කළ යුතු ය. තව ද, දේශීය විලාසිතා වර්ධනය කිරීමටත්, ඒවා ප්‍රචලිත කිරීමටත් රජයේ අනුග්‍රහය හිමිවිය යුතු ය. මේ සඳහා වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම ද ලබාගත යුතු ය.

7. සාහිත්‍ය කලා ප්‍රවර්ධනය

පොත් ප්‍රකාශනය, නාට්‍ය සහ චිත්‍රපට නිර්මාණය වැනි කාර්යයන් තුළින් දේශීය සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා ප්‍රමුඛ වන අයව දිරිගැන්වීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතු ය.

දේශීය සාහිත්‍ය කෘති පුළුල් වශයෙන් පාසල්වල ඉගැන්වීමේත් දේශීය චිත්‍රපට නිර්මාණ පාසල්වල ප්‍රදර්ශනය කිරීමේත් ජාතික වැඩපිළිවෙළක් හඳුන්වා දිය යුතු ය.

දේශීය සාහිත්‍ය කෘති සහ චිත්‍රපට නිර්මාණ වෙනත් භාෂාවලට පරිවර්තනය කර ඒවා සමඟින් ප්‍රමුඛ මට්ටමේ ජාත්‍යන්තර උත්සවවලට සහභාගී වීමේ අවස්ථාව දේශීය ලේඛකයන්ට සහ දේශීය සිනමාකරුවන්ට රජය විසින් ලබාදිය යුතු ය.

පොත් ප්‍රකාශන අංශයේ අතරමැදියන් විසින් ලබාගන්නා කොටස ඉතාමත් ඉහළ එකක් බැවින් කර්තෘවරුන්ට හිමිවන්නේ සියයට 10 ක් පමණ වූ සුළු මුදලකි. මේ වන විට, මංගත වෙළෙඳාම ඉතා ඉහළට දියුණු වී ඇති නිසා ඒ ක්‍රමය යොදාගෙන කර්තෘවරුන්ට වැඩි මුදලක් උපයාගැනීමේ අවස්ථාවක් නිර්මාණය කළ හැකි ය. ඒ අනුව, මංගත අයුරින් පොත් අලෙවිය සඳහා තැපැල් දෙපාර්තමේන්තුව මැදිහත් කරවීමේ ජාතික වැඩපිළිවෙළක් රජය විසින් ආරම්භ කළ යුතු ය.

ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන ක්‍රමය ශක්තිමත් කළ යුතු අතර ඒවායින් ලබාදෙන සේවා අතරට පුස්තකාල පරිහරණ සහ චිත්‍රපට නැරඹීමේ පහසුකම් ද එකතු කළ යුතු ය.

සංස්කෘතික කර්මාන්ත (Culture industry) අංශය ප්‍රවර්ධනය සඳහා රජය මැදිහත් විය යුතු ය. ඒ වෙනුවෙන් නව්‍ය සංස්කෘතික

ඇරැඹීම, පවත්නා සංස්කෘතික උත්සව තව තවත් ප්‍රවර්ධනය රජය විසින් සිදු කළ යුතු ය. මෙම අංශයේ කටයුතු සඳහා පුද්ගලික අංශය ද ජන සහභාගීත්වය ද දායක කරගත හැකි ය.

8. අන්තර්ජාතික සංස්කෘතික හුවමාරු

අධිරාජ්‍යවාදී නොවන පෙරදිග සහ අනෙකුත් රටවල් සමඟ සංස්කෘතික හුවමාරු වැඩසටහනක් රජයේ මූලිකත්වයෙන් ආරම්භ කළ යුතු ය. එ මෙන් ම, මෙම අංශයේ පුද්ගල - පුද්ගල හුවමාරු දිරිගැන්වීම සඳහා වන රාජ්‍ය වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කළ යුතු ය.

දේශීය කලාකරුවන්ට විදේශයන්හි අධ්‍යාපනය ලබාගැනීම සඳහා ශිෂ්‍යත්ව සහ හුවමාරු වැඩසටහන් හඳුන්වාදීමට රජය ක්‍රියා කළ යුතු ය. එ මෙන් ම, දේශීය කලාකරුවන් හට විදේශීය උත්සවවලට සහභාගීවීමේ අවස්ථාව ද රජයේ මූලිකත්වයෙන් ලබාදිය යුත්තේ ය.

අධිරාජ්‍යවාදී නොවන පෙරදිග සහ අනෙකුත් රටවල් සමඟ එක් වී මිත්‍රත්ව කලා සහයෝගිතා වැඩසටහනක් ආරම්භ කිරීමට ද රජය මුල්විය යුතු ය.

රාජ්‍ය ආරක්ෂාව සහ මහජන ආරක්ෂාව

හැඳින්වීම

ශ්‍රී ලංකාව අභ්‍යන්තර තර්ජන (සිවිල් නොසන්සුන්තා, බෙදුම්වාදී කැරලි සහ හමුදා කුමන්ත්‍රණ) සහ බාහිර තර්ජන (ප්‍රසිද්ධයේ සිදු කරනු ලබන යුදමය ක්‍රියා හරහා හෝ ආර්ථික කඩාකප්පල් කිරීම් හෝ සම්බාධක හරහා) යන දෙකට ම මුහුණ දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන් සහ පොලිසිය සෘජුව ම යටත්විජිත සමයේ මර්දන මෙවලම් තුළින් පැවත එන අතර ඒවා මගින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සම්ප්‍රදායන් අඛණ්ඩව පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි. නිදසුනක් ලෙස ඩව්බිගින් (Dowbiggin) යුගය "පොලිසියේ ස්වර්ණමය යුගය" ලෙස සඳහන් කරනු ලැබේ. යුධ හමුදා ඇඳුම් සහ සේවා නිල ඇඳුම් දේශගුණයට ගැලපෙන කාකි නිල ඇඳුමේ සිට, උතුරු ඇමරිකානු හෝ යුරෝපීය නිල ඇඳුම් මෙන් තද කොළට හුරු කළු පාට සහ කළු පාටට මාරු වී ඇති අතර නාවික සහ ගුවන් හමුදා ඇඳුම් සහ සේවා නිල ඇඳුම් ද ඒ ආකාරයට ම වෙනස් වී ඇත.

ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්ගේ මූලික අවධානය යොමු වන්නේ බාහිර තර්ජනවලට වඩා අභ්‍යන්තර තර්ජන කෙරෙහි

ය. ජාතියේ ආරක්ෂක හදවත එක ම අවදානම් ස්ථානයක කේන්ද්‍රගත කරන ආරක්ෂක අමාත්‍යාංශයේ නව මූලස්ථානය වන "රෙක්ටගන්" දෙස බැලීමේ දී මෙය පැහැදිළි වන අතර බාහිර ප්‍රහාරයක් හමුවේ ආරක්ෂාවීමට නම් එය රට පුරා විසිරී පැවතිය යුතු ය. .

ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා මානව සම්පතෙන් පිරී තිබුණ ද අසමතුලිත මට්ටමක ඇත. උපකරණ සම්බන්ධයෙන් සළකා බැලීමේ දී, අනෙකුත් දූපත් රාජ්‍යවල නාවික හා ගුවන් හමුදා ඒවායේ යුද හමුදාවන්ට සාපේක්ෂව පෙන්නුම් කරනු ලබන තත්ත්වය, ශ්‍රී ලංකාවේ නාවික හා ගුවන් හමුදාවන් යුද හමුදාවට සාපේක්ෂව පෙන්නුම් කරනු ලබන තත්ත්වයට වඩා සැළැකිය යුතු ලෙස වැඩි මට්ටමක පවතින අතර ඒවායේ මානව සම්පත් හා උපකරණ අනුපාතය ශ්‍රී ලංකාවේ එකී අනුපාතයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතී. ඒ අතර ම, නවීන යුධ කටයුතු සඳහා අවශ්‍ය අධිතාක්ෂණික උපකරණවල සහ පුහුණුවෙහි ද හිඟතාවක් පවතී.

අපරාධවලින් සමාජය ආරක්ෂා කරනු ලබන්නේ නීතිය හා සාමය මගිනි. අපේ සමාජය වඩාත් සාපරාධී සහ ප්‍රචණ්ඩ තත්ත්වයට පත් වී ඇත. අවදානමට ලක් වී ඇති තැනැත්තන්ට, කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි අපරාධ වැඩි වී තිබේ. අපරාධ පෝෂණය වන්නේ ප්‍රචණ්ඩත්වය, පාලනය, අසමානතාව සහ ජාතිවාදය මත ය. දුප්පතුන්ට දඬුවම් කරනු ලබන නමුත් ධනවත් හා බලවත් තැනැත්තන් මෘදු දඬුවම් හැර අන් සියල්ලෙන් ගැලවී යයි. අපට අවශ්‍ය වන්නේ වැරදිකරුවන්ට දඬුවම් කිරීමට වඩා අපරාධවලට හේතු වූ කරුණු තුරන් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ලබන වඩාත් සාධාරණ සමාජයක් ය. මෙම ප්‍රතිපත්තිය තුළින් අපේක්ෂා කරන්නේ සිරගෙවල් කිහිපයක් පමණක් දක්නට ලැබෙන සහ දඬුවම් සම්බන්ධයෙන් විකල්ප ක්‍රමවේදයන් සහිත සහ සාධාරණ අධිකරණ පද්ධතියක් සහිත සමාජයකි.

අපගේ ආරක්ෂක ප්‍රතිපත්තියෙහි මූලික අරමුණු ලෙස පහත සඳහන් දෑ සඳහන් කළ හැකි යඃ

- විදේශීය සහ අභ්‍යන්තර තර්ජනවලට එරෙහිව රටේ ආරක්ෂාව ප්‍රශස්ත කිරීම
- නොබැඳි ප්‍රතිපත්තිය මත පදනම් වූ ආරක්ෂක ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම
- ජාතියට සහ ප්‍රජාතන්ත්‍රවාදයට යෝග්‍ය වන පරිදි සන්නද්ධ හමුදා නැවත සකස් කිරීම
- ආරක්ෂක අවශ්‍යතා තුළ ස්වයං විශ්වාසය වැඩි කිරීම
- නවීන තාක්ෂණයට ආරක්ෂක හමුදාවන් අනුවර්තනය කිරීම
- අභ්‍යන්තර සාමය සහ නීතිය තහවුරු කර සාධාරණ සමාජයක් ගොඩනැගීම

ඉදිරිමග

රාජ්‍ය ආරක්ෂාව

1. රාජ්‍ය තාන්ත්‍රිකභාවය

ගැටුම් වළක්වා ගැනීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂක උපාය මාර්ගයේ මූලික අරමුණ විය යුතු අතර රාජ්‍ය තාන්ත්‍රිකභාවය මගින් එහි ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලබයි. රට විසින් නොබැඳි ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු අතර ඉන්දියන් සාගරය න්‍යෂ්ටික නොවන "සාම කලාපයක්" විය යුතු ය යන සංකල්පය අවධාරණය කර එයට ශක්තිය මෙන් ම ස්වාධීනත්වය ලබාදෙන ආරක්ෂක සන්ධානවලට එළැඹිය යුතු ය. නිදසුනක් ලෙස ෂං-හයි සහයෝගිතා සංවිධානයට (Shanghai Cooperation Organisation SCO) පූර්ණ සාමාජිකයකු ලෙස සම්බන්ධ වීම දැක්විය හැකි ය. දැනට අප කටයුතු කරන්නේ මෙම සංවිධානයේ හුදු "සංවාද හවුල්කරුවකු" වශයෙන් පමණකි.

2. වැළැක්වීම

ආක්‍රමණයකට හෝ වෙනත් ආකාරයකින් මැදිහත්වීම සෑම අතකින්ම පිරිවැය අධික වන ලෙස රටේ ආරක්ෂක උපාය මාර්ගය

විය යුතු ය. රාජ්‍ය ක්‍රියාකාරීන් සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් යන දෙඅංශයෙන් ම ඇතිවෙන අභ්‍යන්තර තර්ජන සඳහා ද මෙය අදාළ වේ. එනම් කැරැල්ලක් හෝ කුමන්ත්‍රණයක් සාර්ථක වීමේ සම්භාවිතාව ඉතා අඩුකිරීමයි.

3. මුලාකිරීම

සම්පත් හිඟතාව නිසා වැළැක්වීමේ උපාය මාර්ගයක් ලෙසින් මුලාව භාවිතා කිරීම අත්‍යවශ්‍ය බවට පත් කර ඇත. දුර්වලතා වසා ගැනීමට සහ ශක්තීන් අවධාරණය කිරීමට, රටේ යුධමය හැකියා සහ සම්පත් පිළිබඳ අතිශයෝක්ති ප්‍රකාශයක් සිදු කළ යුතු ය. නිදසුනක් වශයෙන්, ආරක්ෂක මධ්‍යස්ථාන තුළ කටයුතු සඳහා අඩු පිරිසක් යොදවන ලද මුත් ඔවුන්ගේ සංඛ්‍යාව වැඩි බව පෙනෙන පරිදි ඔවුන්ගේ ක්‍රියාකාරකම් අතිශයෝක්තියෙන් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය

4. ප්‍රජාතන්ත්‍රවාදය

යල්පැන ගිය යටත්විජිත සම්ප්‍රදාය දේශීය, ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් බවට වෙනස් කළ යුතු ය. නිල ඇඳුම් ලා පැහැති විය යුතු අතර, ඒවා අඳින තැනැත්තා හට වඩාත් සුවපහසු විය යුතු ය. ආරක්ෂක උපකරණ සම්බන්ධ සමස්ත පාලනය ආරක්ෂක අමාත්‍යවරයා විසින් සභාපතිත්වය දරනු ලබන සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානියා ඇතුළත්, පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද ජාතික හමුදා කවුන්සිලයක් සතු විය යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රගතිශීලී පරමාදර්ශවලට පක්ෂපාතීත්වය සහතික කිරීම සඳහා ජාතික හමුදා කවුන්සිලය විසින් එක් එක් ප්‍රධාන ඒකකයකට විනිශ්චය මණ්ඩල ස්ථාපනය කරමින් ප්‍රධාන ප්‍රති-සංවිධානයක් සිදුවිය යුතු ය. නිලධාරීන් සහ විශේෂඥයින් චීනය, කියුබාව සහ වියට්නාමය වැනි බටහිර නොවන රටවල පුහුණුව සඳහා යැවිය යුතු ය. බටහිර නොවන සන්නද්ධ හමුදා සමඟ, විශේෂයෙන් ම ෂං-හයි සහයෝගිතා සංවිධානයට අයත් හමුදා සමඟ තවත් ඒකාබද්ධ අභ්‍යාස සිදු කිරීමට අවශ්‍ය වනු ඇත.

5. මූලධර්මය

රටේ ආරක්ෂක අවශ්‍යතා බාහිර තර්ජන හඳුනාගෙන ඉලක්කගත කළ යුතු ය. දූපතක් වන බැවින් මුහුද එහි පළමු ආරක්ෂක මාර්ගය විය යුතු ය.

දෙවන ආරක්ෂක මාර්ගය වන, විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර වෙරළබඩ තැනිතලාව වෙත ආක්‍රමණවලට ප්‍රතිරෝධය දැක්වීමට හැකි ශක්තිමත් යාන්ත්‍රික බලකායන් අවශ්‍ය වේ. මුහුදට තරමක් ආසන්න වගුරු බිම් සහ කඳු නිසා ගිනිකොන දිග පෙදෙස වඩාත් පහසුවෙන් ආරක්ෂා වනු ඇත.

තුන්වන ආරක්ෂක මාර්ගය වන බලකොටුවක් ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ඇති මධ්‍යම කඳුකරය, අපගේ මුතුන් මිත්තන් විසින් ඵලදායී ලෙස භාවිතා කරන ලද භූමියක් වන අතර, විදේශ ආක්‍රමණයන්ට ප්‍රතිරෝධය දැක්වීමේ දී අවසාන වශයෙන් සැඟ වී සිට සටන් කළ හැකි ස්ථානයක් ලෙස එය ක්‍රියා කරන ලදි. උදාහරනයක් ලෙස ඔස්ට්‍රියානුවන් සහ ස්විස් ජාතිකයන් යන දෙපිරිස ම විසින් කඳුකරයේ බංකර්, බලකොටු සහ ගුවන් යානා ගාල් කළ හැකි ස්ථාන දහස් ගණනක් ඉදි කරන ලද අතර, විශේෂයෙන් පුහුණු වූ සහ සන්නද්ධ කඳුකර යුද ඒකක ඇතුළු ප්‍රබල බලකායන් ඒවායේ ආරක්ෂාවට යොදවන ලදි. උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්ත සඳහා (ආරක්ෂක කර්මාන්ත ඇතුළුව) උපරිම ආරක්ෂාවක් ලබාදීම සඳහා ඒවා මධ්‍යම කඳුකරයේ පිහිටා තිබිය යුතු ය.

සිව්වන ආරක්ෂක මාර්ගය වනුයේ අපගේ මිනිසුන් පුරාණ කාලයේ දී ආක්‍රමණිකයන් සමඟ සටන් කිරීමට භාවිතා කරන ලද ගරිල්ලා සටන් වන අතර, විශාල වශයෙන් බලය වර්ධනය කිරිමට එය ක්‍රියා කරයි. සතුරා විසින් අල්ලාගෙන සිටින ඕනෑ ම ප්‍රදේශයක් මුළුමනින් ම මෙම යුද පිටිය බවට පත් වන අතර, නිත්‍ය නොවන බලකා විසින් සතුරු හමුදාවන් වට කරනු ලබමින් වෙහෙසට පත් කරනු ලබන අතර ඔවුන් විසින් ම තෝරාගත් භූමියක අවසාන, තීරණාත්මක සටන සිදු වනු ඇත.

එ බැවින් බාහිර බලවේගවලින් ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීමට දෙපාර්ශවයක් සිටිය යුතු ය. ශක්තිමත් සාම්ප්‍රදායික ආරක්ෂාවක් හා ඒකාබද්ධව සතුරු සැපයුම්වලට එල්ල කරනු ලබන ගරිල්ලා ප්‍රහාර තිබිය යුතු ය. මෙම අසමමිතික යුද්ධයේ දි නිත්‍ය නොවන හමුදාවන්ට සහය දැක්වීම සඳහා ජනතාව බලමුළු ගැන්වීම ද අවශ්‍ය වේ.

6. සමාන කාර්යයන් ඉටු කිරීම

ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව යන දෙ අංශයේ ම යුද හමුදාවේ කාර්යභාරයට සමාන කාර්යභාරයක් ඉටු කරන භට පිරිස් සිටින අතර එකී හමුදාවන්ට ඔවුන් අවශ්‍ය වන්නේ ඔවුන්ගේ කඳවුරු ආරක්ෂා කිරීමට සහ විශේෂ යාත්‍රා බලසණ්ඩය, දිය මත සහ ගොඩබිම සටන් කරනා සමුද්‍ර කමාන්ඩෝ භටයින් සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විශේෂ බලකායේ වින්ග් බලකාය වැනි විශේෂිත බලකා සඳහා පමණි. යුධ හමුදාවේ ගුවන් යානා නාශක රෙජිමේන්තු පවා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආරක්ෂක වින්ග් බලකාය මගින් ප්‍රතිස්ථාපනය කර ඇති අතර බොහෝ නවීන හමුදා විසින් ජංගම ගුවන් යානා නාශක කාල තුවක්කු අවි ඔවුන්ගේ භට පිරිස් සමඟ යොදවා ඇත. මෙම ප්‍රවණතාව ආපසු හැරවිය යුතු අතර, උපකරණ වැඩි දියුණු කර ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අමතර ගොඩබිම සටන් කරනා භට පිරිස් යුද හමුදාවන්ට මාරු කර යැවිය යුතු ය.

7. අතුරු හමුදාව

ශ්‍රී ලංකාවේ සක්‍රිය සේවයෙහි නිරත හමුදා සාමාජිකයන් සහ උප සේවයෙහි එම සාමාජිකයන් අතර අනුපාතය මගින් (3.5:1) බටහිර/පොදුරාජ්‍ය මණ්ඩලීය ආකෘතිය පිළිබිඹු වේ. මෙම සංඛාලේඛන, ඇතැම් විට, ප්‍රතිවර්ත විය යුතු ය. ස්විට්සර්ලන්තය හෝ සිංගප්පූරුව වැනි බොහෝ රටවල් විසින් පැරණි පෘෂියන් ආකෘතිය අනුගමනය කරනු ලබන අතර, එහි දී කුඩා නිලධාරීන් සංඛ්‍යාවක් සහ අධිකාර නොලත් නිලධාරි සංඛාවක් සහිතව, විශාල උප සේවා හමුදා සාමාජිකයන් සංඛ්‍යාවකගේ සේවය ලබා

ගත හැකි අතර ඔවුන්ගෙන් කුඩා සංඛ්‍යාවක් පමණක් සාම කාලය තුළ යම් වේලාවක සේවය කරයි. එ නමුත් සෑම කණ්ඩායමක් ම පුහුණුවීම් සහ යාවත්කාලීන කිරීම් සඳහා වරින් වර කැඳවනු ලැබේ.

8. මහජන අතුරු හමුදාව

සන්නද්ධ හමුදාවන් තුලනය කිරීමේ අවශ්‍යතාව මෙන් ම හදිසි අවස්ථා සඳහා විශාල අතුරු හමුදාවක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව සපුරා ගත හැක්කේ ඔවුන් අවම උප හමුදාවක් සහිත ස්ථිර ඒකක ලෙස තබාගැනීමෙන් සහ ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සහ ප්‍රගතිශීලී ලක්ෂණ සඳහා නිත්‍ය කණ්ඩායමක් වටා ගොඩනැගුණු විශාල ජනතා අතුරු හමුදාවක් නිර්මාණය කිරීමෙනි. මෙම කණ්ඩායම ත්‍රිවිධ හමුදාව තරම් විශාල නොවිය යුතු නමුත් කුමන්ත්‍රණයක් හෝ දේශද්‍රෝහී ක්‍රියාවකට බාධාවක් ලෙස ක්‍රියා කිරීමට හැකි තරම් විශාල විය යුතු ය. එයට අගනුවර සහ උපාය මාර්ගික වශයෙන් වැදගත් ස්ථාන (වරාය සහ ගුවන් තොටුපොළ) සඳහා ආරක්ෂාව ලබාදෙන හමුදාවෙහි විශාල කොටසක් ලබා දිය හැකි විය යුතු ය.

ජනතා හමුදාව ඔවුන්ගේ නිවෙස් ප්‍රදේශවල භෞමික ආරක්ෂක ඒකක ලෙස යෙදවිය හැකි අතර උප නාවික සහ ගුවන් හමුදා ඒකක ක්‍රියාත්මක කළ හැකි ය. කුඩා ප්‍රහාරක බෝට්ටු සහ ට්‍රෝලර් යාත්‍රා භාවිතා කරමින් නාවික හමුදාවන් ලෙස සහ තම මව්බිමෙහි සටන් කරනු ලබන ඕනෑ ම ගරිල්ලා හමුදාවකට අවශ්‍ය සංඛ්‍යාව ඔවුන් විසින් සපයනු ඇත.

මෙම අතුරු හමුදා, සේවයේ යෙදී සිටිය දී ම රැකියාවක් සොයා ගැනීම ද කළ යුතු අතර ඒ සඳහා වෘත්තීය පුහුණුව හෝ උසස් අධ්‍යාපනයක් හෝ ලබා ගත හැකි ය. නිදසුනක් වශයෙන්, නාවික උප හමුදා විසින්, ධීවරයින්, වෙළෙඳ නාවිකයින් හෝ සංචාරක බෝට්ටු ක්‍රියාකරුවන් ලෙස රැකියා සොයා ගත හැකි අතර - නවීකරණය කරන ලද ධීවර යාත්‍රාවක් වැඩි දියුණුකර සැළැකිය යුතු මට්ටමේ වෙළෙඳ යාත්‍රාවක් ගොඩ නැගීම ඉමහත්

උපකාරයක් වනු ඇත. නිලධාරි කැඩෙට්වරුන් ඇතුළු සන්නද්ධ හමුදාවන් මහජන හමුදාව වෙතින් බඳවා ගනු ඇති අතර එවිට නිත්‍ය හමුදා සම්පූර්ණයෙන් ම මෙම ආයතනයෙන් ආරම්භ වනු ඇත.

9. උපකරණ ප්‍රසම්පාදනය

හමුදාවෙහි ප්‍රසම්පාදනය හා සම්බන්ධ රහස්‍යභාවය ඉවත්කිරීම, නිසි උනන්දුවක් හෝ නිසි පාර්ලිමේන්තු අධීක්ෂණයක් යටතට එය ගෙන ඒම මගින් බොහෝවිට ප්‍රසම්පාදන වියදම් අඩකින් අඩු කර දූෂණය දුරලනු ලැබිම කළ හැකි ය. අමතර කොටස් සහ පතොරම් සැපයීම සම්බන්ධයෙන් ඇතැම් විට සම්බාධක පැනවිය හැකි, එසේත් නැතිනම් එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තියට යම් තරමකට අනුකූල වීම අවශ්‍ය වන ඇමරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය වැනි රටවලින් ආයුධ සහ උපකරණ ලබා නොගැනීමට ක්‍රියාකළ යුතුව ඇත.

විකල්ප සැපයුම්කරුවන් විසින් උපකරණවල ජීව කාලය හා සම්බන්ධයෙන් බෙහෙවින් ලාභදායී මෙන් ම වඩා සකසුරුවම් සහිත අනාවරණයන් කළ හැකි ය. බටහිරට වඩා බෙහෙවින් සකසුරුවම් උපකරණ සපයා තිබියදීත්, රුසියාව සැපයුම්කරුවකු ලෙස බොහෝදුරට නො සළකා හැර ඇත. චීනය ප්‍රධාන විකල්පය ලෙස පවතී. කෙසේ වෙතත්, තනි සැපයුම්කරුවකු මත අධික ලෙස රඳා පැවතීම වැළැක්විය යුතු ය.

10. ආරක්ෂක ස්වයං විශ්වාසය

ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා වන දිගුකාලීන අපේක්ෂාවන් සඳහා අවහිරයක් හෝ සම්බාධක පැනවීමක් හෝ සිදුවිමේ දී ආරක්ෂක ප්‍රයත්නයක් පවත්වා ගැනීමට ප්‍රමාණවත් හමුදාමය කාර්ය මට්ටමක් රට සතුව තිබීම අවශ්‍ය වේ.

දශක තුනකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවන්ට විශාල යුද උපකරණ ප්‍රමාණයක් අවශ්‍ය වුව ද, යුද හා නාවික උපකරණ තැනීමට හෝ ප්‍රතිනිර්මාණය කිරීමට ඉංජිනේරුවන් තම හැකියාවන් පෙන්වමින් සිටිය ද,ඒවා ආනයනය කිරීමෙන් වැළකී සිටීමට නොහැකි විය.

සිවිල් ගැටුම අවසන් වීමෙන් පසු කාලයේ දී යම් ප්‍රගතියක් ලබා ඇත. මිනිසුන් රහිත ඩ්‍රෝන යානයක් සැලසුම් කිරීම සහ තැනීම සඳහා ගුවන් හමුදාව විද්‍යාත්මක ආයතනය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇති අතර කෙටි දුර මිසයිලයක් නිර්මානය කරමින් සිටී. හමුදාව විසින් පිරිසැකසීම සිදු කරන හෝ එකලස් කරන වාහන සංඛ්‍යාව වැඩි කරනු ලැබ ඇත.

කෙසේ වෙතත්, ආරක්ෂක ස්වයං-විශ්වාසයක් සාක්ෂාත් කරගැනීම සඳහා වූ සාමූහික උත්සාහයක් මගින් දිගුකාලීන වශයෙන් විදේශ රටවලින් අයුධ ලබා ගැනීමෙන් මිදී ස්වාධීන මට්ටමක් ලබාදිය හැකි අතර, එ මගින් ඒ සඳහා වැය වෙන විදේශ විනිමය පිරිවැය, සැළැකිය යුතු ලෙස අඩු කරනු ලැබීමේ ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

අවි නිෂ්පාදන අංශයේ දියුණුව කාර්මිකකරණයේ සහ තාක්ෂණික දියුණුවේ පුළුල් ක්‍රියාවලියට සමගාමීව සිදුවිය යුතු ය. ඊළාම් යුද්ධය ජයග්‍රහණය කිරීම සඳහා උපකාරී වූ උපකරණ තෝරාගෙන බලපත්‍රයක් යටතේ ඒ හා සමාන උපකරණ සෑදිම හෝ ගොඩනැගිම ආරම්භයක් ලබා දිය හැකි ක්‍රමයක් වන අතර ධාරිතාවය ගොඩනැගීම සඳහා දේශීය නඩත්තු හා අළුත්වැඩියා ක්‍රියාවලියක් තිබිය යුතු ය.

ගවේෂණය කළ යුතු තවත් මාර්ගයක් වන්නේ, එ තරම් කාර්මික වශයෙන් දියුණු වී නොමැති, උදාහරණයක් ලෙස ගත් විට කියුබාව, වෙනිසියුලාව, බොලිවියාව සහ ලාඕසය වැනි තුන්වන ලෝකයේ ජාතීන් සමඟ, සුදුසු ආයුධ පද්ධති සහ වෙනත් උපකරණ නිර්මාණය කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමයි. තරමක් විශාල හා දියුණු ආර්ථිකයන් විසින් පවා ඊට සමාන පියවර අනුගමනය කරනු ලැබේ

නීතිය හා සාමය

1. අධිකරණය

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය මන්දගාමී සහ දූෂිත වන අතර නීතිය ක්‍රියාත්මක කිරීම සැළැකිය යුතු ප්‍රමාදයකට යටත් වන

අතර ඕනෑ ම අවස්ථාවක නඩු මිලියනයක් පමණ විභාග වෙමින් පවතී. නීති පද්ධතිය තුළ ක්‍රියාත්මක වන විනිසුරුවරුන්ගෙන් සහ නීතිඥවරුන්ගෙන් ස්වායත්තව නීතියට ජීවයක් නොමැති අතර වෘත්තීය ප්‍රමිතීන්හි පිරිහීම යුක්තිය පසිඳලීමේ ක්‍රමවේදය විනාශ කරනා පිළිලයක් බවට පත් වී තිබේ. අප විසින් සියලු ම අධිකරණ නිලධාරීන් සඳහා දැඩි ලෙස බලාත්මක කළ හැකි ආචාර ධර්ම පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, 1988 වර්ෂයේ පනවන ලද ශ්‍රේෂ්ඨාධිකරණ (නීතිඥවරයාගේ හැසිරීම සහ ආචාර විධි) රීති ක්‍රියාත්මක කිරීමට දැඩි ක්‍රියාමාර්ග ගත යුතු ය. නීති ඔම්බුඩ්ස්මන්වරයකු පත්කිරීම ඇතුළුව වසරකට වැඩි කාලයක් ඇදී යන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අප විසින් ක්‍රියා පටිපාටි සකස් කළ යුතු වේ.

2. දණ්ඩ නීති සංග්‍රහය

බ්‍රිතාන්‍ය යටත්විජිත බලධාරීන් විසින් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය පනවනු ලැබූ අතර එය සුළු සංශෝධන සහිතව වසර 240ක් තිස්සේ පවතී. අප විසින් එය 21 වැනි සියවසට ගැළපෙන පරිදි සම්පූර්ණයෙන් ම සංශෝධනය කළ යුතුව ඇත. විශේෂයෙන් ම, අපරාධ සඳහා පළිගැනීමක් ලෙස දඬුවම පැමිණවීම යන සංකල්පය මගින් ප්‍රතිස්ථාපන යුක්තිය සඳහා මඟ පෑදිය යුතු අතර, දඬුවම අපරාධ සිදුවීම වළක්වන නිවාරකයන් ලෙස පමණක් භාවිතා කළ යුතු වේ. දණ්ඩන විද්‍යාව පිළිබඳ වැඩිදුර පර්යේෂණ සිදුකිරීම අවශ්‍ය වන අතර දණ්ඩ නීති පද්ධතිය ඒ අනුව ප්‍රතිසංස්කරණය කළ යුතු ය.

3. විශෝධනය හා පුරුත්ථාපනය

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ජනගහනය 22,000ක් පමණ වන අතර, සෑම පුද්ගලයන් 1000කට ම එක් සිරකරුවකු බැගින් දක්නට ලැබේ. බන්ධනාගාරවල ධාරිතාව 12,000ක් වන අතර එසේ හෙයින් බන්ධනාගාර තුළ රැඳවුම් අනුපාතය 185%ක් පමණ වේ. සිරකරුවන්ගෙන් 60% කට ආසන්න සංඛ්‍යාවක් රිමාන්ඩ් සිරකරුවන් වන බැවින් අධිකරණ ක්‍රියාවලිය වේගවත් කිරීම මෙම ජනගහනය විශාල ලෙස අඩුකිරීමට උපකාරී වේ. රිමාන්ඩ්

බන්ධනාගාර පමණක් කොළඹ තිබිය යුතු වේ .

පරිපාලනයේ නවීකරණයක් හා ප්‍රතිසංස්කරණයක් සිදුවිය යුතු වේ. සිරමැදිරි වෙන් කිරීම, රෝහල් ගත කිරීම යනාදීය සම්බන්ධයෙන් කිසිදු මැදිහත්වීමක් හෝ දූෂණයක් සිදු නොවිය යුතු ය. බන්ධනාගාරගත ජනතාවට ප්‍රමාණවත් පහසුකම් සැලසිය යුතු ය. පොලිසිය හෝ හමුදාව අනවශ්‍ය ලෙස ඇතුළුවීමට ඉඩ නො තැබීම සඳහා බන්ධනාගාර කාර්ය මණ්ඩලය වැඩි කළ යුතු ය.

හැකිතාක් දුරට, අපරාධකරුවන් සංඛ්‍යාව වැඩි කරනු ලබන යටත්විජිත යුගයට අයත් සංවෘත බන්ධනාගාර වෙනුවට "විවෘත බන්ධනාගාර" ඇති කළ යුතු අතර මෙවැනි ස්ථානවල ගේට්ටු, අගුල් හෝ නිල ඇඳුම් නොමැති අතර එහි දී සිරකරුවන්ට නගරයට යාමට, මුදල් ඉපැයීම සඳහා වැඩ කිරීමට හෝ වැඩකිරීම වෙනුවට ඉගෙනීමට තෝරා ගැනිමට හැකියාව ඇත. සිරකරුවන්හට නැවත අධ්‍යාපනය ලබාදීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සිදු කළ යුතු ය. මේ ආකාරයේ ස්ථාන සම්බන්ධයෙන් මෙතෙක් ලද අත්දැකීම සතුටුදායක වේ.

4. නීතිය ක්‍රියාත්මක කිරීම

යටත්විජිත රාජ්‍යයේ මර්දනකාරී ආයතනයක් ලෙස ආරම්භ කරන ලද ශ්‍රී ලංකා පොලිසිය සතුව ඇත්තේ කීර්තිමත් නොවන නමක් වන අතර එය තුළ පරිවර්තනයක් සිදු කළ යුතුව ඇත. පොලිසිය සැළැකිය යුත්තේ අතුරු හමුදාවකට වඩා මහජන සාමය ආරක්ෂා කිරීමේ මෙවලමක් ලෙස ය. පළමු පියවරක් වශයෙන්, සෑම පොලිස් ස්ථානයක ම ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා පුරවැසි කමිටු පිහිටුවා ගත යුතු ය. සත්‍ය වශයෙන් ම ගිනි අවි පිළිබඳ ගැටලුව පරික්ෂණයට භාජනය කළ යුතු ය.

තමන් වෙත රාජකාරි පවරනු ලබන අසල්වැසි ප්‍රදේශය සමඟ දිගුකාලීන පදනමක් මත විශේෂ සබඳතා ගොඩනගා ගන්නා ප්‍රජා පොලිසිය වෙත අවධාරණය යොමු කළ යුතු ය. බ්‍රිතාන්‍ය කොට්ඨාශ පොලිස් බලකායන්ට සමානව දිස්ත්‍රික් මට්ටමින් වෙන ම ප්‍රජා පාදක පොලිස් බලකායන් නිර්මාණය කිරීම, මෙම

නැවත ස්ථානගත කිරීමේ මූලික හරය විය හැකි ය. එහි නාමය (උදාහරණයක් වශයෙන් "සාමසාධක"/ "සමාරක්ෂක"), වෙනස් විය යුතු අතර "පොලිසිය" යන්නෙහි සෘණාත්මක අර්ථයන් ඉවත් කර එය වඩාත් ජනතා හිතකාමී බවට පත් කරලීම සිදු විය යුතු ය.

5. සමාජ ප්‍රතිසංස්කරණ

සිරගත කිරීම ඇතුළු දඬුවම් සමාජ ගැටලුවලට විසඳුම නොවේ. ප්‍රජා පොලිස් සේවය සමඟින්, අප විසින් ප්‍රජාවෙහි හා අවදානමට ලක් වූ පුද්ගලයින්ගේ ගැටලු සමනය කිරීම සඳහා රාජ්‍ය සේවයේ යෙදී සිටින සමාජ සේවකයන් යෙදවිය යුතු ය. විශේෂයෙන්, සාපරාධී හැසිරීම් සඳහා නැඹුරුතාවක් සහිත මානසික රෝගීන් හෝ ආබාධිතයන් කල් තියා හඳුනාගැනීම සහ ප්‍රතිකාර ලබාදීම මගින් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු ලිහිල් කළ හැකි ය.

වරදකරුවන් වූ අයගේ දණ්ඩනය නිම වූ පසු ඔවුන් විසින් නැවත අපරාධ සිදුකිරීම වැළැක්වීම සඳහා ඔවුන් සමඟ සම්බන්ධව කටයුතු කිරිමට සහ පොදු සමා කාල නිලධාරීන් ලෙස කටයුතු කිරිමට සමාජ සේවකයන් සේවයේ යෙදවිය යුතු ය. කෙසේ වෙතත්, දිගුකාලීන විසඳුම් ලබා ගත හැක්කේ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් කෙරෙහි අවධාරණය කරමින්, ජනතාව නඟා සිටුවීම අරමුණු කරගත් සමාජ ප්‍රතිසංස්කරණවලින් පමණකි.

යහපාලන සහ පරිපාලන ප්‍රතිපත්තිය

හැඳින්වීම

රාජ්‍යයක ශිෂ්ටත්වය ප්‍රකාශ කෙරෙන මූලික ම ආකාරය වන්නේ එහි පාලනය සිදු කරනු ලබන යහපත් ස්වභාවය ය. පාලනයේ යහපත් ස්වභාවය (යහපාලනය) තුළින් රජයක් විසින් රාජ්‍ය කටයුතු මෙහෙයවන වෘත්තිමය ස්වභාවය ද මහජන සම්පත් කළමනාකරණය කරන සාධාරණ ස්වභාවය ද ජනතාවගේ මූලික හිමිකම් තහවුරු කෙරෙන උසස් ස්වභාවය ද සහතික කෙරෙයි. මේ උදෙසා රාජ්‍ය පාලනය අත්‍යවශ්‍යයෙන් ම අවභාවිතයෙන් සහ දූෂණයෙන් තොර, එ මෙන් ම, නීතියේ ආධිපත්‍යයට නිසි තැන ලබාදෙන පරිසරයක් නිර්මාණය වී තිබිය යුතු ය. පාලනය යන්නට තීරණ ගැනීමේ ක්‍රියාවලිය ද එම තීරණ ක්‍රියාත්මක කරන ක්‍රියාවලිය ද අයත් වෙයි. මෙම හඳුනාගැනීම තුළ යහපාලනය ජාතික, ප්‍රාදේශීය සහ ආයතනික පාලනය තුළින් ප්‍රකාශ විය යුත්තේ ය.

පාලනයේ යහපත් බව විසින් රාජ්‍යයක් නිරවුල් කරනු ලබන අතර ඒ තුළින් එහි සමාජ - ආර්ථික ප්‍රගමනය සිදුවෙයි. මේ තුළින් සමාජයේ සාමකාමී බව ද විවිධ කණ්ඩායම් අතර සහජීවනය ද තහවුරු කෙරෙයි. මෙයට පටහැනි ලෙසින් පාලනය සිදු කෙරෙන්නේ නම් නිරීක්ෂණය කළ හැක්කේ

ව්‍යාකූලත්වයෙන් පීඩා විඳින, විවිධ වූ අනන්‍යතා කණ්ඩායම් අතර ගැටුම් ඇතිවෙන, සමාජ - ආර්ථික වශයෙන් බිඳවැටෙන රටකි. එහෙයින් යහපාලනය යනු රාජ්‍යයේ සහ ජනතාවගේ පැවැත්ම සහ අභිවෘද්ධිය වෙනුවෙන් අත්පත් කරගත යුතු අනිවාර්යය තත්ත්වයකි.

යහපාලන අවශ්‍යතාව සාක්ෂාත් කරගැනීම උදෙසා රාජ්‍ය පාලනයේ ජනතා සහභාගීත්වය තහවුරු කළ යුතු අතර පරිපාලනයේ විශිෂ්ට බව ද සාක්ෂාත් කරගත යුත්තේ ය. එ මෙන් ම, පාලකයා (දේශපාලනඥයා) අනෙකුත් මිනිසුන් හා සමාන ම කෙනෙකුන් බවට ද පත් කළ යුත්තේ ය. මෙය සිදු කළ හැක්කේ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමෙනි. ඒ අරභයා අධිකරණයේ ස්වාධීනත්වය ද නීතිය සහ සාමය ක්‍රියාවට නැංවීමේ අපක්ෂපාතී බව ද සහතික කළ යුතු ය.

ගැටලු

ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි ජනතා අභිලාෂයන් මෙන් ම වඩා හොඳ ජීවන තත්ත්වයක් උදෙසා කැපැවුණු නූතන රාජ්‍යක් ගොඩ නගා ගැනීමට අප අසමත් වී තිබේ. සමාජීය ව්‍යාපාර විසින් විටින් විට ඇති කළ බලපෑම හේතුවෙන් සිදු කළ ප්‍රතිසංස්කරණ කීපයක් හැර, ශ්‍රී ලංකා රාජ්‍ය සහ එහි ව්‍යුහය යටත්විජිත වැවිලි ව්‍යාපාර හිමි සුදු පාලකයාගේ උරුමය ලෙසින් තවමත් පවතින පාලන ක්‍රමයක් ලෙස පෙනී යයි. වත්මන් රාජ්‍ය කැප වී සිටින්නේ කොම්ප්‍රදෝරු ව්‍යාපාරික පැලැන්තිය සහ මූල්‍ය ධනපතියන්ගෙන් සැදුම්ලත් සුළුතර ධනේශ්වර ප්‍රජාවගේ උවමනා එපාකම් පිරිමසිමින් කර්මාන්ත ව්‍යාප්තිය මෙන් ම වැඩ කරන පංතිය මර්දනය කරීම උදෙසා ය.

නව ලිබරල්වාදී යුගයේ දී, විධායක ජනාධිපතිවරයා අතට බලය වඩාත් සංකේන්ද්‍රණය වීම, මැතිවරණ ව්‍යාපාරයට සුවිශාල මුදල් කන්දරාවක් පොම්ප කරමින් දූෂණය ආයතනගත කිරීමට හේතු වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය බරපතල වෙනස්කම්වලට ගොදුරු විය. මෙ කී පරස්පරතාවල විපාක වශයෙන් අනන්‍යතාව පාදක යුද

ගැටුම්, පසුව ජාතිවාදී ජන සංහාරවලටත් එයින් මතු දිගු කලක් ඇදී ගිය බෙදුම්වාදී යුද්ධයක් ද ශ්‍රී ලංකාවට විඳ දරාගැනීමට සිදුවිය. එම යුද්ධය හමුදා බලයෙන් මැඩ පැවැත්වුව ද ඊට පාදක වූ ආතතිමය විරසකය තවමත් විටින් විට හිස ඔසවන ආකාරය දිස් වේ. ඒ අතර ම, වත්මන් රාජ්‍ය පරිපාලන ක්‍රමය, අධිපතිවාදී දේශපාලන බලවේගවල විචල්‍යතා අනුව නිතර සසලවන, එ නිසා ම දේශපාලන ස්ථාවරත්වය අවදානමට හෙළන, ඒ හේතුවෙන් නිෂ්ඵල කෙටිකාලීන පැලැස්තර විසඳුම්වලට යොමුවීමට ආණ්ඩුවලට බල කෙරෙන ආකාරයේ ක්‍රමයකි.

එක්සත් රටක් ගොඩනැගීමටත්, සංවර්ධනයේ මූලික කාර්යයන් ඉටු කිරීමටත් මෙ කී පරස්පරතා විසඳාගැනීම ඉතා වැදගත් වේ. එ බැවින්, විධායක ජනාධිපති ක්‍රමය, මැතිවරණ ක්‍රමය, රාජ්‍ය පරිපාලනය සහ මධ්‍යම ආණ්ඩුව සහ පළාත් අතර බලය විමධ්‍යගත කිරීම යනාදී ප්‍රතිසංස්කරණ සිදු නො කර, රටේ කිසිදු යථාර්ථවාදී ප්‍රගතියක් සාක්ෂාත් කරගත නො හැකි ය. ආර්ථික ඌන සංවර්ධනයට සහ සමාජීය හර පද්ධතිය නායයෑමට යෑමට බලපා ඇත්තේ අවිචාරවත් ජාතිවාදය, අල්ලස හා දූෂණයයි. එ බැවින් මෙය ශ්‍රී ලංකා රාජ්‍යය යළි ගොඩනැගීමට ඇති හොඳ ම අවස්ථාවයි.

උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන යහපාලන සහ පරිපාලන ප්‍රතිපත්තියේ මූලධර්ම වනුයේ,

- **ජාතික ආරක්ෂාව සහ භෞමික අඛණ්ඩාව සුරැකීම**
- **ජන කණ්ඩායම් අතර සහයෝගිතාව සහ ජාතික සමගිය සුරැකීම**
- **සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම**
- **රාජ්‍ය සේවක ඵලදායිතාව ඉහළ නැංවීම උදෙසා ආර්ථික සහ තාක්ෂණික සංවර්ධනය ප්‍රවර්ධනය**
- **සමාජ-ආර්ථික අයිතීන් ප්‍රවර්ධනය කරමින්, සෑම ශ්‍රී ලාංකිකයෙකුගේ ම ජීවන තත්ත්වය ඉහළ නැංවීම**

- **රටේ ස්වාභාවික පරිසරය, පොදු සංස්කෘතික හා පුරා විද්‍යාත්මක උරුමය සුරැකීම**

ඉදිරිමග

1. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම

1978 දී හඳුන්වා දුන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු යැයි දැඩි මහජන මතයක් ඉකුත් වසර කීපය තුළ ගොඩනැගී ඇත. එ බැවින් එම ආයතනය අහෝසි කළ යුතු ය. ශ්‍රී ලංකා ජනරජය පාර්ලිමේන්තු ව්‍යවස්ථාදායකයෙන් සහ ස්වාධීන අධිකරණයකින් සමන්විත විය යුතු ය. අගමැතිවරයා ප්‍රධානත්වය දරන කැබිනට් ඇමති මණ්ඩලයකට විධායක බලතල ලබා දිය යුතු ය. රාජ්‍ය නායකයා පාර්ලිමේන්තුවෙන් තෝරා පත් කළ යුතු අතර අගමැතිවරයාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

2. මැතිවරණ ප්‍රතිසංස්කරණ

වත්මන් සමානුපාතික නියෝජන ක්‍රමය රටේ දේශපාලනික සංවර්ධනය කෙරෙහි දැඩි බාධාකාරී බලපෑමක් කර ඇති බැවින් එය සංශෝධනය විය යුතු ය. සැබෑ සංවර්ධනයක් ගොඩනැගීමටත් ශ්‍රී ලංකාවේ සෑම ජනතාවක් ම සමගියෙන් ජීවත්වීමට නම් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ ක්‍රමයක් අවශ්‍ය වේ. ඒ සඳහා මන්ත්‍රණ සභා දෙකකින් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවක් පැවැතිය යුතු අතර එහි ඉහළ හා පහළ මන්ත්‍රී මණ්ඩල දෙකට ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් සේවය කළ හැකි විය යුතු ය. මේ සියළුම මන්ත්‍රීවරු මහජන ඡන්දයෙන් තෝරා පත් විය යතු අතර මහ මැතිවරණයේ දී එකිනෙක පක්ෂ ලබාගන්නා ඡන්ද සංඛ්‍යාව මත ආසන හිමි කර ගත යුතු ය. පළමු සභාවේ ආසනවලින් සියයට 50ක් ඡන්ද කොට්ඨාශ පදනමින් සහ සියයට 50 ක් සමානුපාතික නියෝජනයෙන් තෝරාගත යුතු ය.

3. කැබිනට් මණ්ඩලයේ සංයුතිය සහ ව්‍යුහය

අති විශාල කැබිනට් මන්ඩලයක් නඩත්තු කිරීමට ආණ්ඩුවේ මුදල් නාස්තිවීම, සංකීර්ණතා ඇතිවීම සහ ප්‍රතිපත්ති

සම්බන්ධීකරණය අකාර්යක්ෂම කරයි. අමාත්‍යාංශ අතර ක්‍රියාකාරකම් විභේදනය සහ එකම විෂයය දෙතැනක පැවතීම මේ සංකීර්ණතාව වැඩි කරයි. එ බැවින් කැබිනට් ඇමති තනතුරු 30කට සීමා කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කළ යුතු ය. සැබෑ ලෙසින් ම අන්තර් ආංශික සහ අන්තඃආංශික සම්බන්ධීකරණ සිද්ධාන්තය මගින් කැබිනට් ව්‍යුහය පාලනය විය යුතු ය. උදාහරණයක් වශයෙන් කෘෂිකර්ම භෝග, ඉඩම් සහ වාරිමාර්ග ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග එක් අමාත්‍යාංශයකින් පාලනය විය යුතු ය. කර්මාන්ත සහ වෙළෙඳ කටයුතු වැනි එකිනෙක බද්ධ වූ අංශ එක් අමාත්‍යාංශයක් මගින් පාලනය විය යුතු ය.

කැබිනට් මණ්ඩලය වෘත්තීයමය ප්‍රාගුණ්‍යයකින් හෙබි අයගෙන් සමන්විත අය වුවත්, සෑම සතියක ම පැවැත්වෙන කැබිනට් රැස්වීමෙන් මතුවන ක්‍රියාකාරකම් රාශිය ඉටුකිරීම අපහසු වනු ඇත. එබැවින් සම්බන්ධීකාරක සහාය සඳහා කැබිනට් අනු කමිටු පිහිටුවිය යුතු ය. ඒවා කැබිනට් ඇමතිවරයාගේ සභාපතිත්වයෙන් රැස්වී අදාළ නියෝජ්‍ය ඇමතිවරුන්ට අර්ථවත් කාර්යයක් ඉටු කිරීමට හැකිවන පරිදි මෙහෙයවිය යුතු ය.

4. ජාතික ආර්ථික උපදේශක සභාව

කැබිනට් අමාත්‍යවරුන්ට උපදෙස් සැපයීම සඳහා ජාතික ආර්ථික උපදේශක සභාවක් ස්ථාපිත කළ යුතු ය. ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර, සමූපකාර, වෘත්තීය සමිති, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ප්‍රධාන වාණිජ මණ්ඩල හා කර්මාන්ත යනාදී ක්ෂේත්‍රවල නියෝජනයක් මෙයට තිබිය යුතු ය. මෙම උපදේශක සභාවට සුදුසුකම් ලත් තාක්ෂණ ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය.

5. උතුර සහ නැගෙනහිරට දේශපාලනික විසඳුමක් ලබාදීම

බෙදුම්වාදී යුද්ධය නිමාවී දශකයක් පසුවී ඇතත් උතුර හා නැගෙනහිර ගැටලුවට පාදක වූ මුල් බැස ගිය හේතු තවමත් නොවිසඳී පවතී. සංවර්ධනයට අවශ්‍ය පූර්ව අවශ්‍යතාවක්

පමණක් නොව රටේ ප්‍රජාතන්ත්‍රවාදය බලගැන්වීම සහ කලාපීය ස්ථාවරත්වය වඩා ස්ථිරව ස්ථාපිත කරලීම උදෙසා එකී ගැටලු නිරාකරණය වෙනුවෙන් සැකසූ දේශපාලනික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

- මෙහි ප්‍රථම පියවර වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් හඳුන්වා දුන් සමගාමී ලැයිස්තුව අහෝසිකර, බලය බෙදාදීමේ සිද්ධාන්තයට අගතියක් නොවන පරිද්දෙන් එකී බලතල පළාත් සහ මධ්‍යම ආණ්ඩුව අතර නිරවුල්ව බෙදා දිය යුතු ය.
- රජයේ ඉඩම් භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකැසීම අරභයා, ජාතික ඉඩම් කොමිසමක් පිහිටුවිය යුතු ය. සියළු පළාත් සභා මන්ත්‍රීවරු එම කොමිසමේ නියෝජිතයන් විය යුතු ය.
- සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සහ මධ්‍යම ආණ්ඩුව සහ දුෂ්කර පළාත් අතර ගැටලු නිරාකරණයෙහි ලා අගමැතිවරයා, කැබිනට් අමාත්‍යවරු සහ පළාත් මහ ඇමතිවරුන්ගෙන් සැදුම්ලත් ජාතික සැලසුම් කොමිසමක් පිහිටුවිය යුතු ය.
- පළාත් සභා වෙත මුල්‍ය ප්‍රතිපාදන විභජනය කිරීමේ දී, ඒවායේ අවශ්‍යතාව, ආදායම් උත්පාදනය සහ මූල්‍ය කොමිසමක නිර්දේශ මත සිදුවිය යුතු ය. මෙකී පළාත් සභා මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය, ආණ්ඩුවේ අයවැය ලේඛනයේ පැහැදිළිව සටහන් විය යුතු අතර ආණ්ඩුව විසින් එම මුදල් රඳවා ගැනීම නො කළ යුතු ය.

6. යහපාලනය

අල්ලස හා දූෂණය තුරන් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනයේ දී සුදුසුකම්ලත් වෘත්තිකයන්ගේ සහභාගිත්වය සහ රාජ්‍ය පාලනයේ

දී, පාරදෘශ්‍යතාව පැවැතීම, යහපාලනය වශයෙන් හැඳින්වේ. රාජ්‍ය පාලනයේ සියලු ස්ථර මට්ටම්වල දී අල්ලස හා දූෂණය පිටුදැකීමට ජාතික ව්‍යාපාරයක් දියත් කළ යුතු අතර තරාතිරම නො බලා වැරදිකරුවන්ට දැඩි දඬුවම් දිය යුතු ය.

7. විද්‍යාත්මක සහ ආර්ථික සංවර්ධනය

සමාජීය ප්‍රගමනය සහ ජන ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා ආර්ථික සහ විද්‍යාත්මක සංවර්ධනයත්, සේවකයින්ගේ ඵලදායිතාව ඉහළ නැංවීමත් පැවතිය යුතු පූර්ව අවශ්‍යතා වේ. එ බැවින් එකී මූලික සිද්ධාන්ත, රාජ්‍යයේ අරමුණු අතරට එක් කරමින් ඒ බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හුවා දැක්විය යුතු ය.

8. සමාජ-ආර්ථික අයිතීන්

ශ්‍රී ලංකාවේ දැනට දක්නට ලැබෙන සමාජීය දර්ශක පිටුපස සමාජීය ව්‍යාපාර විසින් ගෙන ගිය දිගුකාලීන අරගලයක ප්‍රතිඵල සැඟ වී ඇත. ශ්‍රී ලංකා සමස්ත ජනතාවගේ පොදු ගුණධර්ම සහ සංවේදිතා අතරට සමාජ සුහසාධන කටයුතු මුල් බැස තිබේ. එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ, නිවාස, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය යනාදී මූලික සමාජ සුබසාධන, සමාජාර්ථික අයිතීන් පිලිබිඹු විය යුතු ය.

9. රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ

රාජ්‍ය සේවයට දේශපාලන පත්කිරීම් සිදුකිරීම නතර කළ යුතු ය. රාජ්‍ය සේවාවට කෙරෙන සියලු පත්කිරීම් කුසලතා, අත්දැකීම් සහ හැකියාව මත පමණක් විය යුතු ය. ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් විසින් රාජ්‍ය සේවයේ ක්‍රියා පිළිවෙත්, පරිපාලනය, මූල්‍ය රෙගුලාසි යනාදිය සකස් කර ස්ථාපිත කළ යුතු අතර ඒවා අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනතුරුව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු ය. රාජ්‍ය අංශයේ වෘත්තිය සමිති නියෝජිතයින් එම කොමිසමේ සාමාජිකයන් විය යුතු ය.

පළාත් පාලන ආයතනවල පත්කිරීම්, ස්ථාන මාරු, විනය පාලනය යනාදී අංශ සලකා, පළාත් පාලන කොමිසමක් පත් කළ යුතු ය.

10. අධිකරණ ප්‍රතිසංස්කරණ

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන සෑම පනත් කෙටුම්පතකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලභාවය විමසා තීන්දුදීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවිය යුතු ය. තව ද යටත්විජිත නීති උරුමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම වෙනුවට රටේ අවශ්‍යතාවන්ට ගැළපෙන නීති ක්‍රමයක් සම්පාදනය කිරීම සඳහා ද මුල පිරිය යුත්තේ ය. මේ වෙනුවෙන් අවශ්‍ය පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කෙරෙන අධ්‍යාපන ආයතන ද පිහිටුවිය යුත්තේ ය.

11. ගම් සභා

දෛනික කටයුතු පරිපාලන කිරීමේ ක්‍රියා පටිපාටිවල දී ගම්වාසීන්, ගැමි ගොවියන් සහ කම්කරුවන් යනාදී පාදක තලයේ ජනතාව දක්වා සහභාගිත්වයට ඉඩ සැළැසෙන පරිදි, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදය බිම් මට්ටමින් ස්ථාපිත කළ යුතු ය. සංවර්ධන කටයුතු සම්බන්ධීකරණයට උදව්දීම පිණිස, දිවයින පුරා ගම් සභා ස්ථාපිත කළ යුතු ය. ගමට බලපෑමක් ඇති සෑම සංවර්ධන ක්‍රියාවලියක දී ම ගම් සභාවලට පළාත් සභා, මධ්‍යම ආණ්ඩුව සහ ජාත්‍යන්තර සංවර්ධන ආධාර සපයන ආයතනවල සහයෝගය සහ මගපෙන්වීම ලබාදිය යුතු ය.

විදේශ කටයුතු ප්‍රතිපත්තිය

හැඳින්වීම

රටක විදේශ ප්‍රතිපත්තිය මූලික වශයෙන් විදේශ කටයුතු සම්බන්ධ දේශීය ප්‍රතිපත්තියේ දිගුවකි. එය කෙටි කාලීන හෝ මධ්‍ය කාලීන උපාය මාර්ගයක් ලෙස නොව දිගු කාලීන දැක්මක් ලෙස සංකල්පගත කළ යුතු ය. මූලික වශයෙන්, එය රටේ ජාතික ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව, ජාතික ආරක්ෂාව සහ ආර්ථික අවශ්‍යතා ආරක්ෂා කිරීමට උත්සාහ කරයි.

නිදහසින් පසු පසුගිය වසර 75 තුළ, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය විවිධ පාලනයන් යටතේ සහ විවිධ ගෝලීය සහ භූ-දේශපාලනික තත්ත්වයන් යටතේ විකාශනය විය. 1956 සිට ශ්‍රී ලංකාව ගතික මධ්‍යස්ථභාවය සමඟ නොබැඳි ප්‍රතිපත්තියට කැපැවී සිටියේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කීර්තිය ඉහළ නැංවීමට එය සමත් විය. ජාත්‍යන්තර ප්‍රජාවගේ පිළිගැනීමට අනුව 1976 සිට 1979 දක්වා නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ සභාපතිත්වය ශ්‍රී ලංකාවට පිරිනමන ලදී. ඉන්දියන් සාගරය සාම කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස ඉල්ලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනාවක් ගෙන ඒමට ශ්‍රී ලංකාවට හැකි වූයේ එහි කීර්තියේ උච්චතම අවස්ථාවේ දී ය.

ගැටලු

අධිරාජ්‍යවාදී බලවේගවල මැදිහත්වීම නිසා ඉන්දියන් සාගරය සාම කලාපයක් බවට පත් කරගැනීමේ අවශ්‍යතාව පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගැනීමට හැකි වූයේ නැත. ජනාධිපති ඔබාමා යටතේ ඇමරිකානු අධිරාජ්‍යයේ ආසියාව දෙසට යොමු වූ (Pivot-to-Asia) ප්‍රතිපත්තිය, ජනාධිපති ට්‍රම්ප් විසින් ඉන්දු-පැසිෆික් උපායමාර්ගය ලෙස නැවත නම් කරන ලදී. චීනය පාලනය කිරීමට බටහිර දරන උත්සාහයේ දී ඉන්දියානු සාගර කලාපයේ උපායමාර්ගික වැදගත්කම ඉස්මතු කර ඇත. ආසියාව ලෝක ආර්ථිකයේ පෙරටුගාමියා බවට පත්ව ඇති බැවින් ලෝකයේ අවධානය ආසියා-පැසිෆික් කලාපයට සහ විශේෂයෙන් ම ඉන්දියන් සාගර කලාපයට යොමු වී ඇත. මෙම තත්ත්වය විසින් මෙම කලාපය උපායමාර්ගිකව වැදගත් මෙන් ම අවදානම් තත්ත්වයට ද පත් කර තිබේ.

අපගේ අතීත අත්දැකීම් සමාලෝචනය කරමින්, වෙනස්වන ලෝකයේ සමකාලීන යථාර්ථයන් මත පදනම්ව, වර්තමාන ගෝලීය සහ භූ දේශපාලනික අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, අපගේ විදේශ ප්‍රතිපත්තිය පුළුල් ඉදිරි දර්ශනයකින් නැවත යොමුකිරීම දැන් අවශ්‍ය වේ. කලාපයේ සාමය සහතික කිරීම සහ රට තුළ ආර්ථික සංවර්ධනය සඳහා ධනාත්මක පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු වෙන කවරදාටත් වඩා දැන් වැදගත් වේ. වර්ධනය වන ගෝලීය දකුණේ නව යථාර්ථයන් විසින් ක්‍රියාශීලී සහ ගතික විදේශ ප්‍රතිපත්තියක් ඉල්ලා සිටී.

එහෙයින් උක්ත කරුණු සළකා බලා අප විසින් ඉදිරිපත් කරනු ලබන විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණු වන්නේ,

- **මධ්‍යස්ථභාවය සහ බහු-ධ්‍රැවීය නැඹුරුව සහතික කිරීම**
- **ගෝලීය දකුණ සමඟ ඒකාබද්ධවීම**
- **ඉන්දියන් සාගරය සාම කලාපයක් බවට පත්කිරීම**

වෙනුවෙන් කැපැවී කටයුතු කිරීම

- **විදේශ හමුදා බලවතුන්ගෙන් රාජ්‍යයේ ස්වෛරීයත්වය ආරක්ෂා කිරීම**
- **වෙළෙඳ හා මූල්‍ය කටයුතුවල ස්වෛරීභාවය සහතික කිරීම**
- **ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය වෙනුවෙන් කැපැවීම**

ඉදිරිමග

1. මධ්‍යස්ථභාවය සහ බහු-ධ්‍රැවීය නැඹුරුව සහතික කිරීම

ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි එකක් විය යුතු ය. ගෝලීය කටයුතුවල දී රට මධ්‍යස්ථ බවක් මෙයින් අදහස් නො කෙරෙයි. ඒ වෙනුවට, මෙයින් අදහස් කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ ජාතික ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව සහ අධිරාජ්‍ය විරෝධී මූලධර්ම වෙනුවෙන් ස්ථිරව පෙනී සිටින බවයි. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ගොඩනැගිය යුත්තේ වෙනත් රටවල කටයුතුවලට ඇඟිලි නො ගැසීමේ පදනම මත ය.

2. ගෝලීය දකුණ සමඟ ඒකාබද්ධවීම

ගෝලීය දකුණට ආර්ථික බලය මාරුවීම සැළැකිල්ලට ගෙන ශ්‍රී ලංකාව යුරේසියාව සමඟ සමීප දේශපාලන හා ආර්ථික ඒකාබද්ධතාවක් අපේක්ෂා කළ යුතු ය. බ්‍රික්ස් (BRICS), තීරයක් සහ මාවතක් වැඩපිළිවෙළ (BRI), ෂං-හයි සහයෝගිතා සංවිධානය (SCO), අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN), බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක වැඩසටහන (BIMSTEC) සංවිධානය , දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය (SAARC) සහ ඉන්දියානු සාගර අවට රටවල සංගමය (IORA) වැනි සංවිධාන සමඟ ගැඹුරු සහ සමීප සහයෝගීතාව සඳහා ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය දිය යුතුය.

3. ඉන්දියන් සාගරය සාම කලාපයක් බවට පත්කිරීම වෙනුවෙන් කැපැවී කටයුතු කිරීම

ඉන්දියන් සාගරය සාම කලාපයක් ලෙස ප්‍රකාශ කිරීමේ යෝජනාව ශ්‍රී ලංකාව ඉදිරියට ගෙන යා යුතු අතර ක්‍රියාශීලීව එය යථාර්ථයක් බවට පත් කරගැනීම සඳහා ක්‍රියා කළ යුතු ය. මෙය ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සහතික කරනවා පමණක් නොව ලෝකයේ සාමය සහ ස්ථාවරත්වය සඳහා දායක වන අතර, ඉන්දියන් සාගරය මහා බල ගැටුම් සඳහා වේදිකාවක් ලෙස භාවිත කිරීම ද වළක්වනු ඇත්තේ ය. එ මෙන් ම, ඉන්දියන් සාගරයේ හමුදාකරණයට සහ නව යටත්විජිතවාදයට ද ශ්‍රී ලංකාව තරයේ විරුද්ධ විය යුතු ය.

4. විදේශ හමුදා බලවතුන්ගෙන් රාජ්‍යයේ ස්වෛරීයත්වය ආරක්ෂා කිරීම

විදේශීය හමුදාවන්ට යුද මෙහෙයුම්වල යෙදීම සඳහා රටේ භූමිය භාවිතා කිරීමට ඉඩ සලසන කිසිදු හමුදා ගිවිසුමකට එළැඹීමෙන් ශ්‍රී ලංකාව වැළකිය යුතු ය. රටේ ජනතාවට පැවැත්මේ තර්ජනයක් ජයගැනීම සඳහා වන ගිවිසුම් අවශ්‍ය නම් මිස විදේශ බලවේග සමඟ යුද ගිවිසුම්වලට එළැඹීමෙන් ශ්‍රී ලංකාව වැළකී සිටිය යුතු ය. සියලු ම හමුදා ගිවිසුම් ජනතාවට ප්‍රසිද්ධ කළ යුතු අතර පාර්ලිමේන්තුවේ විශේෂ බහුතරයකගේ අනුමැතියට යටත් විය යුතු ය. එවැනි ගිවිසුම් සඳහා නිශ්චිතව අවසන් වන දිනයක් ද තිබිය යුතු ය.

5. වෙළෙඳ හා මූල්‍ය කටයුතුවල ස්වෛරීභාවය සහතික කිරීම

ජාත්‍යන්තර වෙළෙඳ සහ ආයෝජන ගිවිසුම් අත්සන් කිරීමට පෙර විධායකයේ තීරණ ව්‍යවස්ථාදායකයේ විශේෂ බහුතරයකින් අනුමත කළ යුතු බවට සහ සාකච්ඡා ක්‍රියාවලිය විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුක්ත බවත් සහතික කිරීමට ප්‍රතිපාදන සකස් කළ යුතු ය. විදේශ ණය සහ ආධාර ලබාගැනීම සහ භාවිතාකිරීම භූ දේශපාලනික කොන්දේසිවලට යටත් නොවිය යුතු අතර විදේශ

ණය සහ ආධාර කළමනාකරණය සඳහා නිශ්චිත නීති රාමුවක් හඳුන්වා දිය යුතු ය.

6. ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය වෙනුවෙන් කැපැවීම

ශ්‍රී ලංකාවේ විදේශ දූත මණ්ඩලවල සහ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ ප්‍රමුඛතාව විය යුත්තේ රටේ ආර්ථික අවශ්‍යතා ලොව පුරා ඉදිරියට ගෙන යාම යි. හිතකර වෙළෙඳ කටයුතු, වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සහ තාක්ෂණය සඳහා සාකච්ඡා කිරීමට රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩල පුහුණු කළ යුතු ය. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය ඉදිරියට ගෙනයෑම සඳහා රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලය පෞද්ගලික අංශය සහ අදාළ රජයේ අමාත්‍යාංශ සහ ආයතන සමඟ කටයුතු කළ යුතු ය.

ප්‍රතිපත්ති සම්පාදනය වෙනුවෙන් සාකච්ඡාව මෙහෙයවූ සම්පත්දායකයින්

- මහාචාර්ය කේ. ඩී. එන්. වීරසිංහ
- ශිරාන් ඉලන්පෙරුම
- ආචාර්ය වරුණ චන්ද්‍රකීර්ති
- ආචාර්ය වගීෂා ගුණසේකර
- විනෝද් මුණසිංහ
- කසුන් කාරියවසම්
- පර්සි සමරසිංහ
- ආචාර්ය ජගත් මුණසිංහ
- මහාචාර්ය ඩබ්ලිව්. එම්. ටී. බී. වන්නිනායක
- මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර
- වෛද්‍ය ඩී. එල්. වෛද්‍යරත්න
- ආචාර්ය රංජන සේනාසිංහ
- ආචාර්ය ලොයිඩ් ප්‍රනාන්දු
- ආචාර්ය තිලක් සියඹලාපිටිය
- මහාචාර්ය ඩිල්මා කොග්ගලගේ
- විජයානන්ද රූපසිංහ
- විල්ෆ්‍රඩ් ජයසිංහ
- සමන් විදුනෙත් ජයකොඩි
- ඩී. කේ. ජිනදාස

- කිත්සිරි විජේසූරිය
- මහාචාර්ය කේ. කේ. ඩී. එස්. රණවීර
- රාජා විජේසිංහ
- දුලසිරි ප්‍රනාන්දු
- ඕසුර [redacted]
- වෛද්‍ය ඒ.ජේ [redacted]
- කොමියුනිස්ට් පක්ෂ සභාපති
  ඩිව් ගුණසේකර
- කොමියුනිස්ට් පක්ෂ ප්‍රධාන ලේකම්
  දොස්තර ජී. වීරසිංහ

රටට මග කියන ප්‍රතිපත්ති මාලාව

ඉදිරිමගෙන් ඉදිරියට

වර්තමානයේ දී, 'ජාතික ආර්ථිකයක්' ඇති කරගැනීම ජනප්‍රිය සටන් පාඨයක් වී ඇතත්, එය සාක්ෂාත් කරගැනීම සඳහා කිසිදු දේශපාලන බලවේගයක් විසින් බරපතල සහ ශක්‍යතාවයෙන් යුත් සැලැස්මක් ඉදිරිපත් කර නොමැත. එබැවින්, ආසියානු ප්‍රගති සංසදය සහ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය එක් වී විද්‍යාත්මක ප්‍රවේශය මත පදනම් වූ විකල්ප සංවර්ධන වැඩසටහනක් යෝජනා කරයි.

සංවර්ධනය යන්නෙන් අප අදහස් කරන්නේ ප්‍රාග්ධනයේ නිෂ්පාදන බලවේග සහ ඓන්ද්‍රීය සංයුතිය වැඩි කිරීමයි. මෙය කළ හැක්කේ 'මානුෂිකව' භාවිත වටිනාකම් නිෂ්පාදනය කිරීම සහ කම්කරු පන්තිය කායික ශ්‍රමයේ සිට මානසික ශ්‍රමයට මාරුකිරීම මගිනි. ඒ අනුව සම්පාදනය කෙරුණු 'ඉදිරිමගෙන් ඉදිරියට' මෙම ග්‍රන්ථයෙන් යෝජනා කරන්නේ වත්මන් ආර්ථික, සමාජයීය, දේශපාලන හා සංස්කෘතික අර්බුද විශ්ලේෂණය කර ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත හැකි පුළුල් ප්‍රතිපත්ති සමුදායක් ඇතුළත් විකල්ප සංවර්ධන වැඩපිළිවෙළකි.

අධ්‍යාපන අංශය
ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
ආසියා ප්‍රගති සංසදය

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය
ආසියා ප්‍රගති සංසදය

අංක 91, එන්.එම්. පෙරේරා මාවත, කොළඹ 08
ටෙලි - 011 2695328 ඊ මේල් - info@cpsl.lk

400/-

9 786245 612017